වාර්ෂික වාර්තාව

2021

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව -2021

පටුන	පිටුව
දැක්ම හා මෙහෙවර	1
ඓතිහාසික පසුබිම	2-5
2021 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය	6
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	7-10
2021 වර්ෂය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය	11
අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන	12
2021 විගණන කමිටු වාර්තාව	13
ඉකුත් වසර 7 තුළ වත්කම් හා වගකීම්	14-15
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල -2020	16
01 -කොටස	**පාලන වාර්තාව**
පළමුවැනි පරිච්ඡේදය	**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම** **(18-48)**
	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සංයුතිය හා කර්තව්‍යයන් 18-19
	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය 20
	මහවැලි කලාප වල ව්‍යුහය හා පරිපාලනය 21
	සැලසුම් හා මෙහෙයුම් අංශය 43
	අභ්‍යන්තර විගණන අංශය 43
	ජල කළමනාකරණ ලේකම් කාර්යාලය 44
	ප්‍රසම්පාදන අංශය 48
දෙවැනි පරිච්ඡේදය	**තාක්ෂණ සේවා අංශය** **(49-77)**
	කාර්යභාරයන් 49
	පහළ නිම්න සංවර්ධන අංශය 50
	ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් 51
	ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය 54
	විදුලි හා කාර්මික අංශය 57

	ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය	67
	ඉඩම් පහරණ සැලසුම් අංශය	71
	වන හා පරිසර සංරක්ෂණ අංශය	77
තුන්වැනි පරිච්ඡේදය	**සංවර්ධන අංශය**	**(82-107)**
	ඉඩම් අංශය	82
	කෘෂිකර්ම සංවර්ධන අංශය	86
	ධීවර පශු සම්පත් සංවර්ධන අංශය	90
	ආයතන සංවර්ධන අංශය	101
	ව්‍යාපාර සංවර්ධන අංශය	105
	පර්යේෂණ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය	107
සිව්වැනි පරිච්ඡේදය	**මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ අංශය**	**(112-122)**
	පිරිස් හා පාලන අංශය	112
	නීති අංශය	115
	මුදල් අංශය	117
	මහවැලි ආරක්ෂක බලකාය	119
	ප්‍රවාහන අංශය	122
පස්වැනි පරිච්ඡේදය	i කොටස ශ්‍රී ලං.ම.අ.යටතේ පිහිටුවනු ලැබූ සමාගම්	126
	ii කොටස වාර්ෂික ගිණුම්	127
	iii කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව	141
	iv කොටස විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම	157
	v කොටස ශ්‍රී ලං.ම.අ. සමස්ථ කාර්ය සාධන වාර්තාව	175

දැක්ම

තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය,
පරිසර සංරක්ෂණය සහ මහවැලි බල ප්‍රදේශවල
පදිංචි පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවනු
වස් භූමිය සහ ජලය ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම
සඳහා වන ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට
පත්වීම.

මෙහෙවර

මහවැලි ප්‍රජාව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය
ඉහළ නැංවීම සඳහා නවීන තාක්ෂණය මත
පදනම් වූ නවෝත්පාදන හා තිරසාර
කෘෂිකාර්මික ඵලදායිතාවය උදෙසා භූමිය හා
ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම,
පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, හරිත
පරිසරය සහ පරිසර හිතකාමී සංචාරක
කර්මාන්තයට දායක කර ගැනීම.

ඓතිහාසික පසුබිම

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබ ඇති දැවැන්ත භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහනකි. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේදී එවකට පැවති රජය විසින් UNDP/FAO සංවිධානය මගින් ලද තාක්ෂණික සහායන් මත සැලසුම් කරන ලදී. මධ්‍යම කඳුකරයේ පවතින ස්වාභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂි කර්මාන්තයට හා ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යභාරයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය තීව්‍ර වීමත් සමග පැන නැඟුනු අතුරු ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී නිෂ්පාදන වේගය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. 1969 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 11.8 ක් විය. මෙය 1940 ජනගහනයේ මෙන් දෙගුණයක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 3.1% ක් විය. මෙලෙස ජනගහනය වැඩිවීම නිසා ආහාර සඳහා 1980 වන විට සහල් මෙ.ටො. මිලියන 1.8ක් අවශ්‍ය යැයි උපකල්පනය කරන්නට විය. නමුත් 1969 දී සහල් නිෂ්පාදනය වූයේ මෙ.ටො. මිලියන 0.7 ක් පමණි. එමෙන්ම කර්මාන්ත වර්ධනයට හා ගෘහස්ත පරිභෝජනයට විදුලිය ගිගා වොට් පැය 2000 ක් පමණ විය. නමුත් 1969 වන විට විදුලිය නිෂ්පාදනය වූයේ වසරකට ගිගා වොට් 470 ක් පමණි. ඉන් ගිගා වොට් පැය 388 ක් ජල විදුලිය වූ අතර ඉතිරිය ඛනිජ තෙල් දහනයෙන් ලද තාප විදුලිය වේ. තවද 1960-1967 කාල සීමාව තුළ සහල් මෙ. ටො. 466,000 ක් වාර්ෂිකව ආනයනය වූ අතර ඒ සඳහා වසරකට රු. මි. 200 බැගින් විදේශයන්ට ගලා යන්නට විය. මේ හැර අතිරේක බෝග සඳහා ද රු. මි. 139 ක් වාර්ෂිකව වැය වී ඇත. එම වියදම ඉතා ඉහළ අගයක් විය.

ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ජනගහනය ඒකරාශිවීමක් දක්නට ලැබුණි. තෙත් කලාපය තුළ ජනඝනත්වය වර්ග කිලෝමීටරයට 465 වූ අතර වියළි කලාපය තුල වර්ග කිලොමීටරයට 80 ක් පමණ විය. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 66% ක්ම වියළි කලාපයට අයත් වන අතර ජනගහනයෙන් 70% ක් තෙත් කලාපයේ ජීවත් විය. මේ අනුව වියළි කලාපයේ විශාල බිම් ප්‍රදේශයක් පුරාම ඉතා අඩු ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබිණි. ඒ අනුව ලංකාවේ අනෙකුත් ගංගා හා සසඳන කළ තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 6න් 1කට ලැබෙන වර්ෂා ජලය සිය ග්‍රහණයට ගෙන වියළි කලාපය මැදින් මුහුදු වෙත ගලායන මහවැලි ගඟ වසරේ සෑම කාලයකදීම සුපෝෂිත ගංගාවකි. මේ අනුව මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් ලැබෙන ජලයෙන් වියළි කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමත්, ඉහළ මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිතව විදුලි බලාගාර ඉදිකිරීමත් මගින් ශ්‍රී ලංකාවේ අනාගත අවශ්‍යතා සපුරා ගත හැකි බව ප්‍රත්‍යක්ෂ විය. මේ පිළිබඳ ඉදිරිපත් වූ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස රජය කළ ඉල්ලීමකට අනුව එක්සත් ජනපද මෙහෙයුම් දූත මණ්ඩලය වියළි කලාපය ආශ්‍රිත ඉඩම් සංවර්ධනය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් 1956 දී ආරම්භ කර ඇත. ඒ සමඟම ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා මිනුම් දෙපාර්තමේන්තු යන ආයතනවල සහය ඇතිව කැනේඩියානු රජයේ තාක්ෂණික ආධාර මත කැනේඩියන් හන්ටින් සර්වේ කෝපරේෂන් ආයතනයද ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මහවැලි ගඟ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම ආයතන එම අධ්‍යයනය පිළිබඳ ස්වාධීන වාර්තා දෙකක් 1961 දී ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අනුමැතිය සඳහා 1962 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

සමස්ත මහවැලි ද්‍රෝණියේම ජල සම්පත පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු නොකර මහවැලි ජලයෙන් කොටසක් හරවා යැවීම අයහපත් ප්‍රතිඵල ජනනය කරන බැවින් දේශීය විද්වතුන්ගේ අදහස් හේතුවෙන් පාර්ලිමේන්තුව මෙම යෝජනා අනුමත නොකරන ලදී. ඉන්පසු මහවැලි ගඟ ඇතුළු වෙනත් ගංගා ආශ්‍රිත ඉඩම් හා ජල සම්පත් පිළිබඳ සමස්ත අධ්‍යයනයක් කර සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ව්‍යාපෘති තෝරා ස්වාධීන නිර්දේශ ඉදිරිපත් කරන ලෙස 1962 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවන ලදී. එයට අමතරව එම කණ්ඩායමට සහාය සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥ පිරිසක් හා කාර්ය මණ්ඩලයක් ද පත් කරන ලදී.

සිව් වසරක දැඩි අධ්‍යයන පරිශ්‍රමයකින් පසුව 1968 දී වෙන් වෙන් වූ විශේෂ වාර්තා 14 කින් යුතු කාණ්ඩ තුනක අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලද මහවැලි සංවර්ධන සැලැස්ම 1968 වසරේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
උතුරු මැද පළාත් සහ නැගෙනහිර පළාත් ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ප්‍රදේශය කලාප 13 ක් ලෙස නම් කරන ලද අතර එය ඉංග්‍රීසි A සිට M දක්වා නම් කෙරුණි. ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා අඩු ආයෝජනයක් මගින් වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි ව්‍යාපෘති පළමු වන පියවර යටතට ගන්නා ලදී.

මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්ම ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟේ ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900 ක් පමණ වූ ජල ප්‍රමාණයක් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා සැපයීමයි. දෙවන අරමුණ වූයේ ජලාශ 15 ක් ඉදිකර 11 ක් ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද මහවැලි මහ සැලැස්ම අනුව මහවැලි ගංගා ද්‍රෝණියේ සහ වියළි කලාපය තුළ වූ තවත් ගංගා ද්‍රෝණි වල පිහිටි ඉඩම්, හෙක්ටයාර් 364,372 ක් සඳහා යල මහ දෙකන්නයටම වගා කිරීමට වාරි ජල පහසුකම් සලසා දීමට යෝජනා කර තිබුණි. මෙයින් හෙක්ටයාර 264,777ක් අළුතින් අස්වැද්දීමට යෝජිත වූ අතර හෙක්ටයාර 110,404 ක් ඒ වන විට වසරක එක් කන්නයක් පමණක් වගා කළ ඉඩම් විය. සැලසුම් කළ ජලාශ හා ඇල මාර්ගවල විභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් ගිගා වොට් පැය 2037 ක වාර්ෂික ස්ථාවර විදුලිය ප්‍රමාණයක් ජනනය කළ හැකි බවද එයින් පෙන්වා දී තිබුණි. මහවැලි මහා සැලැස්ම අනුව එම සංවර්ධන කටයුතු වසර 30 ක් තුළ නිම කිරීමට යෝජනා විය. අරමුදල් යෙදවීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුව මෙන්ම විශේෂයෙන්ම සංවර්ධන ප්‍රතිලාභ වල අවශ්‍යතාවය යන කරුණු පිළිබඳ අවධානය යොමුකර සංවර්ධන කටයුතු පියවර තුනකට බෙදා තිබුණි.

I ප්‍රථම පියවර

1969-1980 අතර කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. මේ තුළින් අළුත් ඉඩම් හෙක්ටයාර් 74,494 කට පැරණි ඉඩම් හෙක්ටයාර් 58,300 කට වාරි ජලය සැපයීමටත් ගිගාවොට් පැය 820 ක් වාර්ෂික ස්ථාවර විදුලිය බල ප්‍රමාණයක් ජනනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙම පියවරේ වැඩ කටයුතු ව්‍යාපෘති තුනක ට බෙදන ලදී. එනම්,

- පොල්ගොල්ල හැරවුම (1969-1973)
- වික්ටෝරියා / මිනිපේ හැරවුම (1973-1977)
- මොරගහකන්ද බහුකාර්යය ඒකකය

II දෙවන පියවර

මේ යටතේ මාදුරුඔය ජලාශය, තල්දෙන බහුකාර්ය සංකීර්ණය හා කන්දකාඩු අමුණ යන මූලස්ථ වැඩ කොටස් යටතේ මහවැලි හා මාදුරු ඔය නිම්නයන්හි ඉඩම් හෙක්ටයාර 93,117 ක් වගා කිරීමට වාරි පහසුකම් ලැබෙන අතර මෙයින් ඉඩම් හෙක්ටයාර 8,502 ක් ඒ වන විටත් වගා කරමින් තිබූ ඉඩම් යැයි ගණන් බලා තිබේ. මෙගා වොට් 15 ක ස්ථාපිත ජවයක් සහිත ජල විදුලි බලාගාරයක් තල්දෙනදී ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය පෝෂණය කිරීමට උල්හිටිය රත්කිඳ ජලාශයේ සිට උමඟක් ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය ආශ්‍රිතව මෙගා වොට් 4.9 ක ස්ථාපිත ජවයක් ඇති කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මෙහි ප්‍රධාන කාර්යයන් විය.

III තෙවන පියවර

මෙමගින් දිවයිනේ උතුරු මධ්‍යම පළාතේ අලුත් ඉඩම් හෙක්. 105,668 ක් සංවර්ධනය කෙරේ. ජල විදුලිය නිපදවීමේ අවසන් සැලසුම ක්‍රියාත්මක කොට මෙගා වොට් 293 ක ප්‍රමාණයක ස්ථාපිත ජවයක් ඇති විදුලි බලාගාර ඉදිකරන අතර එමගින් වාර්ෂිකව ගිගා වොට් පැය 1169 ක ස්ථාවර විදුලි ජනනයක් කරනු ඇත. පැරණි මිනිපේ වම් ඉවුර ඇල වැඩි දියුණු කිරීම, කිලෝමීටර් 164 ක් උතුරු මධ්‍යම ඇල ඉදිකිරීම, රොටලාවල, උමාඔය, රන්ටැඹේ. කොත්මලේ, කළුගඟ ආදී ජලාශ ඉදිකිරීම මෙම පියවරට ඇතුලත් විය.නමුත් කාලීන අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දෙමින් මහවැලි මහ සැලැස්ම සංවර්ධන අදියර 3 කින් ක්‍රියාවට නැංවෙමින් පවතී.

මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (1 වන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්ම යටතේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙස පොල්ගොල්ල හා බෝවතැන්න ව්‍යාපාර 1970 දී ආරම්භ කරනු ලැබූ අතර, 1976 වන විට ඉදිකිරීම් කටයුතු අවසාන කිරීමට හැකි විය. මෙමගින්, පෙර පැවති ඉඩම් හෙක්ටයාර් 16,000 කට හා නව ඉඩම් හෙක්ටයාර 23,000 කට වාරි ජලය සැපයීමටද , මෙගා වොට් 40 ක ස්ථාපිත ධාරිතාවයකින් යුත් ජල විදුලිය නිපදවීමට ද හැකි විය. මේ ව්‍යාපාරය යටතේ මහවැලි එවි කලාපයට අයත් කලා වැව නිම්නයේ ගොවි පවුල් 23,000 ක් 1977 වන විට පදිංචි කරනු ලැබිණි. මේ වන විට මහවැලි ව්‍යාපාරය යටතේ එවි කලාපයේ සියලු ජනාවාස කටයුතු අවසන් කර ඇති අතර, එහි පදිංචි කරනු ලැබ ඇති මුළු පවුල් සංඛ්‍යාව 39,500 කි.

1977 වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ගැටලු රැසකට මුහුණ දී තිබිණි. සහල් ඇතුලු කෘෂි නිෂ්පාදන ආනයන වියදම ඉහළ යෑම ප්‍රධාන ගැටළුවක් විය. රට තුළ සහල් අවශ්‍යතාවයෙන් නිපදවූයේ 69%ක් වූ අතර 31% ක් ආනයනය මත රඳා පැවතිනි. එයට අමතරව තවත් අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන රැසක්ද ආනයන කරන ලදී. විදුලි බල නිෂ්පාදනය 1977 වන විට විදුලිබල මණ්ඩලයේ විදුලි ධාරිතාවය මෙගා වොට් 408 ක ප්‍රමාණයක් රටේ විදුලිබල ඉල්ලුම සැපයීමට එය ප්‍රමාණවත් නොවුනි. විදුලි බිඳ වැටීම් සාමාන්‍ය දෙයක් වූ අතර එය වසරකට දින 70 ක විදුලිය විසන්ධිවීමක් දක්වා වර්ධනය වී තිබිණි.

ශ්‍රී ලංකාවේ විරැකියාව 17% දක්වා වර්ධනය විය. විරැකියාව පහළ දැමීම අත්‍යවශ්‍ය කරුණක් විය. මෙම ගැටලුවට කඩිනම් විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය විය. මෙම ගැටළු ඉක්මනින් විසඳීමේ පියවරක් ලෙස මහවැලි සංවර්ධන මහ සැලැස්ම කඩිනම් කල යුතු බවට 1977.10.12 දින එවකට පැවැති රජය තීරණය කරන ලදී.

මහවැලි කඩිනම් වැඩසටහන (දෙවන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්මට අයත් තෝරාගත් ව්‍යාපෘති කිහිපයක් එක විට අරඹා වසර 6 ක් වැනි කෙටි කාලයකදී නිම කිරීමට 1977 දී රජය තීරණය කළේය. එය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම අමාත්‍යාංශයක් ද ආරම්භ කරනු ලැබීය. ඒ අනුව කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල හා මාදුරු ඔය ජලාශ යෝජනා ක්‍රම අරඹා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා විය. පසුව මෙයට රන්ටැඹේ ව්‍යාපාරය ද ඇතුළත් කෙරිණි. මෙයින් මාදුරුඔය හැර අනෙකුත් ජලාශ පාදක කොට ගෙන ජල විදුලිය උත්පාදනය කරනු ලබන අතර, එම ජලයම වාරි කර්මාන්තය සඳහා ද භාවිත කෙරේ. මේ අනුව මහවැලි සී හා බී කලාප සංවර්ධනය කොට ගොවි ජනයා පදිංචි කිරීමද මහවැලි කඩිනම් වැඩසටහනට අයත් විය. ඒ අනුව බී කලාපයේ පවුල් 30,465 ක් ද සී කලාපයේ පවුල් 45,488 ක් ද පදිංචි කර ඇත.

මෙම ව්‍යාපෘති සඳහා පිලිවෙලින් ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ජර්මනිය, හා කැනඩාවත්, පහළ නිම්න සංවර්ධනය සඳහා ලෝක බැංකුව, EEC, ජපන් හා කුවෙට් යන රටවල් මූල්‍ය ආධාර සපයන ලදී. මෙම ව්‍යාපෘති දියත් කිරීම සඳහා 1979 දී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපනය කරන ලද අතර, ඉංජිනේරු හා නිර්මාණ කාර්යයන් සඳහා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියත් නැවත පදිංචි කිරීම සඳහා මහවැලි ආර්ථික ඒජන්සියත් ස්ථාපිත කරන ලදී. එමෙන්ම කඩිනම් මහවැලි සංවර්ධනය මගින් ඉදිවුණු විශාල ජලාශ පාලනය සඳහා මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා මෙහෙයුම් අංශය 1986 දී ස්ථාපිත කරන ලදී. 1990 වර්ෂය වන විට කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘති නිමවූ අතර එමගින් විදුලිබල ක්ෂේත්‍රය හා කෘෂිකර්මාන්තය නැංවීමට විශාල ආයෝජනයක් සිදුවිය. මේ නිසා තවදුරටත් කෘෂිකර්මාන්තය ආයෝජනය සිදු කිරීමට රජය මැලි වූ බැවින් මහවැලි මහ සැලසුමට අදාළ මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටපත් විය. කෙසේ නමුත් දීර්ඝ කාලයක් මුළුල්ලේ සැලසුම් වලට පමණක් සීමා වී තිබූ මෙම සංවර්ධන ව්‍යාපෘතිය වර්තමානය වන විට ක්‍රියාත්මක තත්වයට පැමිණ තිබීම මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට ඉවහල් වේ.

මහවැලි ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය හා අනාගත සැලසුම්
(තෙවන සංවර්ධන අදියර)

මහවැලි සංවර්ධන වැඩසටහන රටේ සිව් දෙස ව්‍යාප්තවීමේ අදියර ලෙස තෙවන සංවර්ධන අදියර හැඳින්විය හැකිය. මොරගහකන්ද කළුගඟ ජලාශ යෝජනා ක්‍රමය හරහා උතුර, උතුර මැද, නැගෙනහිර, වයඹ සහ මධ්‍යම පළාත්වල කුඩා පරිමාණ වැව් 1,200 කට ජලය සැපයීමේ අරමුණින් මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. ඇලහැර ප්‍රදේශයේ කුඹුරුවලට, පොළොන්නරුව ප්‍රදේශයේ සියලු ජලාශවලට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියලු ප්‍රධාන ජලාශවලට වර්ෂය පුරා අඛණ්ඩ ජල සැපයුමක් ලබාදී නව වගා ඉඩම් හෙක්. 81,000 සඳහා ජලය සම්පාදනය කරමින් කෘෂිකාර්මික දියුණුවක් ඇති කිරීම මගින් දැය ස්වයංපෝෂිත කිරීමට දායකවීමත්, එහි විදුලි බලාගාරයේ විදුලි උත්පාදනය මගින් ජාතික විදුලි බල පද්ධතියට මෙ. වො. 25 ක ධාරිතාවයක් එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායකවීමත් මෙහි මූලික අරමුණු අතර වේ. එමෙන්ම ව්‍යාපෘතිය හරහා අවතැන් වූ ජනතාවට අවශ්‍ය ජනාවාස ඉදිකර දීමෙන් නොනැවතී, සියලු යටිතල පහසුකම් සපිරි ලග්ගල නගරය අලුතින්ම ඉදිකර ජනතා අයිතියට පත් කිරීමේ මහගු මෙහෙවරද මේ වන විට සාර්ථකව නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත සංවර්ධන වැඩසටහන් අතරින් තවත් එක් පියවරක සාර්ථක නිමාවක් සනිටුහන් කෙරේ.

මහවැලි සංවර්ධන අධිකාරිය තම කර්තව්‍ය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මේ මගින් උමාඔය ගංගා ද්‍රෝණියේ ජලය වැලිමඩ ප්‍රදේශයේ ඉදිකළ ජලාශ දෙකක එක්රැස් කර දිවයිනේ ප්‍රථම වරට කි. මී. 15.6 ක උමං මාර්ගයක් ඔස්සේ කිරිඳිඔය ද්‍රෝණියට හරවා යැවේ. එමගින් ආසියාවේ විශාලතම භූගත විදුලි බලාගාරය හරහා මෙ.වො. 120 ක ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත්, අතිදුෂ්කර උෂ්ව පළාතේ කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම හා ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම යන තම මූලික අරමුණු ඉටුකරගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සාර්ථකව ගමන් කරමින් සිටී.

එපමණක් නොව මහවැලි ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරි මාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය, රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය, වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යනාදී ව්‍යාපෘතීන් රැසක් මහවැලි කලාප ආශ්‍රිතව ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද වර්තමානය වන විට විවිධ සංවර්ධන කාර්යයන් රැසක් මහවැලි එච්, බී, සී, ඩී, මොරගහකන්ද, රඹකැන්ඔය, හුරුළුවැව, ඊ සහ එල් යන කලාප ආශ්‍රිතව ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගමන් මඟ නව මඟකට යොමුකර මහවැලි නිෂ්පාදන හා ඵලදායිතාවය ඉහළ නැංවීම, මහවැලි ජනපදිකයින්ගේ ආදායම් ඉහළ නැංවීම සහ කඩිනමින් ගොවීන්ගේ ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමෙන් ඉඩම් අයිතිය තහවුරු කිරීම යනාදින් සිදු කරමින් මහවැලි ජානපදිකයින්ගේ ජීවන තත්වය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම අපේක්ෂා කරනු ලබයි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත ජලාශ හා අනෙකුත් ජලය පිරිසිදු ව්‍යාපෘතියක් මෙන්ම ජල පෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ වැඩසටහන්ද මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක කරමින් පවතී. එලෙසම ජාතික ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා මහවැලි කලාප ආශ්‍රිතව හා සත්ව පාලන කටයුතු ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

තවද සුනිත්‍ය බල ශක්ති වැඩසටහන යටතේ මහවැලි ජලාශවල පාවෙන සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම හා කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය කිරීම මගින් පරිසර හිතකාමී ලෙස ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත් ඒ මගින් විශාල ආදායම් උත්පාදනයක් සිදුකිරීම හරහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නව උපායමාර්ගික ආදායම් මාර්ග හඳුනා ගනිමින් සිටී.

මහවැලි කලාප ආශ්‍රිතව දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තෙවන සංවර්ධන අදියරේ සියලු මූලික අරමුණු ඉටුකර ගැනීමේදී රටේ සිව් දෙස ව්‍යාප්ත වෙමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික, වාරිමාර්ග හා පශු සම්පත්, බලශක්ති උත්පාදනය සහ පරිසර සංරක්ෂණය යන ක්ෂේත්‍ර වලින් උපරිම දායකත්වය ලබාදීම සඳහා නව සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතී.

2021 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

අනු අංකය	නම / තනතුර	කාලය
01	අනුර දිසානායක මහතා ලේකම් වාරිමාර්ග අමාත්‍යාංශය	2021 ජනවාරි සිට
02	කීර්ති බී.කොටගම අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	2021 ජනවාරි සිට
03	මලර්මදි ගංගාධරන් මහත්මිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මුදල් අමාත්‍යාංශය	2020 ජනවාරි සිට
04	ඒ.පී.ආර්.ජයසිංහ මහතා - සාමාජික	2020 ජනවාරි සිට
05	කේ.වී.පී රංජිත් ද සිල්වා මහතා - සාමාජික	2020 ජනවාරි සිට

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2021 වර්ෂය අවසන් වන විට සිටි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පිළිබඳ තොරතුරු වාර්තාව

අනු අංකය	තනතුරු නාමය	නම
1	අධ්‍යක්ෂ ජනරාල්	ඉංජි. සුනිල් එස්. පෙරේරා මහතා (2019.12.24 - 2021.02.10 වන දින දක්වා)
		කීර්ති බී. කොටගම මයා (2021.02.11 වන දින සිට මේ දක්වා)
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	-
3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)	ජී.ඩී.එන්. ද සිල්වා මයා (ද්විතීයන පදනම මත 2021.07.22 – 2022.02.03 වන දින දක්වා)
4	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)	ඉංජි. පී.ජී. ගුණපාල මයා (2019.04.19 - 2021.02.06 වන දින දක්වා)
		ඉංජි. ටී.එම්. අතපත්තු මිය (2021.02.07 - 2021.10.27 වන දින දක්වා රාජකාරී ආවරණය)
		ඩී.එම්.එන්.ජේ. ධනපාල මයා, අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය) (2021.10.26 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
5	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)	ආර්.එම්. නෙවිල් රාජපක්ෂ මයා, අධ්‍යක්ෂ (කෘෂිකර්ම) (2021.12.01 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
6	අධ්‍යක්ෂ (පිරිස් හා පාලන)	එච්.එම්.කේ.ආර්. හේරත් මයා, නේවාසික ව්‍යාපාර කළමනාකාර (2020.02.13 - 2020.02.27 වන දින දක්වා වැඩ බැලීම) හා (2020.02.28 - 2021.04.04 වන දින දක්වා ස්ථිර)
		එච්.ජී.ජේ.පී. විජයසිරිවර්ධන මිය, රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (2021.04.05 - 2021.07.25 වන දින දක්වා වැඩ බැලීම)
		එම්.ඩබ්ලිව්.ආර්.එන්. ඩෙල්පට්ටි මිය, රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) (2021.07.26 වන දින සිට මේ දක්වා වැඩ බැලීම)
7	අධ්‍යක්ෂ (මුදල්)	ටී.ඩී. ප්‍රියන්ත මයා
8	අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)	එච්.එන්. යාලිංග මිය (2021.06.07 වන දින සිට මේ දක්වා)
9	අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය)	පී.සී.කේ. පරණගමගේ මයා (2020.12.30 – 2021.12.21 වන දින දක්වා කොන්ත්‍රාත් පදනම මත)

අනු අංකය	තනතුරු නාමය	නම
10	අධ්‍යක්ෂ (කෘෂිකර්ම)	ආර්.එම්. නෙවිල් රාජපක්ෂ මයා (2017.03.15 - 2021.11.30 වන දින දක්වා)
		ඩී.කේ.එච්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ආර්. සෙනෙවිරත්න මිය, අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) (2021.12.01 වන දින සිට මේ දක්වා රාජකාරී කර ගෙන යාම)
11	අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්)	එම්.ජී.ටී. ප්‍රියදර්ශනී මිය (2018.12.20 වන දින සිට මේ දක්වා)
12	අධ්‍යක්ෂ (ඉඩම්)	එස්.ඒ.ඊ.ඩබ්ලිව්. කුලරත්න මිය, වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම්) (2021.01.26 – 2022.05.31 වන දින දක්වා වැඩ බැලීම)
13	අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන)	එම්.එල්.ඩී.සී. අබේවර්ධන මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) (2017.09.08 - 2022.03.31 වන දින දක්වා රාජකාරී ආවරණය)
14	අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන)	ඩී.කේ.එච්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ආර්. සෙනෙවිරත්න මිය (2019.06.25 වන දින සිට මේ දක්වා)
15	අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්)	ඉංජි. ටී.එම්. අතපත්තු මිය (2016.05.18 - 2021.10.27 වන දින දක්වා)
		ඉංජි. එස්.ඒ.ඒ. ධර්මසිරි මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පහළ නිමින සංවර්ධන) (2021.10.26 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
16	අධ්‍යක්ෂ (පහළ නිමින සංවර්ධන)	ටී. රණසිංහ මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) (2021.04.30 වන දින සිට මේ දක්වා)
17	අධ්‍යක්ෂ (ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්)	ඉංජි. එස්.ආර්.කේ. අරුජ්පොල මයා (2017.02.01 වන දින සිට මේ දක්වා)
18	අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ)	ඉංජි. චන්ද්‍රා සෙනරත් මෙය
19	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්)	ජේ.එම්.අයි.එච්. ජයවර්ධන මිය, සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) (2018.08.27 - 2021.08.31 වන දින දක්වා රාජකාරී ආවරණය) හා (2021.09.01 වන දින සිට මේ දක්වා රාජකාරී ඉටු කිරීම)
20	අධ්‍යක්ෂ (වන හා පරිසර)	ඒ.එම්.කේ.බී. අත්තනායක මයා
21	අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය)	ඉංජි. ඩී.එම්.එන්.ජේ. ධනපාල මයා (2021.04.30 වන දින සිට මේ දක්වා)

අනු අංකය	තනතුරු නාමය	නම
22	අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන)	බී.එල්.බී. සේනාරත්න මයා, සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) (2018.08.27 - 2021.08.03 වන දින දක්වා රාජකාරී ආවරණය) හා (2021.08.04 වන දින සිට මේ දක්වා රාජකාරී ඉටු කිරීම)
23	අධ්‍යක්ෂ (පර්යේෂණ, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති)	ඩී.කේ.වී. විජයවීර මිය
24	අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික)	ජේ.ආර්. බෝපිටිය මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) (2019.11.15 - 2021.08.31 වන දින දක්වා රාජකාරී ආවරණය) හා (2021.09.01 වන දින සිට මේ දක්වා රාජකාරී ඉටු කිරීම)
25	අධ්‍යක්ෂ (නීති)	ආර්.එල්. රාජපක්ෂ මිය (2021.05.15 වන දින දක්වා)
26	නේවාසික ව්‍යාපාර කළමනාකාර (බී කලාපය)	පී.ජී. නොයෙල් ජයසිරි මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2020.11.03 - 2022.08.01 වන දින දක්වා රාජකාරී ආවරණය)
27	නේවාසික ව්‍යාපාර කළමනාකාර (සී කලාපය)	අයි.එම්.යූ.කේ. කුමාර මහතා (2020.10.26 වන දින සිට මේ දක්වා)
28	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඩී කලාපය)	ජේ.පී. ජයතිලක මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (කෘෂිකර්ම) (2017.04.04 - 2021.02.11 දින දක්වා රාජකාරී ආවරණය)
		ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා (2021.02.04 - 2022.07.31 වන දින දක්වා)
29	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඊ කලාපය)	ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා (2018.06.05 - 2021.02.03 වන දින දක්වා)
		ජේ.පී. ජයතිලක මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (කෘෂිකර්ම) (2021.02.12 - 2022.08.04 රාජකාරී ආවරණය)
30	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ජී කලාපය)	ඒ.ජී.ටී. හේමන්ත ජයසිංහ මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2017.02.01 -2022.07.27 වන දින දක්වා රාජකාරී ආවරණය)
31	නේවාසික ව්‍යාපාර කළමනාකාර (එල් කලාපය)	ආර්.ඒම්.කේ.බී. රන්දෙණිය මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2020.02.27 - 2021.03.07 වන දින දක්වා රාජකාරී ආවරණය)
		ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා (2021.03.06 - 2021.04.04 වන දින දක්වා වැඩ බැලීම)
		එච්.එම්.කේ.ආර්. හේරත් මයා (2021.04.05 - 2022.08.03 වන දින දක්වා)
32	නේවාසික ව්‍යාපාර කළමනාකාර (එච් කලාපය)	ඩබ්ලිව්.එම්.එස්. වීරසිංහ මයා, කොට්ඨාශ කළමනාකාර (2020.10.29 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)

අනු අංකය	තනතුරු නාමය	නම
33	නේවාසික ව්‍යාපාර කළමනාකාර (හුරුළුවැව කලාපය)	එම්.එම්.ඒ. ගුණතිලක මයා (2020.10.14 - 2022.08.02 වන දින දක්වා)
34	නේවාසික ව්‍යාපාර කළමනාකාර (රඹකැන්ඔය කලාපය)	එච්.එම්. විජේරත්න මයා (2018.11.01 - 2021.10.02 වන දින දක්වා රාජකාරී ආවරණය)
		ඒ.එල්. ඔස්මන් ද සිල්වා මහතා (2021.10.04 වන දින සිට මේ දක්වා)
35	නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය)	ඒ.එල්. ඔස්මන් ද සිල්වා මහතා (2019.08.31 වන දින දක්වා වැඩ බැලීම) හා (2019.09.24 - 2021.10.03 වන දින දක්වා තනතුරේ ස්ථිර කර ඇත.)
		එල්.එම්.එන්. ප්‍රියන්ත මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (පාලන) (2021.10.01 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)

2021 වසර සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය

1979අංක 23 දරණ පනත මගින් විශේෂ බලතල සහිතව බහුවිධ අරමුණු පෙරදැරිව ආරම්භ කළ මහවැලි සංවර්ධන ව්‍යාපාරය මෙරට ක්‍රියාත්මක දැවැන්තම භෞතික හා මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය වන අතර එමඟින් ආරම්භයේ පටන් වර්තමානය දක්වා විවිධ වූ විෂය ක්ෂේත්‍රයන් මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත .මහවැලි සංවර්ධන සැලැස්මට අනුකූලව ජාතික ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය වාරි ජල පහසුකම් සැපයීම, පුනර්ජනනීය විදුලිබල උත්පාදනය, පානීය ජලය සහ වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම මෙන්ම මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ ඉලක්කයන් සපුරාගැනීමෙලා මහවැලි සංවර්ධන වැඩසටහන දශක 5කට වඩා වැඩි කාලයක් පුරාවට ජාතික ආර්ථික ක්‍රියාවලියට සුවිශේෂ දායකත්වයක් ලබාදෙනු ලබයි. වර්තමානයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය කලාප10 ක් තුළ කොට්ඨාශ50 ක් සහ ප්‍රාදේශීය මට්ටමේ ඒකක 238ක් යටතේ තම සංවර්ධන කටයුතු මෙහෙයවීම සිදුකරයි .විවිධ විෂයය ක්ෂේත්‍රයන් යටතේ සංවර්ධන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීමේ ව්‍යුහයක් සහිත ආයතනයක් ලෙස සංවර්ධනයට වෙන් කල දේශීය හා විදේශීය අරමුදල් සහ රාජ්‍ය නොවන ආයතනවල අරමුදල් ඵලදායිව ආයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

මෙම වර්ෂය ලොවපුරා මහත් ව්‍යසනයක්ව පැවති Covid 19 වසංගතයේ බලපෑම අප රටේ ආර්ථිකයට ප්‍රබලව බලපෑමක් එල්ල කල වර්ෂයකි .මෙවැනි තත්වයක් හමුවේ වුවද මහවැලි බල ප්‍රදේශයේ ජනගහනය මිලියන1.23 ක)පවුල් සංඛ්‍යාව (347,285 අවශ්‍යතා කළමනාකරණය කරමින් ප්‍රධාන ජලාශ19 ක් ,කුඩා වැව්654 ක් ,කි.මී9,585 .න් යුතු වාරි පද්ධතියක් සහ කි.මී10,134 .න් යුතු මාර්ග පද්ධතියක් සුරක්ෂිත කරමින් 3,784 MCM ජල ධාරිතාවක් වාරි කටයුතු සඳහා හා පානීය මෙන්ම ගෘහස්ථ අවශ්‍යතා සඳහා ලබාදීමට කටයුතු කර ඇත .ඉදිරියේදී පවතින විශාල ජල ඉල්ලුම හමුවේ ජල හිඟතාවයන් ඇති විය හැකි ප්‍රදේශ වලටත් තද වියළි කාලගුණ තත්වයන් ඇති වන ප්‍රදේශ වලටත් ජලය ලබාදීමට විශේෂ වාරි කළමණාකරන වැඩසටහන් දියත් කර ඇත.

ව්‍යවසනයක් පැවති කාල පරිච්ඡේදයක් හමුවේ වුවද මෙම වර්ෂයේදී කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වර්ධනයක් අත් කර ගෙන ඇති අතර දේශීය අනන්‍යතාවයෙන් පිරිපුන් ගුණාත්මක වී සහ අතිරේක බෝග බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම ,ආනයනය සීමා කර ඇති තෝරාගත් බෝග මහවැලි කලාප ආශ්‍රිත ගොවිබිම් තුළ වගා කිරීම හා ඉහළ අස්වැන්නක් ලබා ගැනීම ,අහරින් ස්වයංපෝෂිත කිරීම උදෙසා ගෙවතු සංවර්ධන වැඩසටහන දිරිමත් කිරීම ,කාබනික පොහොර නිෂ්පාදනය කිරීම හා භාවිතය ප්‍රවර්ධනය කිරීම ,නකල්ස් කාබනික කලාපයෙන් ඇරඹී සංකල්පය සියලුම මහවැලි කලාප තුළ ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම ,වාරිබිම් සුපෝෂණය කිරීම උදෙසා වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය කිරීම යන වැඩසටහන් සුවිශේෂී වේ .ධීවර හා පශුසම්පත් සංවර්ධනය යටතේ දියර කිරි නිෂ්පාදනය ,බිත්තර නිෂ්පාදනය ,මිරිදිය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය හා මිරිදිය ඉස්සන් නිෂ්පාදනය යන සියලු වැඩසටහන් වල ප්‍රගතිය %100 ඉක්මවා ලබා ගෙන ඇත .කෘෂිකර්ම හා පශුසම්පත් යන අංශයන් සඳහා පැවති සාම්ප්‍රදායික ක්‍රමෝපායන් වෙනුවට නවීන තාක්ෂණික ක්‍රමෝපායන් හඳුන්වාදීමට කටයුතු කර ඇති අතර මහවැලි තරුණ කණ්ඩායම් කෘෂිකර්මාන්තයට යොමු කිරීම සඳහා විශේෂ වැඩසටහන් දියත් කළ වර්ෂයකි

පරිසර හා වන සංරක්ෂණ අංශයෙන් ජලාශ වල වේගයෙන් ව්‍යාප්ත වන ආක්‍රමණශීලී ශාක ඉවත් කර පිරිසිදු කිරීමේ වැඩසටහනක්හා ජල පෝෂක ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා පැළ සිටුවීම ඇතුලු නියමු වැඩසටහන් දියත් කර පරිසර සංරක්ෂණ කටයුතු දියත් කර ඇත.නව සංවර්ධන කලාපයන් ලෙස වයඹ පළාත කේන්ද්‍ර කරගනිමින් M හා N නමින් ආර්ථික කලාපයන් දෙකක් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත ප්‍රජා සංවර්ධනය වේගවත් කර ජානපදිකයින් වෙත ඉඩම් ඔප්පු ලබාදීමට කටයුතු කර ඇත

ඉහත කාර්යයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය මූලික මගපෙන්වීම හා උපදේශනය සපයන වාරිමාර්ග අමාත්‍ය තුමන් වන ගරු වමල් රාජපක්ෂ මැතිතුමන්ගෙන් ලැබෙන ධෛර්යය ඉතා අගය කොට සලකමි .එමෙන්ම මහවැලි රාජ්‍ය අමාත්‍යතුමා ,අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමන්ලාගේ සුවිශේෂී හෙහෙයවීම මත ඉහත ඉලක්කයන් සාර්ථකව ජය ගැනීම සඳහා කටයුතු කල ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සමස්ථ කාර්යය මණ්ඩලයට හා සියලුම ව්‍යාපෘති කාර්යය මණ්ඩලය වෙත ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



කීර්ති.බී.කොටගම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 2021-12-31 දිනට සංවිධානයේ විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමඟ කාරුණිකව ඉදිරිපත් කරමු.

2021 වර්ෂය පිළිබඳ සමාලෝචනය

අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති සමාලෝචනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිදුකරන ලද සංවිධානයේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර ප්‍රකාශයක් අන්තර්ගත කර ඇත.

එසේම සංවිධානයේ වත්කම්, සුරැකීම්, වංචා, දූෂණ හා වෙනත් අක්‍රමිකතා සොය බැලීම සහ අවදානම් අවම කිරීමේ අරමුණින් අභ්‍යන්තර පාලනය පිළිබඳ මනා කළමනාකාරීත්වයකින් කටයුතු කර ඇත.

තවද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලුම කාර්ය මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී දක්වා ඇති ඉමහත් කැපවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් වශයෙන් අපගේ ප්‍රශංසාව මෙයින් පල කරමු.

අනුර දිසානායක මහතා
ලේකම්
වාරිමාර්ග අමාත්‍යාංශය

මලර්මදි ගංගාධරන් මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල් අමාත්‍යාංශය

ඒ.පී.ආර්.ජයසිංහ මහතා
සාමාජික

කේ.වී.පී රංජිත් ද සිල්වා
සාමාජික

2021 විගණන කමිටු වාර්තාව

අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය, ශ්‍රී ලංකා ජනරජය විසින් නිකුත් කර ඇති මූල්‍ය රෙගුලාසි (Financial Reguations), ආයතනික රෙගුලාසි (Adminstration Regulations), කාලීනව නිකුත් වන චක්‍රලේඛ, ප්‍රතිපත්ති තීරණ සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, පරීක්ෂණ නිරීක්ෂණ මගින් අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කරමින්, කළමනාකාරිත්වයට සහය වීම සිදු කරනු ලබයි.

කාර්යය භාරයන්

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුකූලව සහ යහපාලන ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියාත්මක කරනවාද යන්නත්, සිදු කරන ලද ගනුදෙනු වලින් ආර්ථිකමය ප්‍රතිලාභ (Value for Money) ලැබෙනවාද යන්නත්, විගණන පරීක්ෂණයන් නිරීක්ෂණ, සැසඳීම්, භෞතික පරීක්ෂණ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (ICA) මගින් සහ ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිතීන් (IAS) මගින් නිකුත් කරන ලද ප්‍රමිතීන් වලට අනුගතව, විගණනය සිදු කර කළමනාකාරිත්වය වෙත වාර්තා කිරීම.

2021 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් සිදු කොට අවසන් කර ඇත.

1. අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කරන ලද විගණන වාර්තා ගණන 28 කි.
2. නිකුත් කරන ලද විමර්ශන වාර්තා ගණන 15 කි.
3. පවත්වන ලද විගණන හා කළමනාකරණ රැස්වීම් ගණන
    - අමාත්‍යාංශ මට්ටමින් විගණන කළමනාකරන කමිටු රැස්වීම් 03
    - අධිකාරි මට්ටමින් විගණන කළමනාකරණ රැස්වීම් 03
4. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ලබාදුන් පිළිතුරු සහ විමසුම් මගින් ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම.
5. විගණන හා කළමනාකරණ කමිටු මගින් ලබාදුන් මහපෙන්වීම හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට, ප්‍රගති වාර්තා ලබාගැනීම තුළින් උපදෙස් ලබාදීම.

විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, විගණන හා කළමනාකරණ කමිටුව, පහත සඳහන් ආකාරයට සමන්විත වේ.

1. මලර්මති ගංගාතරන් මිය - සභාපති -මහා භාණ්ඩාගාරය
2. කේ.වී.පී. රංජිත් ද සිල්වා මයා - කමිටු සාමාජික
3. ඒ.පී.ආර්. ජයසිංහ මයා - කමිටු සාමාජික
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

5. විගණනකාධිපතිවරයා නියෝජනය කරන විගණන අධිකාරි
6. අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන)- අමාත්‍යාංශය

කමිටුව සඳහා සහභාගි වන වෙනත් නිලධාරීන්

7. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
8. අධ්‍යක්ෂ (මුදල්)
9. අවශ්‍යතාවය මත කැඳවන වෙනත් නිලධාරීන්

කමිටු කාර්යභාරය

- වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අධීක්ෂණය කිරීම.
- විගණකාධිපති වාර්තා හා අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ එමගින් හඳුනාගන්නා ගැටළු නිරාකරණය කිරීමට මඟ පෙන්වීම.
- 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) C අනු වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා දක්වා ඇති කරුණු පිලිබඳව කටයුතු කිරීම සහ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම සඳහා උපදෙස් ලබාදීම.

ඉකුත් වසර 07 වත්කම් හා වගකීම්

	2021	2020	2019	2018	2017	2016	2015
	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපල පිරියත හා උපකරණ	115,083,911	119,033,935	4,972,468	4,675,657	4,116,187	4,195,724	4,294,893
ආයෝජන (LT)	23,104	164,555	166,299	171,313	187,531	178,556	152,577
අස්පෘශ්‍ය වත්කම්	6	785					
ප්‍රාග්ධන නොනිමි වැඩ	28,496	57,166	47,482	84,947	78,552	41,301	74,286
මුළු ජංගම නොවන වත්කම්	**115,135,517**	**119,256,441**	**5,186,249**	**4,931,917**	**4,382,270**	**4,415,581**	**4,521,756**
පෙව වත්කම් ප්‍රාග්ධන	286,717	259,342	219,777	167,027	134,578	101,940	-
යෝජිත ලියා හැරීම්			-	-	859	859	-
ජංගම වත්කම්							
භාණ්ඩ තොග	278,716	166,810	170,983	180,342	184,815	168,173	157,428
පෙව වත්කම් - වෙළඳ	41,118	42,721	47,178	26,312	15,875	22,630	-
ලැබිය යුතු - වෙළඳ හා අනෙකුත්	3,432,901	2,594,637	2,997,661	2,032,715	2,084,069	1,730,015	1,307,077
අස්ථිර ගිණුම			-	-	-	-	-
කලින් ගෙවීම්			-	4,767	3,896	8,754	5,172
බැංකු ඇපකර	-	377	374	6,292	6,164	4,153	1,372
අන්තර් සමාගම් ජංගම ගිණුම් ශේෂයන්			-	-	-	-	-
මුදල් හා මුදල් සමාන දෑ	1,177,597	667,498	258,877	312,702	343,312	312,750	429,588
ජංගම වත්කම් වල එකතුව	4,930,332	3,472,043	3,475,073	2,563,130	2,638,131	2,246,475	1,900,637
මුළු වත්කම්	**120,352,566**	**122,987,826**	**8,881,100**	**7,662,074**	**7,155,838**	**6,764,855**	**6,422,393**

	2021	2020	2019	2018	2017	2016	2015
	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000
වගකීම්							
ජංගම බැරකම්							
ගෙවිය යුතු	39,894,796	39,970,622	968,185	651,986	879,967	376,737	341,286
එලායන්ස් ෆිනෑන්ස් සමාගමේ කල් බදු			-	-	2,153	3,080	
උපචිත වියදම්	104,067	94,434	211,909	102,067	175,733	122,286	46,159
අන්තර් ආයතන ජංගම ගිණුම් ශේෂයන්			-	-			
ජංගම බැරකම්වල එකතුව	**39,998,864**	**40,065,057**	**1,180,094**	**754,053**	**1,057,853**	**502,103**	**387,445**
ජංගම නොවන බැරකම්							
පාරිතෝෂික දීමනා	1,343,221	1,500,519	1,371,814	1,379,494	1,388,101	1,489,288	1,551,379
බැංකු ණය			-	-		2,455	
කල් බදු			-	219	271	2,653	11,247
විලම්බිත බදු	-	612	612	612	612	612	612
ජංගම නොවන බැරකම් වල එකතුව	**1,343,221**	**1,501,131**	**1,372,426**	**1,380,325**	**1,388,984**	**1,495,008**	**1,563,238**
බැරකම් වල එකතුව	**41,342,085**	**41,566,188**	**2,552,520**	**2,134,378**	**2,446,837**	**1,997,111**	**1,950,683**
මුළු වත්කම්	**79,010,481**	**81,421,638**	**6,328,579**	**5,527,696**	**4,709,001**	**4,767,744**	**4,471,710**
ශුද්ධ වත්කම්වල එකතුව							
සමුච්චිත අරමුදල	73,874,727	76,926,922	1,837,751	24,649,830	24,407,260	24,066,161	23,702,950
සංචිත - ඉ/ගෙ ආදායම් හා වියදම් ගිණුම් ශේෂය	(490,550)	(1,178,028)	(657,528)	(24,040,551)	(23,755,208)	52,121	53,992
ආදායම් සංචිත - සමාගම්	-	48,288	48,288	50,865	4,006,082	4,019,027	4,021,721
ප්‍රත්‍යාගණන සංචිත	5,626,304	5,624,456	5,100,069	4,867,551	50,865	(23,369,566)	(23,276,474)
ශුද්ධ වත්කම්/ ස්කන්ධය එකතුව	**79,010,481**	**81,421,638**	**6,328,580**	**5,527,696**	**4,708,999**	**4,767,743**	**4,502,189**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය

අනු අංකය	සමාගම්	සභාපති	අධ්‍යක්ෂ මණ්ඩලය	ප්‍රධාන කාර්යාලීය ලිපිනය
1	සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික) පුද් සමාගම)	-	පරාක්‍රම අබේවර්ධන මහතා) අධ්‍යක්ෂ එඩ්වඩ් ද මෙල් මහතා) අධ්‍යක්ෂ ඔස්මන් ද සිල්වා මහතා) අධ්‍යක්ෂ	අංක 260/20, බෙස්ලයින් පාර, කොළඹ 09
2	සී/ස මහවැලි උපදේශක සේවා කාර්යාංශය	ඩී.එම්.අනුර රණවීර බණ්ඩාර දිසානායක මහතා	එල්.එම්.කේ.ආර්.ආශා රාජකීය අධ්‍යක්ෂ පී.ඒ.ඒ.පී.කාන්ති පන්නල) අධ්‍යක්ෂ ආර්.එම්.බී.රාජකරුණා) අධ්‍යක්ෂ එස්.සී.රමාලතා දමයන්ති)අධ්‍යක්ෂ ඊ.ඒ.සී.කුමාර එදිරිසුරිය) අධ්‍යක්ෂ	අංක 11, ජාවත්ත පාර, කොළඹ 05
3	ස්වභාවික සම්පත් කළමනාකරන සේවා පුද් (සමාගම)	-	ඉංජී.බී.ඩබ්.එන්.ඩබ්.සෙනවිරත්න මහතා (අධ්‍යක්ෂ) එන්.එම්.කේ.බී.අත්තනායක මහතා (අධ්‍යක්ෂ)	වේල්ල පෙදෙස,පොල්ගොල්ල, මහනුවර

පාලන වාර්තාව

I කොටස

පළමු පරිච්ඡේදය

1.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය.

1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවා ඇති අතර එකී පනතේ 12 වන වගන්තිය යටතේ යම් විශේෂිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත පරිදි පැහැදිලි කර ඇත.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යාන්ත්‍ර, ස්ථාන ඉදිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැඟීම. එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍ය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් කරනු ලැබිය හැකිය.

(ආ) පූර්ණ හා ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාර වීම සහ එම සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඇ) කෘෂිකාර්මික ඵලදායි වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම තත්ත්වයට පත් කිරීම සහ කෘෂි ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා සුරක්ෂිත කිරීම.

(ඈ) භෞතික පරිසරය සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම.

(ඉ) ජනතා පොදු සුබසාධනය හා සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ පරිපාලනය කිරීම.

(ඊ) අභ්‍යන්තර සහ බාහිර පෞද්ගලික ප්‍රාග්ධනය කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම.

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජන ක්‍රමය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාවට නැංවීමේදී රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන පළාත් පාලන ආයතන රජයේ සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන පෞද්ගලික හෝ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ සුරක්ෂිත කිරීම.

1.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කර්තව්‍යයන්

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එක් එක් විෂය ක්ෂේත්‍රයන් යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති හා ක්ෂේත්‍ර කාර්යාලයන්හි කටයුතු සම්බන්ධීකරණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් හා නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් මගින් සිදුකරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කර්තව්‍යයන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඉටුකර ඇත.

- සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයේ ප්‍රගතිය මාසිකව විමර්ශනය කොට අවශ්‍ය මැදිහත්වීම් මගින් නියමිත ඉලක්ක සපුරා ගැනීම.

- වත්කම් නඩත්තුව හා පරිපාලනය පිළිබඳ නිසි සැලැස්මක් අනුව කටයුතු කිරීම තුළින් වත්කම් අපහරණය කිරීම.

- කාලරාමුවකට අනුව මොරගහන්ද කළුගඟ ජලාශය හා කිවුල් ඔය ජලාශය ඉදිකිරීම.

- බී කලාපය දකුණු ඉවුර හා එල් කලාපයේ වාරි බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා ප්‍රදේශ හඳුනාගෙන මූලික පරිසර අධ්‍යයනයක් සිදුකිරීම.

- කෘෂිකාර්මික සහාය සේවා ප්‍රවර්ධනය කෘෂිකාර්මික ප්‍රවර්ධනය හා ආදායම් උත්පාදන වැඩසටහන් දියුණු කිරීම හා රටේ සුරක්ෂිතතාවය ඇති කිරීම.

- වාරි පද්ධති නඩත්තුව හා කළමනාකරණය ගොවි සංවිධානවලට පැවරීමට හැකිවන පරිදි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිලිබඳ නිලධාරීන් හා ගොවි නියෝජිතයන් බල ගැන්වීම.

- මහවැලි ජානපදික ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට පශු සම්පත් ක්ෂේත්‍ර බලගැන්වීම.

- කෘෂිකාර්මික ඉඩම් සීමිත සම්පතක් වන මහවැලි ජානපදිකයන්ගේ දෙවන, තෙවන පරම්පරාවල ආර්ථික සංවර්ධනය හා රැකියා ජනනය උදෙසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැර වූ රැකියා ආයෝජන ව්‍යාපෘති සඳහා යොමු කිරීම හා මග පෙන්වීම.

- සියළුම මට්ටම් වල නිලධාරීන් හා සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා කටයුතු කිරීම හා කාර්යය මණ්ඩල තොරතුරු පරිසනක ගත කර ඊ-මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කිරීම.


- රේඛීය ආයතන සමඟ සාකච්ඡා කරමින් කන්න මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය තුළින් ප්‍රධාන ජලාශ මගින් වාරිමාර්ග ජනාවාස ව්‍යාපෘති ප්‍රධාන ජලවිදුලි නිෂ්පාදනය හා ගෘහස්ථ ජල විදුලිබලය හා ගෘහස්ථ ජල සම්පාදනය සඳහා ජලය වෙන් කර දීම.

- බී, සී, ඊ, එච්, එල්, ඩී, මොරගහකන්ද, හුරුළුවැව, වලව සහ රඹුක්කන්ඔය යන ව්‍යාපෘති වල භෝග විවිධාංගීකරණය, සමාජ හා ආර්ථික සංවර්ධනය රැකියා උත්පාදනය සඳහා කටයුතු කිරීම.

- ජල කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය කෘෂිකාර්මික සංවර්ධනය පස සහ ජලය සංරක්ෂණය දියබෙත්ම කලමනාකරණය පාරිසරික දූෂණය හා ජල දූෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.

- ප්‍රධාන ජලාශවල හැරවුම නිර්මිත සුරක්ෂිතාවය සිදු කිරීම සඳහා සළුලදායි මෙහෙයුම් නඩත්තු වැඩසටහන් සැකසීම ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් ගොවි සංවිධාන දැනුවත් කිරීම

1.3 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය.



1.4 මහවැලි කලාප - ව්‍යුහය, පරිපාලනය හා වර්තමාන තත්වය


මහවැලි ගංගා ද්‍රෝණි සංවර්ධන මහ සැලැස්මට අනුව ඇති කරන ලද ජනාවාස පරිපාලනය වාරි පද්ධති මෙහෙයවීම නඩත්තුව හා පරිපාලනය සඳහා මහවැලි බල ප්‍රදේශ කලාප වශයෙන් පරිපාලන ඒකක 10 ක් පිහිටුවා ඇත. මහවැලි ගංගා නිම්නය ආශ්‍රිතව බී, සී, ඊ, ඩී, එච්, මොරගහකන්ද, හුරුළු වැව යන කලාපද උඩවලව, වැලිඔය (එල් කලාපය) සහ රඹුක්කන්ඔය කලාප වැනි විශේෂ කලාප ද මෙසේ ආරම්භ කර ඇත.


මහවැලි කලාප වල හා විශේෂිත ප්‍රදේශයන්හි සංවර්ධනය හා කළමනාකරණ කර්තව්‍යයන් නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ගේ බලතල යටතට පවරා ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත වගකිව යුතු අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ අධීක්ෂණය යටතේ කලාප මට්ටමින් සිදුවිය යුතු කාර්යයන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා පත්කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා දෙනු ඇත.
එසේම සෑම කලාපයකටම ප්‍රධාන විධායක නිලධාරිවරයා නේවාසික ව්‍යාපාර කළමණාකරු වන අතර තාක්ෂණ, ඉඩම්, කෘෂිකර්ම හා සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අධීක්ෂණ නිලධාරීන් ලෙස නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් අනුයුක්ත කර ඇත. ඒකක කිහිපයකට එක් කොට්ඨාස කළමනාකාර කාර්යාලයක් ද එම කාර්යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා කොට්ඨාස කළමනාකාරවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු, ආයතන සංවර්ධන නිලධාරියෙකු, කෘෂිකර්ම නිලධාරිවරයෙකු හා ඉඩම් නිලධාරිවරයෙකු ස්ථාන ගත කර ඇත. එම සියලු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියළුම විෂය ක්ෂේත්‍රයන්ගේ රාජකාරි ඉටුකිරීම හා එක් එක් ඒකකයකට එක් ඒකක කළමනාකාරවරයෙකු බැගින් ස්ථාන ගත කොට ඇත. මෙම ඒකකයක් සාමාන්‍යයෙන් පවුල් 250-300 අතර ප්‍රමාණයක ඉඩම් ලාභීන් පිරිසක් පදිංචි කිරීම සිදුකර ඇත.

මහවැලි කලාපයන්හි ඉඩම් පරිපාලනය සිදුකරනු ලබන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත ප්‍රමුඛ කරගත් රජයේ ඉඩම් ප්‍රතිපත්තියට අනුව ය. රජයේ ඉඩම් සංවර්ධන කටයුතු සඳහා බැහැර කිරීමේ සිට ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම දක්වා මූලික කටයුතු එම ඉඩම් වලට අදාළ පසු කටයුතු ද සිදු කරනු ලැබේ. මීට අමතරව වාණිජ හා ආයෝජන කටයුතු සඳහා ඉඩම් බදු පදනම මත බැහැර කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරනු ලබන්නේ ද, මුල් ජානපදිකයන්ට අමතරව දෙවන, තුන්වන පරම්පරාවට ඉඩම් ලබා දීම ද කලාප කාර්යාල තුළින් සිදු කෙරේ.

එසේම වාරි ජල කළමනාකරණය, ආයතනික සංවර්ධනය මගින් වාරි පද්ධති නඩත්තුව, කළමනාකරණය හා වැඩි දියුණු කිරීම ද කෘෂිකාර්මික සංවර්ධනය යටතේ බීජ නිෂ්පාදනය ගොවිපල සංවර්ධනය, පුහුණු හා ආදර්ශ කටයුතු ද පශු සම්පත්, ධීවර හා පරිසර සංරක්ෂණ කටයුතු ව්‍යාප්ති සංවර්ධනය කුඩා හා මධ්‍ය පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාවට නැංවීම, වාණිජ කෘෂි ව්‍යාපාර මෙහෙයවීම, කෘෂි කර්මාන්ත හා සම්බන්ධ ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාවට නැංවීමද කලාපීය පරිපාලනය යටතේ සිදු කෙරේ.

මහවැලි කලාප - සිතියම





බී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම


මහවැලි බී කලාපය මාදුරු ඔය ජලාශය යටතේ පහළ නිම්නයේ මුළු දළ බිම් ප්‍රමාණය හෙක්. 75,441.5 ක පැතිරී පවතින අතර පොළොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්ක යටතට ගැනෙන විශාලතම ව්‍යාපෘතිය ලෙස හැඳින්විය හැකිය. වාරිමාර්ග කළමනාකරණ අභිප්‍රාය පෙරදැරිව ව්‍යාපෘති ප්‍රදේශය පරිපාලන කොට්ඨාස 08 ට බෙදා ඇත.

මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ විශාලතම මහවැලි කලාපය වන්නේ මහවැලි බී කලාපයයි. ඒය හෙක්. 94225 න් සමන්විත වේ. මහවැලි බී කලාපය 1982 – 1983 යන කාල පරාසය තුල ආරම්භ වූ මහවැලි සංවර්ධන කලාපයකි. මෙම කලාපය කොට්ඨාස 08 කින් සමන්විත වන අතර ඒකක 48 න් යුක්ත වේ. ප්‍රධාන වැවිලි බෝගය වී වන අතර අනෙකුත් බෝග වගාවන්ද සුළු වශයෙන් සිදු කරයි. ප්‍රධාන වශයෙන් විශාලතම ජලාශය මාදුරුඔය ජලාශය වන අතර එහි මුළු ධාරිතාවය 596.6 MCM වේ. මීට අමතරව කුඩා ප්‍රමාණයේ වැව් 74 ක් පවති. මහවැලි බී කලාපය වම් ඉවුර සහ දකුණු ඉවුර යන කොටස් දෙකකින් සමන්විත වන අතර පොළොන්නරුව හා මඩකලපුව යන දිස්ත්‍රික්ක වලට අදාළව පිහිටා ඇත. වැලික්නද,දිඹුලාගල ,කෝරළයිපත්තු උතුර වාකරයි යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුනකින් මෙම කලාපය ආවරණය වේ. මහවැලි බී කලාපය1979 .06.15 දිනැති ගැසට් පත්‍රයට අනුව ප්‍රකාශයට පත් කරන ලද අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුළ විශේෂ බල ප්‍රදේශයක් වේ.

මහවැලි මහ සැලැස්මට අනුව ඉදිකරන ලද මාදුරුඔය ජලාශය බී කලාපයේ ප්‍රධාන ජල මූලාශ්‍රයයි. මාදුරුඔය ප්‍රධාන ඇල කි.මී 52.887 ක් වේ. තවද පිඹුරත්තැව ජලාශයද බී කලාපයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ඇළ ද කි.මී. 22 ක් වේ. තවද කි.මී. 77.605 ක අතු ඇළවල් පිහිටා ඇත. ඒමෙන්ම බෙදුම් ඇල කි.මී.474.137 ක් වේ. තවද කලාපයේ කෙත් ඇළ කි.මී. 1117.78 වන අතර දැනට වම් ඉවුර මහවැලි මාදුරුඔය ජලාශය යටතේ සංවර්ධනය කර ජනපද ඇති කර මහවැලි කොට්ඨාස කාර්යාල අටකින් යුක්ත වන අතර පරිපාලනය ඉඩම්, කෘෂිකර්ම , වාරිමාර්ග , සමාජ සංවර්ධන , තාක්ෂණ යනාදි අංශයන් විසින් සිදු කරනු ලැබේ.

DL2 කෘෂි දේශගුණික කලාපයට අයත් බී කලාපයේ වාර්ෂික වර්ෂාපතනය මී. මී 1100 - 1800 අතර වේ.සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් 31 වේ. ප්‍රධාන පාංශු කාණ්ඩය චුර්ණමය නොවූ දුඹුරු පසය. කලාපීය සංවර්ධන කටයුතු අංශ කිහිපයක් මගින් ක්‍රියාත්මක වන අතර වර්ෂයේ අත්කරගත් ප්‍රගතිය පහත සටහන මගින් දක්වා ඇත.

අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල (රු. මී.)	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස **(%)**
		(රු.මිලියන)	**(රු.මිලියන)**	
1	තාක්ෂණ සේවා අංශය	82.60	79.25	96%
2	ඉඩම් අංශය	19.90	19.82	100%
3	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	0.66	0.64	98%
4	ආයතන සංවර්ධන අංශය	53.92	53.22	99%
5	ව්‍යාපාර සංවර්ධන අංශය	6.55	6.38	97%
6	සංස්කෘතික හා ක්‍රීඩා අංශය	1.00	0.99	99%
7	වන හා පරිසර අංශය	6.23	6.23	100%
අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල (රු. මී.)	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස **(%)**
		(රු.මිලියන)	**(රු.මිලියන)**	
8	පාලන අංශය	8.65	8.39	97%
9	ප්‍රවාහන අංශය	11.71	11.71	100%
10	කෘෂිකර්ම අංශය (ආයතනික ප්‍රාග්ධනය)	40.71	37.51	92%
11	පශු සම්පත් (ආයතනික ප්‍රාග්ධනය)	18.44	17.59	95%
	එකතුව	**250.37**	**241.75**	**97%**
1	කෘෂිකර්ම අංශය (ව්‍යාපෘති)	50.00	50.00	100%
2	පශු සම්පත් අංශය (ව්‍යාපෘති)	51.00	50.99	100%
	එකතුව	**101.00**	**100.99**	**100%**
	MCP(ව්‍යාපෘති)	**217.00**	**194.00**	**89%**
	මුළු එකතුව	**568.37**	**536.73**	**94%**



සී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම


මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ නව සංවර්ධන කලාපයක් ලෙස ආරම්භ වූ " සී" කලාපය බස්නාහිරින් මහවැලි ගඟෙන් ද, නැගෙනහිරින් උල්හිටිය ජලාශ රක්ෂිතය හා මාදුරුඔය වනෝද්‍යානයෙන්ද, උතුරින් මහවැලි බී කලාපයද, දකුණින් මහියංගන ප්‍රදේශය ද මායිම්ව බදුල්ල, අම්පාර හා පොලොන්නරුව යන පරිපාලන දිස්ත්‍රික්ක 03 ට අයත්ව පිහිටා පිහිටා ඇති අතර කොට්ඨාශ කාර්යාල**7ක** ක්‍රියාත්මක (ගිරාදුරුකෝට්ටේ, සදුන්පුර,සිරිපුර,මහවනාවේල, නුවරගල, වෙහෙරගල, නවමැදගම) වන ඒකක **31** කින් යුක්ත වේ. මෙම කලාපයෙහි දළ භූමි ප්‍රමාණය හෙක්. 30,760 කි. මහවැලි සී කලාපය දෙහිඅත්තකණ්ඩිය ප්‍රධාන නගරය කර ගනිමින් වේගයෙන් සංවර්ධනය වන කෘෂිකාර්මික කලාපයකි. මෙහි ප්‍රධාන කෘෂිකාර්මික භෝගය වී වන අතර දේශීය නිෂ්පාදනයට දායකත්වය 4%කි. ජානපදිකයින් පදිංචි කර ඔවුන්ට වගාකිරීමට අවශ්‍ය ඉඩම් ලබාදීම,පානීය හා ගෘහස්ථ ජලය ලබාදීම, විදුලිය ඇතුලු අනෙකුත් යටතල පහසුකම් ලබාදීමේ කටයුතු වේගයෙන් ක්‍රියාත්මක වූ කලාපයකි. මෙම කලාපයේ ගොවිබිම් සඳහා අවශ්‍ය වාරි ජලය මහවැලි අධිකාරිය මගින් සිදුකරනු ලබන අතර කාර්යක්ෂම ජල කළමණාකරනය කෘෂිකාර්මික නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින් ඉඩම් කාර්යක්ෂමතාව 100% වැනි ඉහළඅගයක් ගනී. මහවැලි තාරුණ්‍ය ප්‍රමුඛ කරගත් වගා ළිං ආශ්‍රිතව පළතුරු වගාව, ආරක්ෂිත ගෘහ තුළ වගාව, විසිතුරු මත්ස්‍ය වගාව, කලාපයේ ප්‍රමුඛ තැනක් ගනී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිගැන්වීම තුළින් විශාල කාර්යයක් ඉටුකරන මෙම කලාපය ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා විශේෂ පරිසර සංරක්ෂණ ව්‍යාපෘති දියත් කර ඇත. කලාපයේ ජනතාව මුලික කරගත් පරිපාලන රටාව අධිකාරියේ කටයුතු ජනතාවට වඩාත් සමීප කර ඇත.

අනු අංකය	කොට්ඨාශය	ඒකක සංඛ්‍යාව	
1	ගිරාදුරුකෝට්ටේ	7	**ගිරාදුරුකෝට්ටේ , රොටලවෙල, මිල්ලත්තෑව , ගල්පෝරුයාය,හොබරියාව, ගින්නොරුව,උල්හිටිය**
2	මැදගම	3	**දියවිද්දාගම, නවමැදගම, හෙනානිගල**
3	සදුන්පුර	6	**ළිහිණියාගම, මුවගම්මන, සඳමඩුල්ල, ලත්පදුර, බක්මීදෙණිය,සදුන්පුර**
4	සිරිපුර	4	**පලුදෙණිය,මුදුන්ගම,පරගස්වැව,චන්දනගම**
5	නුවරගල	3	**නුවරගල, පල්ලේගම, පිහිටිවැව,**
6	වෙහෙරගල	5	**කපුවත්ත,වෙහෙරගල,වීරලන්ද,උල්පත්වැව,මල්දෙණිය**
7	මහවනාවෙල	3	**මහවනාවෙල ,සූරියපොකුණ ,කුඩාගල**
එකතුව		**31**	

කලාපයේ මූලික තොරතුරු:

- කෘෂි දේශගුණික කලාප - $DL_1/DL_2/IL_2$
- වගා කරන බිම් ප්‍රමාණය හෙක්. - 22,406
- සංවර්ධනය කරන ලද ගෙවතු - 35,640
- කලාපයේ ජනගහනය - 185,356
- වගා කරන ප්‍රධාන බෝගය - වී
- සංවර්ධනය කරන ලද ගෙවතු - 35,640
- කලාපයේ ජනගහනය - 185,356

අනු අංකය	අංශය	මූල්‍ය ප්‍රතිපාදන **2021** **(රු.මී)**	මූල්‍ය ප්‍රගතිය **2021.12.31** **(රු.මී)**	මූල්‍ය ප්‍රගතිය **%**	භෞතික ප්‍රගතිය **%**
1	තාක්ෂණසේවා අංශය	130.51	130.52	100%	100%
2	ඉඩම් අංශය	20.00	20.00	100%	100%
3	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	2.11	2.11	100%	75%
4	ආයතන සංවර්ධන අංශය	27.37	27.36	100%	100%
5	සංස්කෘතික අංශය	0.48	0.47	98%	100%
6	ව්‍යාපාර සංවර්ධන අංශය	4.38	4.38	100%	100%
7	වන හා පරිසර අංශය	3.45	3.46	100%	100%
8	පාලන අංශය	5.60	5.60	100%	100%
9	ප්‍රවාහන අංශය	8.05	8.05	100%	100%
10	කෘෂිකර්ම අංශය	82.00	82.00	100%	100%
11	සත්ත්ව පාලන අංශය	14.99	14.99	100%	100%
	උප එකතුව - ආයතනික ප්‍රාග්ධනය	**298.94**	**298.94**	**100%**	**98%**
12	සත්ත්ව පාලන අංශය	21.34	21.34	100%	100%
	උප එකතුව - ව්‍යාපෘති	21.34	21.34	100%	100%
	එකතුව	**320.28**	**320.28**	**100%**	**98%**



ඩී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කල මැදිරිගිරිය ප්‍රදේශයේ 2004 වර්ෂයේ ස්ථාපිත කර ඇති මහවැලි ඩී කලාපය කොට්ඨාශ 03 කින් යුක්ත වේ. ඒ බිසෝපුර, සූරියපුර හා මීගස්වැව වේ. බිසෝපුර කොට්ඨාශය මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලැබූ පළමු ජනපද පුරවරයයි. බිසෝපුර කොට්ඨාශය ඒකක 04 කින් (දහම්වැව,බණ්ඩාර වැව, බිසෝපුර,නබඩවැව) හා සූරියපුර කොට්ඨාශය ඒකක 02කින් (සමඟිපුර ,සූරියපුර) මීගස්වැව කොට්ඨාශය ඒකක 04කින් (මීගස්වැව, දම්සෝපුර, ජයගම්පුර, දියසෙන්පුර)සමන්විත වේ.

උතුරින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රදේශය දක්වාත්, නැගෙනහිරින් සේරුවිල ප්‍රදේශය දක්වාත්, දකුණින් හා බටහිරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර, හිඟුරක්ගොඩ ප්‍රදේශය දක්වාත් විහිදි පවතී.

විශේෂ ව්‍යාපෘති

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ,ඩී කලාපය ,මැදිරිගිරිය නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය යටතේ පාලනය වන විවිධ අංශ එකොළහක්)11(පවතී. එනම් තාක්ෂණ සේවා අංශය ,කෘෂිකර්ම සංවර්ධන අංශය ,ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය ,ආයතන සංවර්ධන අංශය ,සංස්කෘතික හා ක්‍රීඩා අංශය ,ඉඩම් අංශය ,පරිසර හා වන සංරක්ෂණ අංශය ,ව්‍යාපාර සංවර්ධන අංශය ,ප්‍රවාහන අංශය, ගිණුම් අංශය සහ පාලන අංශය වශයෙන් කලාපයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය දෙමින් කටයුතු කරනු ලබයි .






තාක්ෂණ සේවා අංශය මඟින් කලාපයට අදාළ සියලුම ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය ලබා දී ඇත. මැදිරිගිරිය නව සංවර්ධන කලාපයේ ඉදිකිරීම් කටයුතු සඳහා මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් 2021 වර්ෂයේ තාක්ෂණ අංශයේ සියලු ප්‍රාග්ධන අරමුදල් බිසෝපුර, සූරියපුර සහ මීගස්වැව කොට්ඨාශයට අයත් ගම්මාන වල ජීවත් වන ගොවි ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීමේ කටයුතු සඳහා යොදවා ඇත .විශේෂයෙන් මාර්ග පද්ධති වැඩි දියුණු කිරීම ,වාරි පද්ධතිය වැඩි දියුණු කිරීම ,ක්‍රීඩාපිටි වැඩි දියුණු කිරීම ආදි කාර්යයන් සඳහා එම ප්‍රතිපාදන වෙන් කර ඇත .

කෘෂිකාර්මික අංශය මඟින් සියලු ග්‍රාම සේවා වසම් ආවරණය වන පරිදි ගොවි ජනතාවගේ සියලු කෘෂිකාර්මික අවශ්‍යතා පිළිබඳ අවධානය යොමුකර ඇත .විශේෂයෙන් ගොවීන්ගේ පුහුණු කටයුතු ,බීජ අවශ්‍යතා ,විවිධ පැල වර්ග

ලබා දීම සහ තාක්ෂණික දැනුම ගොවීන් වෙත ලබා දෙමින් ගොවි ජනතාවගේ ජීවන තත්වය උසස් කර දිම සඳහා දැඩි කැපවීමක් සිදුකරනු ලබයි .තවද කාර්යාලය තුළ ඇති ගොවිපලෙහි කාබනික පොහොර භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන පළතුරු සහ එළවළු නිෂ්පාදන කටයුතු මෙන්ම සත්ව පාලනය තුළින් ද ආදායම් උපයාගනී ,එසේම පැළ තවානෙහි නිෂ්පාදනය කරනු ලබන පැල වර්ග ගොවීන් වෙත සහනදායී මිළකට ලබාදීමට සිදුකරනු ලබයි .එසේම මී මැසි පාලනය වැනි ගොවීන්ට ආදායම් උත්පාදනය කරගත හැකි අංශ කෙරෙහිද කෘෂිකර්ම අංශය විසින් අවධානය යොමුකර ඇත .මේ වන විට කලාපයේ මේ සම්බන්ධයෙන් විශාල ආදායම් ලබන ගොවීන් සිටින අතර ,ආදර්ශන වශයෙන් වෙනත් කලාප වල ගොවි ජනතාවට අධ්‍යයනය කිරීමේ හැකියාවද පවති .









ධීවර හා පශු සම්පත් අංශය මඟින්ද සියලු ග්‍රාමසේවා වසම් ආවරණය වන පරිදි ධීවර සහ පශු සම්පත් සංවර්ධන කටයුතු සඳහා සේවය ලබාදීමට කටයුතු කරනු ලබයි .විශේෂයෙන් කිරි ගව පාලනය ,කුකුල් පාලනය ,එළු පාලනය , මිරිදිය මත්ස්‍ය සහ විසිතුරු මත්ස්‍ය වගාවන් පිළිබඳ පුළුල් දැනුමක් ආයතනය වෙතින් ඒ ආශ්‍රිත කටයුතු වල නියැලී සිටින ගොවි ජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලබයි .කාර්යාලයේ ගොවිපල භූමිය ආසන්නයේ දැනට සකස් කරමින් පවතින මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය මඟින් පුහුණු වැඩසටහන් පැවැත්වීමටත් ගොවීන් වෙත අවශ්‍ය මත්ස්‍ය පැටවුන්)ඇසිත්තන් ,ඇඟිල්ලන් (නිෂ්පාදනය කරමින් ගොවීන් වෙත සහනදායී මිළට ලබා දීමටත් එමඟින් ඉදිරියේදී කටයුතු සිදුවනු ඇත .එසේම ධීවර සහ පශු සම්පත් කටයුතු වලට අදාල පුහුණු වැඩසටහන් , පුහුණුවෙන් පසු අවශ්‍ය උපකරණ ලබාදීම වැනි වැඩසටහන් විශාල ප්‍රමාණයක් මේ වන විට පවත්වා සාර්ථක ගොවි කණ්ඩායමක් කලාපය තුළ බිහිකිරීමට මෙම අංශයට හැකියාව ලැබී ඇත .

ජානපදිකයින් සහ මහවැලි අධිකාරිය අතර වඩාත් යහපත් සම්බන්ධතාවයක් ඇති කරලීමට හැකියාව ඇති අංශය වන්නේ ආයතන සංවර්ධන අංශයයි .මෙම අංශය මඟින් බොහෝ අවශ්‍යතා ඉටුකරනු ලබයි .මැදිරිගිරිය ඩී කලාපය විසින්ද කලාපයේ ජනපදිකයින් වෙත බෙහෝ වැඩසටහන් සම්පාදනය කර ඇත .මෙම අංශය මඟින් සිදුකරනු ලබන වැටසටහන් යටතේ,

- ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සහ අලුතෙන් ගොවි සංවිධාන ඇතිකිරීම.
- විවිධ ජානපදික පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කාන්තා සහ තරුණ සංවර්ධන වැඩසටහන්.
- ප්‍රජා සංවර්ධන වැඩසටහන්.
- සංස්කෘතික වැඩසටහන් සහ මහවැලි ක්‍රීඩා වැනි වැඩසටහන්


එමෙන්ම කලාපීය ඉඩම් අංශය මගින් ඉඩම් පරිපාලනය සිදුකිරිමත් ඉඩම් සංවර්ධනය සිදුකිරිමත් එහි උරුමය ජනපදිකයින් වෙත ලබාදීමත් සිදුකෙරේ. කලාපීය පරිසර අංශය මගින් පරිසර සංරක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු

සිදුකරමින් ඉෙව විවිධත්ය තිරකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහාත් සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහාත් ව්‍යාපාර සංවර්ධන අංශය මගින් කටයුතු සිදුකර ඇති කාර්යභාරය ඉහළ අගයක් ගනී.






අනු අංකය	අංශය	2021 සඳහා මූල්‍ය වෙන් කිරීම් රු.මි.	මූල්‍ය ප්‍රගතිය 2021.12.31 (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
01.	තාක්ෂණ සේවා අංශය	31.07	24.20	78%	100%
02.	ආයතන සංවර්ධන අංශය	40.97	40.97	100%	100%
03.	ඉඩම් අංශය	19.50	19.40	100%	100%
04.	ව්‍යාපාර සංවර්ධන අංශය	2.85	2.74	96%	100%
05.	පරිසර අංශය	2.80	2.72	97%	100%
06.	මහවැලි කේන්ද්‍රය	0.58	0.58	96%	100%
07.	කෘෂිකර්ම අංශය	25.19	23.48	93%	95%
08.	ධීවර සහ පශු සම්පත් සංවර්ධන අංශය	12.45	10.50	84%	95%
09.	ප්‍රවාහන අංශය	1.4	1.40	100%	100%
10.	පාලන අංශය	2.00	2.00	100%	100%
	උප එකතුව - ආයතනික ප්‍රාග්ධනය	**142.71**	**131.89**	92%	**95%**
	ව්‍යාපෘතිය මඟින්වෙන් කිරීම්				
11.	ධීවර සහ පශු සම්පත් සංවර්ධන අංශය	17.9	17.00	95%	95%
	උප එකතුව - ව්‍යාපෘතිය	**17.90**	**17.00**	95%	**95%**
	එකතුව	**160.61**	**148.89**	93%	**90%**



ඊ කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත අනුව මහවැලි අධිකාරිය පිහිටුවීමෙන් පසුව වියළි කලාපය සංවර්ධනය කිරීමේ අරමුණ පාදක කරගෙන කොත්මලේ ජලාශය, වික්ටෝරියා ජලශය, රන්දෙණිගල ජලාශය හා රංටැඹේ ජලාශය කටයුතු ආරම්භ කර ඇත. එහිදි සංවර්ධන ප්‍රේරිත අවතැන්වුවන් නැවත පදිංචි කිරීම සඳහා හා ජලාශ ඉදිකිරීමට අත්පත් කරගත් ඉඩම් කටයුතු විදිමත් කිරීම සඳහා වික්ටෝරියා විශේෂ කලාපය ආරම්භ කරන ලදි. එසේම 2019 වර්ෂයේ දි අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් මිණිපේ හා විල්ගමුව ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ මහවැලි “E”, කලාපය ලෙස නම් කර ඇත. ඒ අනුව වර්තමානයේ කොත්මලේ, වික්ටෝරියා විශේෂ බල ප්‍රදේශයත්, මිණිපේ සහ විල්ගමුව කොටියාගද ඇතුලුව සමස්තය මහවැලි ඊ කලාපය ලෙස එකම නේවාසික ව්‍යාපාර කළමණාකාරවරයකු යටතේ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් ප්‍රදේශයක් වන කොත්මලේ හා මහවැලි ගග හරස් කොට ඉදිකර ඇති මිණිපේ අමුණ ඇතුළු වාරි නිර්මිත රැසක් මෙන්ම මහවැලි අධිකාරියේ හදවත බදු කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල, රංටැඹේ හා පොල්ගොල්ල ජලාශ ත් මෙම කලාපයට අයත් වේ.


“E”, කලාපයට අයත් වන පරිපාලන දිස්ත්‍රික්ක මාතලේ, මහනුවර, නුවරඑළිය දිස්ත්‍රික්ක නම් කල හැකි අතර, ඉඩම් පරිපාලන කටයුතු මහවැලි අධිකාරිය විසින් අත්පත් කරගත් ප්‍රදේශවල පමනක් එනම් වික්ටෝරියා කොත්මලේ ප්‍රදේශවල පමනක් සිදු කරණු ලැබේ.

කොත්මලේ වික්ටෝරියා ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අහිමි වූ අයවළුන්ගේ පවුල් 3500 ක් කොත්මලේ කලාපයේ පදිංචි කර ඇති අතර, වික්ටෝරියා රන්දෙණිගල ජලාශ ඉදිකිරීම වෙනුවෙන් ඉඩම් අහිමි වූ පවුල් 500 ක් ද මෙම කලාපය තුල නැවත පදිංචි කර ඇත.

මීට අමතරව ජලාශ ව්‍යාපෘතින් නිසා ඉවත් කරන ලද නගර වෙනුවෙන් තිස්පනේ, කොත්මලේ, අධිකාරිගම, ගුරුදෙණිය, කුණ්ඩසාලේ, දිගන, තෙල්දෙණිය නව නගර නිර්මාණය කොට ඇත. කටුගස්තොට පුළුල් කර සංවර්ධනය කරන ලද කොටස්ද මෙම කලාපයට අයත් වේ.

2021 වර්ෂයේ ක්‍රියාත්මක සැලසුමට අනුව වික්ටෝරියා කොත්මලේ ප්‍රදේශ තුල ඉඩම් රාජකාරි හා තෝරා ගත් සංවර්ධන වැඩ සටහන් සඳහා පමණක් විවෘතව ඇති අතර, මිණිපේ හා විල්ගමුව යන කොටියාගවල සංවර්ධන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දි තිබුණි. එසේම මිණිපේ වනජීවී දෙපාර්තමේන්තුවට අයත් වසම් 18 ක් නැවත ගැසට් කර ගැනීම සඳහා මේවන විට පාරිසරික ඇගයීම් වාර්තාවක් සැලසුම් වෙමින් පවති. පහත අංශ යටතේ මෙම කලාපයේ කටයුතු සිදු වේ.

අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල **(රු. මී.)**	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස **(%)**
		(රු.මිලියන)	**(රු.මිලියන)**	
1	තාක්ෂණ සේවා අංශය	56.27	56.27	100%
2	ඉඩම් අංශය	20.07	20.07	100%
3	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	0.13	0.01	10%
4	ආයතන සංවර්ධන අංශය	10.29	10.29	100%
5	ව්‍යාපාර සංවර්ධන අංශය	2.60	2.60	100%
6	සංස්කෘතික හා මාධ්‍ය අංශය	0.01	0.01	100%
7	වන හා පරිසර අංශය	1.00	1.00	100%
8	පාලන අංශය	2.15	2.15	100%
9	ප්‍රවාහන අංශය	5.00	5.00	100%
10	කෘෂිකර්ම අංශය (ආයතනික ප්‍රාග්ධනය)	10.00	10.00	100%
11	පශු සම්පත් අංශය (ආයතනික ප්‍රාග්ධනය)	6.99	6.99	100%
	මුළු එකතුව (ආයතනික ප්‍රාග්ධනය)	**114.51**	**114.39**	100%
1	පශු සම්පත් (ව්‍යාපෘති)	6.85	6.00	88%
	එකතුව (ව්‍යාපෘති)	**6.85**	**6.00**	88%
	මුළු එකතුව	**121.36**	**120.39**	99%



ජී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

මහවැලි මහ සැලැස්ම යටතේ ඉදිකරන ලද පළමු වේල්ල වන පොල්ගොල්ල ජල බෙදාහැරීමේ පද්ධතිය ජල මාර්ග දෙකක් හරහා ජලය මුදා හරිනු ලැබේ. බෝවතැන්න ජලාශය අබන් ගඟේ සිට පරාක්‍රම සමුද්‍රයටත්, ඇලහැර ඇල හරහා ගිරිතලේ, මින්නේරිය, කවුඩුල්ල සහ කන්තලේ ජලාශ වෙත මුදා හරිනු ලැබේ.

1982 සිට 1999 දක්වා "ජී" කලාපය මහවැලි "බී" කලාපයේ කොට්ඨාස කාර්යාලයක් ලෙස පවත්වගෙන යනු ලැබීය. පසුව එය 1999 දී "ජී" කලාපය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ආරම්භයේ දී මහවැලි ජී කලාපය බකමූණ සහ අත්තනකඩවල යන කොට්ඨාස දෙකකින් යුක්ත විය.

මහවැලි මහ සැලැසමේ අවසාන ජලාශ ව්‍යාපෘතිය වන්නේ මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියයි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමඟ ලග්ගල පල්ලේගම සහ නාඋල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ වල ග්‍රාම නිලධාරී කොට්ඨාස 24 කට බලපෑවේය. එහෙයින් මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියෙන් තම මුල් ගම් ප්‍රදේශ වලින් ඉවත්වූ ජනතාව කළුගඟ වම් ඉවුරේ සහ කළුගඟ දකුණු ඉවුරේ නැවත පදිංචි කරන ලදී.

ඒ අනුව, "ජී" කලාපයට හෙක්ටයාර් 4,524ක් ඒකාබද්ධ කරමින් මොරගහකන්ද කලාපය ලෙස ප්‍රකාශයට පත් කෙරුණි. 2010 වර්ෂයේ දී කළුගඟ වම් ඉවුර ප්‍රදේශයේ පරිපාලන කටයුතු සඳහා වැල්ලෙවෙල සහ කළුගඟ දකුණු ඉවුර ප්‍රදේශයේ පරිපාලනය සඳහා ගුරුවෙල යන කොට්ඨාස 2012 වර්ශයේ දී පිහිටුවන ලදී.


මොරගහකන්ද කලාපය හෙක්ටයාර් 15,058.41 කට වඩා විහිදී යන අතර මොරගහකන්ද කලාපයට උතුරින් දියබෙදුම - කටුකැලියාවත්, නැගෙනහිරින් කළුගඟ - වස්ගමුවත්, දකුණින් නකල්ස් කඳු වැටියත් බටහිරින් ගිරිතලේ - මින්නේරිය ස්වභාවික රක්ෂිතයක් පිහිටා ඇත. මොරගහකන්ද කලාපය උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයට සහ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයට අයත්වේ.

- කලාපයට අයත් දිස්ත්‍රික්ක - පොළොන්නරුව සහ මාතලේ
- මුළු බිම් ප්‍රමාණය - හෙක්. 30,889
- සංවර්ධිත බිම් ප්‍රමාණය - හෙක්. 19,670
- කොට්ඨාශ - 04
- ඒකක කාර්යාල - 17
- පවුල් සංඛ්‍යාව - 13,462
- ජනගහනය - 55,885

කාර්යය භාරය

- වාරි පද්ධතියේ හිමිකම පැවරීම තුළින් පද්ධතියේ ආරක්ෂාව, සංරක්ෂණය, මෙහෙයුම හා නඩත්තුව ප්‍රශස්ථ ලෙස පවත්වාගෙන යනු ලබන, සීමිත ජලය මනාව කළමනාකරණය කිරීමෙන් ජල ඵලදායිතාවය ඉහළ නැංවීමට ක්‍රියාකරන ප්‍රජා මූල නෛතික සංවිධානයක් බවට ගොවි සංවිධාන රැගෙන යාම හා ඒ සඳහා ක්‍රියා කිරීම.
- කෘෂි නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා අවශ්‍ය නිෂ්පාදන යෙදවුම් සම්පාදනය කරන, නවීන කෘෂි තාක්ෂණය කෘෂි නිෂ්පාදකයින් වෙත රැගෙන යන පරිසර හිතකාමී ගොවි ප්‍රජාවගේ සංවිධානය බවට ගොවි සංවිධාන පත් කිරීම හා ඒ සඳහා ක්‍රියා කිරීම.
- දේශීය හා විදේශීය වෙළඳපළ අවශ්‍යතාවයන් අනුව තම නිෂ්පාදන හසුරුවන, අගය එකතු කරමින් ලාභ උපරිම කළහැකි නව කෘෂි නිෂ්පාදන නිමි භාණ්ඩ ලෙස හඳුන්වා දෙන, ව්‍යාපාරික අරමුණු ඔස්සේ ගමන් කරන කෘෂි ව්‍යවසායකයින්ගේ බිම් මට්මමේ උසස්ම ආර්ථික ඒකකය බවට ගොවි සංවිධාන පත් කිරීම හා ඒ සඳහා ක්‍රියා කිරීම.
- කෘෂි නිෂ්පාදන ඇසුරුම්කරණය, ගබඩාකරණය, විවිධ අලෙවි දාමයන් හා එක්ව ඉහළ මිලක් සඳහා තරඟ කළ හැකි අලෙවි ප්‍රවර්ධකයෙකු බවට ගොවි සංවිධාන රැගෙන යාම හා ඒ සඳහා ක්‍රියා කිරීම.
- අපේකම සුරකින ඇලට වේල්ලට වැවට ජලයට ආදරය කරන වාරි විනයක් සහිත අයිතිවාසිකම්වලට මෙන්ම යුතුකම්වලටද ප්‍රමුඛතාවය දෙන දැනුමෙන් ගුණයෙන් හා කෘතවේදී බවින් පිරිපුන් මාතෘ භූමියට ආදරය කරන ගොවි ප්‍රජාවක් නිර්මාණය කරන බිම් මට්ටමේ ඇති සංවිධානය බවට ගොවි සංවිධාන පත් කිරීම හා ඒ සඳහා ක්‍රියා කිරීම.
- පාරම්පරික අපේ සංස්කෘතික උරුමයන් ආරක්ෂාකරන සමාජ සාරධර්ම හා හරපද්ධතීන් රකින හා පවත්වාගෙන යන බොදු පිළිවෙත් අනුව ක්‍රියා කරන සංවර වූ නිවුනු සමාජයක් නිර්මාණය කිරීමට කැපවූ සංවිධානයක් බවට ගොවි සංවිධාන පත් කිරීම හා ඒ සඳහා ක්‍රියා කිරීම.
- ජය පරාජය එකසේ දරාගත හැකි ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් යුත් ජව සම්පන්න තරුණ තරුණියන් පිරිසක් ක්‍රීඩා ඔස්සේ ජාතික හා ජාත්‍යන්තර තලයට රැගෙන යාම හා ඒ සඳහා ක්‍රියා කිරීම.

අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල (රු. මී.)	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)
		(රු.මිලියන)	**(රු.මිලියන)**	
1	තාක්ෂණ සේවා අංශය	29.20	29.20	100%
2	ඉඩම් අංශය	15.80	15.80	100%
3	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	10.00	10.00	100%
4	ආයතන සංවර්ධන අංශය	26.50	26.50	100%
5	ව්‍යාපාර සංවර්ධන	5.50	5.50	100%
6	සංස්කෘතික හා මාධ්‍ය අංශය	0.50	0.50	100%
7	වන හා පරිසර අංශය	5.00	5.00	100%
8	පාලන අංශය	10.13	10.10	100%
9	ප්‍රවාහන අංශය	6.00	6.00	100%
10	කෘෂිකර්ම අංශය (ආයතනික ප්‍රාග්ධනය)	24.93	24.63	99%
11	පශු සම්පත් අංශය (ආයතනික ප්‍රාග්ධනය)	8.99	8.99	100%
	මුළු එකතුව (ආයතනික ප්‍රාග්ධනය)	**142.55**	**142.22**	**100%**
1	කෘෂිකර්ම (ව්‍යාපෘති)	50.00	48.70	97%
2	පශු සම්පත් (ව්‍යාපෘති)	10.10	10.10	100%
	මුළු එකතුව	**202.65**	**201.02**	**99%**



එච් කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

කලා වැව කේන්ද්‍ර කොටගෙන 1977 - 1978 කාලයේ පවුල් 31500 කට මඩින් අක්කර 2½(හෙක්. 01)ද, ගොඩින් අක්කර ½ බෙදා දෙන ලද මහවැලි යෝජනා ක්‍රමයේ සුවිශේෂී කලාපය මහවැලි "එච්" කලාපයයි. මෙහි කෘෂි බිම් අක්කර ලක්ෂයක් (වාරි හා ගොඩ) පමණ පවතී. **මහවැලි යෝජනා ක්‍රමයේ සමාරම්භක ජනාවාස කලාපයවන මෙහි** නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන වශයෙන් අංශ අටක් ,එනම් .පවතී (08) ,කෘෂිකර්ම සංවර්ධන අංශය ,තාක්ෂණ සේවා අංශය සංවර්ධන ,ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය ,අංශය පරිසර හා වන සංරක්ෂණ ,ඉඩම් අංශය ,අංශය ,ව්‍යාපාර සංවර්ධන අංශයගිණුම් අංශය සහ පාලන අංශය වශයෙන් කලාපයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය දෙමින් කටයුතු කරනු ලබයි කලාපයේ පිහිටීම සැලකීමේදි බටහිරින්, අනුරාධපුර - පුත්තලම් මහා මාර්ගයත් , උතුරින් දකුණු ඉවුරු ඇලත් දකුණින් , බලලු වැව ඉවුරු උස්ගල සියඹලන්ගමුව ඔස්සේ රාජාංගන ඉවුරු ඇලෙනුත් සීමාවී පවතින අතර අමතර වශයෙන් කාගම කටියාව හා උස්ගල සියඹලන්ගමුව වැනි පැරණි ජනපද ප්‍රදේශ වලින් සමන්විත වේ.

දිස්ත්‍රික්ක	**02**	**වැව් ගණන**	**127**
ග්‍රා.නි .කොට්ඨාස	**144**	**ගොවි සංවිධාන ප්‍රමාණය**	**225**
ගම්මාන	**576**	**කලාපයේ විශාලත්වය**	**57,225.49 ha**
ප්‍රා.ලේ .කාර්යාල	**10**	**පවුල් සංඛ්‍යාව**	**74,096**
කොට්ඨාස කාර්යාල	**07**	**ජනගහනය**	**229542**
ඒකක කළමණාකරණ කාර්යාල	**22**	**ලංකාවේ මුළු ජනගහනයෙන් H කලාපයේ නියෝජනය**	**%1**
සාමාන්‍ය උෂ්ණත්වය	**28C^0**	**අනුරාධපුර මුළු ජනගහනයෙන් H කලාපයේ නියෝජනය**	**%23**
සාමාන්‍ය වර්ෂාපතනය	**-900 1,100mm**	**වාරි ජල කළමණාකරණය කළ යුතු සම්පූර්ණ ඇල ප්‍රමාණයේ දිග**	**2,481 Km**
කෘෂි පාරිසරික කලාපය	**DL1b**		
ප්‍රධාන පස් කාණ්ඩය	**රතු දුඹුරු පස**		
ප්‍රධාන ජල ධාරිතාවය	**කලාවැව 100,000acft**		
හැරවුම් ජල මූලාශ්‍රය	**කොත්මලේ**		
කලාපයේ වාරි බිම් ප්‍රමාණය	**25,390 ha**		

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ,එච් කලාපය ,තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය ප්‍රධාන වශයෙන් අංශ අටක් (08) පවතී .එනම් ,තාක්ෂණ සේවා අංශය ,කෘෂිකර්ම සංවර්ධන අංශය ,ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය ,සංවර්ධන අංශය ,ඉඩම් අංශය ,පරිසර හා වන සංරක්ෂණ අංශය ,ව්‍යාපාර සංවර්ධන අංශය ,ගිණුම් අංශය සහ පාලන හා ප්‍රවාහන අංශය වශයෙන් කලාපයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය දෙමින් කටයුතු කරනු ලබයි .

රටේ ආහාර සුරක්ෂිතතාවය සඳහා රුකුලක් වීමට වාරි ඉඩම් හෙක්ටයාර් 25,390 ක භූමි ප්‍රමාණය යල මහ දෙකන්නයම හැකි උපරිම ලෙස ජාතික අවශ්‍යතාවයට ගැළපෙන ලෙස වගා කිරීමත් ගෙවතු භූමි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා කායීක්ෂමව යෙදවීම කෘෂි අංශය මගින් ප්‍රධාන වශයෙන්ම සිදුකරයි .

2021වර්ෂය සඳහා ව්‍යාපෘති වැය ශීර්ෂය යටතේ වාර්ෂික ප්‍රාග්ධන වෙන් කිරීම රුපියල් මිලියන 100.00 ක් වන අතර ,ව්‍යාපෘති වැය ශීර්ෂය යටතේ වාර්ෂික මූල්‍ය වෙන්කිරීම රු .මිලියන 70 කි .







2021 වර්ෂයේ එව් කලාපීය බෝග නිෂ්පාදන ප්‍රගතිය හා ජාතික නිෂ්පාදනයට මහවැලි එව් කලාපයේ දායකත්වය

	2021 යල කන්නය			2021/22 මහ කන්නය		
බෝගය	වගා ඉලක්කය (හෙක්)	වගා ඉලක්කය (හෙක්)	නිෂ්පාදනය (මෙ.ටොන්)	වගා ඉලක්කය (හෙක්)	වගා ඉලක්කය (හෙක්)	නිෂ්පාදනය (මෙ.ටොන්)
වී	10156	16910	87932	21755	11719	60938.8
බඩඉරිඟු	454	287.9	2303.2	564	64	512
කුරක්කන්	55	19.4	34.92	25	6	10.8
සෝයා	4500	2252	4504	254	21.6	43.2
මුං	250	186.5	242.45	32	5	6.5
උඳු	200	82.7	124.05	73	2	3
කව්පි	268	124	161.2	57	3	3.9
තල	35	49.1	34.37	7	1	0.7
රටකජු	250	91.1	182.2	0	0	0
ලොකු ඵෑණු	250	206.7	5167.5	2	1.5	37.5
රතු ඵෑණු	0	1.5	22.5	0	0	0
මිරිස්	125	102.2	1022	107	18	180
පළතුරු	1769	1536.5	15365	1479	1376.6	13766
එළවළු	1412	1380.3	20704.5	881	328.5	4927.5
අල බෝග	166	102.3	1023	121	207	2070
වෙනත් බෝග	258	287.7	2301.6	33	416.9	3335.2

ජාතික නිෂ්පාදනයට ප්‍රධාන බෝගයන්හි මහවැලි එව් කලාපීය දායකත්වය හා ඒ සඳහා සිදුකර ඇති ව්‍යාප්ති වැඩසටහන්202-1

වී වගාව ප්‍රවර්ධනය






යාය වැඩසටහන් ක් ඒකක 22මට්ටමින් ක්‍රියාත්මක කළ අතර.ඒ යටතේ පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි ,

අඅ.	වැඩසටහන	සංඛ්‍යාව	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	ඒකාබද්ධ පළිබෝධ පාලනය වැඩසටහන්	24	605
02	බෝග සායන	19	210
03	ක්ෂේත්‍ර දින වැඩසටහන්	7	295
04	පැරෂුට් තැටි ලබා දීම	50000	125
05	ගොවි පුහුණු වැඩසටහන්	28	827
06	අස්වනු සමීක්ෂණ	66	66
07	අස්වනු ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන්	32	976

අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල (රු. මී.)	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)
		(රු.මිලියන)	**(රු.මිලියන)**	
1	තාක්ෂණ සේවා අංශය	169.03	169.03	100%
l	ඉඩම් අංශය	26.10	26.10	100%
3	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	0.20	0.20	100%
4	ආයතන සංවර්ධන අංශය	56.65	56.65	100%
5	ව්‍යාපාර සංවර්ධන අංශය	8.00	8.00	100%
6	සංස්කෘතික හා මාධ්‍ය අංශය	1.35	1.35	100%
7	වන හා පරිසර අංශය	4.63	4.63	100%
8	පාලන අංශය	7.50	7.50	100%
9	ප්‍රවාහන අංශය	13.00	13.00	100%
10	කෘෂිකර්ම අංශය (ආයතනික ප්‍රාග්ධනය)	70.00	70.00	100%
11	පශු සම්පත් අංශය (ආයතනික ප්‍රාග්ධනය)	23.94	23.94	100%
	මුළු එකතුව (ආයතනික ප්‍රාග්ධනය)	**380.40**	**380.40**	**100%**
1	කෘෂිකර්ම (ව්‍යාපෘති)	100.00	100.00	100%
2	පශු සම්පත් (ව්‍යාපෘති)	31.41	31.41	100%
	එකතුව (ව්‍යාපෘති)	**131.41**	**131.41**	100%
	මුළු එකතුව	**511.81**	**511.81**	100%




එල් කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

1984 වර්ෂයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ජනාවාසකරණ කටයුතු ආරම්භ කර ඇති මෙම ප්‍රදේශය 1988 වර්ෂයේදී 562 දරණ ගැසට් නිවේදනය මගින් මහවැලි කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. හෙක්. 163,000 ක් වන වන අතර 2007 මාර්තු 09 අංක 1487/32 දරණ ගැසට් නිවේදනය මගින් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 199209 දක්වා පුළුල් කර ඇත.මෙහි හෙක්ටයාර් 16857 ක සංවර්ධන කටයුතු අවසන් කර ඇත. කොට්ඨාශ 03ක් තුළ ඒකක 16 ක් සථාපිත කර පවුල් 7711 ක් පදිංචි කර ඇත. කුඹුරු අක්කර 2359 ක වාරි ජලය සපයන කුඩා වැව් 24 ක් ඉදිකර ඇත. මෙම කලාපයේ භූමි ප්‍රදේශය උතුරටත්" මුලතිව් වව්නියා ප්‍රධාන මාර්ගයද" නැගෙනහිරින් මුලතිව් මුහුදු වෙරළ තීරයෙන්ද, දකුණින් පුල්මුඩේ කැබිතිගොල්ලෑව ප්‍රධාන මාර්ගයෙන්ද බස්නාහිරින් සිංහයා උල්පතහින්න ත්‍රිකෝණමිතික ස්ථානය ඔස්සේ මහහෙට්ටියාවහින්න කඳුවැටිය ඔස්සේ රේඛාව පුලියන්කුලිම වව්නියාව මාර්ගයෙන්ද සීමා වෙන ප්‍රදේශයක් පුරා විහිදි ඇත.

.

අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල (රු. මි.)	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)
		(රු.මිලියන)	**(රු.මිලියන)**	
1	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	1.00	0.34	34%
2	වන හා පරිසර අංශය	7.56	0.38	97%
3	කෘෂිකර්ම අංශය (ආයතනික ප්‍රාග්ධනය)	67.75	52.84	78%
4	පශු සම්පත් අංශය (ආයතනික ප්‍රාග්ධනය)	10.12	5.00	49%
	මුළු එකතුව (ආයතනික ප්‍රාග්ධනය)	**86.43**	**58.56**	**68%**
1	පශු සම්පත් (ව්‍යාපෘති)	13.75	5.38	39%
	මුළු එකතුව	**100.18**	**63.94**	**64%**



හුරුළුවැව කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1997-07-16 වන දිනැති අංක: 984/5 දරණ නිවේදනය මගින් හුරුළුපෝෂිත ඇලෙහි ජල කළමනාකරණය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරන ලද අතර 1998-05-09 වන දින හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය දඹුල්ල පැල්වෙහෙරෙහි ස්ථාපිත කරන ලදි.

ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව, පලාගල හා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට අයත් ග්‍රාම නිලධාරී වසම් 49 ක් ද, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල හා නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 32 ක් ද, ගල්කිරියාගම, මඩාටුගම, පළඟස්වැව, කළුන්දෑව හා සීගිරිය යන කොට්ඨාස පහට අයත් වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු.


පොල්ගොල්ලෙන් බෝවතැන්න වෙත හරවා එවන මහවැලි ජලය ලෙනදොර උමං පිටවුමේ සිට කි.මී.33 ක් දිගැති හුරුළුපෝෂිත ඇල සහ යාන් ඔය ඔස්සේ බාධාවකින් තොරව හුරුළුවැව වෙත ගෙන යාමට සැලැස්වීම.

හුරුළුපෝෂිත ඇල බලප්‍රදේශය තුළ කරනු ලබන වගාවන් ක්‍රමවත්ව හා උපරිම ඵලදායීතාවයක් ලබා ගන්නා අයුරින් කෘෂිකර්ම හා ප්‍රජා සංවර්ධන කටයුතු කිරීම.

කණ්ඩලම ජලාශයෙන් හා දඹුලුඔය ජලාශයෙන් මඩාටුගම හා ගල්කිරියාගම කොට්ඨාස වෙත සැපයෙන දියවරයෙන් උපරිම ඵලදායීතාවය කරා ගොවීන් යොමු කර ඔවුන්ගේ ආර්ථිකය ඉහළ නැංවීමට වාරි මාර්ග, ඉඩම්,

කෘෂිකර්ම කටයුතු හා ප්‍රජා සංවර්ධන මෙන්ම පරිසර කටයුතු වලට දායක වීම.

අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල (රු. මී.)	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)
		(රු.මිලියන)	**(රු.මිලියන)**	
1	තාක්ෂණ සේවා අංශය	63.15	48.23	76%
2	ඉඩම් අංශය	10.00	9.18	92%
3	ආයතන සංවර්ධන අංශය	15.43	13.82	90%
4	ව්‍යාපාර සංවර්ධන අංශය	1.40	1.40	100%
5	සංස්කෘතික හා මාධ්‍ය අංශය	0.62	0.61	99%
6	වන හා පරිසර අංශය	3.00	2.96	99%
7	පාලන අංශය	2.12	2.09	99%
8	ප්‍රවාහන අංශය	4.00	3.43	86%
9	කෘෂිකර්ම අංශය (ආයතනික ප්‍රාග්ධනය)	35.73	35.73	100%
10	පශු සම්පත් අංශය (ආයතනික ප්‍රාග්ධනය)	6.87	6.87	100%
	මුළු එකතුව (ආයතනික ප්‍රාග්ධනය)	**142.32**	**124.31**	**87%**
1	කෘෂිකර්ම (ව්‍යාපෘති)	20.00	19.04	95%
2	පශු සම්පත් (ව්‍යාපෘති)	12.95	11.66	90%
	එකතුව (ව්‍යාපෘති)	**32.95**	**30.70**	**93%**
	මුළු එකතුව	**175.27**	**155.02**	**88%**




රඹකැන්ඔය කලාපය

1979 අංක 23 දරන මහවැලි අධිකාරී පනත යටතේ 2000/05/04 දින අංක 1130/13 දරණ ගැසට් පත්‍රය මගින් මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇතුළුව රඹකැන්ඔය ව්‍යාපෘති ප්‍රදේශය මහවැලි විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව 2010-09-01 දින සිට මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පවතින ජලය සහ අනෙකුත් ස්වභාවික සම්පත් උපයෝගී කර ගනිමින් ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සිදුකරන බවට ප්‍රකාශයට පත් කරන ලදි. මෙම ප්‍රදේශයේ පවතින දිළිඳුභාවය තුරන් කිරීම සහ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන්නා වූ දායකත්වය ඉහළ නැංවීම උදෙසා සකස් කර ඇති මෙම සංවර්ධන වැඩසටහන වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ රේඛීය ආයතන හා ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි.මේ අනුව රඹකැන්ඔය ජලාශ ව්‍යාපෘතියේ වාරි ඉඩම් සංවර්ධන කටයුතු සහ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ඉටු කරනු ලබයි.

රඹකැන්ඔය කලාපය අම්පාර හා බදුල්ල යන දිස්ත්‍රික්ක වලට අයත්වේ. මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් වේ. මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 17 කින් සමන්විත වන අතර ,පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 20 කින් සමන්විත වේ. රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය උඟව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත්වේ. රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිළධාරී වසම් 42 කින් සමන්විත වේ. 2021 වන විට කලාපයේ මුළු ජනගහනය 110,502 ක් වන අතර මුළු පවුල් සංඛ්‍යාව 35,102කි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2010 වසරේ මහඔය ප්‍රදේශයේ නේවාසික ව්‍යාපාර කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. පොල්ලේබැද්ද, පදියතලාව සහ රිදීමාලියද්ද යන කොට්ඨාස කාර්යාල තුනක් රඹකැන්ඔය කලාපය තුළ ක්‍රියාත්මක වේ.
රඹකැන්ඔය කලාපය අනෙකුත් කලාප වලට වඩා සැලකිය යුතු ලක්ෂණ ඇත. මෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ පොල්ලේබැද්ද ප්‍රදේශයේ ආදිවාසී ජනතාව ජීවත් වීමයි. ආචාර්ය ස්පිටෙල් (1940-1950) මෙම ආදිවාසී ප්‍රජාව සම්බන්ධයෙන් ඔහුගේ සහරාවක ද සඳහන් කරයි. මෙම ප්‍රදේශය සද්ධාතිස්ස රජුගේ යුගයට අයත් විය. එබැවින් පුරාවිද්‍යා නටබුන් රාශියක් ඇති අතර පුරාණ විහාරස්ථාන ද පිහිටා ඇත.

අ.අ	අංශය	**2021** වෙන්කර ඇති මුදල (රු. මී.)	**2021.** දෙසැම්බර් **31** වන දිනට ප්‍රගතිය	**2021.** දෙසැම්බර් මස **31** වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)
		(රු.මිලියන)	(රු.මිලියන)	
1	කෘෂිකර්ම (ආයතනික ප්‍රාග්ධනය)	17.60	15.40	88%
2	පශු සම්පත් (ආයතනික ප්‍රාග්ධනය)	6.69	6.65	99%
	මුළු එකතුව (ආයතනික ප්‍රාග්ධනය)	**24.29**	**22.06**	**91%**
1	පශු සම්පත් (ව්‍යාපෘති)	15.50	12.00	77%
	මුළු එකතුව	**39.79**	**34.05**	**86%**



වලව කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

වලව මිටියාවත වර්ග කි.මී.2442 කින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ බලංගොඩ රත්නපුර කදුකරයේ සිට හම්බන්තොට /රන්න දකුණු වෙරළබඩ තීරය දක්වා විහිදේ. පුරාණ වැව් සිය ගණනක් වලව නිම්නය තුළ පිහිටා ඇත.
උඩවලව බහුකාර්ය යෝජනා ක්‍රමය 1963 ජූලි මස 12 වැනිදා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කර ඇති අතර, උඩවලව ජලාශය ඉදිකිරීමත් එයට සමගාමීව ජනාවාස කරණය සහ ගොවි බිම් සංවර්ධනය 1981 දක්වා ක්‍රියාත්මක කරන ලද්දේ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය මගිනි.

1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 (1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 1981/04/16 දින අංක 137 දරණ ගැසට් පත්‍රය මගින් ගරු ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍යවරයා වූ ගාමිණී දිසානායක මැතිතුමා විසින් වලව කලාපය වලව විශේෂ බලප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. ඒ අනුව 1982.01.01 දින සිට වලව කලාපයේ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට පත් වී ඇත.

වලව කලාපයේ පරිපාලන කටයුතු මහවැලි අධිකාරිය යටතට පත්ව දැනට වසර 34 ක් ගතව ඇති අතර, මෙම කාලය තුළ වලව කලාපය සීඝ්‍ර දියුණුවක් ලබා ඇත. මෙම කලාපය දකුණු පළාත, සබරගමු පළාත හා ඌව පළාත යන පළාත් 03 කට අයත් හම්බන්තොට, රත්නපුර හා මොණරාගල යන දිස්ත්‍රික්ක 03 කට අයත්වේ.

අහුණකොළපැලැස්ස, මුරවැසිහේන, සුරියවැව, මයුරපුර, චන්ද්‍රිකාවැව, කිරිඉබ්බන්වැව හා සෙවනගල යන කොට්ඨාස 07 කින් සමන්විත වන අතර, ඒකක 39 කට බෙදී ඇත.

කලාපයේ ඇති භූමි ප්‍රමාණය පිළිබඳ තොරතුරු.

- මුළු භූමි ප්‍රමාණය - හෙක්ටයාර් 60,803
- වාරි ඉඩම් ප්‍රමාණය - හෙක්ටයාර් 23,203
- ගොඩ ඉඩම් ප්‍රමාණය - හෙක්ටයාර් 14,064

තෘණ බිම්, වැව් රක්ෂිත පුරාවිද්‍යා ප්‍රදේශයනාදිය - හෙක්ටයාර් 24,536

අ.අ	අංශය	2021 වෙන්කර ඇති මුදල (රු. මී.)	2021. දෙසැම්බර් 31 වන දිනට ප්‍රගතිය	2021. දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)
1	තාක්ෂණ සේවා අංශය	**74.05**	**73.71**	**100%**
2	යන්ත්‍රික වැඩපල	**10.45**	**10.39**	**99%**
3	ඉඩම් අංශය	**18.80**	**18.56**	**99%**
4	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	**64.00**	**62.63**	**98%**
5	ආයතන සංවර්ධන අංශය	**27.52**	**27.17**	**99%**
6	සංස්කෘතික හා මාධ්‍ය අංශය	**0.43**	**0.43**	**100%**
7	ව්‍යාපාර සංවර්ධන අංශය	**4.50**	**4.50**	**100%**
8	වන හා පරිසර අංශය	**6.35**	**6.23**	**98%**
9	පාලන අංශය	**4.80**	**4.66**	**97%**
10	කෘෂිකර්ම අංශය (ආයතනික ප්‍රාග්ධනය)	**26.27**	**14.22**	**54%**
11	පශු සම්පත් අංශය (ආයතනික ප්‍රාග්ධනය)	**14.10**	**12.43**	**88%**
	මුළු එකතුව (ආයතනික ප්‍රාග්ධනය)	**251.3**	**234.9**	**93%**
1	කෘෂිකර්ම (ව්‍යාපෘති)	**80.00**	**57.04**	**71%**
2	පශු සම්පත් (ව්‍යාපෘති)	**19.20**	**11.41**	**59%**
	එකතුව (ව්‍යාපෘති)	**99.20**	**68.45**	**69%**
	මුළු එකතුව	**350.50**	**303.32**	**87%**

2021-12-31 දිනට මූල්‍ය ප්‍රගතිය - කලාප වශයෙන්

අ.අ	කලාපය	2021 වර්ෂයට වෙන් කළ මුදල (රු.මිලි.)	2021-12-31 දිනට වියදම් කළ මුදල (රු.මිලි.)	මූල්‍ය ප්‍රගතිය%
1	බී	568.37	521.58	91 %
2	සී	320.28	320.18	99%
3	ඩී	160.61	149.29	92%
4	ඊ	121.37	120.46	99%
5	ජී	202.65	201.02	99%
6	එච්	511.81	501.68	98%
7	හුරුළුවැව	175.27	146.88	83%
8	උඩවලව	350.47	303.38	86%
9	රඹකැන්ඔය	396.79	344.10	86%
10	එල්	333.18	282.09	84%
	එකතුව	**3,140.78**	**2,890.67**	**92%**

අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ කළමනාකරණය වන අංශ.

1. සැලසුම් හා නියාමන අංශය
2. අභ්‍යන්තර විගණන අංශය
3. ජල කළමනාකරණ ලේකම් කාර්යාලය
4. ප්‍රසම්පාදන අංශය

01. සැලසුම් හා නියාමන අංශය

කාර්යභාරයන්

- ආයතනයේ දැක්ම හා මෙහෙවරට අනුව සංයුක්ත ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා වාර්ෂික සැලැස්ම අනුව කටයුතු කිරීම.
- විශේෂ ව්‍යාපෘති වාර්තා සැකසීම හා ආර්ථික සාමාජීය සමීක්ෂණ හා විශ්ලේෂණ සිදු කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මේ සහ ව්‍යාපෘති වාර්තාවල ඇති ප්‍රගතිය මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව සමාලෝචනය කිරීම. ව්‍යාපෘති ඇගයීම් සම්බන්ධීකරණය හා මෙහෙයුම් ඇගයීම් පද්ධතියක් සහතික කිරීම.
- තාක්ෂණ වාර්තා, ශක්‍යතා වාර්තා මෙහෙයුම් හා ඇගයීම් වාර්තා සංරක්ෂණය හා භාවිතයට ලබා දීම.
- මහවැලි පරිගණක ජාලය මෙහෙයවීම නඩත්තුව හා නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ සහාය සැපයීම.
- බලපෑමට ලක්වන ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයන් සම්බන්ධීකරණය කිරීම.

02. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය, ශ්‍රී ලංකා ජනරජය විසින් නිකුත් කර ඇති මූල්‍ය රෙගුලාසි (Financial Reguations), ආයතනික රෙගුලාසි (Adminstration Regulations), කාලීනව නිකුත් වන චක්‍රලේඛ, ප්‍රතිපත්ති තීරණ සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, පරීක්ෂණ නිරීක්ෂණ මගින් අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කරමින්, කළමනාකාරිත්වයට සහය වීම සිදු කරනු ලබයි.

කාර්යය භාරයන්

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුකූලව සහ යහපාලන ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියාත්මක කරනවාද යන්නත්, සිදු කරන ලද ගනුදෙනු වලින් ආර්ථිකමය ප්‍රතිලාභ (Value for Money) ලැබෙනවාද යන්නත්, විගණන පරීක්ෂණයන් නිරීක්ෂණ, සැසඳීම්, භෞතික පරීක්ෂණ, ශ්‍රී ලංකා වරලත්

ගණකාධිකාරි ආයතනය (ICA) මඟින් සහ ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිතීන් (IAS) මගින් නිකුත් කරන ලද ප්‍රමිතීන් වලට අනුගතව, විගණනය සිදු කර කළමනාකාරිත්වය වෙත වාර්තා කිරීම.

2021 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් සිදු කොට අවසන් කර ඇත.

- අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කරන ලද විගණන වාර්තා ගණන 28 කි.
- නිකුත් කරන ලද විමර්ශණ වාර්තා ගණන 15 කි.
- පවත්වන ලද විගණන හා කළමනාකරණ රැස්වීම් ගණන
- අමාත්‍යාංශ මට්ටමින් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 03
- අධිකාරි මට්ටමින් විගණන කළමනාකරණ රැස්වීම් 03
- අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ලබාදුන් පිලිතුරු සහ විමසුම් මගින් ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු මගින් ලබාදුන් මහපෙන්වීම හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට, ප්‍රගති වාර්තා ලබාගැනීම තුළින් උපදෙස් ලබාදීම.

03. ජල කළමනාකරණ ලේකම් කාර්යාලය.

ජල කළමනාකරණ ලේකම් කාර්යාලය


ජල කළමනාකරණ ලේකම් කාර්යාලය මගින් වාර්ෂික යල සහ මහ කන්නයන් සඳහා මෙහෙයුම් ප්‍රතිපත්ති නිර්දේශ කර මහවැලි පද්ධති සඳහා මෙහෙයුම් සැලසුම් සකස් කිරීම සිදුකරන අතර මෙය මූලික ලෙස වාරිමාර්ග හා බලශක්ති අවශ්‍යතා මත පදනම් ව ප්‍රධාන ලෙස වී සහ අතුරු වැවිලි බෝග නිෂ්පාදනය සඳහා පුළුල් දායකත්වයක් ලබාදෙන ජාතික වැඩ සටහන වේ.මෙය සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ උපදෙස් සපයන ඒකකයක් ලෙස ජල පාලන ලේකම් කාර්යාලය මගින් ජලපාලන කමිටුවට අයත් සාමාජික ආයතන සම්බන්ධීකරණය කරගනිමින් සියලු මෙහෙයුම් සැලසුම් සතිපතා අධීක්ෂණය කරමින් එහි ප්‍රගතිය සමාලෝචනය හා ඉදිරි සති ජල මෙහෙයුම් සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීම සිදුකරන අතර එය කෘෂි ,විදුලි හා පානීය ජල අවශ්‍යතාද සලකමින් සමස්ථ පද්ධතිය තුළ නිර්දේශිත ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු කරනු ලබන්නකි.

2020/21 මහ කන්නය) 2021 ජන20 - 01. 21 මාර්තු31

2020/21 මහ කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටුව20 20 ඔක්තෝම්බර් 05 දින පේරාදෙනිය ගන්නෝරුව පැළෑටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර ,ඒ වනවිට පද්ධතියේ සියලු ජලාශවල සක්‍රීය ජල මට්ටම් 2021 ජන .01 වනවිට කොත්මලේ 77.3% ,වික්ටෝරියා 77.0% ,මොරගහකන්ද 52.8%, MH කලාපයට අයත් හුරුලුවැව 35.0,% B කලාපයට අයත් මාදුරුඔය 42.7%, සහ වලව කලාපය 41.1% ලෙස පැවතීය.


ඒ අනුව20 20/2 1මහ කන්නයේ මුළු වගා වපසරිය හෙක් .191,561 වූ අතර එය සමස්ථ ලෙස 98 %පමණ විය. ඒ වනවිට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී නොතිබීම හේතුකොට ජලය නිකුත් කිරීම් ප්‍රමාද කරන ලෙස දන්වන ලද අතර ඒ අනුව ජලය නිකුත් කිරීම ,B, C ,වලව කලාප නොවැම්බර් මැද භාගය තෙක් ද ප්‍රමාද කරමින් ආරම්භ කිරීමට සිදුවිය .

මෙම කන්නය තුළ මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 380.9 ක්ද කැළණි පද්ධතියෙන් ගිගාවොට් පැය 313.0 කද විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදී .විදුලිබල උත්පාදනය20 20/21 මහ කන්නය තුල පැවති ආකාරය පළමුවන රූප සටහනින් දැක්වේ.



පළමුවන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ ඇති කලාපවල 2020/21 මහ කන්නයේ වගාව සැලසුම් හා එහි ප්‍රගතිය දෙවන රූප සටහනින් දැක්වේ.




දෙවන රූප සටහන

2021 යල කන්නය - (2021 අප්‍රේල්20 - 01 21 සැප්30 .)

2021 යල කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටු රැස්වීම20 21 මාර්තු මස0 5 දින පේරාදෙණිය ගන්නෝරුව පැළෑටි හා ඡාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී .ඒ වනවිට කොත්මලේ ජලාශයේ සක්‍රීය ජල මට්ටම 62.9 % ද මාදුරු ඔය 93.2 %ද ,කලාවැව 56.1 %ද ,හුරුලුවැව 71.3 %ලෙස ජල මට්ටමක් පැවති අතර පරාක්‍රම සමුද්‍රය ජල මට්ටම 98.1% ක උපරිම ජල මට්ටමට ආසන්නව පැවතිනි.


එබැවින් සමස්ථයක් ලෙස වගාව 96 %ක පමණ උපරිමය අපේක්ෂා කළ අතර පරාක්‍රම සමුද්‍රය ,D01පද්ධතිය සහ අල්ලෙයි ,සඳහා %100 යෝජිත විය .ඒ අනුව20 21 යල කන්නයේ මුළු වගා වපසරිය හෙක්1 .84,419 වූ අතර එය ආසන්න ලෙස මුළු වගාවෙන් 96 %ක ප්‍රමාණයක් විය.

මෙම කන්නය තුළ මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 1567.1 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදී .විදුලිබල උත්පාදනය20 21 යල කන්නය තුළ පැවති ආකාරය තුන්වන රූප සටහනින් දැක්වේ



තුන්වන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ පවතින කලාපවල 2021 යල කන්නයේ සැලසුම හා ලබාගත් ප්‍රගතිය සිව්වැනි රූප සටහනින් දැක්වේ.




සිව්වැනි රූප සටහන

2021/22 මහ කන්නය - 2021 ඔක්තෝම්බර්20 -01 21 දෙසැම්බර් 31 දක්වා


2021/22 මහ කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටුව20 21 සැප්තැම්බර් 10 දින පේරාදෙනිය ගන්නෝරුව පැළෑටි හා ඡාන සම්පත් මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර ,ඒ වනවිට පද්ධතියේ අපේක්ෂිත සියලු ජලාශවල සක්‍රීය ජල මට්ටම් කොත්මලේ 72.1% ,වික්ටෝරියා 78.9% ,වලව 73.1%, හුරුලුවැව 19.3 %මට්ටමක පැවති අතර මාදුරුඔය 49.5 %ලෙස විය.

ඒ වනවිට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී තිබීම හේතුකොට ජලය නිකුත් කිරීම ඒ අනුව කලාප H ,ඩී0 2, හා වලව කලාපය20 21 නොවැම්බර් 1 වන සතිය වනවිට ආරම්භ කිරීමට හැකි විය .ඒ අනුව20 21/22 මහ කන්නයේ මුළු වගා වපසරිය හෙක්1 .94,639 වූ අතර එය සමස්ථ ලෙස1 00 % පමණ විය.
මෙම කන්නය තුළ මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 1194.1ක්ද කැළණි පද්ධතියෙන් ගිගාවොට් පැය 767.8 ක්ද විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදී .විදුලිබල උත්පාදනය20 21/22 මහ කන්නය තුළ පැවති ආකාරය පස්වන රූප සටහනින් දැක්වේ.



පස්වන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ ඇති කලාපවල20 21/22 මහ කන්නයේ වගාව සැලසුම් හා එහි ප්‍රගතිය හය වන රූප සටහනින් දැක්වේ.



හය වන රූප සටහන

04. ප්‍රසම්පාදන අංශය

කාර්යභාරයන්

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාළ කාර්යයන් හා සම්බන්ධ සියලු කටයුතු මෙහෙයවීම.

2. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පැවැත්වීම හා එයට අදාළ සියලුම කාර්යයන් ඉටු කිරීම.

3. ශ්‍රී. ල. ම. අධිකාරියෙහි සංයුක්ත ප්‍රසම්පාදන සැලසුම් සකස්කිරීම හා අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම.

4. ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු හා සියලුම තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම හා පසු විපරම.

5. ප්‍රසම්පාදන කාර්යයන් හා සම්බන්ධ රජයේ මාර්ගෝපදේශ, චක්‍රලේඛණ විධි විධාන හා ක්‍රමවේදයන් පිළිබඳව ආයතනය දැනුවත් කිරීම හා උපදෙස් ලබාදීම.

6. අභ්‍යන්තර චක්‍රලේඛණ හා මූල්‍ය බලතල විමධ්‍යගත කිරීම් මගින් ආයතනයේ ප්‍රසම්පාදන කාර්යයන් වඩා කාර්යක්ෂමව හා විනිවිද භාවයකින් යුතුව පවත්වාගෙන යාම.

7. ශ්‍රී. ම. අ. ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල සඳහා අවශ්‍ය වන ප්‍රසම්පාදනයන් සිදු කිරීම හා මෙහෙය වීම.

8. ශ්‍රී. ල. ම. අධිකාරියෙහි අංශ මගින් සිදුකරනු ලබන මිල/ ලංසු කැඳවීම් සඳහා වන ප්‍රසිද්ධ මිල/ ලංසු විවෘත කිරීම් සිදු කිරීම හා මෙහෙය වීම්.

9. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන විශේෂ/ හදිසි ප්‍රසම්පාදනයන් හා වෙනත් රාජකාරිමය කාර්යන් ඉටු කිරීම.

10. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත්වන ලේඛණ, ලිපිගොණු හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා පරීක්ෂාකිරීම, නිවැරදි කිරීම හා නිර්දේශයන් ලබාදීම.

11. ශ්‍රී. ල. ම. අධිකාරියෙහි වාර්ෂික වාර්තාවන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සකස් කිරීම හා ඊට අදාළ සියළුම කාර්යයන් මෙහෙයවීම.

දෙවන පරිච්ඡේදය

2.1 තාක්ෂණ සේවා අංශය

කාර්යභාරයන්

- සංයුක්ත සැලැස්ම/වාර්ෂික සැලැස්මට අනුව නව අංගයකින් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම.

- තාක්ෂණික සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සඳහා මගපෙන්වීම හා මෙහෙයවීම.

- ප්‍රධාන වේලි හා ජල හැරවුම් මාර්ග සහ පහළ නිම්න ප්‍රදේශයේ වාරි පද්ධතිය ඇතුළු භෞතික සම්පත් නිසි පරිදි නඩත්තු කර ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රියාවලියක් සැකසීම.

- ජලාශ හා වාරිපද්ධති හරහා කෘෂිකාර්මික කටයුතු,ජල විදුලි නිෂ්පාදනය, පානීය ජලය ඇතුලු අනෙකුත් අවශ්‍යතා සඳහා ජලය කළමනාකරණය කර සපයා දීම සඳහා විධිමත් සැලසුම් පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ව්‍යාපෘති සැලසුම්, කිරීම ශක්‍යතා ඇගයීම, මෙහෙයවීම හා ප්‍රගතිය සමාලෝචනය.

මූලික වශයෙන් ඉහත දැක්වූ ප්‍රධාන ක්‍රියාවලීන් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තාක්ෂණ සේවා අංශය කටයුතු කරනු ලබයි.

ඒ අනුව 2021 වසර තුළ මෙම අංශය මගින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කරන ලදී.

- ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - බී කලාපය
- රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය
- රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපෘතිය
- වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය
- සූර්ය බලශක්තිය ගොඩ ඉඩම් වල හා ජලාශවල පිහිටුවීම සඳහා මඟ පෙන්වීම
- කුඩා ජල විදුලි බලාගාර පිහිටුවීම සඳහා මග පෙන්වීම

තවද පහත සඳහන් ක්‍රියාමාර්ග තුළින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීමටද කටයුතු කරන ලදී

- වානිජ ජල සැපයුම් ලබා දීම.
- ජලාශ හා වැව් වල රොන්මඩ/වැලි වානිජ මට්ටමින් ඉවත් කිරීම.

2021 වසර සඳහා මහා භාණ්ඩාගාරය විසින් ඒ ඒ කලාප සහ ව්‍යාපෘති සඳහා වෙන් කල ප්‍රතිපාදන වැය කිරීම් පහත පරිදි වේ.

අනු අංකය	ව්‍යාපෘති/කලාප/අංශ	**2021**වර්ෂයේ තා.සේ.අංශයට වෙන් කල මුදල්/(රු.මි.)	**2021** වසරේ මුල්‍ය ප්‍රගතිය /(රු.මි.)	මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය%
1	*ව්‍යාපෘති*	807.00	712.01	88.23%	93.81%
2	කලාප	638.88	611.88	95.77%	98.30%
	උප එකතුව(1+ 2) (පහළ නිම්නසංවර්ධන අංශය)	1,445.88	1323.39	91.52%	95.79%
3	ගංගා ද්‍රෝණි කළමනාකරණ අංශය	3.15	3.15	100.00%	97.00%
4	ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්අංශය	360.00	360.00	100.00%	100.00%
	උප එකතුව (3+4)	363.15	363.15	100.00%	99.97%
	මුළු එකතුව - උප එකතුව (තාක්ෂණ සේවා අංශය)	**1,809.03**	**1,686.54**	**93.22%**	**96.63%**

2.1.1 පහළ නිම්න සංවර්ධන අංශය

මහවැලි බල ප්‍රදේශයන්හි ඇති වාරි පද්ධති, වැව් හා ජලාශ මෙහෙයවීම සහ නඩත්තු කිරීම, ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු කිරීම සහ කලමනාකරණය කිරීම, මාර්ග පද්ධති අළුත්වැඩියාවන් හා ඊට අදාළ ඉදිකිරීම්, ඇස්තමේන්තු කිරීම, ඉදිකිරීම්වල තත්ව පාලනය කිරීම් සහ ප්‍රගති සමාලෝචනය මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

කාර්යභාරයන්

- සියලුම කලාපවල හා විශේෂ ව්‍යාපෘති ඇතුළුව වැඩ සහ සේවා සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත් පරිපාලනයට පහසුකම් සැලසීම.
- වාර්ෂික ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සම්බන්ධ වාර්ෂික අයවැය, වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- මහවැලි කලාපවල වැව් හා ඇල මාර්ග පද්ධතිවල අදාළ මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ජල පාලන ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් මහවැලි ප්‍රදේශයේ වගාවන් සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීම සහ බෙදා හැරීම සහතික කිරීම.
- තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් අනෙකුත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පවතින අංශ සමඟ සහ බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

මූල්‍ය ප්‍රගතිය

2021 වසර සඳහා මහා භාණ්ඩාගාරය විසින් කලාප හා ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන වැය කිරීම් පහත පරිදි වේ.

(1) ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතිය	සම්පූර්ණ ආයෝජන ඇස්තමේන්තු මුදල /(රු.මි)	2021 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත වියදම්/(රු.මි)	2021 සඳහා වෙන් කිරීම /(රු.මි)	2021 සඳහා වියදම (රු.මි.)	2021 සඳහා මූල්‍ය ප්‍රගතිය %	2021 සඳහා භෞතික ප්‍රගතිය%
1	ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - බී කලාපය	4,910.00	4749.55	217.00	194.00	89.40%	90.00%
2	රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය	1,100.00	836.58	165.00	137.45	83.30%	92.00%
3	රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපෘතිය	1086.00	660.01	192.00	172.60	89.90%	92.00%
4	වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය	3,957.00	2496.72	233.00	207.96	89.25%	93.00%
	එකතුව (ව්‍යාපෘති)	**11.053.86**	**8,742.86**	**807.00**	**712.01**	**88.23%**	**93.81%**

(2) ආයතනික ප්‍රාග්ධන

අනු අංකය	කලාපය	**2021**/වර්ෂේ කා.සේ. අංශයට වෙන් කළ මුදල /(රු.මි.)	**2021** වසරේ මුල්‍ය ප්‍රගතිය /(රු.මි.)	මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
1	බී කලාපය	82.60	79.25	96.00%	100.00%
2	සී කලාපය	130.51	130.52	100.00%	100.00%
3	ඩී කලාපය	31.07	24.20	78.00%	85.00%
4	ජී කලාපය	29.20	29.20	100.00%	100.00%
5	එච් කලාපය	169.03	169.03	100.00%	100.00%
6	වලව කලාපය	74.05	73.21	100.00%	100.00%
7	හුරුළුවැව කලාපය	63.15	48.23	76.00%	92.00%
8	වික්ටෝරියා කලාපය	56.27	56.27	100.00%	100.00%
9	ප්‍රධාන කාර්යාලය (කා.සේවා)	3.00	1.47	49.00%	60.00%
	උප එකතුව 2(කලාප)	**638.88**	**611.38**	**96..00%**	**98.30%**
	උප එකතුව (1+2)	**1445.88**	**1323.89**	**91.56%**	**95.80%**

(3) විශේෂ කාර්යන් සහ ජාතික ආර්ථිකයට සිදුකළ දායකත්වය

- පාසල් ගොඩනැගිලි ආදිය ලබාදීම මගින් අධ්‍යාපනයට පහසුකම් ලබාදීම.
- මාර්ග අලුත් වැඩියා කිරීම මගින් වඩාහොඳ යටිතල පහසුකම් ලබාදීමට හැකිවීම.
- වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය මගින් ගොවි ජනතාවගේ ජීවිත තත්වය නගා සිටුවීමට කටයුතු කිරීම.

2.1.2 ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය

ඉංජිනේරු නිර්මාණ සැලසුම් අංශය
ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් යෝජිත ව්‍යාපෘවල, ක්‍රියාත්මක වෙමින් පවතින හා සංවර්ධනය කරන ලද ව්‍යාපෘතිවල ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් සකස් කිරීම ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය මගින් සිදුකරනු ලබයි.
පහත කාර්යභාරයන් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

- මහවැලි ජල සම්පත් සැලැස්ම යාවත් කාලීන කිරීම
- රාජ්‍ය හා පුද්ගලික ව්‍යාවසායකයින් විසින් ඉදිරිපත් කරනු ලබන කුඩා පරිමාණ ජල ව්‍යාපෘති යෝජනා හා සැලසුම් විශ්ලේෂණය කිරීම
- නිර්මාණ හා සැලසුම් වලට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු හා ප්‍රමාණ බිල්පත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සකස් කිරීම
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පිළිගත් තත්වයන්ට අනුව ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්කරණය පිළිබඳව නවක ඉංජිනේරුවන් පුහුණු කිරීම.

මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය
මැනුම් වියරය

ප්‍රධාන ඇළ පද්ධතිය ඔස්සේ මාදුරුඔය ජලාශයේ ජලය සිට රැගෙන යන දකුණු ඇළ මාර්ගයට අදාළව ස්ථානයේ මැනුම් වියරයකට අවශ්‍ය Type drawings ඉදිරිපත් කරන ලදි.

යටි අපවහන ඇල මාර්ග නිර්මිත
දකුණු ඇල මාර්ගයට අදාළව යටි අපවහන ඇළ මාර්ගයේ පහත දැක්වෙන ස්ථානවල නිර්මිත 2ක් සඳහා නිර්මාණ හා සැලසුම් ඉදිරිපත් කරන ලදි.

- 6+728 KM
- 7+525 KM

වලව් කලාපය

අගුණකොලපැලැස්ස බස් නැවතුම්පල ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සියළුම සකස් කිරීම් වලට අදාළ නව සංශෝධන ඇතුළත්ව සැලසුම් හා නිර්මාණ සපයමින් ඉදිරි කටයුතු සඳහා අවකාශ සලසා දෙන ලදි.
අගුණකොලපැලැස්ස පොළ සංකීර්ණයට අදාළ භූමි නිර්මාණ සැලසුම් සහ අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කරන ලදි.
වලව් වම් ඉවුර යටතේ ඇති 15 වන බෙදුම් ඇලට අදාළ නිර්මාණ නැවත සමාලෝචනය කර ඉදිරිපත් කරන ලදි.

එල් කලාපය - වැලිඔය

කිවුල්ඔය ව්‍යාපෘතියට අදාළව පිටවාන /වැව් බැම්ම සඳහා මූලික ඉංජිනේරු නිර්මාණ සැලසුම් ඉදිරිපත් කරන ලදි.

එල් කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාරණ කාර්යාලය හරහා සිදුවන සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යය ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් ලබා දෙන ලදි.

වාරි සෞභාග්‍ය ව්‍යාපෘතිය යටතේ තෝරා ගන්නා ලද වැව් 23 ක් සඳහා අධ්‍යනය කරමින් වැව් 07කට අදාළව ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් ඉදිරිපත් කරන ලදි. ඒවා පහත සඳහන් වේ.

(i) <u>බෝගස්වැව</u>
- ✓ බෙදුම් ඇළ මාර්ගය සංවර්ධනයට අදාළව ව්‍යුහයන්ගේ සැලසුම්
- ✓ කුඹුරු ඉඩම් වපසරියට අදාළව නිර්මිත හා කේෂ්ත්‍ර ඇළ මාර්ග සඳහා නිර්මාණ (BOP)

(ii) <u>රුවන් මඩුව වැව</u>
- ✓ කුඹුරු ඉඩම් වපසරියට අදාළව නිර්මිත හා කේෂ්ත්‍ර ඇළ මාර්ග සඳහා නිර්මාණ (BOP)
- ✓ පිටවාන
- ✓ සොරොව්ව

(iii) <u>කොහොඹලස්වැව</u>
- ✓ පිටවාන
- ✓ සොරොව්ව
- ✓ කුඹුරු ඉඩම් වපසරියට අදාළව නිර්මිත හා කේෂ්ත්‍ර ඇළ මාර්ග සඳහා නිර්මාණ (BOP)

(iv) <u>සැළලිහිණිගම අංක 01</u>
- ✓ පිටවාන
- ✓ සොරොව්ව

(v) <u>සැළලිහිණිගම අංක 02</u>
- ✓ පිටවාන
- ✓ සොරොව්ව
- ✓ වැව් බැම්ම

(vi) <u>නාමල්ගම අංක 03</u>
- ✓ පිටවාන
- ✓ සොරොව්ව
- ✓ වැව් බැම්ම

(vii) <u>කුඩාදික්වැව</u>

- ✓ පිටවාන
- ✓ සොරොව්ව
- ✓ වැව් බැම්ම

අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සමගින්

ඉතිරි වැව් 16 සඳහා අවශ්‍ය ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් 2022 වර්ෂය ඉදිරිපත් කිරීමට නියමිතය.
පහත සඳහන් වැව් සඳහා පාරිසරික විමර්ෂණ වාර්තා (EIA) සකස් කිරීමට අවශ්‍ය දත්ත තොරතුරු ලබා දෙන ලදි.

- ✓ කුඩාදික්වැව
- ✓ දික්වැව
- ✓ නාමල්ගම 02
- ✓ දුංකුඩුනේරුව
- ✓ රුවන්මඩුව
- ✓ මහකම්බිලියාව
- ✓ පුරාණමායා

මොරගහකන්ද කලාපය

බකමුණ බස්නැවතුම්පළ හා බස් නැවතුම්පළ අවට භූමි නිර්මාණ සැලසුමට (Landscape) අදාළ සියලු වාස්තු විද්‍යාත්මක හා ව්‍යුහාත්මක ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් ඉදිරිපත් කරන ලදි.

මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය

<u>මැනුම් වියරය සඳහා</u>

කළුගඟ ජලාශයේ සිට කෙත් බිම් කරා දිවයන දකුණ ඇළ මාර්ගය සඳහා මැනුම් වියරයක් සකස් කිරීමට අවශ්‍ය ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් පිළියෙල කරන ලදි. (Type Drawing)

<u>පිටවාන පහළ ඇළ මාර්ගය</u>

සම පැන්නුම 01 යටතේ පිටවාන සඳහා ජලය බැස යාම සඳහා 0+000 Km ස්ථානයේ යෝජිත වූ නිර්මිතයට අදාළ නිර්මාණ හා සැලසුම් ඉදිරිපත් කරන ලදි.

<u>අඹන ජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය</u>

ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් සකස් කර යොමු කරන ලදි.

<u>පොල්ගොල්ල වැඩ මුලිකය - රැඳවුම් බිත්ති සකස් කිරීම (Retaining wall)</u>

ඉවුරු බාදනය වළක්වා ගැනීම සඳහා පොල්ගොල්ල ජල හැරවුම් ප්‍රදේශයේ සෑදීමට නියමිත පස් රැඳවුම් බිත්තියට (Retaining wall) අදාළ නිර්මාණ හා සැලසුම් නිම කරන ලදි.

<u>ක්ෂුද්‍ර ජල විදුලි බල යෝජනා ක්‍රම දායකත්වය</u>

මොරාන සහ කිවුල විදුලි බල යෝජනා දෙක සඳහා අදාළ ආයතන මගින් කරන ලද ඉල්ලීම් සමාලෝචනය කර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික යෝජනා හා අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>යෝජිත කන්දකඩුව හා මුතුවැල්ල - බී කලාපය</u>

කෘෂිකාර්මික, සත්ව පාලන සහ ආශ්‍රිත කර්මාන්ත ආයෝජන ව්‍යාපෘති සඳහා මහවැලි බී කලාපයේ සිංහපුර කොට්ඨාශය තෝරාගෙන තිබුණි. එබැවින් කන්දකඩුව (හෙක් 1825) හා මුතුවැල්ල (හෙක් 146 ක්) යෝජිත ව්‍යාපෘතින් සඳහා මූලික ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් සකස් කර දෙන ලදි.

ඊ කලාපය

මැල්බෝවත්ත ඇළ සංවර්ධනය

හැටන් දික්ඔය ප්‍රදේශයට ආසන්නව පිහිටි මැල්බෝවත්ත වතුයායට අයත් මහවැලි ගඟේ අතු ගංගාවක් දිවෙන මැල්බෝවත්ත ඇල මාර්ගයේ සිදුවන හදිසි ගං වතුර තත්වය අධ්‍යනය කර ඊට අදාළ කෙටි කාලීන හා දිගු කාලීන විසඳුම් ඇතුළත් වාර්තාව සකස් කරන ලදි.

<u>අමතරව කටයුතු</u>

- ✓ මහවැලි ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට රියදුරු නේවාසිකාගාරයට සැලසුම් සකස් කිරීම
- ✓ මහවැලි කලාප සඳහා පාසල් සඳහා වැසිකිළි පද්ධති නිර්මාණ හා ඇස්තමේන්තු සකස් කිරීම
- ✓ අඩු ආදායම්ලාභී මහවැලි ජානපදිකයන් සඳහා වැසිකිළි පද්ධති සෑදීමට අවශ්‍ය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

<u>පුහුණුව</u>

වර්ෂයට අදාළ නවක ඉංජිනේරුවන් පස් දෙනෙකු සඳහා වරලත් ඉංජිනේරු ප්‍රවේශයට පුහුණු කිරීම සිදු කරන ලදි.

2.2 ගංගාද්‍රෝණි කළමනාකරණ කාර්යාලය

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය, මඩාටුගම මහවැලි පරිශ්‍රයේ පිහිටා ඇති අතර අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ) යටතේ ක්‍රියාත්මක වේ. ගංගා ද්‍රෝණි කළමනාකරණ සංකල්පයට අනුකූලව පාරිසරික හා ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළවන කාර්යයන් ඉටු කිරීම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදු කරනු ලබන ඉදිකිරීම් හා නඩත්තු කාර්යන්හි ප්‍රමිතිය පරීක්ෂා කිරීම මෙම කාර්යාලයේ මූලික වගකීම වේ.

ඒ අනුව මෙම කාර්යාලය යටතේ පවත්වාගෙන යනු ලබන ජල තත්ව විද්‍යාගාරය මඟින් මහවැලි ගඟ සහ මහවැලි පද්ධතිය හා සහසම්බන්ධ ගංගා ද්‍රෝණිවල පිහිටි ජල ප්‍රභව වල ජලයෙහි ගුණාත්මය පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර එම දත්ත ඇසුරින් ජලයේ ගුණාත්මය ස්ථානීයව හා කාලීනව වෙනස් වන අයුරු අධ්‍යනය කිරීම සිදු කරනු ලැබේ.

ඒ යටතේ,

1. කලාවැව, කණ්ඩලම, දඹුළු ඔය, බෝවතැන්න, උඩවලව සහ චන්ද්‍රිකා වැව යන මහවැලි ජලාශ වල ජලයේ ගුණාත්මය පිළිබඳව මාසිකව පරීක්ෂා කිරීම.
2. මහවැලි කලාපයන්හි ඇති තෝරාගත් කුඩා වැව්වල ජලයේ ගුණාත්මකභාවය මාසිකව පරීක්ෂා කිරීම.
3. මහවැලි ගඟ සහ මහවැලි පද්ධතිය හා සහසම්බන්ධ තෝරාගත් ජල දහරා වල ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.





අප අංශය සතු ජල තත්ව විද්‍යාගාරය මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත විද්‍යාගාරයක් බැවින් කර්මාන්ත සඳහා වන පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත්කර ගැනීමේදී එම ආයතන හරහා පරිසරයට මුදා හරින අපජලයේ තත්වය පරීක්ෂා කර නිර්දේශයන් ලබා දීමද සිදු කරනු ලැබේ. මෙහිදී එම ආයතන හිමියන්ගෙන් කෙරෙන ඉල්ලීම් වලට අනුව පරීක්ෂණ සිදුකර අප ජලයෙහි සංයුතිය පිළිබඳ වාර්තා ලබා දෙන අතර ඒ සඳහා ගාස්තු අයකරනු ලැබේ.මීට අමතරව බාහිර ආයතන මඟින් කරනු ලබන ඉල්ලීම් අනුව ජල සාම්පල පරීක්ෂා කරනු ලබයි.

- ඒ අනුව, ජල තත්ව විද්‍යාගාරය මඟින් 2021 වර්ෂය තුළදී **ගාස්තු අයකරමින් සිදුකරන ලද** පරීක්ෂණ වල වටිනාකම රු. 1,148,307.00 කි. ඉන් 2021 වර්ෂය තුළදී 880,802.00 ක මුදලක් ලැබී ඇති අතර රු. 267,505.00 ක මුදලක් ලැබීමට නියමිතව ඇත.

- ඊට අමතරව 2022 වර්ෂයේදී සිදු කිරීමට නියමිත පරීක්ෂණ සඳහා අත්තිකාරම් වශයෙන් රු. 155,320.00 ක මුදලක් 2021 වර්ෂය තුළදී ලැබී ඇත.
- ඒ අනුව, 2021 වර්ෂය තුළදී රු. 1,036,122.00 ක මුදලක් ජල සාම්පල් පරික්ෂාව සඳහා ලැබී ඇත.තවද **ගාස්තු අයකිරීමකින් තොරව මහවැලි අධිකාරියට අදාළව සිදු කරන ලද** සාම්පල් පරීක්ෂාවල වටිනාකම රු.2,864,485.15 ක් වේ.ඒ අනුව, 2021 වර්ෂය තුළදී **ගාස්තු අය කර සහ නොකර** සිදු කරන ලද සාම්පල වල වටිනාකම රු. 4,012,792.15 ක් වේ.
- තත්ව පාලන පරීක්ෂණාගාරය මඟින් මහවැලි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කෙරෙන ඉදිකිරීම් වල ප්‍රමිතිය උසස් මට්ටමක පවත්වාගෙන යෑමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. එහිදී මහවැලි කලාප වල සිදු කරන ඉදිකිරීම් සඳහා භාවිතා කරන ඉදිකිරීම් ද්‍රව්‍ය වල යෝග්‍යතාවය පිරික්සීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ සිදුකිරීමද එම ඉදිකිරීම්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමද කලාප කාර්යාල වලින් ඉල්ලීම් ලැබෙන පරිදි කරනු ලබයි. එම ඉදිකිරීම් කොන්ත්‍රාතකරුවන් මඟින් හෝ ගොවි සංවිධාන මඟින් සිදුකරගන්නේ නම් පරීක්ෂණ කටයුතු සඳහා ගාස්තු අයකරනු ලැබේ.
- මෙයට අමතරව මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කිරීමට යෝග්‍ය පස් පවතින ප්‍රදේශ හඳුනා ගැනීමට ව්‍යාපෘති බල ප්‍රදේශය තුලින් පස් නියැදි ගෙනවුත් විද්‍යාගාර පරීක්ෂණ සිදුකරන ලදී.
    - 2021 වර්ෂය තුළදී **ගාස්තු අයකරමින් සිදුකරන ලද පරීක්ෂණ** වල වටිනාකම රු. 647,673.23 කි. ඉන් 2021 වර්ෂය තුළදී 113,090.00 ක මුදලක් ලැබී ඇති අතර රු. 534,583.23 ක මුදලක් ලැබීමට නියමිතව ඇත.
    - ඊට අමතරව 2022 වර්ෂයේදී සිදු කිරීමට නියමිත පරීක්ෂණ සඳහා අත්තිකාරම් වශයෙන් රු. 6435.00 ක මුදලක් 2021 වර්ෂය තුළදී ලැබී ඇත.
    - එමෙන්ම 2020 වර්ෂයේදී සිදු කල පරීක්ෂණ සඳහා ලැබිය යුතු රු.110,200.00 ක මුදලක් 2021 වර්ෂය තුළදී ලැබී ඇත.
    - ඒ අනුව, 2021 වර්ෂය තුලදී රු. 229,725.00 ක මුදලක් පස් සාම්පල් පරික්ෂාව සඳහා ලැබී ඇත.

- එමෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) විසින් විශේෂිතව දැනුම් දෙන අවස්ථාවලදී සහ අහඹු ලෙසද මහවැලි කලාප කාර්යාල මඟින් සිදුකරන ඉදිකිරීම් වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමද සිදු කරයි. එබඳු විටදී **ගාස්තු අයකිරීමකින් තොරව** පරීක්ෂණ සිදු කරන අතර 2021 වසරේදී එසේ සිදු කරන ලද තත්ව පරීක්ෂා කිරීම් වල වටිනාකම රු. 117,000.00 ක් වේ.
- ඒ අනුව, 2021 වර්ෂය තුළදී **ගාස්තු අය කර සහ නොකර** සිදු කරන ලද සාම්පල වල වටිනාකම රු. 764,673.23 ක් වේ.





1. ඉහත රාජකාරි වලට අදාළ 2021 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

<u>මූල්‍ය ප්‍රගතිය</u>

අනු අංකය	විස්තරය	වෙන් කිරීම් රු. මි.	ප්‍රගතිය රු. මි.
1	ප්‍රාග්ධන වියදම්	3.150	3.150
2	පුනරාවර්තන වියදම්	22.425	21.944

ජාතික ආර්ථිකයට හා සමාජයට ලබාදුන් දායකත්වය

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාරයාලය මගින් සැලකිය යුතු මූල්‍යමය ඉපයීමක් සෘජු ලෙසම සිදු නොකරන නමුත් ජාතික ආර්ථිකය සහ සමාජීය ප්‍රගමනය කෙරෙහි වක්‍ර දායකත්වයක් ලබා දෙයි.

ජල තත්ව විද්‍යාගාරයේ ක්‍රියාත්මක වීම මගින් පාරිසරික වශයෙන් ජලයේ සිදුවන ගුණාත්මකභාවයන්හි විචල්‍යයන් පහසුවෙන් හඳුනාගැනීමේ හැකියාව ලැබී ඇති අතර මෙම විචල්‍යයන්ගේ දීර්ඝ කාලීන හැසිරීම් අධ්‍යනය කිරීම තුළින් පරිසරයට මූලිකව එකතුවී ඇති පරිසර දූෂකයන්ද නිගමනය කිරීමේ හැකියාව ලැබේ. එය වඩාත් නිවැරදිව හඳුනාගැනීම තුළ ඊට නිසි ක්‍රියාමාර්ගයන්ට එළඹීමේ හැකියාවද ලැබෙන අතර එය අනාගත පරපුර සඳහා වන පාරිසරික ආයෝජනයක්ද වේ.

තත්ව පාලන පරීක්ෂණ සිදුකිරීම මගින් ප්‍රමිතිය නියමිත මට්ටමට නොමැති ඉදිකිරීම් හඳුනාගැනීමට හැකිවන අතර ඒවා යථාවත් කිරීම සඳහා ඒ අවස්ථාවේදීම පිලියම් යෙදීමට මග පාදාගත හැකිවේ. එමගින් නිර්මිත වල ආයුකාලය සැලසුම් කල පරිදි පවත්වාගත හැකිවන අතර වරින්වර අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය අවම කරවයි. එනිසා ඒවායේ ප්‍රතිලාභ ප්‍රජාව වෙත අඛණ්ඩව ලබාදීමට හැකියාව ලැබෙන අතර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දැරිය යුතු පිරිවැය අවම කරගැනීමටද හැකියාව ලැබේ. එය රටෙහි නිෂ්පාදන ආරථිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි.

2.3 විදුලි හා යාන්ත්‍රික අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2002 වර්ෂයේදී කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති සඳහා ශක්‍යතාවයක් පවතින ස්ථාන හඳුනාගන්නා ලදි. ටෙන්ඩර් පටිපාටියට අනුව තරගකාරී මිල ගණන් කැඳවීම මගින් මේ සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගන්නා ලදි. ප්‍රධාන තෝරා ගැනීමේ ක්‍රමවේදය වූයේ ඉඩම සහ භාවිතයට ගන්නා ජලය වෙනුවෙන් විදුලිය විකිණීමෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවනු ලබන රාජ්‍ය භාගයයි.

ඒ අනුව ලබා දෙන රාජ්‍ය භාගය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට සුදුසු කුඩා පරිමාණ ව්‍යාපෘති 10ක් ආරම්භයේදී හඳුනා ගෙන එම ව්‍යාපෘති සඳහා අභිප්‍රාය ලිපි නිකුත් කරන ලදි. ව්‍යාපෘති වැඩභූමියෙහි ස්වභාවය අනුව මෙම රාජ්‍ය භාගය 3.42 % සිට 34.2 % අතර විය. ඉන් පසුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රධාන ගංගාවේ හා යාමනය කරන ලද ජල මාර්ග වල සුදුසු භූමි වල ව්‍යාපෘති ඉදිරිපත් කරන ලද තවත් ආයෝජකයින් 10 දෙනෙකුට අභිප්‍රාය ලිපි ඉදිරිපත් කරන ලදි. යාමනය කරන ලද ජල මාර්ග වල පිහිටි ව්‍යාපෘති වලින් 10 % ක් ද ප්‍රධාන ගංගාවේ පිහිටි ව්‍යාපෘති වලින් 6 % ක්ද ලෙස රාජ්‍ය භාගය අය කර ගැනීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදි. මේ වන විට කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 12ක් සම්පූර්ණ කර ඇති අතර ඉන් ජාතික විදුලි බල පද්ධතියට මෙ.වො. 39.85 ක ධාරිතාවයක් එක් කොට ඇත.

මීට අමතරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් භූමිය මත පිහිටි හා පාවෙන සූර්ය විදුලි බලාගාර ඉදි කිරීම සඳහා සුදුසු ස්ථානද හඳුනා ගෙන ඇත. මෙම ව්‍යාපෘති වල මූලික අරමුණ වනුයේ සාම්ප්‍රදායික ශක්ති ප්‍රභව වන ගල් අඟුරු, තෙල් හා වායු වලින් තොර පිරිසිදු හරිත සූර්ය විදුලි බලය ජනප්‍රිය කරවීමයි.

1. ක්‍රියාත්මකව පවතින කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති:

අනු අංකය	ව්‍යාපෘතිය	ව්‍යාපෘති ආයෝජකයාගේ නම	විදුලි ජනනය ආරම්භ කරන ලද දිනය	රාජ්‍ය භාගය / %	යාමනය කරන / නොකරන ලද	ධාරිතාවය / MW	2021 වර්ෂය සඳහා ආදායම / Rs.
1	ලෙනදොර	කෙන්ට් හයිඩ්‍රෝ (පුද්.) සමාගම, අංක D/1, ගිල්ඩ්ෆෝඩ් වන්දුවංකය, කොළඹ 07.	2013 මැයි	13.0	යාමනය කරන ලද	1.40	5,355,347.57
2	පලාපත්වල (ලෙනදොර)	එනර්ජි ජෙනරේටර්ස් (පුද්.) සමාගම, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01.	2013 මැයි	6.0	යාමනය කරන ලද	6.00	19,572,394.39
3	මාදුරුඔය වම් ඉවුර සොරොව්ව (මාදුරුඔය I)	ඊගල් පවර් (පුද්.) සමාගම, අංක 09, මෝදර විල කර්මාන්ත කලාපය, පානදුර.	2011 ජූනි	34.2	යාමනය කරන ලද	5.00	45,673,497.73
4	මාදුරුඔය වම් ඉවුර 24+140 km බැසුම් ව්‍යුහය (මාදුරුඔය II)	ඊගල් පවර් (පුද්.) සමාගම, අංක 09, මෝදර විල කර්මාන්ත කලාපය, පානදුර.	2013 නොවැම්බර්	27.0	යාමනය කරන ලද	2.00	20,543,845.82
5	බ්‍රැන්ෆෝඩ්	බ්‍රැන්ෆෝඩ් හයිඩ්‍රොපවර් (පුද්.) සමාගම, අංක 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.	2013 අප්‍රේල්	13.1	යාමනය කරන ලද	2.50	5,126,107.83
6	රොස් එස්ටේට්	රොස් හයිඩ්‍රෝ පවර් (පුද්.) සමාගම, අංක 11, ජෝෂප් වීදිය, කොළඹ 04.	2014 සැප්තැම්බර්	10.0	යාමනය කරන ලද	3.80	38,153,624.23
7	කෝලදෙණිය	කෝළදෙනිය හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම, අංක 344, සිරිමංගලවත්ත, මාමීපේ, පිළියන්දල.	2012 අප්‍රේල්	6.0	යාමනය නොකරන ලද	1.20	1,382,914.37
8	ඕවල	එස්කාස් (ඕවල) පවර් (පුද්.) සමාගම, අංක 276, මාබිම, හෙයියන්තුඩුව	2015 අප්‍රේල්	10.0	යාමනය කරන ලද	2.80	27,408,230.32
9	පහළ කොත්මලේ	ලෝවර් කොත්මලේ ඔය හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම, අංක 9/1-5, රාජකීය මාවත, කොළඹ 07	2014 ජූනි	6.0	යාමනය නොකරන ලද	4.80	539,729.00
10	මාදුරුඔය වම් ඉවුර 28+450 km බැසුම් ව්‍යුහය (මාදුරුඔය III)	ඊගල් පවර් (පුද්.) සමාගම, අංක 09, මෝදර විල කර්මාන්ත කලාපය, පානදුර.	2015 අගෝස්තු	3.4	යාමනය කරන ලද	0.60	966,356.09
11	දඹුඑඔය	එච්.පී.ඩී. පවර් (පුද්.) සමාගම, අංක 334, ටී.බී. ජයා මාවත, කොළඹ 10.	2016 අගෝස්තු	10.0	යාමනය කරන ලද	3.25	11,076,646.21
12	අන්කන්ද	එස්කාස් (අන්කන්ද) පවර් (පුද්.) සමාගම, අංක 276, මාබිම, හෙයියන්තුඩුව	2018 සැප්තැම්බර්	10.0	යාමනය කරන ලද	6.50	47,623,968.38
එකතුව						**39.85**	**223,422,661.94**

2. ක්‍රියාත්මක කිරීමට නියමිත කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති:

අනු අංකය	ව්‍යාපෘතිය	ආයෝජකයා	ධාරිතාවය / **MW**	යාමනය කරන / නොකරන ලද	ප්‍රගතිය
1	උකුවෙල	ඔනික්ස් හයිඩ්‍රෝ පවර් කම්පැනි (පුද්.) සමාගම	2.2	යාමනය කරන ලද	ජනන බලපත්‍රය (Generation License) ලබා ගත යුතුය. ලංකා විදුලි බල මණ්ඩලය විසින් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට (Power Purchasing Agreement) ඒම තාවකාලිකව නවතා දමා ඇත.
2	දිග්ගල	එස්කාස් දිග්ගල පවර් (පුද්.) සමාගම	4.4	යාමනය කරන ලද	ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.
3	කිවුල	එස්කාස් කිවුල පවර් (පුද්.) සමාගම	2.8	යාමනය කරන ලද	සැලසුම් වෙනස් වීම නිසා නව පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාවක් (EIA) ලබා දිය යුතුය.
4	නායක්කුඹුර	රැලික් හයිඩ්‍රෝ පවර් ජෙනරේෂන් (පුද්.) සමාගම	0.5	යාමනය කරන ලද	පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සම්පූර්ණ කර ඇත. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙතින් තාවකාලික අනුමැතිය (Provisional Approval) දීර්ඝ කර ගත යුතුව ඇත.
5	චන්ද්‍රිකා වැව	මහවැලි උපදේශන කාර්යාංශය (පුද්.) සමාගම	0.63	යාමනය කරන ලද	පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සම්පූර්ණ කර ඇත. ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිය ඉල්ලා ඇත.
6	කුඹල්ඔළුව I	නෝවුඩ් හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම	2.4	යාමනය නොකරන ලද	ආයෝජකයින් දෙදෙනා අතර පවතින ගැටුම නිරාකරණය කර ගැනීම සඳහා බිම් මැනුමක් සිදු කිරීමට සැලසුම් කර ඇත.
7	කුඹල්ඔළුව II	කුඹල් ඔළුව හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම	1	යාමනය නොකරන ලද	
8	මාදුරුඔය LBL3	නිපොන් නිට් (පුද්.) සමාගම	0.15	යාමනය කරන ලද	පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සිදු කරමින් පවතී. ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් අභිප්‍රාය ලිපිය බලාපොරොත්තුවෙන් සිටියි. මෙම ලිපිය නිකුත් කිරීම තාවකාලිකව ලංකා විදුලි බල මණ්ඩලය විසින් නතර කර ඇත.
9	මොරගොල්ල කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘතිය	සීජියැන් යන්ග් එනර්ජි කම්පැනි (පුද්.) සමාගම	2.1	යාමනය කරන ලද	පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සිදු කරමින් පවතී. ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් අභිප්‍රාය ලිපිය බලාපොරොත්තුවෙන් සිටියි. මෙම ලිපිය නිකුත් කිරීම තාවකාලිකව ලංකා විදුලි බල මණ්ඩලය විසින් නතර කර ඇත.
10	ගැටඹේ	ඒෂියන් හයිඩ්‍රොපවර් ජෙනරේෂන් (පුද්.) සමාගම	10	යාමනය නොකරන ලද	තාවකාලිකව නතර කර ඇත.
එකතුව			**26.18**		

3. ක්‍රියාත්මකව පවතින සූර්ය විදුලි බල ව්‍යාපෘති:

අනු අංකය	ආයෝජකයා	ස්ථානය	ධාරිතාවය / මෙ.වො.	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	වාර්ෂික බදු මුදල / රු.
1	සාගා සෝලාර් පවර්	වලව / මයුරපුර කොට්ඨාසය	10	18.2109	2,880,000.00
2	අයිරිස් ඉකෝ පවර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	18.5	3,240,000.00
3	ඇනාර්වි ලංකා සෝලාර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	18.5	3,240,000.00
4	සෝලාර් වන් සීලෝන් (පුද්.) සමාගම	"බී" කලාපය, සේනපුර කොට්ඨාසය	10	19.5	297,600.00

4. අනෙකුත් සූර්ය විදුලි බල ව්‍යාපෘති වල වර්තමාන තත්වය:

අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වොා.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	වර්තමාන තත්වය
1	සෝල් නැවිටාස් (පුද්.) සමාගම.	වලව / මයුරපුර කොට්ඨාසය	18.2109	10	3,600,000.00	ඉඩම බාර දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2015 වර්ෂයේදී ලබා දී තිබේ. බදු ගෙවමින් පවතී. තවමත් ක්‍රියාත්මක තත්වයේ නොමැත.	අදාළ ලිපිය යවා ඇත.
2	ඉලෙක්සිස් පවර් (පුද්) සමාගම.	වලව / මයුරපුර කොට්ඨාසය	12.14	10	3,874,000.00	කාර්යයන් සිදු කරමින් පවතී. ඉඩම බාර දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2015 වර්ෂයේදී ලබා දී තිබේ. බදු ගෙවමින් පවතී. තවමත් ක්‍රියාත්මක තත්වයේ නොමැත.	අදාළ ලිපිය යවා ඇත.
3	සිජියැංග් යං (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	20.2343	10		අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ. අයිතිය බාර දීමේ ලිපිය අදාළ කලාපය වෙත යොමු කොට ඇත.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
4	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	වලව / මයුරපුර කොට්ඨාසය	19.6	10		බදු ගෙවීමෙන් අනතුරුව ඉඩම බාර දෙනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2017 වර්ෂයේදී ලබා දී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
5	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	වලව / මයුරපුර කොට්ඨාසය	20.21	10		ඉඩම බාර දී ඇත.	අදාළ ලිපිය යවා ඇත.
6	සිනර්ජි කොන්සොලි ඩේටර්	වලව / මයුරපුර කොට්ඨාසය	9.0639			ඉඩම් අංශය වෙත යොමු කොට තිබේ. අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැත. ලිපි ලේඛන නිසි පරිදි සකසා නොමැත.	ලිපිනය වැරදි බවින් ලිපිය ආපසු ලැබී ඇත.
7	ඒෂියන් සන් එඩිෂන්, ඒෂියන් සන් පවර්, ඒෂියන් ඇක්ටිව් සෝලාර්	වලව / මයුරපුර කොට්ඨාසය	24.281			ඉඩම් අංශය වෙත බාර දී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
8	මැක් එනර්ජි (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.1	5		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත බාර දී තිබේ.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
9	පවර් කන්සල්ට්	වලව / මයුරපුර කොට්ඨාසය	8.0	5		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත බාර දී තිබේ.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
10	ඒෂියන් වින්ඩ් පවර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	5		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත බාර දී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
11	ලේක් ලෙෂර් හෝල්ඩින්ස් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	5		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත බාර දී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
12	රැන්ක් හෝල්ඩින්ස් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	5		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත බාර දී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.

අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වොා.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	වර්තමාන තත්වය
අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වොා.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	වර්තමාන තත්වය
13	ග්‍රීන් රිසෝස් මැනේජ්මන්ට් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	5		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත බාර දී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
14	කොළම්බෝ ලොජිස්ටික්ස් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	20.23	10		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
15	ඩබ්බූ ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.72	4.9		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
16	ඔරියන් සෝලාර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.72	4.9		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
17	ටැනිෂ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.72	4.9		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
18	ටනූ ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.72	4.9		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
19	නිධන්‍යායා ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.72	4.9		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
20	ලක්මිණි ජෙම්ස්	වලව / මයුරපුර කොට්ඨාසය	8.09371	5		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
21	ට්‍රාන්ස් ග්ලෝබ් කොන්සොලි ඩේටඩ් (පුද්.) සමාගම	"බී" කලාපය, අසේලපුර කොට්ඨාසය	19.8296	9.8		අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට තිබේ. ඉඩම බාර දී නොමැත.	අදාළ ලිපිය යවා ඇත.
22	පොලොන්නරුව සෝලාර් (පුද්.) සමාගම	"බී" කලාපය, අසේලපුර කොට්ඨාසය	12	5		ඉඩම බාර දීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. පරිසර අනුමැතිය ලැබුණු පසු බාර දීමට උපදෙස් ලැබී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2017 වර්ෂයෙදී ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
23	මිඩ්ලන්ඩ් නේචර් (පුද්.) සමාගම	"බී" කලාපය, සෙවනපිටිය කොට්ඨාසය	141.7	100		ඉඩම බාර දීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කොට තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2017 වර්ෂයේදී ලැබී තිබේ.	අදාළ ලිපිය යවා ඇත.
24	සම්මානි සෝලාර් (පුද්.) සමාගම	"බී" කලාපය, සේනපුර කොට්ඨාසය	10.12	5		බදු අනුමැතිය ලබා ගෙන තිබේ. ක්ෂේත්‍ර කාර්යයන් ආරම්භ කොට නොමැත.	අදාළ ලිපිය යවා ඇත.

අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	වර්තමාන තත්වය
						අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2017 වර්ෂයේදී ලැබී තිබේ. අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී තිබේ. සංවර්ධන කටයුතු ආරම්භ කොට නොමැත. ඉඩම බාර දී ඇත. බදු ගෙවීමෙන් පසුව ඉඩම බාර දීමට නියමිතය.	
අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	ව වර්තමාන තත්වය
25	කාසල් ඒ සෝලාර් (පුද්.) සමාගම	"බී" කලාපය, අසේලපුර කොට්ඨාසය	12	5		ඉඩම බාර දීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. පරිසර අනුමැතිය ලැබුණු පසු බාර දීමට උපදෙස් ලැබී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2017 වර්ෂයේදී ලැබී තිබේ. අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී තිබේ. සංවර්ධන ක්‍රියාවලි ආරම්භ කොට නොමැත.	අදාළ ලිපිය යවා ඇත.
26	ෆයින් ඒනර්ජි සෝලාර් (පුද්.) සමාගම	"බී" කලාපය, අසේලපුර කොට්ඨාසය	10.1171	5		ඉඩම බාර දීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කොට තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2018 වර්ෂයෙදී ලැබී තිබේ. අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට තිබේ. ඉඩම බාර දී නොමැත.	ලිපිනය වැරදි බවින් ලිපිය ආපසු ලැබී ඇත.
27	සන් රයිස් එනර්ජි සෝලාර් (පුද්.) සමාගම	"බී" කලාපය, අසේලපුර කොට්ඨාසය	10.1171	5		ඉඩම බාර දීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කොට තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2018 වර්ෂයේදී ලැබී තිබේ. අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට තිබේ. ඉඩම බාර දී නොමැත.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
28	වීසික්ස් ඉන්ටර්නැෂනල්	රන්සරතැන්න	70.8			මෙම ඉඩම වගා කළ හැකි බැවින් නිර්දේශ කළ නොහැක. මෙම ඉඩම කෘෂිකාර්මික ඉඩමක් ලෙස වෙන්	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.

අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	වර්තමාන තත්වය
						කොට ඇත. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබා ගැනීමට නොහැකි බවට නි.නේ.ව්‍යා.ක (තා/සේ) නිර්දේශ කළ හොත් මෙම ව්‍යාපෘතිය සඳහා නිර්දේශ කිරීම සලකා බැලිය හැක.	
29	නෙඕමා සෝලාර් (පුද්.) සමාගම	"බී" කලාපය	20.2	10		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත යොමු කළ යුතුය. අනුමැතිය ලැබී නොමැත.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
30	පැන්ස්වික් (පුද්.) සමාගම	"බී" කලාපය	18.2	10		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.	අදාළ ලිපිය යවා ඇත.
අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	ව වර්තමාන තත්වය
31	ඩෝල්ටන් ස්ට්‍රීට් පවර් (පුද්.) සමාගම	"බී" කලාපය	20	10		ඉඩම් පරිහරණ සැලසුම් අංශය වෙත යොමු කළ යුතුය. අනුමැතිය ලැබී නොමැත.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
32	වැලිකන් සෝලාර්	"බී" කලාපය, සිංහපුර	18.2			අනුමැතිය ලැබී නොමැත.	අදාළ ලිපිය යවා ඇත.
33	ජෛව සංරක්ෂණ මධ්‍යස්ථානය	"බී" කලාපය	ZE ඇල මාර්ගයේ 10 km දුරක්	4.9		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
34	ජේ. එස්. ටීම් (පුද්.) සමාගම	"බී" කලාපය	10.72	5		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.	අදාල ලිපිය යවා ඇත.
35	රන්සෙත් (පුද්.) සමාගම	"බී" කලාපය	10.72	5		මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.
36	ජේ. එම්. ටී. බී. ජයසිංහ	"බී" කලාපය	අදාළ ලිපිය යවා ඇත.	අදාළ ලිපිය යවා ඇත.	අදාළ ලිපිය යවා ඇත.	අදාළ ලිපිය යවා ඇත.	අදාළ ලිපිය යවා ඇත.
37	ඉකෝ සෝලාර් වන් (පුද්.) සමාගම	මෙම ආයතනය වීසික්ස් ඉන්ටර්නැෂනල් ආයතනය අයත් දැයි පරීක්ෂා කළ යුතුය.					අදාළ ලිපිය යවා ඇත.
38	බින්තැන්න සෝලාර් (පුද්.) සමාගම	"සී" කලාපය, ගිරාඳුරුකෝ	2.6305	1	1,200,000.00	තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරුව ඉල්ලා ඇත.	අදාළ ලිපිය යවා ඇත.

අනු අංකය	ආයෝජකයා ගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / රු.	විස්තරය	වර්තමාන තත්වය
		ටිටේ කොට්ඨාසය				තක්සේරුව ලැබුණු පසු බදු මුදල දන්වනු ලැබේ. අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී තිබේ. දීර්ඝ කාලීන බද්ධ නිකුත් කොට තිබේ. සැලසුම් ලැබුණු පසු ඉඩම බාරදීමට නියමිතය.	
39	මාපාකඩ සෝලාර් (පුද්.) සමාගම	"සී" කලාපය, ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාසය	2.6305	1	128,000.00	තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරුව ඉල්ලා ඇත. තක්සේරුව ලැබුණු පසු බදු මුදල දන්වනු ලැබේ. අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී තිබේ. දීර්ඝ කාලීන බද්ධ නිකුත් කොට තිබේ. සැලසුම් ලැබුණු පසු ඉඩම බාරදීමට නියමිතය.	අදාළ ලිපිය යවා ඇත.
අනු අංකය	ආයෝජක යාගේ නම	**ස්ථානය**	**භූමි ප්‍රමාණය / හෙක්ටයාර**	**ධාරිතාවය / මෙ.වො.**	**වාර්ෂික බදු මුදල / රු.**	**විස්තරය**	**ව වර්තමාන තත්වය**
40	ඌව සෝලාර් (පුද්.) සමාගම	"සී" කලාපය, ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාසය	2.8328	1	148,000.00	තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරුව ඉල්ලා ඇත. තක්සේරුව ලැබුණු පසු බදු මුදල දන්වනු ලැබේ. අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී තිබේ. දීර්ඝ කාලීන බද්ධ නිකුත් කොට තිබේ. සැලසුම් ලැබුණු පසු ඉඩම බාරදීමට නියමිතය.	අදාළ ලිපිය යවා ඇත.
41	සොලිස් එනර්ජි (පුද්.) සමාගම		6.0	1		සැලසුම් ලැබුණු පසු ඉඩම බාරදීමට නියමිතය.	ලිපිනය නොමැති බැවින් අදාළ ලිපිය යවා නොමැත.

සූර්ය විදුලි බල ව්‍යාපෘති වල ප්‍රගතිය

5. ක්‍රියාත්මකව පවතින සූර්ය විදුලි බල ව්‍යාපෘති:

අනු අංකය	ආයෝජකයා	ස්ථානය	ධාරිතාවය / මෙ.වො.	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	වාර්ෂික බදු මුදල / රු.
1	සාගා සෝලාර් පවර්	වලව / මයුරපුර කොට්ඨාසය	10	18.2109	2,880,000.00
2	අයිරිස් ඉකෝ පවර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	18.5	3,240,000.00
3	ඇනාර්වි ලංකා සෝලාර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10	18.5	3,240,000.00
4	සෝලාර් වන් සීලෝන් (පුද්.) සමාගම	"බී" කලාපය, සේනපුර කොට්ඨාසය	10	19.5	297,600.00

6. අනෙකුත් සූර්ය විදුලි බල ව්‍යාපෘති වල වර්තමාන තත්වය:

ආයෝජකයින් විසින් ලංකා විදුලි බල මණ්ඩලය සමග අත්සන් කරන ලද අභිප්‍රාය ලිපිය (Letter of Intent – LOI) ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති බලපත්‍රය / අවසරය අවලංගු කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තීරණය කර ඇත. අදාළ ලිපි ආයෝජකයින් වෙත අදාල ලිපි යවා ඇත.

2.4 ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත, 1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතට අනුව එවකට මහවැලි සංවර්ධන මණ්ඩලය නමින් තිබූ ආයතනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නමින් විශේෂ බලතල පැවරුණු අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙසට පරිවර්තනය කරන ලදී.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය හා කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදිකරනු ලැබූ ප්‍රධාන ජලාශ, වේලි හා අමුණු වැඩිදියුණු කිරීම, ක්‍රියාකරවීම් හා නඩත්තු කිරීම් උදෙසා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුල 1985 දී පිහිටුවා ස්ථාපිත කරන ලද අංශය මූලික වැඩ පාලන ක්‍රියාකරවුම්, මෙහෙයුම් හා නඩත්තු අංශය නමින් හැඳින්විය. මහජනතාවගේ හඳුනා ගැනීමේ පහසුව සඳහා 2019 වර්ෂයේ සිට මෙම අංශය **"ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය"** නමින් හඳුන්වා දී ඇත.

මේ දක්වා ඉදිකර ඇති ප්‍රධාන වේලි හා ජලාශ පද්ධතිය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වත්කමක් ලෙස රජය වෙනුවෙන් භාරකාරිත්වය පැවරී ඇති අතර එම වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පාලනය කරනු ලැබේ. මෙම ප්‍රධාන වේලි හා ජලාශ පද්ධතියේ ඉදිකිරීම් වියදමෙහි සමස්ථ වත්මන් වටිනාකම රුපියල් බිලියන 420ක් පමණ වේ.

මෙම අංශය මඟින්මහජනතාවගේ ආරක්ෂාව තහවුරු වන අන්දමින් ප්‍රධාන ජලාශ වල මෙහෙයුම් කටයුතු සියල්ල ඉටුකරනු ලැබේ. මේ සඳහා අන්තර්ජාතික ජලාශ හා වේලි මෙහෙයුම් පිළිබඳ නූතන තාක්ෂණ ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් ජලය භාවිතා කරන්නන්ට උපරිම ජල අවශ්‍යතාව සැපයේ. ඊට අමතරව පහළ නිම්න වල ගංවතුර හානි අවම කරලීමට අවශ්‍ය ගංවතුර පාලනය කිරීම සඳහා ජලාශ පාලන ගේට්ටු ක්‍රියාකිරීම සිදු කෙරේ.

තවද, ජලාශ හා අන්තර් නිම්න ඇල මට්ටමේ ජල කළමණාකරණ මෙහෙයුම් කටයුතු, ජලාශ හා ඊට අනුබද්ධ නිර්මිත නඩත්තු කිරීම කරන අතර, ජලාශ වල දීර්ඝ කාලීන පැවැත්ම උදෙසා වූ වැඩිදියුණු කිරීම් සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම් හා ජලාශ පද්ධති වලට අදාල පුනුරුත්තාපන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද කරනු ලබයි.

<u>මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන්</u>

පරිපාලනය- වේලි හා ජලාශ වල ජලදේහය, ස්වාරක්ෂක කලාපය(100m Buffer zone) හා ඊට අයත් රක්ෂිත ආරක්ෂා කර ගැනීම උදෙසා වූ රෙගුලාසි ක්‍රියාත්මක කරමින් ජලාශ හා රක්ෂිත වලට අයත් බල ප්‍රදේශ පරිපාලන කටයුතු කිරීම.

ක්‍රියාකරවීම - ජල කළමණාකරණ ලේකම් කාර්යාලයෙන් නිතිපතා ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ජලාශ හා අන්තර් නිම්න ඇල මට්ටමේ සොරොව් ගේට්ටු ක්‍රියාත්මක කිරීම හා ජලාශවල ඉහල සහ පහල නිම්නවල ගංවතුර අවමකරලීම පිණිස ගංවතුර පාලනය සඳහා ගේට්ටු ක්‍රියාකරවීම.

නඩත්තුව- ජලාශ හා එම ජලාශ වලට අනුබද්ධිත වේලි,ගේට්ටු, ජලාශ පර්යන්ත ප්‍රදේශ හා ජලාශයට අනුබද්ධිත සියලු නිර්මිතයන් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව (ICOLD) නඩත්තු කිරීම මෙන්ම වැඩිදියුණු කිරීම.

ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයෙන් පාලනය වන ජලාශ.

ජලාශ	නඩත්තු කරනු ලබන අංගයන්
කොත්මලේ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
පොල්ගොල්ල හැරවුම	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ උමං මාර්ග
බෝවතැන්න	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
දඹුලු ඔය	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
කණ්ඩලම	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
කලාවැව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
වික්ටෝරියා	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
රන්දෙනිගල	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
රන්ටැඹේ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මිණිපේ අමුණ	සොරොව් ගේට්ටු, වාන්දොරටු, අන්තර් නිම්න ඇල, බදුලු ඔය ජල පාලම, උමං මඟ සහ ජල පැන්නුම් වල නිර්මිත
ලොග්ගල්ඔය, හැපොල ඔය හා දිහබාන ඔය මට්ටම් පැන්නුම්	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
උල්හිටිය-රත්කිද	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මාදුරුඔය	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
උඩවලව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
චන්ද්‍රිකාවැව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මොරගහකන්ද	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
පුහුල්පොල	ව්‍යාපෘතියේ වැඩ නිමකර නොමැති අතර නඩත්තු කාර්යන් භාරගෙන නොමැත. අප අංශයේ කාර්ය මණ්ඩලයේ කීපදෙනෙකු ස්ථාපිත කර ඇත.
ඩයරබා	

<u>2021 වර්ෂය තුළ සිදුකළ ජලාශ ආශ්‍රිත පරිසර සංරක්ෂණ කටයුතු</u>


අනු අංකය	විස්තරය	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය රුපියල්
01	ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහන් දිගන, නිලගම සහ කාර්යාල පරිශ්‍රය	90	270,000.00
02	වික්ටෝරියා සහ පොල්ගොල්ල ජලාශ රක්ෂිතයේ ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත්කිරීමේ ශ්‍රමදාන වැඩසටහන්	85	0.00
03	ජලාශ රක්ෂිත වල ඇති ආක්‍රමණික ශාක, ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත් කිරීමේ මාසික වැඩසටහන්	80	306,432.00
04	ජලාශ රක්ෂිතයේ උණ/වනවගා පැල සිටුවීම	90	131,432.00
05	කාර්යාල පරිශ්‍රවල ගෙවතු වගා කිරීම	70	75,000.00
06	කර්මාන්ත හා පරිසර දූෂණ ආයතන සහ ස්ථාන සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවන්	60	0.00
07	ඩෙංගු කමිටු, පරිසර කමිටු සහ සම්බන්ධීකරණ කමිටු සඳහා සක්‍රීය දායකත්වය සැපයූ වැඩසටහන්	90	147,437.25
08	අපජල විශ්ලේෂණ වාර්තා සහ පරිසර බලපත්‍ර ගාස්තු	100	0.00
එකතුව			930,301.25




කොත්මලේ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 173



පොල්ගොල්ල ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 4.1



වික්ටෝරියා ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන721



රන්දෙනිගල ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 801



රන්ඨැඹේ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන1.15



මාදුරුඔය ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන596



බෝවතැන්න ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන56



දඹුලුඔය ජලාශය
ධාරිතාව :ඝණ මීටර් මිලියන 117



කලා වැව ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 123



උල්හිටිය - රත්කිඳ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 145



චන්ද්‍රිකා වැව
ධාරිතාව :ඝණ මීටර්මිලියන 27.7



මිනිපේ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 0.12



උඩවලව ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 268.65



මොරගහකන්ද ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 558



කණ්ඩලම ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 33



පුහුල්පොල ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 0.634



ඩයරබා ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 0.970

2021 වර්ෂය තුළ සිදුකළ විශේෂ ප්‍රගතිය හා ඒ තුළින් ජාතික ආර්ථිකයට සිදුකළ දායකත්වය

අනු අංකය	ජලාශය	විදුලිබල නිෂ්පාදනය සඳහා ජලය සැපයීම (MCM)	විදුලිබල නිෂ්පාදන ධාරිතාවය (KWH)	ජාතික ආදායම (රු.මිලියන)
01	වික්ටෝරියා kwh සඳහා රු. 18.50	2,392.470	977.053 X 10^6	16,248.39
02	රන්දෙනිගල kwh සඳහා රු. 18.50	2,168.640	426.162 X 10^6	7,304.42
03	රන්ටැඹේ kwh සඳහා රු. 18.50	2,539.750	195.793 X 10^6	3,355.89
04	කොත්මලේ kwh සඳහා රු. 18.50	1,056.640	569.333 X 10^6	10,532.66
05	බෝවතැන්න kwh සඳහා රු. 18.50	916.846	94.566 X 10^6	1,749.47
06	මාදුරුඔය kwh සඳහා රු. 11.99	448.730	16.654 X 10^6	199.681
07	පොල්ගොල්ල kwh සඳහා රු. 18.50	1,203.718	212.647 X 10^6	3,604.37
08	මොරගහකන්ද kwh සඳහා රු.18.50	951.780	85.134 X 10^6	1,504.33
09	උඩවලව kwh සඳහා රු.18.50	832.952	14.122 X 10^6	240.07
එකතුව		**12,511.526**	**2,591.464 X 10^6**	**44,735.613**

2.5 ඉඩම් පරිහරණ සැලසුම් අංශය

හැඳින්වීම

තිරසාර සංවර්ධනය අරමුණු කරගත් ඒකාබද්ධ සැලසුම්කරණය ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ කාර්යභාරයයි. ඒ සඳහා භෞතික, ආර්ථික, සමාජයීය සංවර්ධන හා පරිසර කළමනාකරණ ඉලක්ක ඔස්සේ සැලසුම් සකස් කෙරේ. මහවැලි මහ සැලැස්මට අනුව සංවර්ධන ව්‍යාපෘති හා කාර්යයන් සඳහා ඉඩම් හඳුනා ගැනීම හා සැලසුම් සකස් කිරීම ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ මූලික කාර්යයක් වන අතර එහිදී, වර්තමාන ඉඩම් පරිහරණ රටාව අධ්‍යයනය කරමින් අනාගත සංවර්ධනය සඳහා යෝග්‍ය ඉඩම් හා සංරක්ෂණය කළයුතු ප්‍රදේශ වෙන්කරමින් උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම සිදු කරනු ලබයි.

අංශයේ දැක්ම

‘‘තිරසාර ඉඩම් පරිහරණ රටාවක් තුළින් පරිපූර්ණ ජීවන රටාවක්’’

අංශයේ කාර්යභාරයන්

1. සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් හඳුනාගැනීම.
2. ව්‍යාපෘති ප්‍රදේශ වල අදාළ සැලසුම් සැකසීම හා මහවැලි නගර වල යටිතල පහසුකම් ප්‍රවර්ධනය.
3. නව ව්‍යාපෘති ප්‍රදේශ වල නැවත පදිංචි කිරීම සිදුකිරීම.
4. මහවැලි බල ප්‍රදේශ වල සැලසුම් යාවත්කාලීන කිරීම.
5. වාර්ෂික වැඩ සැලසුම් හා ඇස්තමේන්තුව සැකසීම.
6. ඉඩම් බැහැර කිරීම සඳහා ඉඩම් පරිහරණ නිර්දේශ ලබාදීම.

7. මහවැලි ප්‍රදේශ සංවර්ධනයට අදාළ තොරතුරු සිතියම්ගත කිරීම.
8. බණිජ සම්පත් නිස්සාරණයට අදාළ නිර්දේශ ලබාදීම.
9. මහවැලි ජලාශ රක්ෂිත තුළ පිහිටි පෞද්ගලික ඉඩම් වල සංවර්ධන කටයුතු සඳහා නිර්දේශ ලබා දීම.

2021 වර්ෂය තුළ ඉඩම් පරිහරණ අංශයේ ප්‍රගතිය

අනු අංකය	කලාපය	ක්‍රියාකාරකම	වෙන්කරන ලද මුදල	ප්‍රගතිය	ප්‍රගතිය %	
					මූල්‍ය	භෞතික
1	ඊ	GPS ඉඩම් පරිහරණය සැලසුම් කිරීම	0.13	0.13	100	100
2	එච්	ඔලුවැව සහ නෙලුම් වැව වැව් රක්ෂිත මිනුම් කිරීම	0.2	0.2	100	100
3	වලව	අගුනකොලපැලැස්ස නගරයේ නව සති පොළ ඉදිකිරීම	64	62.62	98	95
		අගුනකොලපැලැස්ස නගරයේ නව බස්නැවතුම්පොළ ඉදිකිරීම				
		සුරියවැව නගරයේ DUC කාණු පද්ධතිය ඉදිකිරීම				
		කටුපිල වැව රක්ෂිතයේ මායිම් ගල පිහිටුවීම				
		ඇඹිලිපිටිය නගරයේ මොරකැටිය අතු ඇළෙහි ගේබියන් බිත්ති ඉදිකිරීම				
4	ඩී	පොදු වැසිකිළිය ඉදිකිරීම	3.9	3.09	79	75
		මැදිරිගිරියේ ජලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම				
		නව සතිපොළ ඉදිකිරීම				
		බිසොපුර නගර සංවර්ධනය				
5	සී	ගිරාඳුරුකෝට්ටේ නගරයේ පවතින ජලාපවහන ජාලය ප්‍රතිසංස්කරණය කිරීම	2.107	1.46	69	75
		රත්මල්කඳුර වැව, වීරලන්ද වැව රක්ෂිතය මායිම් කිරීම				
6	එල්	බෝගස්වැව පොදු වැසිකිළි ව්‍යාපෘතිය	1	0.34	34	50
7	ජී	බකමූණ බස් නැවතුම්පොළ වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම	10	10	100	20
8	බී	කළමනාකරණ වියදම්	0.66	0.54	83	
9	ප්‍රධාන කාර්යාලය	සිතියම්ගත කිරීම සහ සැලසුම් සකස් කිරීම සඳහා තොරතුරු සහ මූලික ඉඩම් සමීක්ෂණය.	0.2	0.09	50	
එකතුව			82.197	78.3	95.3	73.5

ඒ අනුව 2021 වර්ෂය තුළ ඉඩම් පරිහරණ අංශය 95.3% මූල්‍ය ප්‍රගතියක් සහ 73.5% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර දැනට ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්හි 2021 වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කරන ලද වැඩ කටයුතු නිම කර ඇත.

ඉඩම් පරිහරණ සැලසුම් අංශය මගින් 2021 වර්ෂය තුළ කරනු ලැබූ කාර්යන් පිළිබඳ තොරතුරු සාරාංශය

1.මහවැලි බල ප්‍රදේශය තුළ විධිමත් භූමි පරිහරණයක් ඇති කරමින් ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් සකස් කරනු ලැබූ උපාය මාර්ගික සැලසුම් මගින් හඳුනාගත් පහසුකම් සංවර්ධනය සඳහා කටයුතු සිදු කිරීම. (වලව කලාපයේ අගුණකොළපැලැස්ස පොළ සහ නව බස්නැවතුම්පොළ, මොරගහකන්ද කලාපයේ බකමුණ බස් නැවතුම් පොළ, ඩී කලාපයේ මී ගස් වැව සතිපොළ, එල් කලාපයේ බෝගස්වැව වැසිකිලිය සහ සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ නගර තුළ පවතින කාණු පද්ධතිය සකස් කිරීම)












2.අපනයනාභිමුඛ සහ ආනයන ආදේශන ජාතික ආර්ථිකයක් කරා යොමු කිරීමට දායකත්වය ලබාදීමට සහ නිෂ්පාදන කර්මාන්ත නගාසිටුවීමේ අරමුණින් ආයෝජන ව්‍යාපෘති සඳහා යෝජිත මහවැලි බී ,සී ,ඩී සහ වලව කලාප තුළින් වසර 30ක දීර්ඝ කාලීන බදු පදනම මත සුදුසු ආයෝජකයින් ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව ආයෝජකයින් සඳහා ඉඩම් ලබා දීම සඳහා සැලසුම් සකස් කිරීම.








3.මහවැලි කලාපයන්හි ගෙවතු ඉඩම් ස්වයංපෝෂිත නිවාස ඒකකයක් ලෙස සංවර්ධනයේදී අනුගමනය කළ යුතු පොදු නිර්ණායක හා සැලසුම් රෙගුලාසි ඉදිරිපත් කිරීමේ වැඩසටහන යටතේ කුඩා භූමි ප්‍රදේශයක, අඩු නිෂ්පාදන පිරිවැයකින්, උසස් තාක්ෂණික ක්‍රමවේද භාවිතා කර වැඩි ගුණාත්මක භාවයකින් යුත් ඵලදාවක් ලබාගැනීමේ අරමුණින් අක්කර ½ ක ගෙවතු ඉඩම සංවර්ධනය කිරීම සඳහා පොදු නිර්ණායක සකස් කිරීම.







4.වයඹ මහ ඇල සහ දැදුරු ඔය වාරි සංවර්ධන ව්‍යාපෘති යටතේ සංවර්ධනය වන භූමි ප්‍රදේශ ,ඒකාබද්ධ ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන සැලැස්මකට අනුකූලව සංවර්ධනය කිරීම සඳහා සැලසුම් හා මෙහෙයුම් සකස් කිරීම යටතේ යෝජිත එම් හා එන් කලාපයන් ආවරණය වන පරිදි භූගෝලීය සීමා හඳුනා ගැනීම,සමාජ ආර්ථික දත්ත රැස් කිරීම හා සිතියම් සකස් කිරීමේ කටයුතු සිදු කිරීම.




5.මහවැලි කලාපයන්හි තෘණ භූමි සඳහා සුදුසු භූමි හඳුනා ගැනීම හා ගොවිපොළ භූමි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කටයුතු කිරීම.(බී කලාපය,සී කලාපය, එල් කලාපය, වලව කලාපය)







6. වලව කලාපයේ හම්බන්තොට කළමනාකරණ අලි රක්ෂිතය ප්‍රකාශයට පත්කිරීම (MER) යටතේ වන අලි කළමනාකරණ ප්‍රදේශය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරි බල ප්‍රදේශයෙන් යටත් වන හෙක්.4700 ක භූමි ප්‍රදේශය සංවර්ධනයට සංවර්ධන යෝජනා සැකසීම සඳහා සමාජ ආර්ථික සමීක්ෂණය සිදු කිරීම.




7. මහවැලි ඉඩම් කාර්යක්ෂමව උපයෝජනය කිරීම සඳහා ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඌණ උපයෝජිත ඉඩම් හඳුනා ගැනීම සඳහා වන විශේෂ වැඩසටහනක් ලෙස එක් එක් කලාපයන්හි ඌණ උපයෝජිත ඉඩම් හඳුනා ගැනීම සඳහා පරීක්ෂා කර, GPS තාක්ෂණය ඔස්සේ මැන සළකුණු කර සිතියම් ගත කිරීම සඳහා කටයුතු කිරීම.



8.මාදුරුඔය හා වස්ගමුව ජාතික වනෝද්‍යානය යාකරමින් ඉදිකිරීමට අපේක්ෂිත වන අලි සංක්‍රමණික මාර්ගය හේතුවෙන් බලපෑමට ලක්වන ඉඩම් හා ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.




9.මහවැලි කලාපයන්හි වාර්ෂික අවසර පත්‍ර, දීමනා පත්‍ර,බලපත්‍ර, නිදහස් දීමනා පත්‍ර ලබා දී ඇති ඉඩම් පැහැදිලිව හඳුනා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද සිතියම් වර්ණ ගැන්වීමේ වැඩසටහන යටතේ වර්ණ ගන්වන ලද සිතියම් ඩිජිටල් කරණය කිරීම. (වලව කලාපය)




10.හම්බන්තොට ආර්ථික කලාපය තුළ සිදුකෙරෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති හා අනාගත සංවර්ධන විභාවතාවයන් සැලකිල්ලට ගෙන මයුරපුර කොට්ඨාස කළමනාකරණ බල ප්‍රදේශය තුළ මහවැලි අධිකාරිය මගින් සංවර්ධන කටයුතු සඳහා වෙන්වී ඇති මෙතෙක් සංවර්ධනය සඳහා ව්‍යුහාත්මක සැලසුම් සකස් කර නොමැති භූමි ප්‍රදේශය සඳහා ප්‍රධාන කලාප 04 යටතේ උපාය මාර්ගික සංවර්ධන සැලසුමක් සකස් කිරීම.


1. වල්සපුගල තෘණ භූමිය ආශ්‍රිත සංවර්ධන කලාපය
2. කෘෂිකාර්මික සංවර්ධන කලාපය
3. සූර්ය බලශක්ති සංවර්ධන කලාපය
4. කර්මාන්ත සංවර්ධන කලාපය




11.ක්ෂේත්‍රය පරීක්ෂා කිරීමෙන් සහ අනාගත සංවර්ධන විභාවතාවයන් හඳුනා ගනිමින් මහවැලි එල් කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා යෝජනා කළ හැකි ඉඩම් හඳුනා ගැනීම සහ සුදුසු ආයෝජන ව්‍යාපෘති යෝජනා කිරීම.




12..මොරගහකන්ද කාබනික කලාපයේ ඉඩම් පරිහරණ රටාව යටතේ කාබනික ආදර්ශ වගාවේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සඳහා එක් එක් කොට්ඨාසයන්හි සිතියම් ඩිජිටල් පිටපත් බවට පත් කිරීම.







13..මහවැලි නිලනිවාස භූමි ප්‍රශස්ත හා ඵලදායි ලෙස උපයෝජනය කිරීමේ අරමුණින් වලව කලාපයේ කඳවුරු භූමි කේෂ්ත්‍ර පරීක්ෂණයක් සිදු කිරීම මගින් හඳුනා ගැනීම හා සිතියම් ගත කිරීම.




14..කේෂ්ත්‍ර පරීක්ෂණය කිරීම, පාර්ශව කරුවන්ගේ රැස්වීම් මගින් නගරය තුළ සංවර්ධන විභවතාවයන් හඳුනා ගනිමින් වලව කලාපයේ මොරකැටිය නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම.





15.ප්‍රධාන කාර්යාලයේ සහ කලාපිය කාර්යාල අවශ්‍යතාවන් මත සිතියම් සකස් කිරීම.



මහවැලි කලාප තුළ ප්‍රශස්ත ඉඩම් භාවිතයක් සඳහා මග පෙන්වීම හා අවිධිමත් ඉඩම් භාවිතය නියාමනය කිරීමේ අරමුණින් මහවැලි කලාප තුල පදිංචි ජනපදිකයන්ගේ ඉල්ලීම් අනුව ගොඩ, වාරි, පදිංචිය හා අනෙකුත් පොදු අවශ්‍යතා සඳහා සැලසුම් අනුව විධිමත්ව අනුබෙදුම් සකසා නිත්‍යානුකූල කිරීම සඳහා 2021 වර්ෂයේ ජනවාරි මස සිට මේ දක්වා යොමුකරන ලද ස්ථාන 794 ක් සඳහා භෞතික සැලසුම් නිර්දේශ ලබා දී ඇත.

මහවැලි බල ප්‍රදේශය තුළ පිහිටි බණිජ සම්පත් තිරසාර ලෙස නිස්සාරණය සඳහා ඉඩම් භාවිතය විධිමත් කිරීම තුළින් ජනපදිකයින්ගේ ආර්ථික හා සමාජීය මට්ටම් ඉහළ දැමීමේ අරමුණින් බනිජ නිස්සාරණ ව්‍යාපෘති 541 ක් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර 2021 වර්ෂය තුළ රුපියල් මිලියන 328.83 පමණ ඉඩම් පරිහරණ ගාස්තු අයකරගෙන ඇත.

2.6 වන හා පරිසර අංශය.

හැදින්වීම:

ශ්‍රී ලංකාවට සමාජ ආර්ථික ප්‍රතිලාභ රැසක් හිමිකර දෙමින් මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක වූ අතර එය කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම සඳහා තිරසාර පරිසර සංරක්ෂණ වැඩපිළිවෙලට අනුගතවන පරිදි ඉදිරියට ගෙන යාමට එහි පාරිසරික සැලසුම්කරුවන් විසින් මූලිකව සැලසුම් කළ අතර එමගින් යෝජිත සංවර්ධන ක්‍රියාවලියේ සෑම පියවරකින්ම සිදුවිය හැකි පාරිසරික බලපෑම් හා විපර්යාස අවම මට්ටමකින් පවත්වාගෙන යාම අරමුණු විය.

ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම හා මහවැලි කලාප වල මහවැලි)පහළ නිම්න වල(ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම හා ජෛව විවිධත්වය හා වටිනා පරිසර පද්ධතීන් සංරක්ෂණය කිරීම හා අනාගතය වෙනුවෙන් සුදුසු සංරක්ෂණ ක්‍රමෝපායන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම පරිසර හා වන සංරක්ෂණ ක්‍රියාදාමයේ මූලික අරමුණ වේමෙහිදී එම ප්‍රදේශවල එනම් ඉහ .ළ මහවැලි ජල පෝශක ප්‍රදේශ තුළ හා පහළ නිම්නයේ ඇති ගැටළු හා හේතු කාරණා ප්‍රායෝගිකව හඳුනා ගැනීම හා ඒ සඳහා තිරසාර විසඳුම් යෝජනාකර ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

දැක්ම:

තිරසර සංවර්ධනයක් උදෙසා මහවැලි ගංගා ද්‍රෝණිය නිරෝගීව හා සවිමත්ව පවත්වා ගැනීම.
(Healthy Mahaweli River Basin for Sustainable Development)

මෙහෙවර :

- සමස්ථ මහවැලි සංවර්ධන කටයුතු පරිසරය සංරක්ෂණය වන අයුරින් ක්‍රියාත්මක කරවීම සඳහා සංවර්ධන කටයුතු මෙහෙයවීම.
- වසර පුරා අඛණ්ඩ ජලධාරාවක් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව පවත්වාගෙනයාම සඳහා ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම.
- මහවැලි ජලදේහයන් හා පහළ මහවැලි ප්‍රදේශවල ස්වභාවික පරිසර පද්ධතිය ආරක්ෂාකර ගැනීමට කටයුතු කිරීම.
- මහවැලි ප්‍රදේශවල ආවේණික ශාඛ හා සත්ත්ව විශේෂ සහ ජෛව පරිසර පද්ධතිය ආරක්ෂාකර ගැනීම සඳහා වන සම්පත සුරැකීම.
- මහවැලි සංවර්ධන කටයුතු හේතුවෙන් ඉවත්වූ වනවගා ප්‍රදේශ වෙනුවට නව වගාවන් යලි ඇති කිරීම.

ප්‍රධාන ක්‍රියාකාරකම්:

1. ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ ක්‍රියාකාරකම්,
2. මහවැලි පහළ නිම්න හා අනෙකුත් මහවැලි කලාපවල සිදුකරන ලද පරිසර සංරක්ෂණය හා කළමනාකරණය ක්‍රියාත්මක වැඩසටහන හා ඒකාබද්ධ ව්‍යාපෘති වල පරිසර සංරක්ෂණය වැඩසටහන් අධීක්ෂණය හා ක්‍රියාත්මක කිරීම,
3. ජාතික පාරිසරික පනත යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයක් ලෙස පාරිසරික බලපෑම් ඇගයීම් කටයුතු පරිපාලනය හා පසුවිපරම් කටයුතු සිදුකිරීම,
4. මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ ව්‍යාපෘතිවල පරිසර සංරක්ෂණ කටයුතුවල පරිසර අනුමැතියේ කොන්දේසි ක්‍රියාත්මක කරවීමට අදාළ කටයුතු හා පසුවිපරම් කිරීම සහ අමාත්‍යාංශය හා මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරවීමට යෝජිත ව්‍යාපෘති වල තාක්ෂණික කමිටු, මෙහෙයුම් කමිටු හා පසු විපරම් කමිටු නියෝජනය කිරීම.
5. රේඛීය රාජ්‍ය ආයතන වලින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු නියෝජනය, ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරවීමට යෝජිත පරිසර ක්‍රියාකාරකම් සම්බන්ධ රැස්වීම් හා වැඩමුළු සඳහා අධිකාරිය නියෝජනය කිරීම හා අභ්‍යන්තර කමිටු නියෝජනය කිරීම.

2021 සමස්ථ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම හා ප්‍රගතිය:

අංකය	අංශය/කලාපය	මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිශතය
01	පරිසර හා වනසංරක්ෂණ අංශය-කොත්මලේ	35.50	25.78	73%
02	මහවැලි කලාප (බී,සී,ඩී,ඊ,ජී,එච්, වලව,හුරුළුවැව, රඹකැන්ඔය(	34.26	32.84	96%
03	ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය රඹකැන්ඔය	1.55	1.55	100%
04	ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය රිදීමාලියද්ද	0.76	0.70	92%
	එකතුව	72.07	60.87	85%

අං.	සැලසුම්ගත වැඩසටහන	ඒකකය	වාර්ෂික ඉලක්කය		ප්‍රගතිය		ප්‍රගති සාරාංශය
			මූල්‍ය/ මි.ුර	භෞතික	මූල්‍ය/ මි.ුර	භෞතික	
1	ජලජ ශාක ව්‍යාප්ත වී ඇති වැව් පිරිසිදු කිරීම මඟින්කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම	මෙ.ටොන්	1.305	160	1.2690	148.5	බී) මෙ.ටොන් 120),සී)මෙ.ටොන් 10),ජී,වලව, එච් කලාපවල)මෙ.ටොන් 1 බැගින්හා (කොත්මලේ)මෙ.ටොන් 8.5) නිෂ්පාදනය කර ඇත.
2	හරිත මාර්ග සංකල්පය ප්‍රචලිත කිරීම	කිමී .	1.75	14	0.833	9	ඩී)4km),ඊ)1Km), වලව)1Km) හුරුළුවැව)3Km) යන කලාප වල වැඩසටහන ක්‍රියාත්මක කර අලුතින් පැල සිටුවීම හා නඩත්තු කටයුතු සිදුකර ඇත.
3	පැල නිෂ්පාදනය මහවැලි) තවාන්, පාසල් ළමුන් හා ගොවීන් මඟින්(	පැල	13.14	819,284	14.144	508,124	මහවැලි තවාන් 07ක පැල නිෂ්පාදනයට මූදල් යොදවා ඇති අතර පාසල් ළමුන් හා ගොවීන් විසින් නිෂ්පාදිත පැල මිලදී ඇත.
4	ඉහළ ජලාධාර හා පහළ නිම්න ප්‍රදේශ ආශ්‍රිත රුක්රෝපණය	පැල	6.99	431,450	5.69	390,720	ලෝක ජලය දිනය, වනාන්තර දිනය හා අළුත් අවුරුදු නැකතට සමගාමීව බී, සී,ඊ, ජී, එච්, වලව, හුරුවැව කලාපවල හා ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ පැල සිටුවා ඇත.
5	හරිත උයන් ඇති කිරීම	උයන්	1.18	5	1.223	3	හුරුළුවැව, ඩී, උඩවලව කලාපවල උයන් පිහිටුවීමට අදාළව මූලික කටයුතු සිදුකර ඇත.
6	පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන	වැඩසටහන්	1.29	80	1.29	75	ඊ, මොරගහකන්ද, වලව, රඹකැන්ඔය කලාපවල හා , ඉහළ මහවැලි ප්‍රදේශය සඳහා වැඩසටහන් පවත්වා ඇති අතර පරිසර අංශය මඟින් ජනතාව දැනුවත් කිරීම සඳහා මහවැලියයි පරිසරයයි නමින් සතිපතා ගුවන් විදුලි වැඩසටහනක් පවත්වා ගෙන යනු ලබයි.
7	විදුලි අලිවැට නඩත්තු කිරීම	කි.මී .	3.455	විවෘත	3.1407	116	මැදිරිගිරිය)36km), රඹකැන්ඔය)10km) , මොරගහකන්ද)70Km), බී)255 km) කලාප වල විදුලි වැට නඩත්තුව හා අලි මිනිස් ගැටුම අවම කිරීමට අදාළ බැටරි, එනජයිසර්, අලිවෙඩි මිලදී ගැනීම් හා නඩත්තු කටයුතු සිදුකර ඇත සී කලාපයේ කෘෂිකර්ම. පුහුණු මධ්‍යස්ථානය වටා ඉදිවන මී.කි8ක විදුලි වැට සඳහා කිමී 4 ක භූමි සකස් කිරීම සිදුකර ඇත.

වගුව :2

සමස්ථ භෞතික ප්‍රගතිය: සැලසුම්ගත වැඩසටහන 2021

ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය සඳහා වූ ක්‍රියාකාරකම්

පරිසර හා වන සංරක්ෂණ අංශය කොත්මලේ -

වර්ග කි 3118.මී.ක් පමණ වූ ශ්‍රී ලංකාවේ මධ්‍යම තෙත් කලාපයට අයත් ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉටු කෙරෙන වාරිමාර්ග හා ජල විදුලි බල උත්පාදන ව්‍යාපෘතියන්ට ජලය සපයන ප්‍රධානම මාර්ගයයි .එමගින් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ මූලික අරමුණට අමතරව රටෙහි බලශක්ති අවශ්‍යතාවය සපුරාලීම සඳහා ජල විදුලි නිෂ්පාදනයට ද දායක වේ .මහවැලි ව්‍යාපාරය ආරම්භක අවස්ථාවේදී %50කට ආසන්නව පැවති මෙම ජල විදුලි නිෂ්පාදන හැකියාව රටෙහි බලශක්කි අවශ්‍යතාවය මත හා දේශගුණික විපර්යාස හා වෙනත් ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් මෙලෙස රැස්කරන ජලය භාවිතා කිරීම හේතුවෙන් ජලවිදුලි නිෂ්පාදනයට දායක වන ප්‍රමාණය අඩු වුවද දැනටද මහවැලි ජලාශ මගින් නිෂ්පාදනය වන ජල විදුලිය ප්‍රමාණය මගින් රටතුළ ජාතික බලශක්ති අවශ්‍යතාවය සඳහා විශාල දායකත්වයක් ලබා දෙයි මීට අමතරව පානීය . ජලඅවශ්‍යතාවය හා කෘෂිකර්මාන්තය සඳහා වූ ජල අවශ්‍යතාවය සඳහා දායකත්වය ඉන් ඉහළ අගයක් ගනී . විශේෂයෙන්ම මහවැලි වැඩසටහනේ දිගු කාලීන ප්‍රතිඵල ශ්‍රී ලංකාවට ලබාගත හැකි වනු ඇත.

ඉහළ ජලාධාර සංරක්ෂණ ක්‍රියාකාරකම්

- නිරසාර පාරිසරික ක්‍රමවේදයන් හරහා ඉහළ ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය හා පාංශු ඛාදනය අවම කිරීම තුලින් වාරි හා ජල විදුලිය නිෂ්පාදනයේ තිරසාරත්වය තහවුරු කිරීම.
- විශේෂයෙන් කෘෂිකාර්මික ඉඩම්වල ජෛව හා යාන්ත්‍රික පාංශු සංරක්ෂණය හා ජල කඳුරු සංරක්ෂණය.
- විවිධ වන වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගොවි පුහුණු වැඩසටහන්.
- ජෛවවිවිධත්ව සංරක්ෂණ වැඩසටහන්.
- පැළ තවාන් මගින් පැළ නිෂ්පාදනය කිරීම හා දේශීය පැළ අවශ්‍යතාවය සඳහා ලබාදීම.
- පැළ නිෂ්පාදනය සඳහා පාසැල් ළමුන් සම්බන්ද කර ගැනීම සඳහා මහවැලි තුරු ඉතුරුම්වැඩ සටහන් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ගොවීන් සම්බන්ධකර ගනිමින් පැළ නිෂ්පාදනය කිරීම හරිත රැකියා) (උත්පාදනය

- පටක රෝපණ තාක්ෂණය මගින් ජලාශ රක්ෂිත සංරක්ෂණය සඳහා උණ ශාක නිෂ්පාදනය හා රෝපණය සඳහා ලබාදීම.
- පාරිසරික සංරක්ෂණ කාර්යයන් පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීම සඳහා පාරිසරික ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා ගෙන යාම.
- මහවැලි පවිත්‍ර ගංගා වැඩසටහන යටතේ,
    a) ජල විද්‍යාත්මක දත්ත ලබාගැනීම එකී දත්තයන් සංවර්ධන කාර්යයන් සඳහා උචිත ලෙස යොදා ගැනීම.
    b) ජලපෝෂක ප්‍රදේශයේ ජලතත්ව අධ්‍යන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
    c) ඉහළ මහවැලි ජල පෝෂකය තුළ හා මහවැලි කලාපවල ඇති රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධීකරණය හා එකී ආයතන ජල පෝශක සංරක්ෂණ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම හා ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
    d) ගංගා ඉවුරු සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
    e) ජලාශ හා ජල පෝෂක ප්‍රදේශවල පැතිර ඇති ආක්‍රමණශීලි සත්ව හා ශාක විශේෂ මර්ධනය කිරීමට කටයුතු කිරීම.
    f) ඝන අප ද්‍රව්‍ය හා අප ජලය මහවැලි ගඟට එක් කිරීම අවම කිරීමේ කාර්යයන් සිදු කරනු ලබයි.

මහවැලි කලාප තුළ ක්‍රියාත්මක පරිසර සංරක්ෂණ වැඩසටහන

මහවැලි කඩිනම් සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් බලපෑමට ලක්වූ ස්වභාවික පරිසර පද්ධති සංරක්ෂණය කිරීම ,විශේෂයෙන්ම එම කලාපවල වැඩිවන ජනගහනය හේතුවෙන් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු නිසා පාරිසරික හා සාමාජීය වශයෙන් ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පරිසර අංශයේ මග පෙන්වීම යටතේ සිදුවේ .

ඒ යටතේ මූලිකවම පහත පරිසර ක්‍රියාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

I. වන ගහනය වැඩිකිරීම සඳහා වූ අවශ්‍ය පැල තවාන් ආරම්භ කිරීම හා නඩත්තු කිරීම.
II. ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ ජලාශ රක්ෂිත ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම හා වනගහනය , වැඩිකිරීම සඳහාවූ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
III. මහවැලි ජානපදිකයින් හා පාසැල් ළමුන් සඳහා පරිසර අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
IV. ජලයේ ගුණාත්මක භාවය සුරැකීම සඳහා ජල තත්ව පරීක්ෂාව හා මූලික දත්ත පද්ධතියක් පවත්වා ගැනීම හා ජනතාව දැනුවත් කිරීම.
V. පහල නිම්න බල ප්‍රදේශ තුළ ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා තිරසාර සංවර්ධනය තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ හා හා නිර්දේශ ලබාදීම.
VI. වන පැල , පළතුරු පැල ඖෂධ පැල නිෂ්පාදනය හා එතුළින් රටතුළ වන ආවරණය ඉහළ දැමීමට කටයුතු කිරීම.
VII. මහවැලි බල ප්‍රදේශ තුළ ජෛව විවිධත්ව සංරක්ෂණය හා ජෛව නිෂ්පාදන අඩපන කරන ආක්‍රමණශීලී ජීවී විශේෂ ව්‍යාප්තිය පාලනය
VIII. මහවැලි ගංඟා හා අනෙකුත් ගං ඉවුරු ආශ්‍රිත සංරක්ෂණ ක්‍රියාවලිය
IX. මිනිසුන් සහ වන ජීවීන් අතර ගැටුම් කළමනාකරණය තුළින් වන ජීවීන් හා සහජීවන පැවැත්මක් තහවුරු කිරීම ජීව වැට ඉදිකිරීම හා ,අලිමිනිස් ගැටුම අවම කිරීම සඳහා විදුලි වැට ඉදිකිරීම . නඩත්තු කිරීම.
X. පරිසර හිතකාමී ප්‍රවර්ධනය හා හරිත රැකියා ප්‍රවර්ධනය
XI. පරිසර හිතකාමී ජීවන රටාවකට ජනතාව හුරු කරවීම හා හරිත නගර හා හරිත ගම්මාන මහවැලි ගම්මාන තුළ ප්‍රවර්ධනය කිරීම.

තුන්වැනි පරිච්ඡේදය

3.0 සංවර්ධන අංශය

3.1 ඉඩම් අංශය

හැඳින්වීම :-

සීමිත සම්පතක් වන ඉඩම් යහපත් කළමනාකරණ විධි මඟින් මහවැලි බලප්‍රදේශ තුළ පදිංචි ප්‍රතිලාභී ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්වය වැඩි දියුණු කිරීමට දායකවීම.

ඉඩම් අංශයේ කාර්යභාරය :-

01. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පුද්ගලයින් වෙත ඉඩම් ලබාදීම හා පසු කටයුතු


මහවැලි විශේෂ බල ප්‍රදේශයන්හි පිහිටි රජයේ ඉඩම් පරිපාලනය හා කළමනාකරණය කිරීම ඉඩම් අංශයේ ප්‍රධාන කාර්යභාර්ය වේ. ඉඩම් නොමැති පුද්ගලයින් වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පදිංචියට මෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහාද ඉඩම් බෙදාදීමත්, ඊට අදාළ වන පසු කටයුතු සිදු කරනු ලබයි.

02. රජයේ ඉඩම් ආඥා පනත යටතේ පුද්ගලයින් වෙත ඉඩම් ලබාදීම හා පසු කටයුතු

වාණිජ ආයෝජන ව්‍යාපෘති, නිවාස, රජයේ ආයතන හා ආගමික ස්ථාන ආදිය වෙනුවෙන් දීර්ඝ කාලීන බදු පදනමින් ඉඩම් බැහැර කිරීම මෙන්ම බදු ආදායම් රැස් කිරීම සහ ඒ හා සම්බන්ධ පසු කටයුතු රජයේ ඉඩම් ආඥා පනතේ ඇති ප්‍රතිපාදන මත සිදු කිරීමත් මෙම ඉඩම් අංශය මඟින් සිදු කරනු ලබයි.

මූල්‍ය ප්‍රගතිය - 2021


කලාපය	මූල්‍ය ඉලක්කය රු.(මි)	ප්‍රගතිය
බී	19.90	19.82
සී	20.00	20.00
ඩී	19.50	19.36
එච්	26.10	26.10
එල්	15.00	14.31
වික්ටෝරියා	20.07	20.07
හුරුළුවැව	10.00	9.18
මොරගහකන්ද	15.80	15.80
වලව	18.80	18.56
රඹකැන්ඔය	39.98	51.41
ප්‍රධාන කාර්යාලය	10.00	0.72
එකතුව	**215.55**	**215.33**



ප්‍රදානපත්‍ර ලබාදීම

ඉඩම් සංවර්ධන ආඥා පනත - 2021

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	13,000	7,026
සී	13,000	5,184
ඩී	1,500	1,010
එච්	11,500	6,058
එල්	9,000	3,150
වික්ටෝරියා	1,200	230
හුරුළුවැව	2,300	1,043
මොරගහකන්ද	3,000	2,387
වලව	43,000	8,431
රඹකැන්ඔය	2,500	1,018
එකතුව	**100,000**	**35,537**



රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍ර/බදුකර ලබාදීම - 2021

කලාපය	ඉලක්කය	දීමනාපත්‍ර/ බදුකර ප්‍රගතිය
බී	19	16
සී	370	16
ඩී	-	05
එච්	-	122
එල්	-	01
වික්ටෝරියා	-	-
හුරුළුවැව	-	01
මොරගහකන්ද	140	16
වලව	-	69
රඹකැන්ඔය	-	-
එකතුව	**529**	**246**

රජයේ ඉඩම් ආඥා පනත යටතේ විභාරස්ථාන දීමනාපත්‍ර ලබාදීම - 2021

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	-	06
සී	28	01
ඩී	04	-
එච්	-	01
එල්	-	-
වික්ටෝරියා	--	--
හුරුළුවැව	-	-
මොරගහකන්ද	06	02
වලව	-	03
රඹකැන්ඔය	-	-
එකතුව	**38**	**13**

රාජ්‍ය ආයතන සඳහා ඉඩම් ලබාදීම - 2021

	පැවරුම් නියෝග		ඉඩම් භාරදීම	
කලාපය	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
බී	-	-	-	-
සී	81	03	71	01
ඩී	05			
එච්	-	10	-	-
එල්	-	01	-	-
වික්ටෝරියා	--	--	--	--
හුරුළුවැව	-	01	-	-
මොරගහකන්ද	15	02	-	-
වලව	-	-	-	10
රඹකැන්ඔය	-	23	-	-
එකතුව	**101**	**40**	**71**	**11**

3.2 කෘෂිකර්ම සංවර්ධන අංශය

කාර්යභාරය

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි කලාප වල පදිංචි ගොවියන්ගේ ආර්ථිකය ඵලදායි ලෙස වැඩිදියුණු කිරීම උදෙසා පරිසර හිතකාමී කෘෂි තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා හුරුකිරීම සඳහා ගොවීන් පුහුණු කිරීම.
- ආහාර නිෂ්පාදන ජාතික ඉලක්කයන්ට අනුව මහවැලි වාරි හා වාරි නොවන ඉඩම් වල බෝග වගාව, සත්ව නිෂ්පාදනය හා කෘෂි ව්‍යාපාර ඇති කිරීම සඳහා වාර්ෂික ඉලක්කයන් සකසා ගැනීම.
- වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන වලට අනුකූලව ව්‍යාප්ත ඉලක්ක හා උපක්‍රම සැලසුම් සකස් කිරීම, ඒවා කලාප මට්ටමින් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කරවීම, පසුවිපරම අධීක්ෂණය හා වාර්තා කිරීම.

2021 වර්ෂයේ අයවැය මඟින් කෘෂි ඵලදායි වැඩසටහනට මුල්‍ය ප්‍රතිපාදන ලබාදීම

2021 වර්ෂය සඳහා කෘෂිකර්ම නිෂ්පාදන ඵලදායිතා වැඩසටහනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් රු.මිලි . 821.22 ක මුල්‍ය ප්‍රතිපාදන අනුමත කරන ලද අතර එය පහත දැක්වෙන පරිදි මහවැලි කලාප සඳහා වෙන්කර ලබාදෙන ලදී.

කලාපය	වෙන්කළ මුදල (රු.මී)
බී	84.5
සී	82
ඩී	25.196
ඊ	10
ජී	76.434
එච්	170
හුරුළුවැව	72
එල්	67
රඹකැන්ඔය	99.14
උඩවලව	106.152
ප්‍රධාන කාර්යාලය	28.802
එකතුව	**821.224**

2021 කෘෂි ඵලදායිතා වැඩ සටහන සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

ඉහත සඳහන් පරිදි කෘෂි ඵලදායිතා වැඩසටහන තුළ කලාපය සඳහා වෙන්කල ප්‍රතිපාදන එම වැඩසටහනේ මූලික සැලසුම් වලට අනුව වියදම් කිරීම සඳහා සැලසුම් කරන ලදී.

2021 වර්ෂයේ කෘෂිකර්ම ඵලදායිතා වැඩසටහනට අනුව අනුමත ක්‍රියාත්මක සැලසුම් වලට අනුව පහත ප්‍රගතිය ලභා කරගෙන ඇත.

ක්‍රියාකාරකම	**ඉලක්කය (රු.මි)**	**ප්‍රගතිය (රු.මි)**
ආනයනය සීමා කර ඇති භෝග වගා කිරීම වී බෝගය හැර) අනෙකුත් ආනයනය සීමා කර ඇති බෝග (	44.110	40.2
ආදර්ශ ගෙවතු තෝරාගෙන සංවර්ධනය කිරීම හා හොඳම ගෙවත්ත තේරීම	76.49	75.5
කලාපීය මට්ටමින් තෝරාගත් වගා ළිං ඉදි කිරීම	63.000	47.25
කලාපීය මට්ටමින් තෝරාගත් වගා ළිං වැඩිදියුණු කිරීම	28.325	14.5
කලාපීය මට්ටමින් සූර්යබල ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීම	24.625	30.5
කලාපීය මට්ටමින් අක් 2/1 .ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීම	37.250	26.08
කලාපීය මට්ටමින් ආරක්ෂිත ගෘහ ස්ථාපනය කිරීම	51.555	40.75
ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා වී හා අතිරේක බෝග බීජ ලබා දීම	38.321	34.42
ආදර්ශ යාය වැඩසටහන්	33.299	32.4
ගොවි නිලධාරී පුහුණු හා කෘෂි ව්‍යාප්ති වැඩසටහන්/	24.075	24.64
ගොවිපල පැල තවාන් සංවර්ධන වැඩසටහන් /	204.854	146.76
වෙනත් වැඩසටහන් ක්‍රියාකාරකම්/	195.32	191
එකතුව	**821.224**	**704**

සියළුම කලාප වල 2021 වර්ෂයේ ලබාදී ඇති ප්‍රතිපාදන වලට අනුව භෞතික ක්‍රියාකාරකම් සාර්ථකව ඉටුකිරීමට කාර්ය මණ්ඩලය උනන්දුවෙන් මෙම භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට ක්‍රියාකර ඇත .

ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්ක	ප්‍රගතිය
ආදර්ශ ගෙවතු තෝරාගෙන සංවර්ධනය කිරීම හා හොඳම ගෙවත්ත තේරීම	ගෙවතු	214,970	201,154
කලාපීය මට්ටමින් තෝරාගත් වගා ළිං ඉදි කිරීම	ළිං	372	315
කලාපීය මට්ටමින් තෝරාගත් වගා ළිං වැඩිදියුණු කිරීම	ළිං	1,714	857
කලාපීය මට්ටමින් සූර්යබල ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීම	පද්ධති	122	122
කලාපීය මට්ටමින් අක් 2/1 .ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීම	පද්ධති	874	504
කලාපීය මට්ටමින් ආරක්ෂිත ගෘහ ස්ථාපනය කිරීම	ගෘහ	257	210
ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා වී හා අතිරේක බෝග බීජ ලබා දීම	කි.ග්‍රෑ .	161,707	144,070

ආදර්ශ යාය වැඩසටහන්	යාය	80	78
ගොවි/නිලධාරී පුහුණු හා කෘෂි ව්‍යාප්ති වැඩසටහන්	වැඩසටහන්	1,082	1,223
වෙනත් වැඩසටහන්/ක්‍රියාකාරකම්	වැඩසටහන් / ක්‍රියාකාරකම්	1,706	1,671
කාබනික පොහොර නිෂ්පාදනය	මෙට්‍රික්	355,092	158,060
ග්ලිරිසීඩියා වගාවප්‍රවලිත කිරීම	පැල	5,000,000	369,025
ගෙවතු වගාව සඳහා මාර්ගෝපදේශය ලබාදීම	පොත්	214,970	194,049
ගෙවතු වගාව සඳහා බීජ කට්ටල ලබාදීම	බීජ කට්ටල	214,970	195,164
ගෙවතු වගාව සඳහා රෝපණද්‍රව්‍ය ලබාදීම	පැල කට්ටල	107,485	101,618

- 2021/22 මහ කන්නයේදී හරිත කෘෂිකර්ම ප්‍රතිපත්තිය යටතේ මහවැලි බල ප්‍රදේශ වල ගොවීන් සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර ගොවීන්ගේ නිෂ්පාදන ඉලක්කය මෙ.ටො. 190,448ක් වූ අතර ළඟාකරගත් ප්‍රගතිය මෙ.ටො 131,094ක් විය. මහවැලි කලාප තුළ සමස්තයක් ලෙස කොම්පෝස්ට් නිෂ්පාදන ප්‍රතිශතය 69%ක් විය.
- 2021 වර්ෂය තුළදී මහවැලි ගොවිපල 17න් ගොවිපල 8ක් ලාභ ලැබීමට සමත් විය.
- මහවැලි කලාප තුළ තුන්වන කන්නයේ මුං වගාව හෙක්. 6,767ක සිදු කිරීම විශේෂ ජයග්‍රහණයක් විය. එමගින් බෝග තීව්‍රතාවය 150%කින් වැඩි විය.

බෝග නිෂ්පාදනය ප්‍රගතිය සහ දායක්වය - 2020/21 මහ සහ 2021 යල කන්නය

බෝගය	2020/21 මහ		2021 යල		2021 එකතුව	
	වපසරිය හෙක්	නිෂ්පාදනය මෙ.ටොන්	වපසරිය හෙක්	නිෂ්පාදනය මෙ.ටොන්	වපසරිය හෙක්	නිෂ්පාදනය මෙ.ටොන්
වී	96,026	556,951	86,979	504,480	183,005	1,061,431
බඩඉරිඟු	6,628	33,141	1,431	7,155	8,059	40,296
මිරිස්	308	2,775	525	4,728	834	7,503
සෝයා	23	53	2,582	5,939	2,605	5,992
ලොකුළූණු			915	18,294	915	18,294
මුං	1,257	1,886	6767	10150	8024	12.036
කව්පි	213	277	623	810	837	1,088
රටකජු	416	1,041	591	1,478	1,008	2,519
එදු	278	416	2034	3052	2,229	3,343
කුරක්කන්	347	834	226	543	574	1,377
තල	95	81	788	670	883	750
අල වර්ග	898	13,463	1,104	16,560	2,002	30,023
එලවළු	3,688	55,323	4,484	67,255	8,172	122,579
පළතුරු			12,882	193,234	12,882	193,234

ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන තුළ ජාතික ආහාර නිෂ්පාදනයට දායක වෙමින් හෝ ආර්ථිකය සරු කිරීම හා නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම ඉතා සාර්ථකව ඉටුකර ඇත.

වී වගාව ප්‍රවර්ධනය සඳහා වන වැඩසටහන්





අතිරේක බෝග වගාව ප්‍රවර්ධන වැඩසටහන්





ගොවි පුහුණු සහ දැනුවත් කිරීම්









මහවැලි ගොවිපල තුල බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

3.3 ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය

හැදින්වීම

කෘෂිකර්මාන්තයට අමතරව,මහවැලි ජනපදිකයින්ගේ ආදායම් නගා සිටුවීමේ විකල්ප මාර්ගයක් ලෙස ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍ර හඳුනා ගෙන ඇත.එසේම,කිරිගව පාලනය ගෘහ ආර්ථිකය තුළ විශාල කාර්යයභාරයන් ඉටු කරන බැවින් පශු සම්පත් ක්ෂේත්‍රය තුළ වැඩි ප්‍රමුඛත්වයක් හිමි වේ.තව ද පෝෂණමය වැදගත්කම ,ග්‍රාමීය ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම හා ආහාර සුරක්ෂිතතාවය සලකා බැලීමේ දී කිරි හා අතුරු නිෂ්පාදන වැදගත් තැනක් ගනී.එමෙන්ම අහිතකර කාළගුණික තත්ව යටතේ බෝග වගාවට සිදු විය හැකි අවදානම සහ බෝග නිෂ්පාදනය සඳහා සාපේක්ෂව ඉහළ නිෂ්පාදන පිරිවැයක් දැරීමට සිදුවීම යන කරුණු සැලකීමේ දී ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම සඳහා වඩාත් යෝග්‍යතා විකල්ප ආදායම් ප්‍රභවයක් ලෙස මිරිදිය ධීවර හා කිරි යන අංශ හඳුන්වා දිය හැකි අතර දැනට මහවැලි ගොවීන් අතර මෙම ක්ෂේත්‍ර පුළුල් ලෙස ව්‍යාප්තව පවතී.

මහවැලි බල ප්‍රදේශය තුළ පශු සම්පත් හා ධීවර යන ක්ෂේත්‍ර සඳහා පවතින විභවය හා යෝග්‍යතාව සලකා බැලීමේ දී එහි සිටින කිරිගව,එළගව,එළු සහ කුකුළු ගහනය ඇතුළත් විශාල සත්ත්ව ගහනයක් සිටීම,මිරිදිය ධීවර කටයුතු සඳහා සුදුසු ප්‍රමාණවත් අභ්‍යන්තර ජලාශ ප්‍රමාණයක් තිබීම,ක්ෂේත්‍රයේ යෙදුණු විශාල ගොවීන් පිරිසක් සිටීම සහ මහවැලි හා අනෙකුත් රේඛීය ආයතන ඒකාබද්ධව ලබා දෙන තාක්ෂණික සහය හඳුන්වා දිය හැක.

මෙම තත්වය හමුවේ,මහවැලි කලාප තුළ පශු සම්පත් හා මිරිදිය ධීවර යන ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීම,අදාළ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය,අවශ්‍ය තාක්ෂණික නායකත්වය හා කළමණාකරණ සහය ලබා දීම ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය මගින් සිදු කරයි.

දැක්ම

සත්ව නිෂ්පාදන තුළින් මහවැලි පදිංචිකරුවන්ගේ පවුල්වල ආදායම් මට්ටම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම.

මෙහෙවර

සත්ත්ව නිෂ්පාදන ඵලදායීතාව හා ලාභදායීතාව ඉහළ නැංවීම තුළින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම හා රටේ දළ දේශීය නිෂ්පාදනයට දායකවීම සඳහා වූ තිරසාර නිෂ්පාදන කාර්යය සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම.

2021 සඳහා අපේක්ෂිත ඉලක්ක

- වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 40 දක්වා වැඩි කිරීම සහ ජාතික කිරි අවශ්‍යතා සපුරාලීම සඳහා වන දායකත්වය වැඩි කිරීම(ජාතික දායකත්වය 8%).
- වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 11000 දක්වා ඉහළ නැංවීම සහ ජාතික දළ දේශීය නිෂ්පාදන දායකත්වය 11% දක්වා වැඩි කිරීම
- වාර්ෂික බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන 60 දක්වා වැඩි කිරීම.
- වාර්ෂික විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය යුගළ මිලියන 37 දක්වා ඉහළ නැංවීම.
- ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලන අතරම සත්ව නිෂ්පාදන හරහා පදිංචිකරුවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.
- කාර්යක්ෂම හා ඵලදායී තාක්ෂණික ව්‍යාප්තිය සහ යෙදුම සහතික කිරිම.
- නිසි පශු වෛද්‍ය සේවාවක් සැපයීම සම්බන්ධීකරණය තුළින් සත්ව සෞඛ්‍යයේ ආරක්ෂාව සහතික කිරීම.
- අගය එකතු කළ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරණ ජාලය ශක්තිමත් කිරීම.
- කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සහ පදිංචිකරුවන්ගේ ගෘහ ආදායම වැඩි කිරීම.

ධීවර හා සත්ව පාලන කළමනාකරණයේ ව්‍යාපෘති ක්‍රමවේදය ප්‍රධාන ක්ෂේත්‍ර හතරකින් සමන්විත වේ.

- කිරි නිෂ්පාදන සංවර්ධනය
- කුකුළු පාලනය
- මිරිදිය ධිවර කර්මාන්තය
- විසිතුරු මත්ස්‍ය වගාව

1. කිරි ගව සංවර්ධන වැඩසටහන

මහවැලි ප්‍රදේශවල ක්‍රියාත්මක කිරි ගොවිපල ප්‍රධාන වශයෙන් සතුන් 2-5 යුත් කුඩා පරිමාණ ඒකකයන්ගෙන් සමන්විතය .එසේම මධ්‍ය පරිමාණ හා වාණිජමය වශයෙන් කිරි කර්මාන්තයෙහි නියැලුනු ගොවි පිරිසක්ද සිටී. සම්පත් ලබා ගැනීමේ හැකියාව හා මුල්‍ය හැකියාව පදනම්ව, ගොවීන් සූක්ෂ්ම, අර්ධ සූක්ෂ්ම හා නිදැලි ගව කළමනාකරණ ක්‍රමයන් අනුගමනය කරයි ගව ගහනයෙන් සාපේක්ෂව අඩු .ප්‍රතිශතයක් ජර්සි සහ ජර්සි සහිවාල්- දෙමුහුම්ප්‍රභේදයන්ගෙන් සමන්විත වන අතර වැඩි ,ප්‍රතිශතයක් දේශීය සහ සහීවාල් යන ප්‍රභේදවලින් වලින් යුක්ත වේ. මෙම ප්‍රදේශහෙහි මී ගව ගහනය තුළ මූරා නිල් රවි සහ ඔවුන්ගේ දෙමුහුම් ,ප්‍රභේද බහුලව දක්නට ලැබේ.

ගොවීන් සතුන්ගේ ආහාර අවශ්‍යතාවය සපුරාලීම සඳහා තණකොළ සහ සාන්ද්‍ර ආහාර යන දෙකම යොදා ගනී . වගා කරන ලද තෘණප්‍රභේදවලට CO3 සහ බ්‍රැකේරියා ඇතුළත් වේ .ප්‍රදේශවල හරිත තෘණ සීමිත වන විට වියළි කාලය සඳහා භාවිතා කරන අනෙකුත් ආහාර සංරක්ෂණ ක්‍රම වන පිදුරු සහ සයිලේජ් නිෂ්පාදනය යොදා ගනී. මහවැලි ප්‍රදේශයේ කිරි එකතු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වන්නේ මිල්කෝ, නෙස්ලේ, කොත්මලේ, පැලවත්ත වැනි සමාගම් ය,රිච් ලයිෆ් ,සෙසු කණ්ඩායම් වශයෙන් කිරි එකතු කරන්නන්ගේ සමූපකාර සමිති . කඩුවෙල, සීඅයිසී, වෙලෝ, කාගිල්ස් සහ මහවැලි ගොවිපල සහ පෞද්ගලික එකතු කරන්නන් ද මෙම කටයුත්තට සම්බන්ධ වී කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කරයි.

මේ වන විට කුඩා පරිමාණ සහ ව්‍යාපාර අරමුණු කරගත් කිරි ගොවීන් 749 12ක් පමණ කිරි කර්මාන්තය තුළ නියැලී සිටිඅවසන් වන විට සමස්ථ 2021 . දියර කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 42 කිදෙනිකව දියර කිරි . ලීටර් 100,000 ක් පමණ නිපදවන අතර ඉහත සමාගම් වෙත අලෙවිය මූලික අරමුණ වේ මීට අමතරව සුළු . ප්‍රමාණයක් දියර කිරි පරිභෝජනය සඳහා යොදා ගැනේකිරි ලීටරයක සාමා .න්‍ය මිල රු2021 ක් වන අතර 80 . වර්ෂයේ ද මහවැලි ගොවීන් කිරි නිෂ්පාදනයෙන් ලැබූ ආදායම රු මිලි කිරි සැපයුම් සහ .කි 3360.00. බෙදාහැරීම් ජාලය ශක්තිමත් කිරීම සඳහා කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන .ක් පවතී 471

2019 අවසානයේ සිට, මහවැලි අධිකාරිය හා DAPH (සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (ඒකාබද්ධව ශ්‍රී ලංකා කිරි නිෂ්පාදන විශිෂ්ටතා පුහුණු මූලපිරීමේ ව්‍යාපෘතිය) SLDETIP) ක්‍රියාත්මක වූ අතර මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් නවසීලන්තය රජය මඟින් ලැබෙන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ කිරි ගොවීන් හට අවශ්‍ය නවීන තාක්ෂණික දැනුම ලබා දීමයි .ඒ අනුව , “ඒකාබද්ධ ගොවිපල සංවර්ධනය” යන සංකල්පය පාදක කර ගනිමින් සමස්ත කිරි ගොවිපලෙ හි තාක්ෂණික, පාරිසරික සහ ආර්ථික යන සියලු අංශ කෙරෙහි අවධානය යොමු කර වඩා ලාභදායී , තිරසාර ගොවිපල සංවර්ධනයක් සඳහා ගොවීන් පුහුණු කෙරුණි .

කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග

1. යටිතල පහසුකම් සංවර්ධනය, සම්පත් තිරසාර ලෙස උපයෝගී කර ගැනීම තුළින් අර්ධ සූක්ෂ්ම හා සූක්ෂ්ම ගව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම.
2. වැඩි දියුණු කරන ලද සතුන් හඳුන්වා දීම සහ සත්ව අභිජනනය වැඩි දියුණු කිරීම තුළින් එළ ගවයන්ගේ / .මී ගවයින්ගේ ජානමය විභවය වැඩි දියුණු කිරීම
3. නිසි පෝෂණ සැලසුම්, ආහාර සංරක්ෂණ ක්‍රම, තෘණ බිම් ස්ථාපිත කිරීම සහ කාර්යක්ෂම පශු වෛද්‍ය සේවාවන් ලබාදීම සම්බන්ධීකරණය තුළින් සත්ව පෝෂණය වැඩි දියුණු කිරීම සහ සත්ව ගහණය කළමනාකරණය කිරීම.

4. කිරි සමිති හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම තුළින් කිරි සමිති හා අලෙවිකරණ ජාලය ශක්තිමත් කිරීම හා කිරි කර්මාන්තය ලාභදායී කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

5. කිරි සැකසීම සහ පසු අස්වනු තාක්ෂණය වැඩිදියුණු කිරීම

6. කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සහ ජීව වායු ඒකක තිරසාර බලශක්ති ප්‍රභවයක් ලෙස හඳුන්වා දීම.

9. නිෂ්පාදනයේ දී නව්‍ය තාක්ෂණයන් භාවිතයට පහසුකම් සැලසීම හා දත්ත රැස් කිරීම, අධීක්ෂණය සහ වාර්තාකරණය සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයන් භාවිතා කිරීම.





AI වැඩසටහන් සහ තාක්ෂණික දැනුම බෙදා දීමේ වැඩසටහන් හඳුන්වා



කිරි ගව පෝෂණ වැඩසටහන් සංවර්ධනය කිරීම





අගය එකතු කරන ලද නිෂ්පාදන අලෙවි කිරීම



සත්ව පෝෂණය සඳහා තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර ලබා දීම.





ආදර්ශ කිරිගව අභිජනන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම



තෘණ භූමි හා ඇසොල්ලා වගා ආදර්ශන ඒකක ස්ථාපිත කිරීම

2. කුකුළු පාලනය ප්‍රවර්ධනය කිරීම

මහවැලි කලාප වල කුකුළු පාලනය වාණිජමය හා ගෘහාශ්‍රිත වශයෙන් ප්‍රධාන කොටස් දෙකකිඒ . අනුව කුකුළු පාලනයේ යෙදුන ගොවීන් මූලික වශයෙන් ගෘහාශ්‍රිත හා වාණිජමය බිත්තර හා බ්‍රොයිලර් නිෂ්පාදනයෙහි නිරතව සිටින අතර එමඟින් මහවැලි ගොවිපවුල් වල පෝෂණ අවශ්‍යතා සපුරාලයිඑසේම මෙම කර්මාන .ංතය ග්‍රාමීය ආර්ථිකය දියුණු කිරීම සඳහා වූ ආදායම් උත්පාදන ප්‍රභවයකිඒ අතරින් ගෘහා .ශ්‍රිත කුකුළු පාලනය ප්‍රධාන වශයෙන් මන්දපෝෂණය අවම කිරීමටත්, ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීමටත් විශේෂයෙන් ගෘහස්ථ කාන්තාවන්ට ස්වයං රැකියා අවස්ථා ලබා දීමටත් උපකාරී වේ .ග්‍රාමීය ප්‍රජාවේ ප්‍රෝටීන් අවශ්‍යතා සපුරාලන අතරම රටේ 35% ක මන්දපෝෂණ තත්ත්වය අවම කිරීම සඳහා ගෘහාශ්‍රිත කුකුළු පාලනය එක් විසඳුමකි.

%50 වර්ෂයේදී මහවැලි අධිකාරිය මඟින් 2021ප්‍රතිපාදන දායකත්වය මත මධ්‍ය පරිමාණ කුකුළු නිවාස 691 එමඟින් .ක් ගොවීන් හට ලබා දී ඇත 95 ක් සහ මහා පරිමාණ කුකුළු නිවාසප්‍රදේශයේ ගෘහාශ්‍රිත හා වාණිජ කුකුළු පාලනය ප්‍රවර්ධනය සඳහා දායක වේ එම .ව්‍යාපෘතිය මඟින් දිනක් සහ මසක් වයසැති කුකුළු පැටව් ,119 816ක් %50දායකත්වය බෙදා දෙන ලදී.

2021මහවැලි අධිකාරිය විසින් දේශීය බිත්තර නිෂ්පාදනයට ලබා දුන් දායකත්වය බිත්තර මිලියන 62 ක් වන අතර එය ජාතික නිෂ්පාදනයෙන් %1.3කි. ගම් කුකුළු බිත්තරයක සාමාන්‍ය මිල රු .19.00 කි. ඒ අනුව 202 1 වර්ෂයේදීබිත්තර නිෂ්පාදනයෙන් ලබාගත් මුළු මුදල රු1122 .මිලි . කි.

කුකුළු පාලනය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග

1. කුකුළු නිවාස තැනීම මඟින් බිත්තර හා මස් පිණිස පවතින කුකුළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
2. .ගෘහාශ්‍රිත කුකුළු පාලන ප්‍රවර්ධනය සඳහා මසක් හා දිනක් වයසැති ගුණාත්මක කුකුළු පැටවුන් මහවැලි ගොවිපළ තුළින් බෙදා හැරීම.
3. උසස් තත්ත්වයේ පැටවුන් සැපයීම සහතික කිරීම සඳහා දෙමාපිය පරම්පරාව නඩත්තු කිරීම
4. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් ආහාර සලාක නිෂ්පාදනය කොට සතුන්ගේ පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම තුළින් නිෂ්පාදනය කාර්යක්ෂමව හා ඵලදායිතාව සිදු කිරීම
5. එන්නත් හා නිසි සනීපාරක්ෂක වැඩසටහන මඟින් සත්ත්ව සෞඛ්‍යය සුරක්ෂිත කිරීම.





50% දායකත්වය යටතේ කුකුළු නිවාස ලබා දීම ගොවි පුහුණු පැවැත්වීම





බිත්තර නිෂ්පාදනය සඳහා කුකුළු පාලනය



50% දායකත්වය මත කුකුළු පැටව් ලබා දීම



ගෘහාශ්‍රිත කුකුළු



බිත්තර රක්කවන තුළ කුකුළු පැටව් නිෂ්පාදනය



බෘඩරය (Brooder) තුළ කුකුළු පැටව් නඩත්තුව

3. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

මිරිදිය ධීවර කර්මාන්තයෙහි පැවැත්ම සඳහා මහවැලි ප්‍රදේශවල ප්‍රධාන ජලාශ ක් ඇතුළුව 10මධ්‍ය සහ කුඩා පරිමාණයේ ජලාශ 591 ක් ඇති අතර ජල මූලාශ්‍රවල සම්පූර්ණ ව්‍යාප්තිය හෙක්ටයාර් 49,419 පමණ වේ ධීවර .. ප්‍රජාවට අයත් ධීවරයන්3252ක් පමණ සිටිති .මෙමඟින් ධීවර කර්මාන්තය ගොවි පවුල්වල පෝෂණ , අවශ්‍යතාවය සහ රටේ ආහාර සුරක්ෂිතතාව සපුරාලීමට උපකාරී වේ කැට්ලා සහ මිරිගාල් මිරිදිය ,තිලාපියා . මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රමුඛතම මත්ස්‍ය විශේෂ වන අතර එම ප්‍රභේද සමස්ත නිෂ්පාදනයට සියයට ක 90 දායකත්වයක් ලබා දී ඇත .මීට අමතරව අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගත් මිරිදිය ඉස්සන් වගාව සිදු වේ . ජලාශ තුළ අඛණ්ඩවමත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම මඟින් ධීවර කර්මාන්තයේ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට විශාල දායකත්වයක් ලබා දේ. ජලාශ වලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ජලාශ තුළ නිෂ්පාදනය කරන විට ඒ සඳහා පාවෙන දැල් කූඩු ස්ථාපිත කර ඇති අතර එමඟින් මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ජලාශ වලට මුදාහැරේ .මීට අමතරව විශාල වැව් සංඛ්‍යාවක දැල් කූඩු තුළ මත්ස්‍ය ඇසිත්තන් වගාව ද සිදු කරයි මෙමඟින් නිෂ්පාදන පිරිවැය අවම කර මෙම .ක්ෂේත්‍රයෙන් ලැබෙන ලාභය වැඩි කරගැනීමට අපේක්ෂා කර ඇත.

වසර අවසානෙය්දී මෙම 2021ව්‍යාපෘතිය මඟින් තෝරාගත් මහවැලි ජලාශ 20.39 ක ඇඟිල්ලන් මිලියන 181 වර්තමානෙ .ක් තැන්පත් කිරීමට හැකියාව ලැබී ඇතය්දී ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය)NAQDA) මඟින් ඇඟිල්ලන් අවශ්‍යතාවය ලබා දෙන නමුත් එම ප්‍රමාණය වාර්ෂික අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් නොවේ. එයට පිළියමක් ලෙස මහවැලි අධිකාරිය මඟින් මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක ක් 11B,D,H,L සහ උඩවලව කලාප තුළ පිහිටුවා ඇතඑස .ේම බාහිර වගා කරුවන් ප්‍රවර්ධනය කිරීම මඟින් සමස්ථ ඇඟිල්ලන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා කාලානුරූපීයව සැකසුනු කඩිනම් ක්‍රියාමාර්ග ගෙන තිබේ 2021 වර්ෂයේදී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 11,700 ක් වූ අතර එහය හි නිෂ්පාදනය මෙන් 2020මෙට්‍රික් ටොන් ට සාපේක්ෂව 5512මෙට්‍රික් ටොන් .ක වැඩිවීමකි 6188 එය ප්‍රතිශතයක් ලෙස %12කි එසේම මහවැලි.

අධිකාරිය මඟින් ජාතික මිරිදියමත්ස්‍ය නිෂ්පාදනයට %8ක දායකත්වයකි .මත්ස්‍ය1 Kg වටිනාකම රැපියල් ක් ලෙස ගත් විට මත්ස්‍ය නිෂ්පාදනෙයන් ලබා ගත් මුළු වටිනාකම 350රුකි 4095 .මිලි .. තවද 2021 වර්ෂෙය්දී මිරිදිය ඉස්සන්නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ක් 1956 ලෙස වාර්තා වී ඇති අතර ඉස්සන් 1Kg ක ගොවිපළ මිල රුපියල් 1500ලෙස සැලකූ විට ගොවීන් අතර බෙදා හරින ලද මුළු වටිනාකම රු 29.34 .මිලි . .කි

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමේ උපාය මාර්ග

1. ජලාශ තුළ ඇඟිල්ලන් තැන්පත් කිරීම හා නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම

2. ප්‍රදේශයේ මත්ස්‍ය ඇඟිල්ලන්ගේ අවශ්‍යතාවය සහතික කිරීම සඳහා මත්ස්‍ය වර්ධක මධ්‍යස්ථාන 11 ක් පවත්වාගෙන යාම

3. ධීවර ආඥපන්න, දැල් සහ බෝට්ටු වැනි ධීවර උපකරණ ලබා දීමෙන් ධීවර සමිති සවිබල ගැන්වීම.

4. අගය එකතු කළ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සහ මාළු නිෂ්පාදනයේ අලෙවිකරණ ජාලය ශක්තිමත් කිරීම.

5. ධීවරයින්ට තාක්ෂණික දැනුම බෙදා හැරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.




වගා පොකුණු සහ පාවෙන දැල් කූඩු තුල මත්ස්‍ය ඇසිත්තන් වගා කිරීම




ජලාශ තුල මත්ස්‍ය ඇගිල්ලන් තැම්පත් කිරීම

4. විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම

මහවැලි බී එච් සහ උඩවලව කලාප වල විසිතුරු.ඩී.සී,මත්ස්‍ය වගාව ප්‍රචලිතව පවතින අතර වර්ථමානයේ විසිතුරු මත්ස්‍ය වගාවේ නියැලෙන ගොවීන් සංඛ්‍යාව 1150 ක් පමණ වන අතර පවති පොකුණු සංඛාව ක් පමණ 2655 වේ ජනපදිකයන් ලෙස ඉඩම් හිමි .ප්‍රජාවේ දෙවන තෙවන පරම්පරාවේ දරුවන් අතර වගා කටයුතු සඳහා ඉඩම් සීමිත වීම නිසා කුඩා ඉඩම් ප්‍රමාණයක වැඩි ආදායමක් ලබාගත හැකි කර්මාන්තයක් ලෙස විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රචලිතව ඇතමෙම කර්මාන්තය තුළ ව .ිසිතුරු මත්ස්‍ය වගාකරුවන් පැටවු නිෂ්පාදනයේ නියුතු අභිජනකයින් ,

මත්ස්‍ය නිෂ්පාදනය වෙළඳ පල සඳහා එකතු කරන්නන් සහ තොග හා සිල්ලර ප්‍රමාණයේ අලෙවිකරුවන් වශයෙන් විශාල පිරිසක් ජාලයක් ලෙස එකට බැදුණු නිෂ්පාදන ක්‍රියාවලියක් මෙම ක්ෂේත්‍රයේ දැකිය හැක . පවුල් ,එසේම900 කට වැඩි පිරිසක් සඳහා තම ජීවනෝපාය රඳා පවතින නිෂ්පාදන අංශයක් ලෙස ද සැළකිය හැක එමෙන්ම .ප්‍රාදේශීය මට්ටමේ ගැණුම්කරුවන් විසින් ගුණාත්මයෙන් යුතු නිෂ්පාදන විදේශ වෙළඳපලට යොමු කරන අතර වැඩි නිෂ්පාදන ,ප්‍රමාණයක් මේ වන විට යොමු වන්නේ දේශීය වෙළඳපලට වේ ,ඇමරිකාව . ජපාන ,චීනයය සහ යුරෝපීය රටවල් වෙත ප්‍රමුඛව මෙම නිෂ්පාදනය අපනයනය කරනු ලබයි මීට අමතරව . මැලේෂියාව යන රටවලින් ,සිංගප්පූරුව ,විදේශීය වෙලඳපලට වැඩි ඉල්ලුමක් ඇති මවි සතුන් තායිලන්තය ආනයනය කොට නිෂ්පාදන කාර්යය සඳහාකොන්ත්‍රාත් ක්‍රමවේදයට සංවිධානය වූ ගොවීන් වෙත ලබාදීම සිදු කරයි දේශීය වෙළඳපලේ වැඩිම ඉල්ලුමක් ඇත්තේ ගෝල්ඩ් ෆිෂ් .ප්‍රභේදයට වන අතර විදේශීය වෙළඳ පල සඳහා ගප්පි මොලී යන ,ප්ලේටි ,ස්වඩ්ටේල් ,ප්‍රභේද සඳහා වැඩි ඉල්ලුමක් ඇත .

2021 වර්ෂය වන විට විසිතුරු මසුන් යුගළ මිලියන 40ක් දේශීය හා විදේශීය වෙළඳපොළවල් සඳහා සපයා ඇති අතර එහි වටිනාකම රු .මිලියන1200 කි.

- ❖ විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ග

1. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මඩ පොකුණු ඉදිකිරීම
2. මත්ස්‍ය විශේෂවල වර්ණය වැඩි කිරීම හා ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා නිරෝධායන සහිත ටැංකි ස්ථාපනය කිරීම.
3. ගොවීන්ට ඇඟිල්ලන් සැපයීම සඳහා අභිජනන මධ්‍යස්ථාන නඩත්තු කිරීම.
4. තාක්ෂණික සහය සැපයීමෙන් ගොවි සමිති සවිබල ගැන්වීම
5. කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය
6. අලෙවිකරණ ජාලය දියුණු කිරීම සහ දේශීය හා විදේශීය අපනයන වෙළඳපොළ පිළිබඳව අවධානය යොමු කර අවධානය යොමු කරමින් නිෂ්පාදනයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම.



50% දායකත්වය මත නිරෝධායන ටැංකි ඉදි කිරීම



50% දායකත්වය මත දැල් ආවරණ ලබා දීම

5. 



මත්ස්‍ය අස්වනු නෙලීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි කළමණාකාරිත්වය යටතේ ගොවිපල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වන අතර වර්තමානයේදී ගොවිපල ක් මහවැලි කලාප තුළ 13ව්‍යාප්තව පවති මූලිකව කෘෂි හෝග නිෂ්පාදනය ඒකකයන් . පැවතුනද අයහපත්හා අවිනිශ්චිත කාලගුණික තත්ත්ව යටතේ හෝග වගාව මුහුණ පා ඇති අවධානමට විසඳුමක් ලෙස පශු සම්පත් හා ධීවර නිෂ්පාදන කටයුතු ඇතුළත් වූ කෘෂි හෝග හා පශු සම්පත් ඒකාබද්ධ ගොවිපලක් ලෙස සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

ගොවිපල සංවර්ධන කාර්යයයෙහි මූලික අරමුණ වන්නේ,

- එම ප්‍රදේශයේ ගොවීන් සඳහා කෘෂි සහ පශු සම්පත් පිළිබඳ ව්‍යාවහාරිත්වය හා තාක්ෂණික දැනුම ලබාදෙන පුහුණු සහ ආදර්ශන ඒකකයන් ලෙස ගොවිපල ක්‍රියාත්මක කිරීම.

- කෘෂි හා පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන ඵලදායිතාව වැඩි කිරීම සඳහා නොයෙකුත් පර්යේෂණ සිදු කිරීමේ ඒකකයන් වීම.

- ගව අභිජනන මධ්‍යස්ථානයක් ලෙස කලාපයට අවශ්‍ය ආරයෙන් උසස් කිරිගව පැටවුන් ලබාදීම, බිත්තර රක්කවන යන්ත්‍ර මඟින් ගොවීන් හට කුකුළු පැටවුන් ලබාදිම හා කිරි හා පලතුරු අතුරු නිෂ්පාදන සිදු කිරීම හා අලෙවිකරණ ඒකකයක් වීම.

මෙලෙස මහවැලි ගොවිපල සංවර්ධන වැඩසටහන ඔස්සේ ,ප්‍රාදේශීය ගොවීන් හට පුළුල් සේවාවක් ලැබෙයි.

6. <u>ධාරිතා සංවර්ධන වැඩසටහන</u>

ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍රයේ තාක්ෂණික හා ව්‍යාවහාරික දැනුම සැපයීම හා නවීන යෙදවුම් භාවිතය සඳහා ආකල්පමය සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් යුතුව ධාරිතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි මෙමගින් ධීවර හා පශු.සම්පත් නිෂ්පාදන වල ගුණාත්මය ඉහළ නැංවිය හැකි අතර කාර්යය සාධනය, ඉහළ නැංවීම තුළින් නිෂ්පාදන කාර්යයට වඩා කාර්යක්ෂමව හා ලාභදායි ව්‍යාපාරයක් කරා ගෙන යනු ඇත .

වැඩ සටහනෙහි මූලික අරමුණු

- නව තාක්ෂණික දැනුම ලබා දිම, ක්‍රමවේද හදුන්වා දිම හා ආකල්ප සංවර්ධනය.
- ප්‍රායෝගික දැනුම හා කුසලතා වැඩි දියුණු කිරිම.
- පවතින සම්පත් තිරසාර අයුරින් භාවිතය සඳහා අවශ්‍ය දැනුම ලබා දිම.
- නිෂ්පාදන ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වැඩි කිරිම

7. <u>තෘණ වගා කිරීමේ ව්‍යාපෘතිය</u>

මහවැලි කලාප තුළ කිරි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීමම සඳහා සත්ව පෝෂණය කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු බව හඳුනාගෙන ඇත. ඒ සඳහා සත්ව ආහාර ලෙස දැනට අත්හැර දමා ඇති වගා බිම් මහා පරිමාණ තෘණ බිම් ලෙස සංවර්ධනය

කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරුණි. එමඟින් සතුන්ගේ ආහාර අවශ්‍යතාවය සපුරා ලීමත් වැඩි පෝෂණයෙන් යුත් අවශ්‍ය ගුණාත්මක සත්ව ආහාර ලබා ගැනීමට හැකි වේ.
මෙම භූමි ප්‍රදේශ බොහොමයක් වියළි කලාපය තුළ පිහිටන අතර නිදැලි ගව පාලනය යටතේ කිරි ගව පාලනය සඳහා අකාර්යක්ෂම අන්දමින් භාවිතා වේ.එබැවින් එම කටයුතු වඩා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස වර්ධනය කිරීම අරමුණින් මෙම මහා පරිමාණ තෘණ වගා ව්‍යාපෘතිය මහවැලි බී, සී, ඩී, එල් , වලව සහ රඹකැන්ඔය යන කලාප වල හඳුනාගත් ඉඩම් තුළ සංවර්දනය කිරීමට යෝජිතයි. එම ව්‍යාපෘතිය යටතේ වියළි ප්‍රදේශ වලට වඩාත් යෝග්‍ය, CO3,CO4,සෝගම් සහ පැවෝන් යන ගෝචර හා පෝෂ්‍ය ප්‍රභේද වලට අයත් වැඩිදියුණු කල තෘණ වර්ග වගා කිරීමට යෝජිතයි.

මෙම ව්‍යාපෘතිය යටතේ බී කලාපයෙහි ඉඩම් අක්. 700 ක් සී කලාපයේ ඉඩම් අක්. 20 ක්, ඩී කලාපයේ ඉඩම් අක්. 50 ක් වලව කලාපයේ ඉඩම් අක්. 200 ක් හා එල් කලාපයේ ඉඩම් අක්. 100 ක් හා රඹකැන්ඔය කලාපයේ ඉඩම් අක්. 100 ක් ලෙස මුළු ඉඩම් ප්‍රමාණය 1180 ක් තෘණ බිම් ලෙස සංවර්ධනය කිරීමට නියමිතය.
බී කලාපයේ හා ඩී කලාපයේ ඉඩම් දැනටමත් බිම් සැකැස්ම ආරම්භ කර ඇති අතරම වලව හා රඹකැන්ඔය කලාපයේ හඳුනා ගෙන තිබුණ අනුමැතිය සඳහා IEA හා EIA වාර්තා පරිසර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍ර වල නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලසුම් කළ ව්‍යාපෘති වැඩ සටහනෙහි ආදර්ශ ඒකකයන් ලෙස කලාප මට්ටමින් සිදු කළ භෞතික ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සඳහන් සාරාංශ සටහන වගු අංක හි 1.2 දක්වා ඇත.

1.2 සංවර්ධන ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

	ක්‍රියාකාරකම	ඒකකය	2021 වර්ෂය	
			ඉලක්කය	ප්‍රගතිය
1	මිරිදිය මත්ස්‍ය සංවර්ධන වැඩසටහන			
	නිෂ්පාදන ඉලක්ක (මෙට්‍රික් ටොන්)	MT	11000	11700
	ඉලක්කගත ජලාශ/ වැව් සංඛ්‍යාව	No	260	181
	ඇඟිල්ලන් නිෂ්පාදනය			
	පාවෙන දැල් කූඩු	No	100	120
	වගා පොකුණු	No	17	11
1.1	ජලාශ තුළ මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම	Mn	35	20.39
1.2	පාවෙන දැල් කූඩු තුළ ඇඟිල්ලන් වර්ධනය	Mn	21	15.5
1.3	මිරිදිය ඉස්සන් පශු ලාවේ)Post larvae) තැන්පත් කිරීම	Mn	17	10.15
2	විසිතුරු මත්ස්‍ය වගාව			
	නිෂ්පාදන ඉලක්ක	Mn.Pairs	37	40
2.1	මත්ස්‍ය අභිජනන ගොවිපළ පිහිටු වීම	No	51	48
2.2	නිරෝධායන ටැංකි ඉදිකිරීම (size of 10'*10' tanks 02-(Rs75000/=Masl cont)	No	135	258
2.3	මඩ පොකුණු ඉදි කිරීම (size of 60'*40' tanks 02=(75000/=Masl cont)	No	172	167
2.4	යටිතල පහසුකම් සැපයීම (කුරුලු දැල් /ආවරණ දැල්)	No	500	457
3	කිරිගව සංවර්ධනය			
	කිරි නිෂ්පාදන ඉලක්කය	L Mn	40	42
3.1	ඒකාබද්ධ ගොවිපොළ සංවර්ධන වැඩසටහන	No	1000	900
3.2	තෘණ වගා පිහිටුවීම. (minimum 1/4 Ac land MASL contre'n Rs10000/=)	No.of plots	279	152
3.5	%50දායකත්වය මත බණිජ මිශ්‍රණ ලබාදීම.	kg	2400	1400
3.6	සයිලේජ් බැරල් ලබා දීම. (Minimum 5 barrels/farm, MASL Con'n 50%)	No.	1770	1213
3.7	සයිලේජ් හා තෘණ සංරක්ෂණ ඒකක පිහිටු වීම. (MASL Con'n Rs. 50000/=)	No	18	5
3.8	උසස් ආකාරයේ ඒළ ගවයින් ලබා දීම. (100% MASL Con'n)	No	98	30
3.9	උසස් ආකාරයේ කිරි දෙනුන් හා නෑම්බියන් ලබා දීම (75% MASL Con'n)	No	113	42
3.10	AI වැඩසටහන් (Successful AI female Calf born from farm) (MASL Con'n Rs5000/=/ calf)	No.prog	429	269
3.11	අභිජනන ගොවිපොළ පිහිටුවීම. (MASL Con'n Rs. 125000/=/ farm)	No.	15	12

	ක්‍රියාකාරකම	ඒකකය	2021 වර්ෂය	
			ඉලක්කය	ප්‍රගතිය
3.12	ගව නිවාස ඉදිකිරීම. (Rs. 100,000/= MASL Contribution)	No	151	135
3.13	තෘණ කැබලි කිරීමේ හා කැපීමේ යන්ත්‍ර ලබා දීම. (50% MASL Con'n.Demostrated Farm)	No	345	352
3.15	කිරි උපකරණ ලබා දීම (Milk cane, buckets, filters) (MASL con'n 75% for Demonstrated Farm)	No	470	400
3.16	ජංගම කිරි දොවන යන්ත්‍ර ලබා දීම (Bucket milkers) (50% Contribution)	No	48	47
3.17	ජීව වායු ඒකක (Rs. 100000/= MASL Contribution)	No	13	8
3.18	කාබනික පොහොර නිපදවීම. (Rs. 10000/=/ farm MASL con'n)	No	688	586
3.19	සත්ව රක්ෂණ වැඩසෙහන (Rs.3000/=/ Animal MASL Con'n)	No	397	117
3.20	සත්ව සායන හා ඒන්නත් කරන වැඩසටහන	No	49	18
3.21	ගොවි ක්ෂේත්‍ර පාසල්	No	74	44
4	කුකුළු පාලනය			
	බිත්තර නිෂ්පාදන ඉලක්ක(Egg million)	Mn	60	62
4.1	කුඩා පරිමාණ මධ්‍ය පරිමාණ හා විශාල පරිමාණ කුකුළු ඒකක / ඉදිකිරීම(MASL Con. 50%) - 20,000/=	No	994	958
4.2	%50දායකත්වය මත කුකුළු පැටව් ලබා දීම (day old, 7 day old and one month chicks)	No	107700	119816
4.3	කුකුළු ගම්මාන	No	260	260
4.4	මහවැලි ගොවිපොළ සඳහා බිත්තර රකක්වන යන්ත්‍ර බදාහැරීම Distribution of incubators for Mahaweli farms	No	22	19
5	ඒළු පාලනය			
5.1	ආදර්ශ ගොවිපොළ සඳහා එළු නිවාස ඉදිකිරීමC (MASL Con'n Rs.100000/=01shed)	No	50	41
5.2	අභිජනන ගොවිපොළ (male & female) (MASL Con'n Rs.30000/=)	No	25	22

1.3 ධීවර හා පශු සම්පත් අංශය මඟින් ජාතික ආර්ථිකයට සිදු කළ දායකත්වය

නිෂ්පාදනය	නිෂ්පාදිත ඒකක ගණන	ආදායම (රු, මිලියන)
කිරි	ලීටර මිලියන 42	3360
බිත්තර	මිලියන 62	1122
මිරිදිය මත්ස්‍ය	මෙට්‍රික් ටොන් 5512	4095
මිරිදිය ඉස්සන්	මෙට්‍රික් ටොන් 1956	29.34
විසිතුරු මත්ස්‍ය	යුගල මිලියන 40	1200
මුළු ආදායම		9806.34

3.4 ආයතන සංවර්ධන අංශය

ආයතන සංවර්ධන අංශයේ දැක්ම

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය උදෙසා මහවැලි කලාපවල මානව සම්පත ප්‍රශස්තව මෙහෙයවීම.

ආයතන සංවර්ධන අංශයේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය උදෙසා මහවැලි කලාපවල ජානපදිකයින්ගේ ජීවන තත්වය උසස් කිරීම.

ආයතන සංවර්ධන අංශයේ කාර්යභාරය
ප්‍රජා සංවර්ධනය
මහවැලි කලාප තුළ මතින් තොර, හිංසනයෙන් තොර, අපචාරයන්ගෙන් තොර, සාරධර්ම සපිරි නිරෝගිමත් ගොවි ප්‍රජාවක් බිහිකිරීම සඳහා මගපෙන්වීම ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි මූලික අරමුණ වේ.
මේ යටතේ,

- මත්ද්‍රව්‍ය භාවිතය වැළක්වීම සඳහා ග්‍රාමීය ස්වේච්ඡා නායක නායිකාවන් පුහුණු කිරීම හා පාසල් ළමුන් හා ප්‍රජාව දැනුවත් කිරීම
- ළමා අපචාර, කාන්තා හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අඩුවයස් විවාහ හා ගැබ්ගැනීම් වැළක්වීම සඳහා දැනුවත් කිරීම
- බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීම හා සෞඛ්‍ය සායන පැවැත්වීම (විශේෂයෙන් සීග්‍ර ලෙස පැතිරියන චකුගඩු රෝගයෙන් ආරක්ෂා වීම පිළිබඳ දැනුවත් කිරීම හා හදුනාගත් රෝගීන් ප්‍රතිකාර සඳහා යොමු කිරීම)
- අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම (පහ වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පොෙ.ස. සාමාන්‍ය පෙළ විභාගය හා අ.පොෙ.ස. උසස්පෙළ විභාගය සඳහා)
- මහවැලි පදනම ශිෂ්‍යත්ව ලබා දීම (දෙමාපියන් ඉතා දිළිඳු, ආබාධිත හෝ මියගිය, සාමාන්‍ය පෙළ සමත් දරුවන් සඳහා ලබා දේ) සිදු කෙරේ.

2021 වර්ෂයේ ප්‍රජා සංවර්ධනය වැඩසටහන් වලට අදාළ ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව 3263කි.ඉන් වැඩසටහන් 3198ක ප්‍රගතිය ලබා ගෙන ඇති අතර මූල්‍ය ඉලක්කය රුපිල් මිලියන 255ක් හා මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 250කි. 2021 වර්ෂයේදී ප්‍රජා සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රධාන වශයෙන්ම අඩු පහසුකම් සහිත පාසල් සඳහා පානීය ජල පහසුකම් සැපයීම මෙන්ම වැසිකිළි පහසුකම් සැපයීමත්, සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීමත් කලාප මට්ටමින් සිදුකරන ලදී. සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සඳහා වැසිකිළි පහසුකම් ලබාදීම යටතේ පාසල් 137ක් සඳහා රුපියල් මිලියන 108.25 ක මුදලක් වැයවී ඇත.එය වගු අංක එක මගින් පෙන්නුම් කරේ.

කලාපය	වැසිකිළි පහසුකම් ලබාදුන් පාසල් සංඛ්‍යාව	
	ඉලක්කය	ප්‍රගතිය
මොරගහකන්ද	11	11
මැදිරිගිරිය කලාපය	6	6
එච් කලාපය	39	39
වලව විශේෂ	16	16
බී කලාපය	31	31
හුරුවවැව කලාපය	8	8
සී කලාපය	11	11
එල් කලාපය	6	6
ඊ කලාපය	4	4
රඹකැන්ඔය කලාපය	5	5
එකතුව	**137**	**137**

(වගු අංකය -01,සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සඳහා වැසිකිළි පහසුකම් ලබාදීම)
ප්‍රජා සංවර්ධන වැඩසටහන් යටතේ අඩු පහසුකම් සහිත පාසල් පාසල් 103ක් සඳහා පානීය ජල අවශ්‍යතාවය සැපයීම වෙනුවෙන් රුපියල් මිලියන 11.94ක මුදලක් වැයවී ඇත. එය වගු අංක 02 මගින් නිරූපණය වේ.

කලාපය	පානීය ජල පහසුකම් නොමැති පාසල් සඳහා පානීය ජල පහසුකම් සැපයීම.	
	ඉලක්කය	ප්‍රගතිය
C - කලාපය	54	54
B - කලාපය	29	29
මොරගහකන්ද	9	9
H - කලාපය	3	3
රඹකැන්ඔය කලාපය	8	8
එකතුව	**103**	**103**

(වගු අංකය -02 පානීය ජල පහසුකම් නොමැති පාසල් සඳහා පානීය ජල පහසුකම් සැපයීම)

මීම අමතරව සනීපාරක්ෂක පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි 1793ක් රුපියල් මිලියන 72ග15ක් වැය කරමින් මහවැලි ඊ කලාපය, බී කලාපය, මැදිරිගිරිය කලාපය හා රඹකැන්ඔය කලාපයන්හි ජානපදිකයින් සඳහා ලබාදී ඇත. පානීය ජල පහසුකම් නොමැති පවුල් 186ක් සඳහා රුපියල් මිලියන 10.351 ක වියදමින් ජල ටැංකි ලබාදීමත්, අඩු ආදායම්ලාභී පවුල් 156ක් සඳහා නිවාස ඉදිකිරීම සඳහා මැදිරිගිරිය හා රඹකැන්ඔය කලාපයන් සඳහා රුපියල් මිලියන 12.5ක මුදලක් දරා ඇත.
මීට අමතරව ප්‍රජා සංවර්ධන වැඩසටහන් යටතේ අඩු පහසුකම් සහිත පාසල් 33ක් සඳහා රුපියල් මිලියන 6.3ක වියදමින් පුස්තකාල සඳහා පොත් ලබාදීමත්, රුපියල් මිලියන 1.68 ක් වැය කරමින් මහවැලි කලාප දහය පුරා සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් 71 දෙනෙකු වෙනුවෙන් මහවැලි පදනම ශිෂ්‍යත්ව ලබාදීමත්, අඩු ආදායම්ලාභී පවුල් වලින් තෝරාගත් ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ හා දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වමින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමත් ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් ප්‍රජා සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන ලදී.




(ඡායාරූප - වැසිකිළි පහසුකම් නොමැති පවුල් සඳහා වැසිකිළි පහසුකම් ලබාදීම)

<u>ජානපදික හැකියා හා වෘත්තීය පුහුණු</u>

- මහවැලි ජානපදිකයින්ගේ ආර්ථික මට්ටම රුපියල් 30,000. 00 වඩා ඉහළ නැංවීම අරමුණු කරගනිමින් වෘත්තීය පුහුණු ලබා දීම හා ඒ ඔස්සේ ඔවුන් රැකියා/ගත කිරීම මූලික අපේක්ෂාව වේ.
- ගොවි සංවිධාන නිළධාරීන් සඳහා ගිණුම් පුහුණුව ලබාදීම හා පොල්ගොල්ල ජාතික අධ්‍යාපන සමූපකාර සංවර්ධන ආයතනය යටතේ මහවැලි කලාප වල උසස් පෙළ සමත් තරුණ තරුණියන්ට විගණනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී ගොවි සංවිධාන විගණනය සඳහා බලය ලබා දීම හා කලාපයේ ගොවි සංවිධාන වාර්ෂිකව විගණනය කිරීම ඔවුන් විසින් සිදු කිරීම.

2021 වර්ෂය තුළ මේ යටතේ වැඩසටහන් 155ක් ඉලක්ක ගතව තිබූ අතර ඉන් වැඩසටහන් 154ක ප්‍රගතියක් හා රුපියල් මිලියන 16.58ක මූල්‍ය ඉලක්කයක් හා 15.35 ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගන්නා ලදී. තවද දිළිඳුකම

තුරන් කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂයේ මාසික ආදායම රුපියල් 30,000.00 ට වැඩියෙන් උපයන සංඛ්‍යාව 821 ක් ලෙස රැකියාගත කිරීම සිදුකරන ලදී.

(ඡායාරූප- ජානපදික පුහුණු වැඩසටහන්)





<u>කාන්තා සංවර්ධනය</u>

- ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීම හා ගෘහස්ථ මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා මගපෙන්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ.
- මහවැලි කලාප තුළ සිටින කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා මේ යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි
- තම නිවසේ සිටම ආදායම් උත්පාදනය සඳහා ඇයට කටයුතු කළහැකි වන පරිදි ස්වයංරැකියා හා විවිධ වෘත්තීය පුහුණු ලබාදීම සිදුකරන අතර ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමද මේ යටතේ සිදුකරයි.2021 වර්ෂයේ මෙහි වැඩසටහන් ඉලක්කය 69 ක් වන අතර ප්‍රගතිය වැඩසටහන් 70කි. මූල්‍ය වියදම රුපියල් මිලියන 3.532කි.

<u>ගොවි සංවිධාන ප්‍රවර්ධනය</u>

ගොවි සංවිධාන නිලවරණ පැවැත්වීම හා ගොවි සංවිධාන සඳහා අදාළවන අණපනත්, නීති රීති, ජලකළමනාකරණය ආදිය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. එමෙන්ම ගොවීන් ගේ ආකල්ප වර්ධනය හා ධාරිතා සංවර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් සිදුකරන අතර කළමනාකරණ කමිටු යටතේ ගොවි ගැටලු සඳහා විසඳුම් ලබාදීම සිදු කරයි.

<u>ප්‍රජා සහභාගිත්ව වාරිපද්ධති කළමනාකරණය</u>

- ඇළ පද්ධතිවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කිරීම මගින් කෙත්ඇළ නවීකරණය කිරීමේ ප්‍රජා සහභාගිත්ව කළමනාකරණ වැඩසටහන
- ප්‍රතිසංස්කරණය කළයුතු මට්ටමේ ඇති කෙත්ඇළ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් හා ශ්‍රමදායකත්වයෙන් අමුද්‍රව්‍ය සඳහා වන පිරිවැය පමණක් දරා ප්‍රතිසංස්කරණය කිරීම

(කාර්යක්ෂම ජල භාවිතයකට ගොවීන් හුරුකිරීම හා ජල කළමනාකරණය පිළිබඳ ආකල්පමය වෙනසක් ප්‍රායෝගිකවම මේ තුළින් ඇතිකරවනු ලබන අතර විශාල පිරිවැයක් දැරීමට සිදුවන කටයුත්තක් ප්‍රජාවගේම ශ්‍රමයෙන් වඩා ඵලදායී ලෙස සිදු කරයි.)

උපරිමය රුපියල් ලක්ෂ පහකට(5) යටත්ව ඇළමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා මුදල් ලබාදෙන අතර එහි නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 15ක් පමණ වෙතැයි ගණන් බලා ඇත.

කලාපය	ප්‍රතිසංස්කරණය කරන ලද ඇල සංඛ්‍යාව	දිග (Km)	ඇස්තමේන්තුගත මුදල (රු.මී)	ශ්‍රම වටිනාකම (රු.මී)	සම්පූර්ණ නිමවුම් වටිනාකම (රු.මී)
බී කලාපය	2	0.155	0.99931	0.311	1.310911
සී කලාපය	17	7.652	7.86	12.9	20.76
මොරගහකන්ද කලාපය	6	0.506	2.968	0.903	3.9726
එච් කලාපය	12	21.9	5.833	2.4	8.233

කලාපය	ප්‍රතිසංස්කරණය කරන ලද ඇල සංඛ්‍යාව	දිග (Km)	ඇස්තමේන්තුගත මුදල (රු.මී)	ශ්‍රම වටිනාකම (රු.මී)	සම්පූර්ණ නිමවුම් වටිනාකම (රු.මී)
එල් කලාපය	1	0.15	0.519	0.125	0.394
වලව කලාපය	9	1.354	4.2	0.3	4.11
හුරුළුවැව කලාපය	6	4.85	0.998343	0.723287	1.742175
රඹකැන්ඔය	2	1	0.97		0.97
එකතුව	55	37.567	24.347653	17.662287	41.492686

(වගු අංක-03, ප්‍රජා සහභාගිත්ව වාරි පද්ධති කළමනාකරණ වැඩසටහන)





ඒ අනුව මී.35567 ක දිගින් යුතු වාරි පද්ධති ප්‍රමාණයක් රුපියල් මිලියන 17.66ක ඉතිරියකින් යුතුව නිමකර අත.

(ප්‍රජා සහභාගිත්ව වාරි පද්ධති කළමනාකරණ වැඩසටහන)

<u>ක්‍රීඩා කටයුතු</u>

මහවැලි ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම අරමුණු කොටගෙන මහවැලි ක්‍රීඩා පැවැත්වීම සිදු කරන අතර ඒ යටතේ

- ඒකක/කොට්ටාස හා අන්තර් කලාප ක්‍රීඩා තරග පැවැත්වීම
- ක්‍රීඩා පුහුණු කඳවුරු පැවැත්වීම
- මහවැලි ක්‍රීඩා සමාජ පිහිටුවීම
- අඩු ආදායම්ලාභී දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කරගැනීම සඳහා මුල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබාදීම
- අඩු පහසුකම් සහිත පාසල් හා ක්‍රීඩා සමාජ වෙත ක්‍රීඩා උපකරණ ලබාදීම





2021 වර්ෂයේදී සිදු කරන ලදී. ඒ අනුව කලාප දහය පුරා මහවැලි ක්‍රීඩා සමාජ 317ක් පිහිටුවා ඇති අතර ඒ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 11,860ක් සහභාගී වී ඇත. ක්‍රීඩා කටයුතු වෙනුවෙන් 2021 වර්ෂයේදී වැය කරන ලද මුදල රුපියල් මිලියන 11.197කි.

3.5. ව්‍යාපාර සංවර්ධන අංශය

ව්‍යාපාර සංවර්ධන අංශය , ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටුකරන අංශයක් වෙයි . මහවැලි කලාප තුළ එක් එක් කලාපයන්ට අනන්‍ය වූ සීමිත සම්පත් උපරිම ඵලදායී ලෙස උපයෝජනය කරමින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය හා ආර්ථික සංවර්ධනය සඳහා වගකීම් දරමින් කටයුතු කරයි.
ඒ අනුව මහවැලි කලාපවල කෘෂිකර්ම ,සත්ත්ව පාලන ,සංචාරක ආදී අදාළ විවිධ ක්ෂේත්‍රයන්හි කුඩා ,මධ්‍ය හා මහා පරිමාණයේ විවිධ වූ ව්‍යවසායකයන් බිහි කරලීම සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම ,ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම හා ඇගයීම, පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවර්ධනයට යොමු කර ගැනීම, අළෙවිකරණය සඳහා වෙළෙඳපොළ සම්බන්ධතා ඇති කිරීම , ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ණය යෝජනා ක්‍රම දියත් කර ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම ,ඔවුන්ට අවශ්‍ය මගපෙන්වීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

<u>ව්‍යාපාර සංවර්ධන අංශයේ අරමුණු:-</u>

01. ස්වයං රැකියා පුහුණුව මඟින් කුඩා පරිමාණයේ නිෂ්පාදන ක්ෂේත්‍රයට දායකත්වය ලබාදීම.
02. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් බිහි කිරීම.
03. ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය මැදිහත්කරුවෙකු වීම.
04. ව්‍යවසායකත්ව හැකියා වර්ධනය හා තාක්ෂණ නිපුණතාවය ලබා දීම.
05. වෙළඳපල සම්බන්ධීකරණය මඟින් මහවැලි බල ප්‍රදේශවල නිෂ්පාදනවලට ඉහළ වටිනාකමක් ලබාදීම
06. මහවැලි බල ප්‍රදේශවල තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ජනනය කිරීම.
07. ආයෝජන තුළින් ප්‍රාදේශීය සංවර්ධනය.
08. ජාතික නිෂ්පාදනයට දායකත්වයක් ලබාදීම හා අපනයන ප්‍රවර්ධනය.
09. ව්‍යාපාර උපදේශනය/ව්‍යාපාර සැලසුම් සකස්කිරීමට සහය ලබාදීම හා ඇඟයීම.
10. අධිකාරියේ වාර්ෂික ආදායම් තත්වය ඉහළ නැංවීම.

<u>ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්යභාරය:-</u>

- ග්‍රාමීය වශයෙන් හදුනාගත් සම්පත් ව්‍යාප්ති ස්වභාවය යටතේ ව්‍යාපාර සැලසුම් සකස් කිරීම
- හදුනාගත් ස්වයං රැකියා ක්ෂේත්‍රයන් සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීම
- සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබාදීම හා 50% මහවැලි දායකත්වය යටතේ යන්ත්‍ර හා උපකරණ ලබාදීම
    - කෘෂිකාර්මික හා සත්ව පාලන ව්‍යාපෘති මඟින් විදේශීය විනිමය ඉපයීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම.
    - සත්ව පාලන,විසිතුරු මත්ස්‍ය,පොල් වගාව,වෙනත් බෝග හා පලතුරු වගා ආදී ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම මත බදු ආදායම් ලබා ගැනීම.
    - සුර්යබල ශක්ති, පෛව ස්කන්ධ විදුලි බල ශක්ති, ජල විදුලි බලශක්ති ආදි විදුලිබල ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් වල බදු අදායම්/මහවැලි අධිකාරිය සමඟ හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම තුලින් ලාභ ඉපයීම.

- කර්මාන්ත උද්‍යාන පවත්වා ගෙන යාම මඟින් ප්‍රාදේශීය මට්ටමේ ආර්ථිකය ශක්තිමත් කිරීම.
- මහවැලි බල ප්‍රදේශවල ඉතා ආකර්ෂණීය ස්ථානවල පිහිටි සංචාරක බංගලා නවීකරණය කරමින් දෙස් විදෙස් සංචාරකයින්ට විවෘත කිරීම තුළින් අදායම් උත්පාදනය.
- පාරම්පරික දේශීය ආහාර ප්‍රචලිත කිරීම හා කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය සඳහා මහවැලි හෙල බොජුන් හල් ආරම්භ කිරීම.
- පරිසර හිතකාමී සංචාරක අවස්ථා පුළුල් කිරීම උදෙසා ජලාශවල සංචාරක බෝට්ටු සේවා සඳහා අවසර ලබාදී වාර්ෂික බදු මුදලක් ලබා ගැනීම

<u>සංචාරක බංගලා ව්‍යාපෘතිය</u>

වසරකට ආසන්න කාලයක් පැවැති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ සංචාරක බංගලා පාරිභෝගිකයින් සඳහා අඛණ්ඩව විවෘත කල නොහැකි වීමත් , සංචරණ සීමා හේතුවෙන් සංචාරකයින් නොපැමිණීමත් හා සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද යටතේ විවිධ සීමාවන් පැනවීමත් යන කරුණු මත සියළුම සංචාරක බංගලා වෙන්කිරීම් පසුබෑමකට ලක් වූ අතර202 1 වර්ෂයේ අග භාගයේ දී මෙරට සියළුම ක්ෂේත්‍රයන් නැවත යාවත්කාලීන වීමත් සමඟ 2021 ඔක්තෝම්බර් මස දී මහවැලි අධිකාරිය සතු සුවිශේෂී සංචාරක බංගලාවක් ලෙස කලාවැව සංචාරක බංගලාව විවෘත කරන ලදී.

තවද මීට සමගාමීව 2021 නොවැම්බර් මස සිට නැවත සියලුම සංචාරක බංගලා වෙන් කිරීම් කටයුතුද ආරම්භ කරන ලද අතර සංචාරක බංගලා සඳහා නව වක්‍රලේඛ හා සංචාරකයින් සඳහා වන නව ආහාර මෙනුවක් සකස් කරන ලදී.

එහෙත් 2021 අවසන් වන විට සංචාරක බංගලා ආදායම රු මිලි 5.4ක දක්වා ළඟා වීමට හැකි විය.

2021 වර්ෂයේ ඉලක්කය රු මිලි 5.7 වන අතර මූල්‍ය ප්‍රගතිය 94% කි.

<u>හෙළ බොජුන්හල් ව්‍යාපෘතිය</u>

මහවැලි අධිකාරිය මඟින් ආරම්භ කළ හෙළබොජුන් සංචිතය සඳහා 2020 වර්ෂයේ සිට ඉදිරි කරමින් පැවති මහවැලි සී කලාපයේ ගිරාදුරුකෝට්ටේ නගරය ආශ්‍රිතව නව හෙළ බොජුන්හල 2021 ජනවාරි මාසදී 14 වන දින ජනතා අයිතියට පත් කෙරිනි. තවද එච් කලාපයන්හි තම්මැන්නාව ප්‍රදේශය නව හෙළබොජුන්හල් සඳහා ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව ලග්ගල, දෙහිඅත්තකණ්ඩිය, ගිරාදුරුකෝට්ටේ, මනම්පිටිය, මැදිරිගිරිය, හුරුළුවැව හා ඇඹිලිපිටිය යන ස්ථාන වල හෙළබොජුන්හල් පවත්වාගෙන යනු ලබයි. ගෙවිලියන් 62 දෙදෙනෙකු සඳහා රැකියා අවස්ථා ලබා දී ඇත.

කෙසේ වෙතත් පැවති කොරෝනා වසංගත තත්වය යටතේ 2021 වර්ෂයේ ජනවාරි හා අප්‍රේල් මැයි ජුනි මස මෙන්ම ඔක්තෝබර් මාසයන්හි විවිධ අවස්ථාවලදී තාවකාලිකව වෙළඳාම් කටයුතු සීමා කිරීමට සිදු වූ අතර සමස්තයක් ලෙස ගෙවිලියන්ගේ ආදායම සීඝ්‍ර ලෙස පහළ බසින්නට සිදු විය.



මහවැලි කලාපවල පවතින භෞතික හා මානව සම්පත ව්‍යවසායකත්ව සංවර්ධනය උදෙසා ඵලදායි ලෙස උපයෝජනය කරමින් ජනපදිකයින්ගේ ජීවන තත්වය ඉහළ නංවාලමින් ඔවුන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම සඳහා කටයුතු කිරීම හා මෙහෙයවීම අංශයේ කාර්යභාරයයි.

ඒ අනුව 2021 වර්ෂය තුළ ව්‍යාපාර සංවර්ධන අංශ යටතේ ව්‍යවසායකයින් සඳහා අයෝජන ව්‍යාපෘති ඉඩම් ලබාදීමට අවශ්‍ය කටයුතු සහ දැනටමත් ලබාදී ඇති ආයෝජන ඉඩම් ඵලදායි ලෙස යෙදවීමට අවශ්‍ය මගපෙන්වීම් හා පසුවිපරම් කටයුතු සිදුකර ඇත. වලව කලාපයේ කර්මාන්ත ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයි 30 දෙනෙකු සඳහා අධ්‍යක්ෂමණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. බී කලාපයේ කෘෂිකාර්මික හා සත්ව

පාලන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීමට අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇති අතර ඌණ උපයෝජිත ඉඩම් සඳහා සමීක්ෂණ කටයුතු ඉඩම් සහ ඉඩම් පරිහරණ හා ඒකාබද්දව සිදුකර ඇත. ආයෝජන ඉඩම් වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයෝජන ප්‍රවර්ධන හා නියාමනය කිරීමේ වැඩසටහන් 17ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

පශ්චාද් කොවිඩ් වසංගත තත්වය යටතේ මුහුණදීමට සිදුවූ අර්බුධයන් මධ්‍යයේ වුවද මහවැලි හෙලබෝජුන්හල් සෞඛ්‍ය නිර්දේශ අනුගමනය කරමින් වරින් වර මහවැලි හෙලබෝජුන්හල් කිහිපයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇති අතර මහවැලි එච් කලාපයේ නව හෙලබෝජුන් හලේ ඉදිකිරීම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රතිපාදන මත ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම හෙලබෝජුන් නිෂ්පාදන වල ගුණාත්මකභාවය ඉහළ නංවාගැනීමට අවශ්‍ය පුහුණු වැඩසටහන් කාන්තා ව්‍යවසායිකාවන් සඳහා පැවැත්වීමට කටයුතු කර ඇත.

පරිසර හිතකාමී ඔරු හා බෝට්ටු මහවැලි කලාප ආශ්‍රිත වැව් හා ජලාශවල ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය යටතේ නව ව්‍යාපෘති 4ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. 2ක් සඳහා ගිවිසුම්ගත වී ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නඟා සිටුවීම සඳහා GYB සහ IYB පුහුණු වැඩසටහන්, සහ වෙළඳපල හඳුන්වාදීමේ වැඩසටහන් කොවිඩ් වසංගත තත්වය යටතේ වුවද නිසි උපදෙස් පිළිපදිමින් වැඩසටහන් 15ක් පැවැත්වීමට කටයුතු කර ඇත. 50% මූල්‍ය දායකත්වය යටතේ ව්‍යවසායකයින් 383 දෙනෙකු සඳහා භාණ්ඩ හා උපකරණ බෙදාදීම කටයුතු කරමින් නව ව්‍යවසායන් ආරම්භ කිරීමට මෙන්ම පවතින ව්‍යවසායන් ඉහළ තලයකට ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

තවද මූල්‍ය අපහසුතා ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කරගනිමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්දව ක්‍රියාත්මක කරන "මහවැලි සවිය"ණය යෝජනා ක්‍රමය යටතේ සියලුම කලාප ඉලක්ක කරගනිමින් ව්‍යවසායකයින් 54 දෙනෙක් සඳහා ණය ලබාදීමට කටයුතු කර ඇති අතර මොරගහකන්ද නව සංවර්ධන කලාපය ඉලක්ක කරගනිමින් "මොරගහකන්ද අත්වල" ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින් 09 දෙනෙකු සඳහාද ණය ලබාදී ඇත.

3.6 පර්යේෂණ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය.

දැක්ම

නවීන තාක්ෂණය හා උපායමාර්ග ක්‍රමවේද තුළින් මහවැලි කලාපවල බහුආංශික සංවර්ධනය සාක්ෂාත් කරගැනීම.

අරමුණ

මහවැලි ජානපදිකයින්ගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා මහවැලි මහ සැලැස්මට අනුකූලව දේශීය හා විදේශීය විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

<u>අංශයේ කාර්යභාරය</u>

- මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්වය නඟා සිටුවීම සඳහා බහු ආංශික සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති, ආයතනික ප්‍රතිපත්ති සහ මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි අධිකාරියේ අංශ සඳහා වන දේශීය හා විදේශීය මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘතීන් සකස් කිරීම , බලාත්මක කිරීම සඳහා වන ක්‍රමෝපායන් සකස් කිරීම , අදාළ අංශ හරහා ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය, සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය මෙන්ම මහවැලි බල ප්‍රදේශ වල සංචාරක ව්‍යාපාර කටයුතු ප්‍රවලිත කිරීම හා ප්‍රවර්ධනයට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම මගින් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
- මහවැලි ජනපදිකයින්ගේ වෙළඳ පොළ ඉලක්ක කර ගත් කෘෂි හා වෙනත් නිෂ්පාදන සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම මගින් නිෂ්පාදන ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හා දේශීය / විදේශීය පර්යේෂණ ආයතන/ විශ්ව විද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන ආදිය සමග සම්පත් වල ස්වභාවය , ආර්ථික විචල්‍යත්වයන් හා පවතින විභවතාවයන් ආදිය පිළිබඳව පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය , ක්ෂේත්‍රයේ ආදර්ශ පර්යේෂණ කටයුතු සිදුකිරීම හා පර්යේෂණ ප්‍රතිඵල මහවැලි කලාප වලට අනුගත කිරීම තුළින් ජනපදිකයන්ගේ ආදායම් උත්පාදනය වැඩි කිරීම.

2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ ඉටු කිරීමට යෝජිත වැඩසටහන්

- මූල්‍ය ප්‍රතිපාදන මිලියන - 40.15
- අලි මිනිස් ගැටළු අවම කිරීම සඳහා වන විශේෂ නියමු ව්‍යාපෘතිය
- අරලගංවිල බීජ ගොවිපළ නිලධාරී සහ මහවැලි දෙවන හා තුන්වන පරම්පරා තරුණ පිරිස් තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් වාණිජ ගොවීන් බවට පත්කිරීම සඳහා වන මූලික පුහුණු වැඩසටහන
- කොත්මලේ හරිතාගාරය -බිම් සකස් කිරීම,ජල ප්‍රවාහන පහසුකම් වැට සකස් කිරීම ඉඩම් සකස් කිරීම, උපදේශනය
- මහවැලි කාබනික වගා ව්‍යාපෘතිය
- මහවැලි වෙළඳ මධ්‍යස්ථානය
- කෘෂි නවෝත්පාදන සන්නිවේදන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම - මැදිරිගිරිය (තොරතුරු ගම්මානය)
- තොරතුරු තාක්ෂණය ගම්මානය පිහිටුවීම

<u>2021 වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ලබා ගත් ප්‍රගතිය හා ක්‍රියාකුරි සැලැස්මට අමතරව ඉටුකළ ක්‍රියාකාරකම්</u>

- **අලි මිනිස් ගැටළු අවම කිරීම සඳහා වන විශේෂ නියමු ව්‍යාපෘතිය**

මහවැලි එල් කලාපයේ20 Km ක විදුලි වැට ඇස්තමේන්තු ආරම්භ කර ඇත.

මහවැලි C කලාපයේ තෝඩා ගොවිපොල වටා10 Km ක විදුලි වැට ඉදිකිරීම අවසන් කිරීම.

ඇස්තමේන්තු මුදල මිලියන . 4.3 අරලගංවිග බීජ ගොවිපල වටා7.5 Km ක විදුලි වැට ඉදිකිරීම ද අවසන් අතර කන්දකාඩු %15 ක භෞතික ප්‍රගතියක් ඇත .අදාළ ප්‍රදේශයේ කැලෑ කැපීම, මාර්ගය සැකසීම හා කණු සිටුවීම සඳහා වලවල් කැපීම ආදි කටයුතු සිදු කර ඇත.

මීට අමතරව කරඳපොල කන්දකාඩු සිංහපුර14 Km ක දිගින් යුත් විදුලි වැටෙන්4 Km ක් අවසන් කර ඇත.

පිඹුරුත්තෑව සංචාරක බංගලාව වටා525 m ක ප්‍රමාණයක විදුලි වැට සවීකිරීම අවසන් කර ඇත .

මාදුරුඔය දකුණ ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ උප කාර්යාලය වටා300 m ක විදුලි වැට ඉදිකරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර, ඒ සඳහා නව නිපයුම්කරුවන්ගේ කොමිෂම වෙතින් ඇස්තමේන්තු ඉල්ලා ඇත..





- **දේශගුණික අවබලපෑම් අවම කිරීම සඳහා වන නියමු අධිතාක්ෂණික හරිතාගාර ගොවිපල ව්‍යාපෘතිය - බිම් සකස් කිරීම,ජල ප්‍රවාහන පහසුකම් වැට සකස් කිරීම ඉඩම් සකස් කිරීම, උපදේශනය (SMART Green House Project)**

හරිතාගාරය ඉදිකිරීමේ කටයුතු වල ප්‍රමාදයට හේතු වී ඇත්තේ කොරියාවේ සිට පැමිණීමට නියමිත ඉංජිනේරු කාර්ය මණ්ඩලය ලෝක වසංගතයක් වූ කොවිඩ් රෝගය නිසාය. නමුත් මෙම වසරේ ඔක්තෝබර් මාසය තුළදී කොරියාවේ සිට පැමිණි ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් මෙහි කටයුතු සිදු

කර ඇත. බිම් සකස් කිරීම මේ වන විට අවසන් වී ඇති අතර , අධි තාක්ෂණික හරිතාගාරය ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇත.









මහවැලි කාබනික වගා ව්‍යාපෘතිය

මේ වන විට පාංශු පරීක්ෂණ කටයුතු සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත මුදල් ගෙවා ඇත.මූලික වැඩ කටයුතු ආරම්භ කර ඇත. කොම්පෝස්ට් පොහොර අංගනයේ ඉදිකිරීම් කටයුතු CECB ආයතනය මගින් මේ වන විටත් සිදුකර අවසන් .

එසේම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන කටයුතු සිදුවෙමින් පවති. එහි මේ වන විට නිෂ්පාදන ප්‍රගතිය මෙ. ටොන් 570 පමණ වේ.

කාබනික විද්‍යාත්මක කැට පොහොර සැදීම සඳහා අත්හදා බැලීමක් සිදුකිරීම සඳහා විශේෂඥ කමිටු සාමාජිකයකු සමග ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කළ අතර ඒ සම්බන්ධව නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා සමග ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වා ඇත. මහවැලි අධිකාරිය මගින් සිදු කළ අහඹු පාංශු සමීක්ෂණයෙන් පසුව පාංශු සිතියම් මගින් කොට්ඨාශ මට්ටමින් හා ඒකක මට්ටමින් භෝග හඳුනාගැනීම සිදු කර ඇත. මහවැලි කාබනික විශේෂඥ කමිටු සාමාජිකයින් සමඟ මොරගහකන්ද කලාපයේ කාබනික ව්‍යාපෘතියට අදාළ නිලධාරීන් සමඟ පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

කාබනික අංගන පරිශ්‍රයේ භාණ්ඩ බහාලුම් යොදා ගනිමින් විද්‍යාගාරයක් හා කාර්යාලයක් ඉදි කිරීම සඳහා වන මූලික කටයුතු සිදු කරමින් පවතී.









මහවැලි වෙළඳ මධ්‍යස්ථානය

මේ සඳහා වන මූලික නිර්මාණ සැලසුම් ඉදිරිපත් කිරීමට වරලත් ගෘහ නිර්මාණ ශිල්පී මහත්මියකට භාර දී අවසන් කර ඇත.





කෘෂි නවොත්පාදන සන්නිවේදන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම මැදිරිගිරිය -

(තොරතුරු ගම්මානය)

මේ වන විට පරිසණක 20 ක් මැදිරිගිරිය කලාපය වෙත ලබාදී ඇති අතර , මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය අනෙකුත් කාර්යාල උපකරණ හා යෝජිත ගොඩනැඟිල්ලේ අඩුපාඩු සකස් කර දී පරිසණක මධ්‍යස්ථානය විවෘත කරන ලදි.





විශේෂ ව්‍යාපෘති වැඩසටහන යටතේ එවි කලාපය තුළ පරිසර හිතකාමී මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන හා මඩ පොකුණු ස්ථාපිත කිරීමේ වැඩසටහන

මේ සඳහා වැයවන මුදල පර්යේෂණ, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ 2021 වර්ෂයේ අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව වෙන් කර ඇති අදාළ ප්‍රතිපාදන වලින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සිදු කළේය.









හතරවන පරිච්ඡේදය

4.1 පිරිස් හා පාලන අංශය.

පිරිස් හා පාලන අංශය වෙත පැවරී ඇති කාර්යභාරයන්

1. **සේවක අවශ්‍යතා හඳුනා ගැනීම, සැලසුම් කිරීම සහ ආකර්ෂණය කර ගැනීම**
   - පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම
   - විභාග/සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම
   - සුදුස්සන් තෝරා පත් කර ගැනීම
   - සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු)

2. **සේවක පුහුණුව හා සංවර්ධනය**
   - නවක නිලධාරීන් ආයතනගත කිරීමේ පුහුණු වැඩසටහන්
   - කෙටිකාලින හා දිගුකාලින පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම.
   - දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ලබා දීම

3. **වන්දි හා ප්‍රතිලාභ සම්බන්ධ කටයුතු**
   - උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම
   - වැටුප් සංශෝධන කටයුතු (ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව)
   - පාරිතෝෂික දීමනා ප්‍රතිලාභ නිදහස් කිරීම
   - සේ.අ.අ./සේවා නියුක්ත භාර අරමුදල් නිදහස් කිරීම සම්බන්ධ කටයුතු.

4. **සේවක කාර්ය සාධන කළමනාකරණය**
   - පුද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම
   - කාර්ය සාධනය ඇගයීම
   - කාර්ය මණ්ඩලය අධීක්ෂණය හා සුපරීක්ෂණය
   - විශ්‍රාම ගැන්වීම්
   - සේවය අවසන් කිරීම්
   - ස්ථානමාරු
   - විනය කටයුතු (ආයතන සංග්‍රහය හා විනය කාර්ය පටිපාටියට අනුව)
5. **කළමනාකරණ සම්බන්ධතා හා කම්කරු සම්බන්ධතා**
   - සේ.අ.අ./සේවා නියුක්ත භාර අරමුදලේ සාමජිකයන් ලියාපදිංචි කිරීම.
   - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙනුවෙන් නීතිමය කටයුතු සඳහා පෙනී සිටීම.
   - සම්බන්ධීකරණය (විවිධ අංශ, කලාප හා බාහිර පර්ශවයන් අතර)
   - මහජන සම්බන්ධතාවය.
   - නිල උත්සව සම්බන්ධ කටයුතු.
   - පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු උපදේශක කාරක සභා කටයුතු.
   - මහජන පෙත්සම් කාරක සභා කටයුතු.
   - පාර්ලිමේන්තු වාචික ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට, සහභාගී වීම හා අනෙකුත් අංශ සම්බන්ධීකරණය.

පිරිස් හා පාලන අංශය 2021 වර්ෂයේ ඉලක්ක සඳහා අත්කරගත් ප්‍රගතිය

1. සියලු අංශවල සේවක පුරප්පාඩු හඳුනාගැනීම හා පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීම.
2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලු අංශවල වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
3. සියලුම අංශවල පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම හා ඊට අදාළ පුහුණු වැඩසටහන සංවිධානය කිරීම.

සේවක සංඛ්‍යා තොරතුරු **2021.12.31** වන දිනට

2021 වර්ෂයේ නව බඳවා ගැනීම්

අනු අංකය	සේවා ගණය	තනතුර	තනතුරු සංඛ්‍යාව
1	MM 1-1	ඉංජිනේරු) සිවිල්	18
2	MM 1-1	ඉංජිනේරු (විදුලි	3
3	MM 1-1	ඉංජිනේරු) යාන්ත්‍රික	5
4	MA 2-2	ක්‍රීඩා සහකාර	1
5	MA 2-2	පොත් තබන්නා	2
6	MA 2-2	පශු සම්පත් සංවර්ධන සහකාර	9
7	MA 2-2	ජල විද්‍යා සහකාර	2
8	MA 1-2	ක්ෂේත්‍ර සහකාර	16
9	MA 1-2	කළමනාකරණ සහකාර	54
10	-	එකතුව	**110**

2021 වර්ෂයේ අභ්‍යන්තර උසස් කිරීම්

අනු අංකය	සේවා ගණය	තනතුර	තනතුරු සංඛ්‍යාව
1	HM 1-1	අධ්‍යක්ෂ) පහළ නිම්න සංවර්ධන(	1
2	HM 1-1	අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය(	1
3	HM 1-1	අධ්‍යක්ෂ) අභ්‍යන්තර විගණක(	1
4	MM 1-1	සහකාර අධ්‍යක්ෂ) ඩීවර හා පශු සම්පත්(	2
5	MM 1-1	සහකාර අධ්‍යක්ෂ (පාලන(	1
6	MM 1-1	ගණකාධිකාරී	1
7	MM 1-1	නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර) පාලන(	1
8	MM1-1	සහකාර අධ්‍යක්ෂ) මුදල්(	1
9	MM 1-1	සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන(	1
10	MM 1-1	ඉංජිනේරු) යාන්ත්‍රික(	1
11	MM1-1	සහකාර අධ්‍යක්ෂ (පරිසර(	1
12	MM 1-1	ශෂ්‍ය විද්‍යාඥ	8
13	MM 1-1	කොට්ඨාශ කළමණාකාර	15
14	MM 1-1	සහකාර අධ්‍යක්ෂ (නීති(	1
15	JM 1-1	ආයතන සංවර්ධන නිලධාරී	6
16	JM 1-1	ඩීවර හා පශු සම්පත් සංවර්ධන නිලධාරී	1
17	JM 1-1	ගොවිපළ කළමණාකාර	2
18	JM 1-1	අභ්‍යන්තර විගණක නිලධාරී	1
19	JM 1-1	තාක්ෂණ ඉංජිනේරු) සිවිල්(	9
20	JM 1-1	ප්‍රවාහන නිලධාරී	1
21	JM 1-1	කෘෂිකර්ම නිලධාරී	2

22	JM 1-1	ව්‍යාපාර සංවර්ධන නිලධාරි	2
අනු අංකය	**සේවා ගණය**	**තනතුර**	**තනතුරු සංඛ්‍යාව**
23	JM 1-1	තාක්ෂණ ඉංජිනේරු (විදුලි(	1
24	JM 1-1	පුස්තකාලයාධිපති	3
25	MA -3	සංවර්ධන සහකාර	2
26	MA 3	ඒකක කළමනාකාර	21
27	MA 3	සහකාර ගොවිපළ කළමනාකාර	1
28	MA 2-2	පොත් තබන්නා	1
29	MA 1-2	කළමනාකරණ සහකාර	11
30	-	**එකතුව**	**100**

2021 වර්ෂයේ පුහුණු කිරීම්

අනු අංකය	**වැඩසටහන් නම**	**වියදම (රු.)**
01	කොට්ඨාස කළමනාකරුවන් සඳහා පුහුණු වැඩමුළුව	537956.00
02	කළමණාකාර සහකාරවරුන් සඳහා පුහුණු වැඩමුළුව	262250.00
03	ආයතනික කළමනාකරණය පිලිබඳ පුහුණු වැඩසටහන) වලව කලාපයේ නිලධාරීන්(	42000.00
04	ගබඩා කළමනාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිලිබඳ පුහුණු වැඩමුළුව	7000.00
	එකතුව	**849,206.00**

4.2 නීති අංශය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නීති අංශය ප්‍රධාන කාර්යාලයේ 8 වන මහලේ ස්ථාපිත කර ඇති අතර එහි ප්‍රධානියා වශයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) කටයුතු කරනු ලබයි.

දැක්ම
මහවැලි ජනපදිකයින්ගේ ජන ජීවිතය නංවාලීම හා සමස්ත මහවැලි අධිකාරිය තුළ උද්ගත වන නෛතික ගැටළු නිරාකරණය කිරීමට හා ගැටළු අවම කිරීමට උපරිම දායකත්වය ලබා දීම.

අරමුණු
උපරිම කාර්යක්ෂමතාවයකින් හා අවම පිරිවැයක් තුළ නෛතික ගැටළු අවම කර ගැනීම සහ අධිකාරියේ ආදායම් උත්පාදනය සඳහා දායක වීම.

නීති අංශයේ කාර්ය භාරයන් සහ උපදෙස් ලබා දෙන විෂය ක්ෂේත්‍ර

- ❖ සේවකයන්ගේ නීතිමය ගැටළු සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ, කාර්මික අධිකරණයේ, කම්කරු විනිශ්චය සභාවේ සිට ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා අදාළ කටයුතු ඉටු කිරීම.

- ❖ ආයතනයට අදාළ සියලු නීතිමය කටයුතුවලදී නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීම සහ අදාළ අධිකරණ කටයුතු සිදු කිරීම.

- ❖ කොන්ත්‍රාත් සහ අවබෝධතා ගිවිසුම් හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙනුවෙන් අත්සන් තබන අනෙකුත් ගිවිසුම් නීතිමය අවශ්‍යතාවන්ට අනුකූල වන ලෙස සකස් කිරීම, අත්සන් ලබා ගැනීම සහ ඉදිරි නීතිමය කටයුතු සිදු කිරීම.

- ❖ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ පාර්ශ්වකරුවන් අතර පවතින ගිවිසුම්, එකඟතා ගනුදෙනු සම්බන්ධ ආරවුල්වලදී ඊට අදාළ බෙරුම් කටයුතු කිරීම සහ / හෝ ඊට අදාළව නඩු පැවරීම් සිදු කිරීම.

- ❖ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉඩම්, දේපළ සම්බන්ධයෙන් නීතිමය ගැටළුවලදී ක්‍රියාත්මක වීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම.

- ❖ කාර්මික ආරවුල්, බෙරුම්කරණ, කම්කරු විනිශ්චය සභා සහ අනෙකුත් අධිකරණමය කටයුතු ඉටු කිරීම.

- ❖ බදු මුදල් පැහැර හැරීම, අනවසර ඉවත් කිරීම් වැනි ඉඩම් රාජකාරීවලදී අවශ්‍ය කරන උපදෙස් ලබා දීම සහ නීතිමය කටයුතු ඉටු කිරීම.

- ❖ අංශයට අදාළ වාර්තා සකස් කිරීම.
- ❖ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අදාළ සියලුම අංශවලින් පැන නගින නීතිමය ගැටළු සඳහා උපදෙස් ලබා දීම.

- ❖ වාහන අනතුරු නඩු

- ❖ කුඩා පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අදාළ උපදෙස් ලබාදීම.

- ❖ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සමාගම් සම්බන්ධ කටයුතු කිරීම හා උපදෙස් ලබාදීම.

- ❖ නෛතික ගැටළුවලට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කිරීම.

2021 වර්ෂයේ තැබූ ඉලක්කයන් හා ලැබූ ප්‍රගතිය
හිඟ බදු අයකර ගැනීමට අදාළව ප්‍රගතිය

- ❖ දැන්වීම් යැවීම.
- ❖ එන්තරවාසි යැවීම.
- ❖ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ අස්කිරීමේ නිවේදන යැවීම.
- ❖ වටිනාකම රු.500,000/- කට අඩු නම් එම ගැටළු සමථ මණ්ඩලය වෙත යොමු කිරීම.
- ❖ නඩු පැවරීම.
- ❖ ඉදිරි වර්ෂ සඳහාද මේ වන විටත් කටයුතු කරමින් පවතී.

2021වර්ෂය තුළ සිදු කළ විශේෂ කාර්යයන් සහ එයින් ජාතික ආර්ථිකයට සිදු කළ_දායකත්වය

- ❖ ශ්‍රී ලංකා මහා අධිකාරියට අය විය යුතු හිඟ බදු මුදල් හා අනෙකුත් පැහැර හරින ලද මුදල් අය කර දීම.

- ❖ යම් යම් සේවක ගැටළු, ඉඩම් ගැටළු සහ අනෙකුත් ආරවුල් අධිකරණමය කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම සමථ කිරීම.

- ❖ විවිධ පාර්ශ්වයන් විසින් රජයට එරෙහිව පවරන ලද නඩුවලදී යුක්තිය ඉටු කිරීමට අවශ්‍ය සහාය ලබා දීම, රජයේ කීර්ති නාමය රැක ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම.

- ❖ යම් අක්‍රමිකතා කරන ලද මහවැලි නිළධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබා දීම තුළ අවංක මහවැලි නිළධාරීන් බිහි කිරීම තුළින් ඵලදායීතා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට දායක වීම. එතුළින් රජය විසින් දැරීමට සිදු වන ලද වියදම් අඩු කිරීම සහ ඒ සඳහා වැයවන රජයේ නිළධාරීන්ගේ කාලය සහ ශ්‍රමය ඵලදායීව යොදා ගැනීමට අවස්ථාව සලසා දීමට හැකි වීම.

- ❖ නීතිමය ගැටළුවලදී නීතිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීමය දායකත්වය සහ උපදෙස් ලබා දීම තුළින් වඩා නීත්‍යානුකූල මඟ පෙන්වීමක් ශ්‍රී ලංකා මහා අධිකාරිය වෙත ලබා දීමෙන් තිරසාර මහවැලි ඉදිරි ක්‍රියාමාර්ග කෙරෙහි දායකත්වය ලබා දීම සහ මහවැලි සේවක හා දේපළ සුරක්ෂිතතාවය සහ අභිවෘද්ධිය සලසා දීමට හැකි වීම තුළින් ජාතික ආර්ථිකයට එම යහපත් ප්‍රතිඵල ලබා දීමට හැකි වීම.

1.4 මුදල් අංශය.

ආයතනයේ ආයතනික සැලසුම‘ හා වාර්ෂික සැලසුම‘ අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජාතික අයවැය ලේඛනය යටතේ මහවැලි අධිකාරිය සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අයවැය යෝජනා සැකසීම, මාසිකව අවශ්‍ය මුදල් පිළිබඳව පූරෝකථනය කිරීම හා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගැනීම, දේශීය හා විදේශීය ව්‍යාපෘති වල වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම, සේවක වැටුප් හා අනෙකුත් ගෙවීම්, භෞතික සම්පත් කළමණාකරනය , විගණන විමසුම් සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ (COPE) විමසුම් අනුව තොරතුරු සැපයීම මෙම අංශය වෙත පැවරෙන මූලික කාර්යභාරයන් වේ.

මූල්‍ය වෙන්කිරීම් හා වියදම් පිළිබඳ විස්තර

	ප්‍රාග්ධන මූලය	ප්‍රතිපාදන (රු.'000)	වියදම් (රු.'000)
පුනරාවර්තන වියදම්		2,161,937	2,161,937
ප්‍රාග්ධන වියදම්		2,421,621	2,421,621
මහවැලි ව්‍යාපෘති			
මහවැලි ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය ‘බී’	දේශීය	194,000	194,000
රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය	137,450	137,450
රඹකැන්ඔය ව්‍යාපෘතිය	දේශීය	172,602	172,602
වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය	දේශීය	207,969	207,969
කෘෂි හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය	418,953	418,953
කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව AMTC		45,029	45,029
එකතුව		3,597,624	3,597,624

දේපළ පිරියත හා උපකරණ

						රු '000
විස්තරය	01.01.2021 දිනට පිරිවැය	මිල දී ගැනීම්	විකිණීම්, බැහැර කිරීම්, මාරුකිරීම්	31.12.2021දිනට පිරිවැය	ක්ෂය වීම	ක්ෂයවීම් අඩු කිරීමෙන් පසු 31.12.2021
ඉඩම්	296,000	-	-	296,000	-	296,000
ගොඩනැගිලි හා කාර්යාල	2,732,276	56,979	-	2,789,256	729,433	2,059,823
ගොඩනැගිලි - වෙනත්	3,090,195	43,248	355	3,133,088	1,840,477	1,292,611
ප්‍රධාන ඇල	74,989,140	-	-	74,989,140	2,200,978	72,788,162
මෝටර් වාහන	1,378,861	362,684	23,598	1,717,946	917,843	800,103
කාර්යාල උපකරණ සහ සුභසාධන අයිතම	165,719	28,867	2,489	192,097	116,084	76,013
විදුලි ජනක යන්ත්‍ර	6,568,922	1,664	162	6,570,424	1,004,879	5,565,546
යන්ත්‍ර හා උපකරණ - වැඩපොළ සේවා	21,220	6,941	25	28,135	15,169	12,966
යන්ත්‍ර හා උපකරණ - ඉදිකිරීම්	489,940	47,798	41	537,696	369,020	168,676
යන්ත්‍ර හා උපකරණ - පොදු	221,225	75,940	2,412	294,753	121,491	173,262
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	316,847	24,536	983	340,400	95,064	245,336
පරිගණක හා උපාංග	148,337	73,394	10,520	211,211	63,289	147,922
ආරක්ෂක උපකරණ	-	4,410	-	4,410	-	4,410
පොත් හා අත්පොත්	5,306	1,225	-	6,532	94	6,437
වේලි	31,764,287	-	-	31,764,287	317,643	31,446,644
එකතුව	**122,188,275**	**727,685**	**40,586**	**122,875,374**	**7,791,463**	**115,083,911**

4.4 මහවැලි ආරක්ෂක බලකාය

හැඳින්වීම :

මහවැලි ආරක්ෂක සංවිධානය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන ඉදිකිරීම් , අවශේෂිත ගොඩනැගිලි සංකීර්ණ සහ දේපළ ආරක්ෂා කිරීම ප්‍රධාන කොටගෙන ද මහවැලි නිළධාරීන් හා කාර්ය මණ්ඩලය / ජනපදිකයින් ආරක්ෂා කිරීම වස් ද **1985 වර්ෂයේ ජූනි 15** දින 1979 අංක 23 දරණ මහවැලි අධිකාරි පනත යටතේ ආරක්ෂක නිළයන් 10කට ආසන්න ප්‍රමාණයකින් සමන්විතව **මහවැලි ආරක්ෂක සංවිධානය** පිහිටුවා ඇත.

මෙම අවධියේ දී මහවැලි ආර්ථික ඒජන්සිය හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ ආරක්ෂක කටයුතු එම ආයතන මඟින්ම ආරක්ෂක නිළධාරීන් සුළු පිරිසකින් ඉටු කර ගත් අතර එම සංඛ්‍යාව ප්‍රමාණයෙන් ඉතා සුළු පිරිසක් වුහ . ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක කටයුතු විමධ්‍යගත කිරීමේ පරමාර්ථයෙන් හා විධිමත්ව පාලන හා මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා මහවැලි අධිකාරියේ උපදෙස් පරිදි මහවැලි ආර්ථික ඒජන්සියේ හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ සේවය කළ ආරක්ෂක නිළයන් 1989 වර්ෂයේ දී මහවැලි ආරක්ෂක සංවිධානය වෙත අන්තර්ග්‍රහණය කරන ලදි.

1985 වර්ෂයේ ජූනි 15 දින මෙම බලකාය ස්ථාපිත කළ අවධියේ ආයතන ප්‍රධානී තනතුර වශයෙන් අධ්‍යක්ෂ තනතුරක් නොතිබූ අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධිකාරි ලත් නිළයක් ද්විතීයික පදනම මත **ආරක්ෂක සම්බන්ධීකාරක වශයෙන්** මෙම ආරක්ෂක සංවිධානය මෙහෙයවන ලදී. ඒ අනුව පළමු වැනි ආරක්ෂක සම්බන්ධීකාරක වශයෙන් **ලුතිනන් කර්නල් එන්.පී. ප්‍රනාන්දු මහතා** 1985 ජූනි 15 දින සිට 1988 වර්ෂය දක්වා මෙම ආයතනයට නායකත්වය ලබා දී ඇත.

ඒ අනුව ආරක්ෂක සම්බන්ධීකාරක වශයෙන් 1988 වර්ෂයේ සිට 1989 මැද භාගය දක්වා **කර්නල් බී මහීපාල මහතා** කටයුතු කර ඇති අතර 1989 වර්ෂයෙන් පසු මෙම ආයතනයේ විෂය පථය පුළුල් වීම හේතුවෙන් හා මෙම ආයතනය භාවිතා කරනු ලබන අවි ආයුධ ආදියට මෙන්ම එකල ප්‍රධාන වශයෙන් ආරක්ෂාව සපයන ලද වික්ටෝරියා , රන්දෙණිගල , මාදුරු ඔය , කොත්මලේ , පොල්ගොල්ල , බෝවතැන්න ආදී සීමිත වූ නමුත් අතිශය සංවේදී ආර්ථික මර්මස්ථාන වල ආරක්ෂාව සම්බන්ධව සෘජු වගකීම හා වගවීම සම්බන්ධව සළකා බලා 1990 වර්ෂයේ දී **අධ්‍යක්ෂ (ආරක්ෂක)** තනතුර ස්ථාපිත කරන ලදී.

ඒ අනුව මහවැලි ආරක්ෂක සංවිධානයේ **පළමු අධ්‍යක්ෂ (ආරක්ෂක) වශයෙන් මේජර් තිලක් රත්නසේකර මහතා** රාජකාරි ඉටු කර ඇත.
එසේම ආරම්භක අවධියට වඩා 1990 දශකයේ අග භාගය වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක අවශ්‍යතාවයන් විශාල ලෙස පුළුල් වීමත් සමඟම එතෙක් පැවති මහවැලි ආරක්ෂක සංවිධානය නව සන්නාමයකින් **මහවැලි ආරක්ෂක බලකාය** වශයෙන් සංශෝධනය කරන ලදී.

කෙසේ වුවද 2011 වර්ෂයේදී බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනයේ දී මෙම ආයතනයේ එතෙක් පැවති අධ්‍යක්ෂ (ආරක්ෂක) තනතුර අහෝසි කර ඒ වෙනුවට සහකාර අධ්‍යක්ෂ (ආරක්ෂක) තනතුර ස්ථාපිත කරමින් ඒ වන විට අධ්‍යක්ෂ (ආරක්ෂක) තනතුරේ රාජකාරි ඉටු කරමින් සිටි අධ්‍යක්ෂවරයා ඔහුගේ තනතුරට පුද්ගලික වන සේ තබා ඇති බව දැන්වේ. ඒ අනුව දැනට මහවැලි ආරක්ෂක බලකායට නායකත්වය දෙනු ලබන්නේ සහකාර අධ්‍යක්ෂ (ආරක්ෂක) විසිනි.

එසේම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ අලුතෙන් ඉදි වූ හා ආරම්භ කළ මොරගහකන්ද , කළු ගඟ , ආදී සුවිශාල ජලාශ වල ආරක්ෂක වගකීම මෙන්ම රඹකැන්ඔය , ඊ කලාපය , මාදුරුඔය දකුණු ඉවුර , මයුරපුර වන අලි කළමනාකරණ රක්ෂිතය ආදී ස්ථාන වලද ආරක්ෂක කටයුතු මේ වන විට මෙම බලකාය මඟින් ඉටු කරනු ලැබේ. විශේෂයෙන් මේ වන විට රටේ පවතින තත්ත්වය අනුව මුල් අවධියේ පැවති කාර්යභාරයට වඩා ආරක්ෂක විෂය පථය පුළුල් වීමත් සමඟ සුවිශේෂී ආරක්ෂක මර්මස්ථාන සම්බන්ධ වගකීම වත්මන මෙම අංශයට පැවරී ඇති අතර ඒ අනුව **වික්ටෝරියා , කොත්මලේ , රන්දෙණිගල , පොල්ගොල්ල , රන්ටැඹේ , මාදුරුඔය , මොරගහකන්ද , කළු ගඟ , බෝවතැන්න , උඩවලව ඇතුලු මහවැලි අධිකාරියට අයත් ප්‍රධාන ජලාශ හා වාරි පද්ධති ගොඩනැගිලි හා දේපොළ ආරක්ෂා කිරීම් , ඉඩම් හා වන සංරක්ෂණ කටයුතු , කාර්යාල , වැඩ බිම් , ගොවිපොළ හා ව්‍යාපාරික ස්ථාන ආරක්ෂා කිරීම අනවසර ක්‍රියාකාරකම් වැළැක්වීම , අල්ලස් ගැනීම් වැනි නීති විරෝධී ක්‍රියා පාලනය කිරීම , ආරක්ෂක කටයුතු සංවිධානය කිරීම , බුද්ධි තොරතුරු රැස් කිරීම, විශේෂිත ආරක්ෂක මෙහෙයුම් සැළසුම් කිරීම , මහවැලි අධිකාරියේ නිලධාරීන් සඳහා ආරක්ෂාව සැපයීම , මහවැලි අධිකාරියේ පොදු අවශ්‍යතා සඳහා ආරක්ෂක සහය ලබා දීම , ප්‍රභූ ආරක්ෂාව සැපයීම සහ ජාතික ආරක්ෂාවට සහය ලබා දීම** වැනි වගකීම් සහගත කාර්යභාරයක් මේ වන විට මෙම බලකායට පැවරී ඇත.

ප්‍රධාන අරමුණු

- මහවැලි සංවර්ධනය යටතේ ඉදි කරනු ලැබූ ප්‍රධාන ජලාශ , ඇළවේලි හා ගොඩනැගිලි ඇතුලුව 1979 අංක 23 දරණ පනත ප්‍රකාරව නිශ්චල හා චංචල දේපළ , කායමණ්ඩල සහ කොන්ත්‍රාත්කරුවන් විසින් භාර දෙන ලද ව්‍යාපෘති හා දේපළ වලට ආරක්ෂාව ලබා දීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සියලුම කාර්යාල සංකීර්ණ , ගොඩනැගිලි , ගබඩා පරිශ්‍ර ආදියට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් කාර්යමණ්ඩලවලට හා ජනපදිකයින්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම.

අනෙකුත් රාජකාරින් හා කාර්යභාරය

- ගරු මහවැලි සංවර්ධන අමාත්‍යතුමා හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමන්ලා ඇතුළු මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ , ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රභූ සම්මාන සහ ප්‍රභූ ආරක්ෂක රාජකාරින් මහවැලි ක්‍රීඩා සහ අනෙකුත් විශේෂ උත්සව සඳහා අවශ්‍ය සම්මාන සහ ආරක්ෂක රාජකාරින් ඉටු කිරීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දේපළ ආරක්ෂාව සම්බන්ධයෙන් යුද හමුදාව හා පොලිසිය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු මුදල් හා වටිනා දේපළ ප්‍රවාහනයේ දී ආරක්ෂාව සැපයීම.

- මහවැලි ආරක්ෂක බලකායට හා අනෙකුත් ආයතන වලට අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම.

- මහවැලි ආයතනයන් හි ප්‍රධාන නිලධාරින්ට සහ ව්‍යාපෘතිභාර නිලධාරින්ට ඔවුන් සේවය කරන ආයතන වල මුරකරුවන්ගේ රාජකාරින් අධික්ෂණය කිරීමෙන් සහය වීම.

- මහවැලි අධිකාරියේ සහ ඊට අයත් ආයතන වල සොරකම් අයතා පාවිච්චිය සහ වංචා නැවැත්වීමට කටයුතු කිරීම හා එසේ කරන පුද්ගලයින්ට විරුද්ධව කටයුතු කිරීම.

- මහවැලි අධිකාරි පනත යටතේ මහවැලි ප්‍රදේශවල අනවසර පදිංචි වීම් , අනවසර ඉදි කිරීම් හා අනවසර කටයුතු වැළැක්වීම.

- මහවැලි අධිකාරියට අයත් පුපුරන ද්‍රව්‍ය , අවි ආයුධ ,පතරොම් යන ද්‍රව්‍ය තබාගැනීම , ආරක්ෂා කිරීම , බෙදා හැරීම හා ගිණුම්ගත කිරීම.

- මහවැලි අධිකාරියට හා ඊට අයත් ආයතන වලට ආරක්ෂක උපදේශන සේවා සැපයීම.

- මහවැලි අධිකාරිය , කාර්යමණ්ඩලවලට හා ජනපදිකයින්ට අවශ්‍ය පරිදි ආරක්ෂක පුහුණුවීම් පැවැත්වීම.

මහවැලි ආරක්ෂක බලකායේ ප්‍රධාන කාර්යභාරය ඉහත පරිදි වන අතර , එය රජයේ වාරිමාර්ග අමාත්‍යාංශයේ මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී සහ එයට අනුකූල වන දේපළ හා පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා සැකසූවකි. මෙහි කාර්යභාරය ක්‍රියාවට නැංවීමේ දී **මහවැලි ආරක්ෂක බලකායට අණ දීම සහ උපදෙස් දීම සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙක් ද ඒ යටතේ මෙහෙයුම් අංශයක් ද , ක්ෂේත්‍රයේදී එම අණ සහ උපදෙස් ක්‍රියාවට නැංවීමට බල ප්‍රදේශ 10ක් ද , අවශ්‍ය පරිදි ආරක්ෂක නිලධාරින් සහ ආරක්ෂක නියාමකයින්ගෙන් සමන්විත විශාල , මධ්‍යම හා කුඩා වශයෙන් අනුඛණ්ඩයන් 42ක් ද දැනට ස්ථාපිත කර ඇත** . එසේම සියළුම නිළයන්ගේ පාලන හා වැටුප් ගෙවීම් ආදී ගිණුම් කටයුතු ඉටු කරලීම සඳහා 50 දෙනෙකුගෙන් පමණ සමන්විත සිවිල් කාර්යමණ්ඩලයක් ද සේවයේ නිරත අතර දිගන මෙම බලකා මූලස්ථානය මඟින් එකී කටයුතු ඉටු කරනු ලැබේ . ඒ අනුව 2021 නොවැම්බර් මාසය වන විට අප බලකායේ සම්පූර්ණ ආරක්ෂක කාර්යමණ්ඩලය 620කි .

එම ආරක්ෂක රාජකාරින් ඉටු කරන ආරක්ෂක නිළයන් මනා සංයමයකින් හා විනයකින් යුතුව රාජකාරි කටයුතු වල නියැලීම පිණිස අවශ්‍ය ස්ථාවර නියෝග හා උපදෙස් නිකුත් කර ඇත.

මහවැලි ආරක්ෂක බලකාය රජයේ වෙනත් සිවිල් ආරක්ෂක ආයතන වලට වඩා මනා නිපුණත්වයකින් ද , අවි ආයුධ සන්නද්ධව සැකසුන විධිමත් ආරක්ෂක අංශයකි.

2021 වර්ෂයේ අත් පත් කර ගත් ඉලක්ක හා විශේෂ සිදුවීම්

තවද 2020 වර්ෂයේ මාර්තු 18 දින සිට රට පුරාම පැතිරී ගිය මාරාන්තික කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සිවිල් කාර්යමණ්ඩලය නිසි පරිදි රාජකාරියට වාර්ථා නොකළ පසුබිමක තම ජීවිත අවදානම ද නොතකා , ඇතැම් අවස්ථාවන්හී දී තම පුද්ගලික ගමනාගමන ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් ආරක්ෂක රාජකාරි අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යෑමේ අරමුණ සහිතව බොහෝමයක් ආරක්ෂක නිළයන් රාජකාරියට වාර්තා කරමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලු නිශ්චල හා චංචල දේපළ සුරැකීම සඳහා ඉමහත් පරිශ්‍රමයක් හා දැඩි කැපකිරීමක් සිදු කළ බව ද අභිමානයෙන් යුතුව සිහිපත් කරමු.

එසේම මහවැලි ආරක්ෂක බලකායේ ආරක්ෂක කටයුතු විධිමත්ව හා අඛණ්ඩව පවත්වාගෙන යෑමේ අරමුණින් මෙම බලකායේ ආරක්ෂක කටයුතු සඳහා ESCORT AIMGUARD වර්ගයේ රිපීටර් ගිනි අවි 150ක් 2021 මාර්තු මස 02 දින මිළදී ගැනීමට හැකි විය.

තවද එම නව අවියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විධිමත් පුහුණුවක් සහ යාවත්කාලීන දැනුමක් ලබා දීම සඳහා මෙන්ම මෙම බලකායේ ආරක්ෂක නිළයන්ගේ පෞර්ෂත්වය හා ආයතනයීය ජීව ගුණය වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව එක් කලාපයකට කණ්ඩායම් දෙකක් වශයෙන් දෙදිනක විශේෂ පුහුණු පාඨමාලා වැඩසටහනක් පැවැත්වීමටද අධ්‍යක්ෂ ජනරාල් තුමා (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය)ගේ අනුමැතිය හිමි විය.

ඒ අනුව එහි පළමු අදියර ලෙස 2021 අගෝස්තු 15 දින සිට 2021 අගෝස්තු 20 දින දක්වා වලව කලාපයේ ආරක්ෂක නිළයින් උදෙසාද , දෙවන අදියර වශයෙන් 2021 නොවැම්බර් 07 දින සිට 2021 නොවැම්බර් 12 දක්වා මොරගහකන්ද කළුගඟ කලාපයේ ආරක්ෂක රාජකාරි නිරත නිළයන් උදෙසාද , තෙවන අදියර වශයෙන් 2021 දෙසැම්බර් 04 දින සිට 2021 දෙසැම්බර් 09 දක්වා රන්දෙණිගල සහ සී කලාප වල ආරක්ෂක රාජකාරි නිරත ආරක්ෂක නිළයන් උදෙසාද වශයෙන් ඉතා කෙටි කාලයක් තුළ මෙම බලකායේ සම්පූර්ණ බල සංඛ්‍යාවෙන් විශාල පිරිසක් උදෙසා ඉතා සාර්ථකව පවත්වා අවසන් කිරීමට හැකි වීම අප බලකාය ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය.

2021 අත්පත් කර ගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය

<u>ගිණුම් අංකය</u>

2003	ණය පොලී ආදායම	1.02
2005	දඩ පොලී ආදායම	0.04
2008	නොගෙවන ටෙන්ඩර් තැන්පත්	-
2010	විවිධ ආදායම්	-
එකතුව		1.06

		මිලියන
2021	වසරට වෙන් වූ මුදල	28.0
2005	වසරට ඉලක්කය	28.0
2008	වර්ෂයේ ප්‍රධාන කාර්යාලයෙන් ලැබූ මුදල	28.0
2010	වර්ෂයේ වියදම් වූ මුදල	11.80
		% 42.00

<u>මූල්‍ය ප්‍රගතිය</u>

ගිණුම් අංකය		වෙන් වූ මුදල (මිලියන)	වියදම් වූ මුදල (මිලියන)
2385	ගොඩනැගිලි	4.25	10.0
2383	වාහන නඩත්තු	2.7	. 2.19
2386	කාර්යාල උපකරණ	0.049	0.1
2112	ආරක්ෂක උපකරණ	13.554.41	
2706	ගෘහ භාණ්ඩ හා උපාංග	1.250.91	
		28.111.80	

4.5 ප්‍රවාහන අංශය.

හැඳින්වීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය වන සේවාවන් අතර ප්‍රමුඛ කාර්යය භාරයන් ප්‍රවාහන අංශය වෙත පැවරෙයි. ඒ සඳහා ආයතනයේ ප්‍රවාහන සේවාව, ආයතනය තුළ පවතින භෞතික හා ශ්‍රම සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගෙන කඩිනම් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලෙස ආර්ථික, සාමාජීය හා පාරිසරික බලපෑම් අවම කරගනිමින් විධිමත් අයුරින් පවත්වාගෙන යාම ප්‍රවාහන අංශයේ මූලික කාර්යය ලෙස දැක්විය හැකිය.

නව සංකල්ප හා නවීන තාක්ෂණ ක්‍රමවේද වෙත අනුගත වෙමින් පරිසර හිතකාමී සේවාවන් ලෙස පවත්වාගෙන යාම යුගයේ අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉටුකිරීමට නිවැරදි මඟ පෙන්වීම, අවශ්‍ය උපදෙස් ලබා දීම, සංචිත වාහන කළමනාකරණය කිරීම නිවැරදි මඟකට යොමු කිරීම තුළින් වඩාත් ඵලදායී පරිසර හිතකාමී කාර්යක්ෂම සේවාවන් ලබා දීම අපගේ පරමාර්ථය වේ. අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය රජයට වැය බරක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු බවත්, එහි ආදායම් උපද්දවා හෝ ලාභ ලබන ආයතනයක් ලෙස ඉදිරියට කටයුතු කල යුතු බවටත් මහා භාණ්ඩාගාරය (මුදල් අමාත්‍යාංශය) විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව, ඉදිරි කටයුතු සැලසුම් කිරීමේදී ප්‍රවාහන කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරවන ලදි.

අංශයේ ප්‍රධාන කාර්යයන් හා වගකීම

අධිකාරියට අයත් සියලුම වාහන සම්බන්ධයෙන් වගකීම, සියලුම වාහනවල අලුත්වැඩියාව හා නඩත්තුව හා වාහන නඩත්තු සහ ඉන්ධන සඳහා වාර්ෂික වියදම් සකස් කිරීම, ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික නියමිත දිනට යාවත්කාලීන කිරීම,රාජකාරී සඳහා නිලධාරීන් වෙත වාහන වෙන් කිරීම, රියදුරන්ට සහ රිය සහයකයන්ට රාජකාරී පැවරීම, වාහන ලැයිස්තුවක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම, වාහන වලට සිදුවන හදිසි අනතුරු අවස්ථාවලදි විධිමත් ක්‍රියා පරිපාටිය කටයුතු කිරීම, කලාප සහ ප්‍රාදේශිය කාර්යාලවල ප්‍රධානීන් සහ ප්‍රවාහන නිලධාරීන් සමඟ අදාළ විෂය සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම, වාර්තා ලබා ගැනීම සහ යාවත්කාලීන කිරීම ආදිය ප්‍රවාහන අංශයේ ප්‍රධාන කාර්යයන් හා වගකීම් වේ
3.0 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුව වාහන 895 ක සංචිතයක් පවති. එය මෝටර් වාහන 552 ක් ද බර වාහන 214 ක් හා යන්ත්‍රෝපකරණ (ලෝඩර්, ජේ.සී.බී ආදි) 129 කින් සමන්විත වේ. (මෝටර් වාහන වල සාරාංශ සටහනක් පහත වගුවේ දැක්වේ.

වාහන වර්ගය	වාහන ගණන 2021.12.31					එකතුව
	අවුරුදු 0 - 5	අවුරුදු 5 - 10	අවුරුදු 10 - 15	අවුරුදු 15 - 20	අවුරුදු <20	
	(2021-2015)	(2014-2010)	(2009-2005)	(2004-2000)	(1999 <)	
මෝටර් බයිසිකල්		5	09	5	5	24
ත්‍රී රෝද රථ					3	3
මෝටර් කාර්			1		9	10
ජීප්	1	3	2	13	198	218
ඩබල් කැබ්	38	33	33	78	86	268
බස්/වෑන්	3	3	5	4	14	29
එකතුව	42	44	50	100	315	552

ඉහත සඳහන් මෝටර් වාහන, යන්ත්‍ර සූත්‍ර හා ට්‍රැක්ටර් ධාවනයට කරවීමට හා ක්‍රියාකරවීම සඳහා පිළිවෙලින් රියදුරන් 413ක්, යන්ත්‍ර ක්‍රියාකරුවන් 71ක්, ට්‍රැක්ටර් රියදුරන් 13ක් හා රිය සහයකයින් /අත් උදව්කරුවන් 39 ක් සේවය කරනු ලබයි.

මූල්‍යමය ප්‍රගතිය

2021 වසරේ ප්‍රවාහන අංශ සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 71.31 ක් වෙන් කරන ලදි. එම ප්‍රාග්ධන මුදල ප්‍රධාන කාර්යාලය ඇතුළුව කලාප කාර්යාල වෙත පහත ආකාරයෙන් වෙන් කර ලබා

දි ඇත.

ප්‍රධාන කාර්යාලය	බී කලාපය	සී කලාපය	ඩී කලාපය	ඊ කලාපය	ජී කලාපය	එච් කලාපය	නුරුළුවැව කලාපය	රඹකැන්ඔය කලාපය	වලව කලාපය
10.0	11.71	9.75	1.4	5.0	6.0	13.0	4.0	6.90	10.45

වාහන වල එන්ජිම, අවලම්බන පද්ධතිය, ටින්කරින් හා පින්තාරු කිරීම හා වාහන වල (ඇතුළත හා පිටත) වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා මෙම ප්‍රාග්ධන මුදල යොදවා ගත් අතර, එහි ප්‍රගතිය 100%කි. අළුත් වාහන ආනයනයට පනවන ලද සීමා හේතුවෙන් දැනට පවතින වාහන අළුත්වැඩියා කර ධාවනයේ යෙදවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදි.

ඉන්ධන, රියදුරු ගෙවීම්, අතිකාල, යැපීම්, වාහන වල සුළු අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවු අතර, 2021 වසරේ අධිකාරියේ සමස්ථ පුනරාවර්තන වියදම රු.154,542,000.00ක් වේ

පුනරාවර්තන වියදමින් සිදුකරනු ලැබූ වියදම් වල සාරාංශ සටහනක් පහත දැක්වේ. ඒවා විධිමත් අයුරින් කළමනාකරණය කිරීමට ප්‍රමුඛතාවය ලබා දි කටයුතු කර ඇත.

වාර්ෂික පුනරාවර්තන වියදම 2021	
ඉන්ධන සඳහා වියදම	රු. 81,518,000.00
වාහන අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු සඳහා වියදම	රු. 66,539,000.00
රක්ෂණය හා ආදායම් බලපත්‍ර ගාස්තු ගෙවීම සඳහා වියදම	රු. 4,326,000.00
වාහන කුලී පදනම මත ලබා ගැනීම සඳහා වියදම	රු. 2,159,000.00
පුනරාවර්ථන වියදම් හි එකතුව	රු. 151,542,000.00

ඉහත තත්වය මත හා ක්‍රය ශක්තිය හීන වන වාහන නඩත්තුව හා අළුත්වැඩියාවන් සඳහා ඉදිරි වසරට වෙන් කරනු ලබන ප්‍රතිපාදන වැඩිකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

3.2 අධිකාරිය සතු මෝටර් වාහන වල අයිතිය පිළිබඳව ගැටළු නිරාකරණය කර ගැනීම

පසුගිය වසර තුළ වෙනත් ආයතන හා දෙපාර්තමේන්තු වෙත මුදා හැර තිබූ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නමින් ලියාපදිංචි වාහන 30 ක් නැවත අධිකාරිය වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදි. එසේම වෙනත් ආයතන හා දෙපාර්තමේන්තු වෙත තාවකාලිකව දීර්ඝ කාලයක් ලබා දි තිබූ වාහන 5 ක් ස්ථිරවම එම ආයතන වෙත ලබා දීමට විධිමත් අයුරින් කටයුතු සිදු කරන ලදි.

3.3 ධාවනය කළ නොහැකි තත්වයේ පවතින මෝටර් වාහන අපහරණය කිරීම

මුදල් අමාත්‍යාංශය මඟින් ලබා දි ඇති උපදෙස් අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුළ භාවිතායෙන් ඉවත් කරන ලද අපහරණයට යෝජිත වාහන හා යන්ත්‍ර සූත්‍ර හා අබලි ද්‍රව්‍ය අයිතමයන් 145 ක් හඳුනා ගත් අතර, එයන් තවත් වාහන 37 ප්‍රමාණයක් අළුත්වැඩියා කිරීමට ඉවත් කරන ලදි. අපහරණ කමිටුව විසින් එම හඳුනාගත් වාහන වලින් මෝටර් වාහන ලෙස 45 ක්ද, ලියාපදිංචිය අහෝසිකර අබලි යකඩ ලෙස අපහරණයට වාහන 63 ක් ද නම් කරන ලදි. අපහරණයේ ඉදිරි කටයුතු 2022 වර්ෂයේ දි ටෙන්ඩර් මඟින් අවසන් කිරීමට සැලසුම් කර ඇත.

3.4 අධිකාරිය සතු වාහන කළමනාකරණය කිරීම සහ තොරතුරු යාවත්කාලීන කිරීම

- රජයේ නිලධාරින්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව අධිකාරියේ ඉහළ කළමනාකාරිත්වය විසින් ලබා දි

ඇති උපදෙස් හා මහ පෙන්විම් යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සංචිත වාහන කළමනාකරණය කිරීම තවදුරටත් නිවැරදි මහකට යොමු විය. එම ක්‍රියාදාමය ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක අතර, එම පිළිවෙත් කලාප කාර්යාල තුළ ක්‍රියාත්මක කිරීමෙන් ඵලදායි මෙන්ම කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට හැකි වී ඇත.

- ප්‍රධාන කාර්යාලයේ වාහන කළමනාකරණයේ දී වෙන් කරනු ලබන වාහන (නිල වාහන හිමිකාරිත්වය) හැර සෙසු සියලුම වාහන ප්‍රවාහන සංචිතය තුළ කළමනාකරණය කරනු ලබයි. එදිනෙදා රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා දෛනික වාහන ඉල්ලීම් මසකට 150-175 අතර ප්‍රමාණයක් ඉදිරිපත් වන අතර, මසකට ක්ෂේත්‍ර චාරිකා 70 ක් පමණ ඉදිරිපත් කරනු ලබයි. මෙම සියළුම ඉල්ලීම් දැනට සංචිතය තුළ පවතින සීමිත සම්පත් තුළින් (රියදුරු මහතුන් 18 හා වාහන) කළමනාකරණය කර ගැනීමට ප්‍රවාහන අංශයට සමත් වී ඇත.
- මෙසේ එක් සංචිතයක් තුළ වාහන කළමනාකරණය කිරීම තුළින් නිවැරදි ප්‍රවාහන කළමනාකරණයක් ඉටු කිරීමට හැකියාවක් ලැබී ඇති අතර ප්‍රවාහන පහසුකම් සඳහා අධිකාරිය විසින් දරණු ලබන ඉන්ධන හා අනෙකුත් වියදම් පාලනය කර ගැනීමට හැකියාව ද ලැබී ඇත. මීට අමතරව වාහන අවභාවිතය, සීමිත වූ ශ්‍රමය හා කාලය ඉතිරි කර ගැනීමට මෙන්ම ආර්ථික,සාමාජීය හා පාරිසරික බලපෑම් අවම කිරීමට හැකියාව ලැබී ඇත.
- සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට කලාප කාර්යාල වෙතින් ලබා ගැනීම හා අවශ්‍ය පාර්ශවයන් වෙත තොරතුරු සැපයීම.
- 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රජය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, අධිකාරියේ වාහන වල ඉන්ධන දහනය විම නැවත පරීක්ෂාව සඳහා කටයුතු ආරම්භ කිරීම.

- මෙම වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලයේ වෙන් කරන ලද වාහන (නිල වාහන හිමිකම් ඇති) හැර අනෙකුත් සියලුම වාහන එක් සංචිතයක් තුළින් කළමනාකරණය කල අතර, අධිකාරියේ රාජකාරි අවශ්‍යතා සඳහා වාහන හා රියදුරු මහතුන් වෙන් කිරීම ප්‍රවාහන අංශය තුළින් පමණක් සිදු කරන ලදි.

මේ හේතුවෙන් පෙර වර්ෂයන්ට සාපේක්ෂව වාහන අවභාවිතය ඉන්ධන සඳහා වැය වන මුදල්, පැවති කළමනාකරණ ගැටළු අවම කර ගැනීමට හැකිවුවා මෙන්ම පවතින සංචිතයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි විය. රජයේ මහ පෙන්විම් අනුව පිළිගත් නිවැරදි ප්‍රවාහන කළමනාකරණය වෙත යොමු විමට අවස්ථාව උදාවිය.

3.5 වාහන අනතුරු

2021වසර තුළ සමස්ථ (කලාප කාර්යාල ඇතුළුව) වාහන අනතුරු සංඛ්‍යාව 21 ලෙස වාර්තා වී ඇති අතර එය පසුගිය වසර වලට සාපේක්ෂව අඩු මට්ටමක පවති.

4.0 අභියෝග හා අනාගත අරමුණු

- ප්‍රධාන කාර්යාලයේ හා කලාප කාර්යාලය තුළ ප්‍රවාහන අංශය සඳහා ප්‍රවාහන නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම කටයුතු කළමනාකරණය විධිමත් කිරීම සඳහා පවතින ප්‍රධානම අභියෝගයක් වේ. මේ නිසා ඉදිරියේ දී එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම කළ යුතුව ඇත.
- රජයේ ප්‍රතිපත්ති වලට සමගාමීව (සෞභාග්‍යයේ දැක්ම) දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක් යන තේමාව මුල් කරගෙන ඵලදායි හා කාර්යක්ෂම ප්‍රවාහන සංචිත කළමනාකරණය කිරීමට නවින/කාලීන තාක්ෂණ ක්‍රමවේද (Information Communication Technology (ICT), Global Positioning System (GPS), Fleet Management Soft wear (FMS) අනුගමනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදි. අධිකාරිය තුළ ඉදිරියේ දී මෙම තාක්ෂණ ක්‍රමවේද අනුව ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු සැලසුම් කිරීමට අපේක්ෂා කරයි.
- වාහන අළුත්වැඩියා කිරීමේදී සීමාවක් නොමැතිව (මාස ගණන් හා වර්ෂ ගණන්) පමාවිම සංචිත කළමනාකරණයේදී මුහුණ දෙන ප්‍රධාන සාධකයක් ලෙස හැඳින්විය හැකිය. වාහන අලුත්වැඩියාවන් අභ්‍යන්තර හා බාහිර ලෙස ප්‍රධාන වශයෙන් වර්ග කල හැකිය. බාහිර අලුත්වැඩියාවන් සඳහා ටෙන්ඩර් හෝ මිළ ගණන් කැඳවීම කලයුතු වුවද අභ්‍යන්තර අළුත්වැඩියාවන් සඳහා එසේ කිරීමට හැකියාවක් නොවේ.
කෙසේ වෙතත්, මෙම තත්වයන් පැහැදිලි කර නොගැනීම හේතුවෙන් හා ප්‍රසම්පාදන පිළිවෙත් සංකීර්ණ තත්වයකට පත් කර ගැනීම හා යාථාවත් නොවීම නිසා මෙවැනි තත්වයන්ට මුහුණ පෑමට සිදුවී ඇත. ක්‍රමවත් නිවැරදි පුහුණු පාඨමාලා හා රජය විසින් නිකුත් කරනු ලබන නීති රිති හා චක්‍රලේඛ සම්බන්ධව අදාළ නිලධාරීන් දැනුවත් කිරීම ඉතා වැදගත්වේ.

- ප්‍රවාහන අංශය වෙත පැවරී ඇති රාජකාරීන් ස්වාධීනව ඉටු කිරීමේදී මුහුණ පෑමට සිදුවී ඇති බලපෑම් අවම කර ගැනීම. මෙහිදී යාන්ත්‍රික වැඩපල (මෝටර් රථ අලුත්වැඩියා) වෙන් වශයෙන් නොව එක වහලක් යටතේ කළමනාකරණය වීම තුළින් ඵලදායී හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා ගත හැකිය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඇතුළු බොහෝ රාජ්‍ය ආයතන වල ප්‍රවාහන සංවිත කළමනාකරණ කටයුතු 1970 දශකය පටන් පවත්වාගෙන එනු ලබන සාම්ප්‍රදායික ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබයි. මෙම පැරණි ක්‍රමවේද අද ලෝකය තුළ පවතින නවීන ක්‍රමවේද (තාක්ෂණ ක්‍රම) සමඟ සමාන්තරව ඉදිරියට ගෙන යාම යුගයේ අවශ්‍යතාවයන් ලෙස පෙන්වා දිය හැක.

එබැවින්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුළ එම නවින ක්‍රමවේද අනුගමනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉටු කළමුත්, ඒ සඳහා වූ ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමේදී පැවති අපහසුතාවයන් නිසා එය ඉදිරියට ගෙන යාමට හේතුවිය.

කෙසේ වෙතත්, නවින තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දී නිවැරදි ලෙස කඩිනම් හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවන් ලබා ගැනීමට අප සැම විටම උත්සහ ගනිමින් සිටින්නේය. මෙසේ සාමාජීය, ආර්ථික මෙන්ම පාරිසරික ගැටලු අවම කර ගැනීමටත් කඩිනම් හා කාර්යක්ෂම ඵලදායී සේවාවන් ලබා ගත හැකි මාර්ග කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමුකර ඇති බව සඳහන් කරමි.

පස්වන පරිච්ඡේදය
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පිහිටවනු ලැබ ඇති සමාගම්
I කොටස

සමාගම් පනතේ යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදුකළ ව්‍යාපාරික කටයුතු වලින් කොටසක් කළමනාකරණ සඳහා පහත සඳහන් පෞද්ගලික සමාගම් වෙත පවරා දී ඇත.

- සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික)සමාගම
  Mahaweli Livestock & Agro Enterprises (Pvt) Ltd
- සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශය (පුද්ගලික)සමාගම (MCB)
  Mahaweli Consultancy Bureau (Pvt) Ltd
- ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික)සමාගම(NRMS)
  Natural Resources Management Services (Pvt) Ltd

2021 වර්ෂය තුළ සමාගම් වල කාර්යය සාධනය

අ.අ.	සමාගම	වර්ෂය තුළ ඉටුකළ කාර්යයතත්වය/
01	සී‍ෘ ස මහවැලි පශු සම්පත් හා කෘෂි/ සමාගම (පුද්) ව්‍යාපාරික	▪ පළාතේ කිරි ගොවීන්ගෙන් කිරි එකතු කිරීම හා ඔවුන්ට එමඟින් සේවාවන් සැපයීම. ▪ කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා ඒ නිෂ්පාදන මහවැලි කලාප සහ අවට ප්‍රදේශ වල අළෙවි කිරීම. ▪ පුං ගවයන් ලෙස යොදා ගැනීම සඳහා මීගවයන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දීම. ▪ 2021 වසරේ මුල් කාර්තු දෙක තුළදී තත්වයෙන් උසස් බ්‍රොයිලර් මස් නිෂ්පාදනය කර අළෙවිය. ▪ මහකන්නයේ ගිරාදුරුකෝට්ටේ සත්ව ගොවිපල අක්කර 200 ක් බඩ ඉරිගු වගාව සඳහා ගොවීන් වෙත ලබා දීම සහ කුඹුරු අක්කර 25 ක් කුඹුරු වගා සිදු කර ඇත. ▪ දම්මින්න සත්ව ගොවිපලේ කන්න දෙකක් බිත්තර වී සඳහා හෙක්ටයාර 08 (අක්කර 20) වගා කර ඇත. ▪ සුළු වශයෙන් ඩ්‍රැගන් පෘට් වගාව
02.	සීස මහවැලි උපෙදේශ/ සේවා කාර්යාංශය සමාගම (පුද්)	මෙම සමගම 2020.12.30දින සිට වාරිමාර්ග අමාත්‍යාංශයට මාරු වී ඇත.
.03	සී ස ස්වභාවික සම්පත්/ කළමනාකරණ සේවා පුද්ගලික	ඈවර කිරීමට තීරණය කිරීමෙන් පසු සියලුම මුල්‍ය ප්‍රකාශන නීති අංශයට භාර දී ඇත.

වාර්ෂික ගිණුම්

II - කොටස

2021.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

			සමූහය			අධිකාරිය	
			රු '000	රු '000		රු '000	රු '000
			2021	**2020**		**2021**	**2020**
	සටහන්						
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපළ පිරියත හා උපකරණ	**(1)**		115,083.911	118,854,645		115,030,068	118,798,415
ආයෝජන (දිගු කාලීන)	**(2)**		23,104	164,555		437,085	530,787
අස්පෘෂ්‍ය වත්කම්			6	785		6	785
ප්‍රාග්ධන නොනිම් වැඩ			28,496	36,0333		28,496	36,033
ජංගම නොවන වත්කම් එකතුව			115,135,517	119,056,017		115,495,656	119,366,020
පෙජව වත්කම් - ප්‍රාග්ධන	**(3)**		286,717	259,342		278,294	250,156
ජංගම වත්කම්							
භාණ්ඩ තොග	**(4)**		278,716	155,905		275,535	151,895
පෙජව වත්කම් - වෙළඳ	**(3)**		41,118	42,721		40,242	42,363
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**(5)**		3,432,901	2,383,580		3,424,119	2,362,374
බැංකු ඇපකර			-	377		-	-
මුදල් හා මුදල් සමාන දෑ	**(6)**		1,177,597	667,498		1,175,376	662,746
ජංගම වත්කම් එකතුව			4,930,332	3,250,081		4,915,272	3,219,378
වත්කම් එකතුව			**120,352,566**	**122,565,441**		**120,689,222**	**122,835,554**
බැරකම්							
ජංගම බැරකම්							
ගෙවිය යුතු	**(7)**		39,894,796	39,747,952		39,892,577	39,735,335
උපචිත වියදම්	**(8)**		104,067	94,563		67,279	54,804
ජංගම බැරකම් එකතුව			39,998,864	39,842,515		39,959,856	39,790,139
ජංගම නොවන බැරකම්							
පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම්	**(9)**		1,343,221	1,424,246		1,332,168	1,410,245
විලම්බිත බදු			-	612		-	-
ජංගම නොවන බැරකම් එකතුව			1,343,221	1,424,858		1,332,168	1,410,245
බැරකම් එකතුව			41,342,085	41,267,373		41,292,025	41,200,384
මුළු ශුද්ධ වත්කම්			79,010,681	81,298,068		79,397,197	81,635,70
ශුද්ධ වත්කම්/ ස්කන්ධය							
සමුච්චිත අරමුදල	**(10)**		73,874,272	76,779,867		73,874,727	76,779,867
සංචිත - ඉ/ගෙ ආදායම් හා වියදම් ගිණුම් ශේෂය			(490,550)	(1,156,391)		(96,412)	(763,578)
ආදායම් සංචිත - සමාගම්			-	48,288		-	-
ප්‍රත්‍යාගණන සංචිත			5,626,304	5,626,304		5,618,881	5,618,888
ශුද්ධ වත්කම්/ ස්කන්ධය එකතුව			79,010,841	81,298,068		79,397,197	81,635,170

2021.12.31 අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යඵලය පිළිබඳ ප්‍රකාශය

සමූහය	අධිකාරිය				සමූහය	අධිකාරිය
රු '000	රු '000				රු '000	රු '000
2020	2020				2021	2021
				<u>උපලේඛණය</u>		
			<u>ආදායම්</u>	(01)		
296,298	296,298		කුලී		304,110	304,110
452,903	452,903		රාජ්‍ය භාග		653,583	653,583
4,911	-		ගොවිපළ නිෂ්පාදන විකිණුම්		8,859	-
10,403	6,319		ආයෝජන ආදායම් (සමාගම්)		6,478	6,478
192,489	192,489		වෙනත් ආදායම්		3,336,532	3,336,532
957,005	**948,010**		**උත්පාදිත ආදායම්**		**4,309,562**	**4,300,703**
			භාණ්ඩාගාර ප්‍රදාන -			
1,810,000	1,810,000		පුනරාවර්තන	(02)	2,161,937	2,161,937
823,258	823,258		- ප්‍රාග්ධන		3,314,843	3,314,843
112,977	112,977		- කෘෂිකර්ම හා පශු සම්පත්		-	-
43,243	43,243		විශාල හා මධ්‍යම වාරිමාර්ග ප්‍රතිසංස්කරණය		-	-
3,746,483	**3,737,489**				9,786,341	9,777,483
			<u>අඩු කිරීම : වියදම්</u>	(03)		
3,118,130	3,103,674		පුද්ගලික පඩි නඩි		2,817,807	2,815,516
80,705	80,250		ගමන් වියදම් හා යැපුම් දීමනා		86,400	86,343
132,591	132,326		සැපයුම්/ ප්‍රවාහන		154,543	154,543
68,195	68,149		නඩත්තු වියදම්		440,492	440,492
111,575	110,486		ගිවිසුම්ගත සේවා		134,151	134,100
1,815	1,815		රක්ෂණය		1,950	1,950
92,125	83,795		අනෙකුත් වියදම්		97,007	91,633
657,078	653,007		ක්ෂය වීම්		3,242,826	3,240,416
1,231,123	1,231,123		ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම් හා වෙනත් නඩත්තු කටයුතු	(04)	2,495,308	2,495,308
			ප්‍රජා සංවර්ධනය හා වෙනත් ජානපදික සේවා			
16,295	16,295		සංචාරක බංගලාවේ අලාභය	(05)	36,400	36,400
1,471	1,471		සංවර්ධන මධ්‍යස්ථානයේ ලාභය		6,806	6,806
4,008	4,008		ජල කළමණාකරණ ව්‍යාපෘතියේ අලාභය		5,950	5,950

(1,183)	(1,183)		යාන්ත්‍රික වැඩපොළේ අලාභය/ ලාභය		632	632
24,423	24,423		පැළ තවාන් අලාභය	**(06)**	34,430	34,430
(18,389)	(18,389)		ගොවිපළේ අලාභය/ ලාභය	**(07)**	25,748	25,748
877	877		හෙළ බොජුන් හල් අලාභය / ලාභය		293	293
(1,185,952)	(1,185,952)		මොරගහකන්ද විදුලි බලාගාරය අලාභය / ලාභය		(459,736)	(459,736)
4,334,886	**4,306,175**		**මෙහෙයුම් වියදම් එකතුව**		**9,121,007**	**9,110,823**
(588,403)	(568,686)		**මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ලැබූ අතිරික්තය/ (ඌනතාවය)**		665,334	666,660
(375)	(375)		එකතු කිරීම. ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභය/ අලාභය	**(08)**	506	506
(588,778)	(569,061)		**බදු පසු ලාභය**		665,841	667,166
	-					
(589,250)	(245,703)		2021.01.01 දිනට ඉ/ගෙන ආ ශේෂය		(1,156,391)	(763,578)
(1,178,028)	**(8,14,764)**		**ඉදිරියට ගෙන යන ශුද්ධ අතිරික්තිය (ඌනතාවය)**		**(490,550)**	**(96,412)**

2021 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		සමූහය		අධිකාරිය
		(රු '000)		**(රු '000)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		665,841		667,166
මුදල් නොවන වෙනස් වීම්				
	ක්ෂය වීම්	4,245,462		4,243,052
	පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම	(81,025)		(78,077)
	වැඩිවූ පෙළව වත්කම් උපයාගැනීම්	(27,375)		(28,138)
	වත්කම් මාරුකිරීම්	(193,156)		(193,156)
	වත්කම් පවරා දීම්	(507)		(507)
	මෙහෙයුම් ක්‍රියාකාරකම්			
	තොග වැඩිවීම/ අඩුවීම	(122,811)		(123,640)
	පෙළව වත්කම් වැඩිවීම/ අඩුවීම - වෙළඳ	1,604		2,121
	වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	(1,049,321)		(1,061,745)
	බැංකු ඇපකර වැඩිවීම/ අඩුවීම	377		-
	ගෙවිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	146,844		157,242
	උපචිත වියදම්වල වැඩිවීම/ අඩුවීම	9,504		12,475
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**3,595,438**		**3,596,794**
ආයෝජන ක්‍රියාකාරකම්				
	දේපළ පිරියත හා උපකරණ මිලදි ගැනීම්	(282,805)		(282,781)
	අස්පෘෂ්‍ය වත්කම් වැඩිවීම	778		778
	වත්කම් විකිණීමෙන්	1,739		1,739
	ආයෝජන වැඩිවීම/ අඩුවීම	141,451		93,702
	නොනිමි වැඩ වැඩිවීම/ අඩුවීම	7,537		7,537
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(131,299)**		**(179,024)**
මූල්‍ය ක්‍රියාකාරකම්				
	සමුච්චිත අරමුදලේ හා සංචිතවල වැඩිවීම/ අඩුවීම	(612)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(2,954,039)**		**(2,905,140)**
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩු වීම).		**510,099**		**512,630**
01.01.2020 වන විට මුදල් හා මුදල් සමාන දෑ		667,498		662,746
12.31 .2020 වන විට මුදල් හා මුදල් සමාන දෑ		**1,177,597**		**1,175,376**

ස්කන්ධය වෙනස්වීම් දක්වන ප්‍රකාශය - සමූහය

	රු.'000	රු.'000	රු.'000	රු.'000
විස්තරය	ඒකාබද්ධ අරමුදල	සංචිත	ආදායම් හා වියදම්	එකතුව
2020.01.01. දිනට ශේෂය	76,826,891	5,077,151	(585,814)	81,318,228
වසර තුළ	145,774	547,305	(588,778)	104,301
විලම්බිත ආදායම	(42,740)			(42,740)
2020.12.31 දිනට ශේෂය	**76,926,922**	**5,624,456**	**(1,178,028)**	**81,373,350**
2021.01.01 දිනට **ශේෂය**	**76,779,867**	**5,626,304**	**(1,156,391)**	**81,249,780**
වසර තුළ	282,781			
විලම්බිත ආදායම	(3,187,920)	-	-	**(3,187,920)**
NRMS	(3,003)	-	(3,436)	**(6,439)**
2021.12.31 දිනට **ශේෂය**	**73,874,727**	**5,626,304**	**(490,550)**	**79,010,481**

ස්කන්ධය වෙනස්වීම් දක්වන ප්‍රකාශය - මහවැලි අධිකාරිය

	රු.'000	රු.'000	රු.'000	රු.'000
	ඒකාබද්ධ	සංචිත	ආදායම් හා	එකතුව
	අරමුදල	-	වියදම්	**81,647,912**
2020.01.01. දිනට ශේෂය	76,823,887	5,069,728	(245,703)	124,018
වසර තුළ	145,774	547,305	(569,061)	(42,740)
විලම්බිත ආදායම	(42,740)	-	-	
2020.12.31 දිනට ශේෂය	**76,926,921**	**5,617,033**	**(814,764)**	**81,729,190**
2021.01.01 දිනට **ශේෂය**	76,779,867	5,618,881	(763,578)	81,635,170
වසර තුළ	252,781	-	667,166	949,947
විලම්බිත ආදායම	(3,187,920)	-	-	(3,187,920)
2021.12.31 දිනට **ශේෂය**	**73,874,727**	**5,618,881**	**(96,412)**	**79,397,197**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1.) **වාර්තාකරන ඒකකය**

1979 අංක 23 දරණ පනත යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යයන් එම පනතේ 12 වගන්තියෙහි දක්වා ඇති අතර මහවැලි සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය එමගින් පැවරී ඇත.
මහවැලි පනත අනුව යම් විශේෂ ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත දැක්වෙන කර්තව්‍ය විය යුතුය

(අ) ජලාශ, වාරිමාර්ග බෙදා හැරීමේ පද්ධතිය සහ විදුලි බල උත්පාදනය සහ සැපයීම සඳහා ස්ථාපනයන් ඉදිකිරීම හා මෙහෙයවීම ඇතුළුව මහවැලි ගංගා සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

(ආ) එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍යය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් සිදු කරනු ලැබිය හැකිය.

(ඇ) යම් විශේෂ ප්‍රදේශයක පූර්ණ හා ඒකාබද්ධ සංවර්ධනයට ප්‍රතිශ්‍යාධාර වීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම ;

(ඈ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ කෘෂිකාර්මික ඵලදා වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් ප්‍රශස්ත තත්ත්වයට පත් කිරීම සහ ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම සහ එම සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඉ) කිසියම් විශේෂ ප්‍රදේශයක භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ පවත්වා ගෙන යාම

(ඊ) ඕනෑම විශේෂ ප්‍රදේශයක ප්‍රජාවගේ පොදු සුබසාධනය සහ සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ එම ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කිරීම ;

(උ) ඕනෑම විශේෂ ප්‍රදේශයක ආර්ථික හා කෘෂිකාර්මික දියුණුව සඳහා අභ්‍යන්තර හා බාහිර වූ උභය පුද්ගලික ප්‍රාග්ධනය යෙදවීම නංවාලීම හා සුරක්ෂිත කිරීම ; සහ

(ඒ) මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීමෙහි සහ ක්‍රියාවට නැගීමෙහි දී මෙන්ම යම් විශේෂ ප්‍රදේශයක් සංවර්ධනය කිරීමෙහි දී ද රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය
ආයතනවල, පළාත් පාලන ආයතනවල, රජයේ සංස්ථාවල සහ පෞද්ගලික හෝ රජයේ වූ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ එය නංවාලීම .

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කිරීම සඳහා අධිකාරියට පැවරී ඇති බලතල එම පනතේ 12 වැනි වගන්තියේ දක්වා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලිත සමාගම් හතරකින් සහ ආශ්‍රිත සමාගමකින් සමන්විත වේ. එනම් මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම, සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම සහ සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම වේ.

සියලුම අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිත සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති අතර, පහත සඳහන් මූලික කර්තව්‍යයන් සිදු කරයි.

සමාගම්වල කොටස් ප්‍රාග්ධනය ගැන විස්තර පහත පරිදි වේ.

	සමාගම	කොටසක මිල	සම්පූර්ණයෙන් ගෙවා නිකුත් කරඇති කොටස් ගණන	මහවැලි අධිකාරියට නිකුත් කර ඇති කොටස් ගණන
1	සීමාසහිත මහවැලි උපදේශක කාර්යංශ (පුද්ගලික) සමාගම	රු. 10	6385	6384
2	සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම	රු. 10	1502	1500
3	මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම	රු. 10	1,039,803	1,039,800
4	සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම	රු. 10	3	-

<u>මහවැලි සමාගම් වල මූලික කර්තව්‍යයන්</u>

පරිපාලිත

අ) මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම

අ) මහවැලි ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් ලබාදීම

ආ) සමාගම සඳහා අරමුදල් උත්පාදනය කිරීම සඳහා වාණිජ ව්‍යවසාය ආයෝජන කටයුතු කිරීම

ආ) සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම

(අ) ස්වභාවික සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය යටතේ එන නිර්මාණ සැලසුම, පුහුණුකිරීම්, ද්‍රව විද්‍යාත්මක අධීක්ෂණය, ඉඩම් භාවිතා සිතියම්කරණය, ජලාධාර ප්‍රදේශ සංරක්ෂණය සහ වනය ආශ්‍රිත කටයුතු පිළිබඳව වෘත්තීයමය උපදෙස් හා සේවා සැපයීම.

ආ) තොරතුරු සහ දත්ත සැපයීම සහ ශක්‍යතා අධ්‍යයන,
පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනය (EIA), මූලික පාරිසරික ඇගයීම් වාර්තා (IEER) ආදිය සකස් කිරීම

ඇ) සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම

(අ) මහවැලි ගොවීන්ට උසස් ගුණාත්මක බවින් යුත් සතුන් සැපයීම .

(ආ) කිරි හා මාංශ නිෂ්පාදනය හා අලෙවිකරණය

ඇ) සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම

අ) ගොඩනැගිලි, වාරිමාර්ග සහ ඉඩම් ජලාපවහන සහ මාර්ග ආදි ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි උපදේශන සේවා සැපයීම.

ආ) ගොඩනැගිලි, වාරිමාර්ග සහ ඉඩම් ජලාපවහන සහ මාර්ග ආදි ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම් කොන්ත්‍රාත්තු භාර ගැනීම .

ආශ්‍රිත සමාගම

ඉ) සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම

(අ) බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය හා අලෙවිය

(ආ) මහවැලි ගොවීන් සමඟ බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය කළ පසු මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළැඹීම.

කෙසේ වෙතත්, මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 දී මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම විසුරුවා හැරීමට තීරණය කළේය. එබැවින් මෙම සමාගමේ ගිණුම් ඒකාබද්ධ ගිණුම්වලට ඇතුළත් නොවේ. එවිට වත්කම් සහ බැරකම් සටහනක් ලෙස අනාවරණය කර ඇත.

2) පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම දක්වන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විතවේ. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම ප්‍රකාශන පිළියෙල කොට ඇත. අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තින් ඊට පෙර මූල්‍ය වර්ෂයේ අනුගමනය කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

.

2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම අනුවය. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනකාරි සාධක සඳහා ගැළපීමක් සිදු නොකරන ලදී

2.3 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කොට ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි. රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු ආසන්නතම දහසට වටයා ඇත.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල ප්‍රකාශිත වටිනාකම්වලට බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් ඇති තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන වලට එළැඹීමට කළමනාකාරිත්වයට සිදු වේ. ඓතිහාසික අත්දැකීම් සහ පවත්නා සංසිද්ධීන්ට අනුව සාධාරණ යැයි විශ්වාස කළ හැකි අපේක්ෂා ද ඇතුළත් වන පරිදි, තීන්දු හා ඇස්තමේන්තු පදනම් වේ. කරුණු එසේ හෙයින් සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල, එකී තීන්දු හා ඇස්තමේන්තු වලින් අපගමනය විය හැකිය.

මෙකී ඇස්තමේන්තු හා පාදක උපකල්පන, අඛණ්ඩ පදනමකින් විචාරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිශෝධනයක් සිදු කළේ නම්, එකී ප්‍රතිශෝධනයන් එකී කාලසීමාවට හා වෙනත් ඕනෑම අනාගත කාලසීමාවකට බලපාන්නේ නම් පමණක් එම ප්‍රතිශෝධනය එය සිදු කළ කාලසීමාව තුළ හඳුනා ගත යුතුවේ.

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි වෙනස් වීම්

පහත සඳහන් අවස්ථාවන්හි හැර ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ අනුගමනය කළ ප්‍රතිපත්තින්ම වේ.

2.5.1 ගොවිපළ, පැල තවාන් හා සංචාරක බංගලා ඒ ඒ මහවැලි කලාප යටතේ ඇති ආදායම් හා වියදම් ගිණුම් යටතේ වෙන වෙනම ගිණුම් ගත කරන ලදී.

2.5.2 ජෛව වත්කම් ඇගැයීමට ලක් කෙරෙන්නේ සාධාරණ වටිනාකමකින් යුතුවය. ලාභ හෝ අලාභ හඳුනාගනු ලබන්නේ ගොවිපල ගිණුමෙනි.

3) සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති එම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති කාලපරිච්ඡේදය සඳහාම අඛණ්ඩව අනුකූල වේ.

3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

3.1.1 මව් සමාගමේ සහ පරිපාලන සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම ද ඇතුළත්ව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, සකසා ඇත්තේ ඒකාබද්ධ ක්‍රමවේදයන් අඛණ්ඩව යොදාගනිමින් වාර්තාගත ප්‍රතිඵලය හා ස්කන්ධ ක්‍රමය පදනම අනුවය. ඒ අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තනි ආර්ථික ව්‍යුහයක් ලෙස පිළිඹිබු වන පරිදි ඒ පිළිබඳව මූල්‍ය තොරතුරු නිරූපණය කරනු ලබයි.

3.2 දේපළ, පිරියත හා උපකරණ

3.2.1 වත්කම්වල පිරිවැය එහි ප්‍රත්‍යාගණන වටිනාකම, ගැණුම් මිල හෝ ඉදි කිරීමේ පිරිවැය හා අදාළ වත්කම අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම අදාළ වන පිරිවැයෙන් සමන්විත වේ.

3.2.2 ක්ෂය ප්‍රතිපාදනය සියලු දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මත රේඛීය පදනමින් ගණනය කරන අතර එහිදී වත්කමක පිරිවැය එම වත්කම් වර්ගයේ ඇස්තමේන්තුගත ආයුකාලය සුදුසු කාලසීමාවක් පුරා හානිකරණය කරනු ලැබේ.වත්කමක් භාවිතය සඳහා පවතින අවස්ථාවේ ක්ෂයවීම් සිදු කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා ඇති බවට වර්ගීකරණය කරන දිනට පෙර නතර වේ. මෝටර් වාහන සම්බන්ධයෙන් පහත දක්වා ඇති ක්ෂයවීම් අනුපාත යෙදීමට පෙර 10% ක සුන්බුන් වටිනාකමක් අදාළ කරගනු ලැබේ.

3.2.3

1	ගොඩනැගිලි – කාර්යාල	2 ½ % වාර්ෂිකව
	වෙනත්	5% වාර්ෂිකව
2	මෝටර් වාහන	20% වාර්ෂිකව
3	දේපළ, පිරියත හා උපකරණ කාර්යාල උපකරණ සහ සුභසාධන අයිතම	15% වාර්ෂිකව
4	දේපළ, පිරියත හා උපකරණ - ජනන යන්ත්‍ර	15% වාර්ෂිකව
5	දේපළ, පිරියත හා උපකරණ - ඉදිකිරීම්	15% වාර්ෂිකව
6	දේපළ, පිරියත හා උපකරණ - පොදු	15% වාර්ෂිකව
7	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10% වාර්ෂිකව
8	පරිගණක සහ උපාංග	20% වාර්ෂිකව
9	ඇල මාර්ග	4% වාර්ෂිකව
10	වේලි	1% වාර්ෂිකව

3.3 ආයෝජන

3.3.1 ආශ්‍රිත සමාගමේ සිදුකළ ආයෝජන

ආශ්‍රිත සමාගමෙහි ආයෝජනය පිරිවැය අනුව ගිණුම්ගත කර ඇති අතර ශේෂ පත්‍රයේ දිගුකාලීන ආයෝජනයක් ලෙස වර්ගීකරණය කර ඇත. ආයෝජක සමාගමේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් අධිකාරියට සැලකිය යුතු බලපෑමක් නොමැති අතර එම නිසා ස්කන්ධ ක්‍රමය අනුගමනය කිරීම අනුචිත වේ.

3.3.2 අනෙකුත් ආයෝජන

අනෙකුත් ආයෝජන ශේෂ පත්‍රයේ දිගු කාලීන ආයෝජන ලෙස සලකනු ලබන අතර පිරිවැයට ගණනය කර දක්වා ඇත.

3.3 භාණ්ඩ තොග

භාණ්ඩ තොග තක්සේරු කර ඇත්තේ පිරිවැය හා නිෂ්කාෂණය ශුද්ධ වටිනාකම යන දෙනෙක් අඩු වටිනාකම අනුව වේ. අවශ්‍ය තැන්හි නිකුත් නොවන, දෝෂ සහගත හා යල්පැන ගිය තොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

3.4 වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රකාශ කොට ඇත්තේ නිෂ්කාෂණය කරගත හැකි වෙතැයි ඇස්තමේන්තු ගත වටිනාකම් මත වේ.

3.5 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලට අයත් වන්නේ මුදල් ශේෂයන් හා ඉල්ලූ විට ගෙවිය යුතු බැංකු අයිරා ඇතුළත් වටිනාකම වන අතර එය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මුදල් කළමණාකරනයේ අනිවාර්ය අංගයක් වන එය මුදල්වල සංඝටයක් ලෙස අයත් ඇතුළත් වන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහාය

3.6 විදේශ ආධාර

ආධාර ලබා දෙන ආයතන විසින් 2012 දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද සමුච්චිත ගෙවීම්වල වාර්තා වී ඇති විදේශ ආධාර භාවිතා කිරීම. විදේශ මුදල් වලින් සිදුකරන ලද වියදම්, අදාළ ගෙවීම් සිදු කරන ලද දිනයන්හිදී පැවති විනිමය අනුපාත අනුව රුපියල්වලට පරිවර්තනය කර ඇත.

3.7 බැරකම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස වර්ගීකරණය ඇති බැරකම් යනු ඉල්ලූ විට ගෙවිය යුතු හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක කාලය ඇතුළත ගෙවා නිම කළ යුතු බැඳීම් වේ. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම ශේෂ පත්‍ර දිනයෙන් වසරකට වඩා කාලයක් පවතින බැඳීම් වේ.
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දැන සිටි සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

3.8 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම

සියලුම සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂික ලබාදීමට ප්‍රතිපාදන සලසා ඇත.පාරිතෝෂිත සඳහා සුදුසුකම් ලබන අඩමසක වැටුප, පළමු සේවා වසරේ පටන් සෑම වසර අගකදීම ගණනය කර මෙම ප්‍රතිපාදනය වෙන්කර ඇත.

3.8 ආදායම් ප්‍රකාශනය

3.9.1 මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලනය යටතේ පවතින ඉඩම් බදු දීමෙන් ලබන බදු කුලිය, නිල නිවාස වල කුලිය හා රාජ්‍යභාග, ආයෝජන වලින් ලබන ආදායම සහ පොලිය යනාදියෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආදායම සමන්විත වේ.

3.9.2.1 එම ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලැබීමට ඇති වැඩි සම්භාවිතාව අනුව සහ එය විශ්වාසනීය ලෙස මැනිය හැකි තරමට ආදායම ගණනය කර ඇත.
අනෙකුත් කුලී, රාජ්‍ය භාග, පොලී ආදායම උපචිත පදනම මත ගණනය කෙරේ.

3.10.3 රාජ්‍ය ප්‍රදානයන් " ප්‍රාග්ධන ප්‍රදානයන් හා පුනරාවර්තන ප්‍රදානයන්" ලෙස ප්‍රකාශ කරනු ලැබේ පුනරාවර්තන ප්‍රදානයන්, අදාළ ප්‍රදානයන් මඟින් ගෙවීමට අපේක්ෂිත පිරිවැය වියදම් ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හඳුනා ගන්නා කාල සීමාවන්හි ක්‍රමානුකූල පදනමකින් යුක්තව, ලාභ අලාභ ගිණුමේ හඳුනා ගැනීම සිදු කෙරෙනු ලැබේ .

3.9.3 වත්කම්වලට අදාළ ප්‍රාග්ධන ප්‍රදානයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්බිත ආදායම් ලෙස නිරූපණය කරනු ලබයි. එය වත්කම්වල ඵලදායි ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනම්න් මූල්‍ය කාර්යඵලය ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

3.10 වියදම

ආයතනයේ එදිනෙදා මෙහෙයුම් සඳහා වැයවන වියදම්,දේපළ පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් තබා ගැනීම සඳහා වැයවන වියදම් ඇතුළු සියලු වියදම් ආදායම් ප්‍රකාශනයේ සැලකිල්ලට ගෙන වසර සඳහා ලාභය/ අලාභය ගණනය කර ඇති අතර බොල් ණය හා අඩමාන ණය, දන්නා සියලු බැරකම් හා දේපළ, පිරියත හා උපකරණ වල ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් සිදු කොට ඇත.

3.11 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවුන සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා අදාළ අවස්ථාවල ගැළපීම් සිදු කර ඇත.

3.12 අවිනිශ්චිත අවස්ථා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට එරෙහිව ගොනු කර ඇති විවිධ නඩු සම්බන්ධයෙන් 2021.12.31 දිනට අසම්භාව්‍ය බැරකම රුපියල් මිලියන 62.631 කි.

3.13 විසිරුවා හැරීම

සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම ණයහිමියන් ස්වේච්ඡා විසුරුවා හැරීම යටතේ පවතී.

මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම
202012.31 දිනට වත්කම් හා බැරකම්
(ණයහිමියන් ස්වේච්ඡා විසුරුවා හැරීම යටතේ)
සටහන

වත්කම්		2021 Rs.	2020 Rs.
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	07	3	3
වත්කම්	08	2,794,671	2,749,671
		2,794,671	**2,749,671**
ජංගම වත්කම්			
සිංගර් මැෂින් තොගය		29,480	29,480
පොළී ලැබිය යුතු	10	380,726	380,726
පුපුරණ ද්‍රව්‍ය පාලන ගිණුම		28,336	28,336
ආදායම් බදු ආපසු		62,008	62,008
වෙනත් ලැබියහැකි	11	25,000	25,000
භාණ්ඩාගා. බිල්		9,455,896	9,455,896
බැංකු මුදල්	12	4,466,061	4,068,828
අතැති මුදල්		2,521	2,521
		14,450,028	**14,052,795**
		17,244,702	**16,847,469**
මුළු වත්කම්			
ස්කන්ධය හා බැරකම්			
ස්කන්ධය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	06	10,398,000	10,398,000
අරමුදල් ලැබීම් ATI		150,325	150,325
අරමුදල් ලැබීම් EEC		10,000,000	10,000,000
අධිකාරියෙන් ලද මුදල		432,000	432,000
රඳවාගත් ලාභ/(පාඩු)		(4,196,788)	(4,594,021)
මුළු ස්කන්ධය		**16,783,537**	**16,386,304**

ජංගම බැරකම්			
උපචිත වියදම්	13	71,183	71,183
වත්කම්		2021 Rs.	2020 Rs.
විවිධ ණය හිමියන්		310,025	310,025
ශේෂ පිරික්සුමේ කලින් ලැබුනු පොළිය		79,957	79,957
මුළු බැරකම්		**461,165**	**461,165**
මුළු ස්කන්ධය හා බැරකම්		17,244,702	16,847,469

3.15 වේලි, ජලාශ, ඇලමාර්ග, මාවත්, වැව් හා අනෙකුත් ඉදිකිරීම් සහ ඉඩම් වත්කම්

2021.12.31දින විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ **වේලි, ජලාශ, ඇලමාර්ග, මාවත්, වැව් හා අනෙකුත් ඉදිකිරීම් සහ ඉඩම්** වල සාරාංශය පහත දක්වා ඇත.

3.15.1 වැව් ගණන

කලාපය	**වැව් ගණන**	**වැව් ධාරිතාව (අක්කර අඩි)**	**බැම්මේ උස (මීටර්)**	**බැම්මේ දිග (මීටර්)**	**වර්ගඵලය (හෙක්)**
බී කලාපය	76	10,204	-	-	18,214
සී කලාපය	52	20,461	132	-	399
ඩී කලාපය	52	28,110	-	-	-
ජී කලාපය	17	708	277	6,567	-
එච් කලාපය	127	23,031	253.	11,682	2,888
එල් කලාපය	31	30,426	-	-	-
වලව	22	54,948	-	-	-
රඹකැන්ඔය	73	48,270	-	-	-
හුරුළුවැව	13	6,511	31	-	1,090
එකතුව	463	222,669	693	18,249	22,591

3.15.2 මාර්ග

කලාපය	වලව කලාපය(Km)	එල් කලාපය (Km)	බී කලාපය(Km)
ප්‍රධාන මාර්ග	100.00	51.0	549.0
ග්‍රාමීය මාර්ග	250.00	-	-
වෙළඳ පොල මාර්ග	12.5	-	-
කෘෂි මාර්ග	25.0	-	-
පාලම්	5.0	-	-
බෝක්කු	125.0	-	-
සපත්තු පාලම්	10.0	-	-
එකතුව527.5	527.5	51.0	549.0

3.15.3 ජල සැපයුම සහ ලිං

ළිං	**එල් කලාපය (ගණන)**	**හුරුළුවැව (ගණන)**
පානීය ජල ළිං	**350**	**-**
වගා ලිං	**150**	**297**
බෝර වළ	**100**	**-**
උඩිස් ටැංකි	**100**	**-**
ප්‍රති ආශ්‍රිත ජල පිරි පහදු යන්ත්‍ර	**-**	**1**
නල ළිං	**-**	**48**
එකතුව	**700**	**346**

3.15.4 වේලි ගණන

වේලි	(පිරිවැය රු. බිලියන)
කොත්මලේ	13.0
වික්ටෝරියා	9.8
රණ්දෙනිගල	5.8
රන්ටැඹේ	3.2
පොල්ගොල්ල	0.09
බෝවතැන්න	0.05
මිණිපේ	0.65
රත්කිඳ	1.9
මාදුරු ඔය	2.6
උඩවලවේ	0.14
චන්ද්‍රිකා වැව	0.08
මුළු	37.31

3.15.6 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉඩම්

කලාපය	මුළු ඉඩම් (හෙක්)	විකිණූ ඉඩම් (හෙක්)	ඉතිරි ඉඩම් (හෙක්)
බී කලාපය	95,687.0	28,448.0	67,239.0
සී කලාපය	52,564.0	41,024.0	11,540.0
ඩී කලාපය	16,396.0	1,597.0	14,799.0
එච් කලාපය	80,803.0	33,191.0	47,612.0
ජී කලාපය	11,940.0	9,560.0	2,350.0
එල් කලාපය	37,338.0	4,762.0	32,576.0
වික්ටෝරියා	311,118.0	3,384.0	307,734
වලව	57,775.0	34,506.0	23,269.0
හූරුළුවැව	9,704.0	6,904.0	2,800.0
රඹකැන්ඔය	134,002.0	6,111.0	127,891
එකතුව	**807,327.0**	**169,517.0**	**637,810.0**

විගණකාධිපති වාර්තාව

111 කොටස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IWR/B/MASL/01/21/19 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 සැප්තැම්බර් 06 දින

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) අධිකාරිය විසින් පාලනය හා නඩත්තුව කරගෙන යනු ලබන කලාප 6 ක කි.මී.9,237.9 ක් දිග ඇල මාර්ග රු. මිලියන 74,989 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණද එම ඇල මාර්ග වෘත්තීය සුදුසුකම් සහිත පිලිගත් තක්සේරුකරුවෙකු හෝ තක්සේරු මණ්ඩලයක් මඟින් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම නිසා එම තක්සේරු වටිනාකම් විගණනයේදී පිලිගත නොහැකි විය.

(ආ) අධිකාරියේ පාලනය යටතේ පවතින වත්කම් ලෙස වැව් 463 ක් හා වේලි 11 ක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණද එම වැව් හා වේලි වල අයිතිය මහවැලි අධිකාරිය සතුවේද යන්න තහවුරු කිරීමට අදාල ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම එම වත්කම් අධිකාරියට අයත් වන බව තහවුරු කරගෙන තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන්, රු.671,503,748 ක මොරගහකන්ද ව්‍යාපෘතියෙන්, රු.430,418,733 ක දේශගුණ අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන්, රු.325,457,540 ක වත්කම් අධිකාරිය වෙත ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය වනවිට පිලිවෙලින් රු.537,950,118 ක, රු.225,822,896 ක හා රු.186,391,238 ක වත්කම් පමණක් ගිණුම්ගතකර තිබුණි. තවද මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලබාගත් වාර්තා අනුව අධිකාරිය වෙත පවරන ලද වත්කම්වල අගය රු.586,015,546 ක් විය. එසේ වුවත් මෙකී වෙනස්කම් පිළිබඳ පරීක්ෂා කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්) සමාගම 2020 දෙසැම්බර් 30 දින සිට වාරිමාර්ග අමාත්‍යාංශය යටතට පවරා තිබීම හේතුවෙන් 2021 වර්ෂයට අදාල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් එම සමාගමේ වත්කම් හා වගකීම් අත්හැර තිබුණි. එසේ වුවත් මෙම පැවරීමට අදාළව සිදුකරන ලද ගිණුම් ගැලපීම් විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අදාල පැවරීම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමේ නිවැරදිතාවය විගණනයේදී සනාථ කරගත නොහැකි විය.

(ඉ) ඇඹිලිපිටිය කලාපයේ වාණිජ ඉඩම් බදුදීම් ආදායම වූ රු.2,688,000 ක් ආදායම් ලෙස සටහන් නොකර වෙළඳ ණයහිමියෝ ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) මුරවැසිහේන යෝජිත කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාලව රු.478,496 ක වැට හා රු.1,446,980 ක අමුද්‍රව්‍ය අත්තිකාරම් එම ගිණුම් වලට හර කිරීම වෙනුවට එකතු වටිනාකම රු.1,925,476 ක් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ රු.1,925,476 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) මොරගහකන්ද ව්‍යාපෘතියේ ගිණුම් අනුව ණයගැති හා ණයහිමි වටිනාකම් පිළිවෙලින් රු.108,452,464 ක් හා රු.907,550 ක් වුවද අධිකාරියේ ගිණුම්වල එම අගයන් පිළිවෙලින් රු.11,645,087 ක් හා රු.38,388,969,995 දක්වා තිබුණි. ඒ අනුව පිළිවෙලින් ණයගැති ශේෂය රු.10,737,537 ක් හා ණයහිමි ශේෂය රු.38,280,517,531 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද මෙකී වෙනස්කම් පිළිබඳ පරීක්ෂා කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2015 – 2018 කාලය තුළ රු.80,000,000 ක වියදමින් වැලිකන්ද සහ වැලිඔය කලාපවල ඉදිකර තිබුණු ජලපිරිපහදු යන්ත්‍රාගාර 30 ක් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව වියදම් ලෙස කපා හැර තිබුණි. එසේම ඒවායේ මෙහෙයුම් කටයුතු ගිවිසුම් මඟින් අදාළ ගොවි සංවිධාන වෙත පැවරීමටද කටයුතු කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම සැලකිය යුතු තරම් වෙනස්වන හා ඉක්මනින් වෙනස්වීම්වලින් යුක්ත වන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කළ යුතු වුවත්, අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.64,320,853 ක් වූ ඉඩම් කට්ටි 02 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර ඒවායේ පිරිවැය හෝ ගිණුම්ගත කර නොතිබුණි. එසේම අධිකාරිය විසින් සිය කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය කිරීම සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයනන්ට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ), (ඇ) හා (ඒ) ඡේද වල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 1646	වාහනවල දෛනික ධාවන සටහන් අදාල මාසයට පසු ඊලඟ මාසයේ 15 දිනට ප්‍රථමයෙන් විගණකාධිපති වෙත එවිය යුතු වූවද, අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වාහන 57 ක දෛනික ධාවන සටහන් 2021 නොවැම්බර් 26 දින විගණනයෙන් ඉල්ලා සිටියද, වාර්තාවේ දිනය දක්වා ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)	1970 ඔක්තෝබර් 18 දිනැති 803 දිනැති භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	රජයේ සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම සඳහන් කළ යුතු වුවද අධිකාරියේ කිසිදු වාහනයක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 වගන්තිය	මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළයුතු වූවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ)	2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	

(i)	3.1 වගන්තිය	නිල වාහන හිමි එච්එම් 1-1 ගණය යටතට වැටෙන අධ්‍යක්ෂවරුන්ට අනුමත මාසික ඉන්ධන දීමනාව ලීටර 120 ක් වුවත් ඊට පටහැනිව ලීටර 140 ක් ගෙවීම් කිරීම නිසා 2018, 2019, 2020 සහ 2021 වර්ෂවල ප්‍රධාන කාර්යාලය විසින් රු.1,173,213 ක වැඩිපුර මුදලක් ගෙවා තිබුණි.
(ii)	3.2 වගන්තිය	රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ දරන ලද සත්‍ය ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කළ හැකි වුවත්, සේවා ස්ථානයෙන් බැහැර රාජකාරී සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව නිල වාහන සඳහා අතිරේක ඉන්ධන ලබා දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ නිල වාහන හිමි නිලධාරීන්ට රු.1,262,050 ක ඉන්ධන දීමනාවට අමතරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව රු.1,657,505 ක අතිරේක ඉන්ධන වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.
(iii)	3.6 වගන්තිය	නිල වාහන හිමි නිලධාරීන්ට සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 40 ට වඩා දුර විශේෂ රාජකාරී කටයුතු සඳහා කණ්ඩායම් වශයෙන් සහභාගී වීමට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සපයා දිය හැකි වුවත් අධිකාරිය විසින් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.
(ඉ)	2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 වගන්තිය	සෑම වර්ෂයකට වරක්ම වාහන අපහරණ ක්‍රියාවලිය සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් 2016 වර්ෂයෙන් පසු වාහන අපහරණයක් සිදුකර නොතිබුණි
(ඊ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	

(i)	3.1 වගන්තිය	රජයේ වාහන සඳහා සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කි.මී 25,000 ක දුර ධාවනයෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් අධිකාරිය විසින් සිය වාහන සම්බන්ධයෙන් එවැනි ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.
(ii)	3.3 වගන්තිය	වාහනවල මාසික ඉන්ධන දහනය සහ අළුත්වැඩියා සම්බන්ධ සටහනක් අදාල ආකෘතිය ප්‍රකාරව නඩත්තු කර දැඩි අන්දමේ අහිතකර වෙනස්කම් සහිත වාහන වහාම පරීක්ෂා කළ යුතු වුවත් අධිකාරිය විසින් සිය වාහන සම්බන්ධයෙන් එවැනි පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.
(iii)	4.2 හා 4.3 වගන්ති	වාහනවල බාහිර අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවිය යුතු වුවත් අභ්‍යන්තර අළුත්වැඩියාවන් සඳහා එසේ ක්‍රියාකිරීමට හැකියාවක් නොමැති හෙයින් කොටස් ගලවන ලද ගරාජයේ මිල ගණන් පිළිගැනීමට සිදු වන අතර එම මිල ගණන් සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තුවක සංස්ථාවක හෝ මණ්ඩලයක සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගත යුතු වුවද අධිකාරිය විසින් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.
(c)	2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන මුදල් අමාත්‍යාංශයේ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 02 (අ) වගන්තිය	ධාවන තත්ත්වයේ නොපවතින වාහන 2020 දෙසැම්බර් 31 දිනට අපහරණය කල යුතු වුවත් අපහරණය කල යුතුයැයි හඳුනාගෙන තිබුණු වාහන 120 ක අපහරණ කටයුතු 2022 අප්‍රේල් 27 විගණිත දිනය දක්වා අපහරණය කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ (අදාළ වන පරිදි) බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව

අධිකාරියේ 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රධාන කාර්යාලය විසින් රු.5,160,000 ක ප්‍රතිපාදනයක් යටතේ Intel-3, Intel-5, Intel-7 පරිගණක යන්ත්‍ර 25 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, රු.7,719,450 ක් වැයකර පරිගණක යන්ත්‍ර 54 ක් මිලදී ගෙන තිබුණි. තවද, රු.7,390,000 ක ප්‍රතිපාදනයක් යටතේ Intel-5, Intel-7 ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 45 ක් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණද, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 61 ක් රු.14,690,658 කට මිලදී ගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් ප්‍රතිපාදන ඉක්මවා රු.9,800,000 ක් වැයකර තිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) 2002 වර්ෂයේදී ණය ලබාදීමට චක්‍රීය අරමුදලක් ඇති කිරීමට රු.මිලියන 48 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණද, 2010 වර්ෂයෙන් පසුව එම ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමකින් තොරව සියයට 4 ක අඩු පොලී අනුපාතිකයක් යටතේ බැංකුවේ රඳවාගෙන තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට පොලිය සමඟ එම අරමුදල රු.93,783,845 ක් වී තිබුණු අතර, 2021 අප්‍රේල් මස ඉන් රු.81,162,538 ක මුදලක් අයකරගෙන තිබූ අතර, රු.12,621,307 ක මුදලක් හා ඊට අදාල පොලිය තවදුරටත් අයකර ගතයුතුව පැවතුණි.

(ආ) අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී ද, ස්වභාවික සම්පත් කළමනාකරණ පුද්ගලික සමාගම 2019 වර්ෂයේදී ද ඇවර කිරීම සඳහා තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ද ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති කමිටුව විසින් තෝරා ගත් බාහිර ආයෝජකයකු සමඟ මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දින අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී

තිබුණි. ඒ අනුව සමාගම විසින් කළමනාකරණය කරනු ලබන සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ සහ බී කලාපයේ දම්මින්න ගොව්පළට අයත් අක්කර 1,154 ක වපසරියකින් යුත් භූමිය සියළු දේපළ ඇතුලත්ව රාජ්‍ය පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂයන් කැඳවීමට 2022 පෙබරවාරි 28 දින අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ තුනකට අධික කාලයක් ගතවී තිබුණ ද ඊට අදාල කටයුතු නිමකර නොතිබුණි.

(ඇ) වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුල වැව් අමුණු හා කෘෂි ඇල මාර්ග පිළිසකර කිරීමේ ජාතික වැඩසටහන යටතේ ප්‍රමුඛතාවය මත වැව් 37 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහාත් වැව් 66 ක් ගාස්තු අයකර රොන්මඩ ඉවත් කිරීමටත් සැලසුම් කර තිබුණි. වැව් පද්ධතිය ආරක්ෂා කිරීමට නම් මෙම වැඩසටහන හරහා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී තනි තනිව වැව් තෝරා නොගෙන එල්ලාංග පද්ධති වශයෙන් තෝරා ගෙන ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම වඩා යෝග්‍ය බව විශේෂඥයින්ගේ මතය වූවත්, ඊ හා බී කලාපවලට අයත් වැව් 11 ක් එල්ලාංග පද්ධතිවලට අයත් වූවද, එම වැව් පිළිසකර කිරීමට තෝරාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට ප්‍රතිසංස්කරණය කිරීමට තෝරාගත් වැව් 18 ක භෞතික ප්‍රගතිය සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පැවතුණු අතර ගාස්තු අයකර රොන්මඩ ඉවත් කරන ලද වැව් ගණන 05 ක් පමණක් විය. එසේම රොන්මඩ ඉවත් කිරීම තුළින් රු.මිලියන 598.7 ක ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කර තිබුණද, රු.මිලියන 9.45 ක් පමණක් උපයාගෙන තිබුණි.

(ඉ) ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/3 ක් පමණ මහවැලි බලප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, එම ප්‍රදේශයට අයත් රජයේ ඉඩම් කළමනාකරණය අධිකාරිය සිදුකරන අතර, එය වඩා කාර්යක්ෂම කිරීම තුළින් ජනපදිකයින් හා ආයෝජකයන් වෙත ප්‍රශස්ත සේවාවක් ලබාදීම අරමුණු කර ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉඩම් කළමනාකරණයට හඳුන්වාදීම සඳහා අධිකාරිය විසින් 2016 හා 2018 වර්ෂවලදී රු.6,973,405 ක මුදලක් පෞද්ගලික ආයතන 03 ක් වෙත අවස්ථා තුනකදී ගෙවීම් කර තිබුණු අතර, පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් 60 ක් පුහුණු කිරීමටද කටයුතු කර තිබුණි. නමුත් වර්තමානය වනවිටද ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක නොවීම නිසා එම වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි.

(ඊ) ණයගැනි ණයහිමි කාල විශ්ලේෂණය අනුව වර්ෂ 05 ට වඩා වැඩි රු.242,525,000 ක ණයගැනි ශේෂයක්ද, රු.85,844,000 ක ණයහිමි ශේෂයක්ද පැවතුණද, එම ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයින් 695 දෙනෙකු වෙත හෙක්ටයාර 6,879 ක් මුළු ඉඩම් ප්‍රමාණයක් ලබාදී තිබුණි. ඉන් පූර්ණ වශයෙන් සංවර්ධනය කර ඇති ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 3,284 ක් වූ අතර ඌන සංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 2,023 ක් ද, අසංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 1,572 ක් ද වශයෙන් පැවතුණි. මේ අනුව ලබාදුන් ඉඩම් ප්‍රමාණයෙන් 52%ක් ඌන සංවර්ධිත හා අසංවර්ධිත ඉඩම් වශයෙන් පැවතුණු අතර එම ඉඩම් නැවත පවරාගෙන වෙනත් ආයෝජකයින්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) මිරිදිය මත්ස්‍ය වගාව සඳහා අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් අවශ්‍යතාවය කලාපය තුළම නිෂ්පාදනය කරගැනීම සඳහා වූ 2019 – 2023 කාලයට අදාල පස් අවුරුදු සැලැස්ම තුළ එල් කලාපයේ ජලාශ 10 ක 2021 වර්ෂය තුළ මත්ස්‍ය ඇඟිල්ලන් 2,164,000 ක් තැන්පත් කිරීමට ඉලක්ක කර තිබුණද, සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම තුලින් මෙ. ටොන් 500ක මත්ස්‍ය අස්වැන්නක ඉලක්කයක් වෙනුවෙන් මත්ස්‍ය ඇඟිල්ලන් 400,000ක් මුදාහැරීම සඳහා රු.1,300,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. වර්ෂය අවසාන වනවිට මත්ස්‍ය ඇඟිල්ලන් 60,000 ක් පමණක් තැන්පත් කර තිබුණි. තවද, මත්ස්‍ය ඇඟිල්ලන් හා කීට ඉස්සන් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,300,000 ක අත්තිකාරම් ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණද, රු.300,000 ක අත්තිකාරම් 2022 ජුනි 20 වන විටත් පියවා නොතිබුණු අතර, ඇහැටුගස්වැව පිහිටුවීමට සැලසුම් කර තිබුණු අභිජනන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතුද ආරම්භ කර නොතිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ අපේක්ෂිත මත්ස්‍ය අස්වැන්න මෙ. ටොන් 500 වූවත් සමාලෝචිත වර්ෂයේ අවසානයට මත්ස්‍ය අස්වැන්න මෙ.ටොන් 99.3 ක් පමණක් විය.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 34 ක් පැවතුණු අතර, ඉන් තනතුරු 15 ක් පුරප්පාඩුව පැවතුණි. තනතුරු 14 ක් වැඩබැලීම්, රාජකාරී ආවරණය, කොන්ත්‍රාත් පදනම හා ද්විතීයන පදනම් මත රාජකාරී ඉටුකරනු ලබන අතර, එම තනතුරු ස්ථිරව පිරවීමට කටයුතු කර නොතිබුණි. තවද, මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 79 ක් ද, මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 730 ක් ද පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ස්ථිරව බඳවාගත් නිලධාරීන් 68 ක් ද, අනුමත කාර්යය මණ්ඩලය තුළ ඇතුළත් නොවුණු කොන්ත්‍රාත් පදනම් මත බඳවාගත් සම්බන්ධීකාරක තනතුරු 33 ක් හා මාධ්‍ය උපදේශක තනතුරක් ද ඇතුළුව අනිරික්ත නිලධාරීන් 102 ක් විය. අනුමත කාර්යය මණ්ඩලය තුළ ඇතුළත් නොවුණු කොන්ත්‍රාත් පදනම් මත බඳවාගත් සම්බන්ධීකාරක තනතුරු 33 ක් හා මාධ්‍ය උපදේශක තනතුර සඳහා

පිළිවෙලින් රු.2,469,641 ක් හා රු.832,792 ක් වැටුප් හා දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

(ඒ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් 2017 වර්ෂයේදී අධිකාරිය වෙත ලැබී දෙහිඅත්තකන්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකගේ කටයුතු වෙනුවෙන් මැදිරිගිරිය කලාපයේ රියදුරකු වෙත ලබාදී තිබුණු අතර, 2019 දෙසැම්බර් 22 දින එම වාහනය අනතුරට ලක්වී තිබුණි. මුදල් රෙගුලාසි 104(4) අනුව අලාභහානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුළදී හානි සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වූවත් අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් මු.රෙ.104 (4) ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. වාහනයට සිදුවූ රු.6,915,484 ක අලාභයෙන් රු.2,500,000 ක් පමණක් රක්ෂණ ආයතනයෙන් අයකරගෙන තිබුණු අතර, ඉතිරි අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි.

(ඔ) අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. එම ගබඩා වී ගබඩා කිරීමට ප්‍රමිතගත පරිදි අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය මත ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දෙනමෙන් වී අලෙවි මණ්ඩලයේ සභාපති විසින් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් කරන ලද ඉල්ලීමට අනුව අදාල පැවැරීම් කටයුතු සිදුකිරීමට එම ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතින බව පසුගිය වර්ෂයේ දී විගණනයට දන්වා තිබුණි. එසේ වූවද 2022 ජුනි 20 දින විගණනයට ලබාදුන් තොරතුරු අනුව රජයේ ඉඩම් ආඥා පනත අනුව අධිකාරිය සතු ඉඩමක් මණ්ඩලයකට නොමිලේ පවරා දීමට ප්‍රතිපාදන නොමැති බැවින් කුලී අයකර ගැනීම හෝ පවරා දීම සම්බන්ධ ගැටළුව මෙතෙක් විසඳාගත නොහැකි වූ බව දන්වා තිබුණි.

(ඕ) අධිකාරිය සතු සංචාරක බංගලා සංඛ්‍යාව 27 ක් වන අතර, එම සංචාරක බංගලා 27 ම ආදායම ඉක්මවා වියදම් දරා තිබීම හේතුවෙන් රු.36,385,684 ක අලාභයක් සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණි. සංචාරක බංගලා ආදායම අඩුවෙමින් පැවතියදීත් 2021 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යක්ෂ (ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්) කාර්යාලය යටතේ පවත්නා සංචාරක බංගලා 05 ම අන්තර්ජාල පහසුකම් මඟින් වෙන් කිරීම හා බාහිර පුද්ගලයින් වෙත නිකුත් කිරීම නවතා දමා තිබුණු බව නිරීක්ෂණය වූ අතර සේවා අවශ්‍යතාවය වෙනුවෙන් සංචාරකයින් වෙත බැහැර කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බව විගණනයට දන්වා තිබුණි.

(ක) අධිකාරිය සතු පැල තවාන් 11 කින් පැල තවාන් 08 ක් ම අලාභ ලබා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අලාභය රු.35,077,470 ක් විය.

(ග) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් අස්ථානගතවී ඇති බැව් සඳහන් කරමින් 2021 ජූලි 01 දින කොළඹ වංචා හා විමර්ෂණ කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. උක්ත වාහනය අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇති බවත්, එම වාහනයේ පැවැත්ම පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලින් තහවුරු කර නොතිබුණු බවත් සඳහන් කරමින් 2018 ජනවාරි 09 දින විගණන විමසුමක් මඟින් දන්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් නිසි අවධානය යොමුකර නොතිබුණු අතර, ආයතනික මට්ටමින් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම

IV කොටස

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක: 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
இலங்கை மகாவலி அதிகாரசபை
இல.: 500, டி.பி. ஜயா மாவத்தை, கொழும்பு 10.
Mahaweli Authority of Sri Lanka
No.: 500, T.B. Jayah Mawatha, Colombo 10, Sri Lanka.

දුරකථනය தொலைபேசி Telephone 011-2687491-5
ෆැක්ස් අංකය பெக்ஸ் இல. Fax No. 011-2687391 011-2687240
විද්‍යුත් තැපෑල් மின்னஞ்சல் E-mail dgmasl@sltnet.lk dg@mahaweli.gov.lk
වෙබ් අඩවිය இணையத்தளம் Website www.mahaweli.gov.lk

මගේ අංකය - IWR/B/MASL/01/21/19

2022.11. 15

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72, පොල්දුව පාර ,
බත්තරමුල්ල.

<u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද ඔබගේ අංක IWR/B/MASL/01/21/19 හා 2022.09.06 දිනැති 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මාගේ පිළිතුරු පහත සඳහන් පරිදිවේ.

1.2

(අ). නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) ගේ ප්‍රධානත්වයෙන් යුක්තව සියළු කලාප/අංශවල නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන්ගේ (තාක්ෂණ සේවා) සහභාගිත්වයෙන් (වරලත් ඉංජිනේරුවරුන්) යුක්තව පිළිගත් තාක්ෂණික ක්‍රමවේද භාවිතා කර මෙම වටිනාකම් තක්සේරු කර ඇත.

(ආ). මහවැලි අධිකාරිය විසින් නඩත්තු කරන ප්‍රධාන වේලි 11 සහ වැව් 463 ක් හෙක්තිකව හදුනාගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මගින් දක්වා තිබුණ ද රට තුල පැවතුන කොරෝනා වසංගත රෝග තත්ත්වය මත එම වත්කම් තක්සේරු කර ගැනීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ දී එම වත්කම් විධිමත් ලෙස තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කරනු ලැබේ

(ඇ). දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් (CRIP) 2015 සිට 2021/12/31 දක්වා ලබාදෙන ලද වත්කම් ලෙස පහත සඳහන් පරිදි රු.මිලියන 325.5 ක ලේඛණයක් ද මොරගහකන්ද ව්‍යාපෘතියෙන් 2021 වර්ෂයේ ලබාදුන් වත්කම් ලෙස රු.මිලියන 113 ක ලේඛණයක් ද ඉදිරිපත්කර ඇත. 2021 වර්ෂයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වත්කම් ලේඛණයෙහි ව්‍යාපෘති දෙකෙහි වත්කම් ලෙස පහත පරිදි ගිණුම් ගතකර ඇත. (ඇමුණුම 01)

ව්‍යාපෘති වලින් ලබාදෙන ලද වත්කම් හා ගිණුම්ගත කරන ලද වත්කම් අතර වෙනස පහත හේතූන් නිසා සිදුවී ඇත.

1. ව්‍යාපෘති විසින් කලාප/ අංශවල කාර්යාල වෙත සෘජුවම වත්කම් ලබාදීම හා එසේ ලබා දීමේ දී ඒකීය ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම.

2. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) හා වෙළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (DSWRP) යන ව්‍යාපෘති වලින් කලාප/අංශවල කාර්යාල වෙත සෘජුවම ලබා දී තිබූ වත්කම් ගිණුම්ගත කිරීම සඳහා විස්තර ඉදිරිපත් කරනු / සොයාගනු ලද්දේ 2021 වර්ෂයේදීය. මෙසේ ගිණුම්ගත කිරීම් සඳහා ඉදිරිපත් කල වත්කම් ලේඛණ වල ඇතුලත් හණ්ඩ, භෞතිකව හඳුනාගැනීමේ ගැටළු මතු වීම නිසා 2021 වර්ෂයට ගිණුම් ගතකර නොමැත.

   කෙසේ වෙතත් ව්‍යාපෘති වලින් ලබාදුන් වත්කම් වල නිවැරදි තොරතුරු සොයා බලා එම තොරතුරු පරිගණක ගතකිරීමේ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතින අතර එම තොරතුරු පදනම් කරගෙන 2022 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. එසේම මෙම වත්කම් පැවරීම පිළිබඳ ලේඛණ අදාල ව්‍යාපෘති වෙතින් ප්‍රමාද වී ඉදිරිපත් කිරීම නිසා (CRIP ව්‍යාපෘතියෙන් අදාල ලේඛණ ඉදිරිපත් කරන ලද්දේ 2021 වර්ෂයේ නොවැම්බර් මාසයේ බැවින්) මෙම වත්කම් ප්‍රත්‍යාගණය කර ගිණුම්ගත කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි.

   වෙළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය, මොරගහකන්ද ව්‍යාපෘතිය හා දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 3 න් අධිකාරිය වෙත ලැබුණු වත්කම් වර්තමානයේ ගිණුම් ප්‍රකාශන තුල "ප්‍රදානයක්" ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර ඇති අතර වාර්ෂිකව එම වත්කම් වල ක්ෂය අනුපාතික අනුව ගණනය කල වටිනාකම " විලම්බිත අයභාරය " (Differed Income) ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල ගැලපීම් කර ඇත. තවද ණයගිම් ශේෂය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ). පිළිගතිමි. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඉ). පිළිගතිමි. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඊ). මුරවැසිහේන කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීමේ දී මුළු කාර්යයෙහි වටිනාකම රු. 7,314,810.80 වේ. නමුත් 2021 අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී සිදුවී ඇති ප්‍රමාද දෝෂයන් නිසා 9,240,287.00 ක මුදලක් "කෙරීගෙන යන වැඩ" ගිණුමට ගිණුම්ගත කර ඇත. ඒ අනුව, වැඩියෙන් ගිණුම්ගත වී ඇති රු. 1,925,476.20 ක මුදල ජ'නල් සටහනක් මඟින් නිවැරදි කර ගිණුම්ගත කර ඇත.

(උ). මොරගහකන්ද ව්‍යාපෘතිය මඟින් ණයගැති ශේෂය ලෙස රු. 108,452,464.09 ලෙස සනාථ කල ද එම ශේෂය තුල 2021.12.31 දිනට ප්‍රධාන කාර්යාලයේ ණයගැති ශේෂය වන රු. 38,564,344,510.86 ක මුදල ඇතුලත් කර නැත. මොරගහකන්ද ව්‍යාපෘතියේ ජංගම ගිණුම් හා අධිකාරියේ ජංගම ගිණුම් අතර වෙනසට හේතු වී ඇත්තේ ව්‍යාපෘතිය විසින් කලාප /අංශ කාර්යාල වලට වත්කම් භෞතිකව ලබා දීමේ දී එම වත්කම්වල අදාල කලාප /අංශ ජංගම ගිණුම් හරහා හුවමාරු නොවී ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම හරහා පමණක් හුවමාරුවීමයි. බී,සී, එච්, වලව, එල් හුරුළුවැව යන කලාපවලට හා මහවැලි ආරක්ෂක බලකාය, යාන්ත්‍රික වැඩපල - (නඹුත්තේගම), ගංගාද්‍රෝණි කළමනාකරණ කාර්යාලය යන අංශ වලට අදාලව භෞතිකව ලබා දෙන ලද වත්කම් වටිනාකම් මේ වන විට නිවැරදිව ගලපා ඇත. ඒ අනුව ණයගැති ශේෂයේ වෙනසින් රු.690,000 ක් ද ණයගිම් ශේෂයේ රු.27,545,052.26 වටිනාකමක් ද හඳුනාගෙන නිවැරදි කර ඇත.

අනෙකුත් කලාප හා අංශ සඳහා සැසඳීම් සිදු කරගෙන යන අතර 2022 වර්ෂයේ අවසන් ගිණුම්වල අවශ්‍ය සියළු ගැලපීම් කර නිවැරදි කරනු ලැබේ.

(ඌ). ගොවි සංවිධාන වෙත මෙවැනි කටයුත්තක් භාර දීමේ දී එය ගිවිසුමක් මඟින් නීත්‍යානුකූලව භාරදිය යුතුබව සත්‍යයකි. නමුත් ගොවි සංවිධාන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත මඟින් නීතිගත කොට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් බලප්‍රදේශයන් තුල බලාත්මක කර ඇති නීත්‍යානුකූල ආයතනයකි.

එබැවින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් මහවැලි බල ප්‍රදේශවල සුභසාධන කටයුතු සිදුකරන අවස්ථාවන් වලදී ගොවි සංවිධාන හා සම්බන්ධීකරණය කරමින් එම කටයුතු සිදු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. උක්ත යන්ත්‍ර මහවැලි "බී" හා "එල්" කලාපයන් තුල ස්ථාපිත කිරීමේ දී ද ගොවි සංවිධාන වල සහාය ලබා ගැනීම සිදු කරන ලදි. මක්නිසාද යත් උග්‍ර පානීය ජල භීතය හා මහවැලි "බී" හා "එල්"කලාපයන් හි දැඩිලෙස පවතින වකුගඩු රෝගයට හැකි ඉක්මණින් පිළියමක් යෙදීම සඳහා ප්‍රති ආශ්‍රැති ජල පිරිපහදු යන්ත්‍ර ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදි.

මෙම යන්ත්‍ර ක්‍රියාත්මක කොට පවත්වා ගෙන යාමේදී ජලය නිසි කළමණාකරණයකින් යුක්තව ප්‍රදේශයේ ජනතාව වෙත බෙදා හැරිය යුතු අතර ඒ සඳහා නිරන්තරයෙන් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට හා ජලය බෙදා හැරීමටත් ඒ සඳහා මුදල් අයකර ගැනීමටත් පුද්ගලයෙකු එම ස්ථානයේ රඳවා තැබීම අත්‍යාවශ්‍ය විය. එබැවින් එම කටයුතු නිසියාකාරව පවත්වා ගෙනයාම සඳහා නිරන්තරයෙන් මහවැලි අධිකාරියේ නිලධාරියෙකු එම ස්ථානයේ රඳවා තැබීම සිදුකල නොහැකි බැවින් ඒ සඳහා ගොවි සංවිධාන සමඟ සාකච්ඡා කොට ගොවි සංවිධානය හරහා පුද්ගලයෙක් එම යන්ත්‍රයේ කටයුතු පිළිබඳව පුහුණුවක් ලබා දී එහි රඳවා තැබීමට කටයුතු කරන ලදි.

ඒ අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිරන්තර අධීක්ෂණය යටතේ ගොවි සංවිධානය මඟින් එම යන්ත්‍රයේ නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදු කරන අතර එහි රඳවා සිටින පුද්ගලයා සඳහා ජලය විකුණා ලැබෙන මුදලින් වැටුපක් ලබා දීම ද ගොවි සංවිධානය මඟින්ම සිදු කරගෙන යනු ලබයි.

මේ අනුව මෙම කටයුතු යහපත් ආකාරයෙන් සිදුකෙරෙමින් පවතින බවත් ගොවි සංවිධාන නීත්‍යානුකූලභාවයෙන් යුක්ත වුවද ඉදියේ දී විධිමත්ව ගිවිසුමක් මඟින් ගොවි සංවිධාන වෙත මෙම යන්ත්‍ර භාර දීම සඳහා මේ වනවිට සියළු කටයුතු සූදානම් කරගෙන යයි.

(එ). මෙම ඉඩම් කට්ටි දෙකෙහි වර්තමාන වෙළඳපල වටිනාකම තක්සේරු කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2016 වර්ෂයේ ලබා දී ඇති අතර මෙතෙක් අදාල තක්සේරු වාර්තා ලැබී නොමැත. මේ පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත සිහිකැඳවීමක් යොමු කල ද පිළිතුරු නොලද බැවින් දුරකථනය මඟින් වාචිකව ද විමසීම් කරන ලදි. ඉන් අනතුරුව 2022.06.08 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද ලිපියක් මගින් ඉඩම්, තක්සේරු කිරීමට අදාලව තොරතුරු කිහිපයක් ඉල්ලා ඇත. එම තොරතුරු ද කඩිනමින් ලබා දී අදාල තක්සේරු වටිනාකම් ලද වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.

එමෙන්ම සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගනු ලබන ඉඩම් මහවැලි ජනපදිකයින් හා ව්‍යවසායකයින් වෙත බැහැර කරනු ලබයි. මෙහිදී ගොවි පංතියේ පුද්ගලයින් වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොඩ, වාරි, කෘෂිකාර්මික හා වර්ෂාපෝෂිත ඉඩම් නොමිලයේ ලබාදෙන අතර ව්‍යවසායක හා වැඩි ආදායම් කාණ්ඩයේ පුද්ගලයින් වෙත රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ හා ආයෝජන ඉඩම් ලෙස රජයේ තක්සේරුගත බදු මුදල් අය කර ද නිවාස ඉඩම් ලෙස රජයේ තක්සේරුව අයකර ද බැහැර කිරීම සිදු කරයි.

අධිකාරියෙහි කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම්, රජයේ ඉඩම් වන අතර මෙහි පරම අයිතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු නොවන අතර එහි පරිපාලනය පමණක් අධිකාරිය සතු බැවින් මෙම වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැති බව දන්වා සිටිමි.

නීතිරීති/විධානයට යොමුව

(අ). ප්‍රධාන කාර්යාලයේ සහ කලාප/අංශ වල දෛනික ධාවන සටහන් පත් රජයේ විගණන අංශයට යොමු කිරීමේ දී විගණන අංශය තුල එය ගොඩ ගැසෙන බැවින් තාවකාලිකව නවතා දමන ලෙස විගණන අධිකාරි විසින් මීට පෙර ලබා දී තිබූ උපදෙස් පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් එම ධාවන සටහන් පත් වාහනටය අදාල ලිපි ගොනුවේ ගොනු කිරීමට කටයුතු කර ඇතිබව නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් මා වෙත දන්වා ඇත.

එසේම නැවත ඉදිරිපත් කිරීමේ දී එය වාහනයට අදාල ලිපි ගොනුවේ ගොනු කරන ලෙසත් හදිසි අවස්ථාවක ලබා ගැනීමට පහසු වන ආකාරයට කටයුතු කරන ලෙසත් දැනුම් දීම් නිසා ඒ අනුව කටයුතු කර ඇත. ඉදිරියේ දී විමසුම මගින් දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කිරීමට සහ ඉල්ලුම් කරන ලද ධාවන සටහන්පත් ඉදිරිපත් කිරීමටත් කටයුතු කරමි.

(ආ). රාජ්‍ය ලාංඡනය සහ අධිකාරියේ නම අධිකාරියේ සියළු වාහන වල සඳහන් කිරීමට ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

(ඇ). 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යවස්ථාපිත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2022.02.25 දින අදාල තොරතුරු සමග භාර දී ඇත. එම කාලපරිඡේදය තුල රටේ පැවති වාතාවරණය හේතුවෙන් (කොවිඩ් වසංගත තත්ත්වය) කලාප / අංශ වලින් කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ අන්තර්ගත විය යුතු තොරතුරු ලබා දීමේ දී කාලපමාවක් සිදු වූ බැවින් මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේ දී කෙටුම්පත් වාර්ෂික වාර්තාව ද නියමිත දිනට ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි

(ඈ).

(i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයක් සලකා බැලූ විට ඒ තුල ස්ථාපිත කොට්යාශ හා ඒකක කාර්යාල බොහෝ අවස්ථාවල පළාත් 2-3 ක් ද දිස්ත්‍රික්ක 2-3 ක් ද ආවරණය වන පරිදි ක්ෂේත්‍රය පැතිරි ගොස් ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් ගත්විට අතිරේක දිසාපති වශයෙන් ද කටයුතු කිරීමට නෛතික විධිවිධාන සැලසී ඇත. එසේ ගත් විට මෙම නිලධාරියා ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් වශයෙන් රාජකාරි කරන බැවින්ද සියලු කලාපවල ඒ ඒ විෂය ගත කරුණු ඒ ඒ විෂය ගත අධ්‍යක්ෂවරු හරහා සිදුවන බැවින් මෙම නිලධාරීන් උක්ත චක්‍රලේඛයේ දක්වා ඇති " ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා" ගේ රාජකාරි භූමිකාව සිදුකරන බැවින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලු නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් හා අධ්‍යක්ෂවරුන් ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සේ සලකා 2015/01 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛණයේ සඳහන් පරිදි ඉන්ධන ලීටර් 140 බැගින් ලබා දී ඇත. කෙසේ වෙතත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2015/01 (ii) චක්‍රලේඛයේ ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ 1-1 සෙණයේ සියළු නිලධාරීන් සඳහා මසකට ලීටර් 115 බැගින් හිමි ඉන්ධන ලීටර් ප්‍රමාණය ලබා දී ඉහත මේ තත්ත්වය චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදි කර ඇත.

(ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 37 වන විධායක කළමනාකරණ කමිටු රැස්වීමේ තීරණය අනුව මාගේ අනුමැතිය මත අතිරේකව ලබා ගන්නා ඉන්ධන සඳහා ගෙවීම් කර ඇත.

කෙසේ වෙතත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2015/01 අනුව අමතර ලබා ගන්නා ඉන්ධන සඳහා ගෙවීම් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන) දැනුවත් කර ඇත.

(iii) අධිකාරිය තුල අංශ කිහිපයක් පවතී. එම අංශයන් වල නිලධාරීන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් හැකිතාක් දුරට ලබා දීමට කටයුතු කර ඇත.

එක් එක් අංශවල විවිධ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු යෙදෙන අවස්ථාවන් හිදී පවතින සීමිත වාහන සංඛ්‍යාව තුල කළමනාකරණය කර කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසා දුන්නද ඒ පිළිබඳව ප්‍රයෝගික ගැටළු මතු වී ඇත. එබැවින් එම අවස්ථාවල කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසීමේ දී ක්ෂේත්‍ර රාජකාරී සඳහා ප්‍රමුඛත්වය ලබා දී, හැකි සෑම අවස්ථාවක දිම කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.

(ඉ). පිළිගනිමි. පසුගිය කාලය තුල රටතුල පැවති ව්‍යසන තත්ත්වය මත සහ රජය මගින් වාහන අපහරණය සම්බන්ධයෙන් ලබා දුන් උපදෙස් අනුව (වාහන ආනයනය නතර කර ඇති බැවින් හැකි සෑම අවස්ථාවකම වාහන අළුත්වැඩියා කර භාවිතා කරන ලෙසට) මෙම කාර්යය අඛණ්ඩව සිදු කරගෙන යා නොහැකි වුවද 2022 වර්ෂයේ දී මෙම කාර්යය අවසන් කිරීමට කටයුතු කරමි.

(ඊ).

(i) සෑම වාර සේවාවකින් පසුව අදාල නියෝජිත ආයතන විසින් වාහනය පිළිබඳ වාර්තාවක් නිකුත් කරනු ලැබේ. ඉන් පසුව එම අලුත් වැඩියා භෞතිකව නිරීක්ෂණය කිරීම මගින් අලුත් වැඩියාව පිළිබඳ තහවුරු කිරීමක් කර ගනු ලැබේ. එසේම ඉන්ධන දහනය පිළිබඳව වෙනසක් දක්නට ඇති බව රියදුරු විසින් වාර්තා කිරීමේදි ද ඒ පිළිබඳ පරීක්ෂා කිරීමක් සිදු කරනු ලබයි.

කෙසේ වෙතත් මගේ අංක MASL/HO/TR/ADM/106 හා 2022.02.09 දිනැති ලිපිය මගින් ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් කරන ලෙස ප්‍රධාන කාර්යාලය ඇතුළුව සියලු කලාප/අංශ දැනුවත් කර ඇත.

(ii) නියෝජිත ආයතනයෙන්, වාර සේවාව යොමු කරන ආයතනය විසින් වාහනය පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා දෙන අතර එම වාර්තාව අනුව යම් අළුත්වැඩියාවක් හෝ නිවැරදි කිරීමක් සිදු කල යුතු නම් සොයා ලබා අවශ්‍ය කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වාහන අතරින් බොහෝමයක් 32 කාණ්ඩයට අයත් වන අතර එම නිෂ්පාදිත වර්ෂය 1986 සිට 1989 අතර වේ. වර්ෂ 36 ක කාලයක් පැරණි මෙම වාහන නිතර නිතර අළුත්වැඩියාවට යොමු කිරීමට සිදුව ඇති බව කාරුණිකව දන්වමි.

(iii) රාජකාරී කටයුත්තක් අතරතුරේ දී සිදුවන ආපදාවකදී පවතින තත්ත්වය මත සිදුව ඇති දෝෂ නිසි පරිදි අලුත්වැඩියා කර ඒ සඳහා ආවරණ අනුමැතිය ගනු ලැබේ.

නමුත් සියලුම වාහන අලුත්වැඩියා කිරීම ආයතනයේ පවතින ප්‍රසම්පාදන පිළිවෙතට අනුකූලව කරන බව ද යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ ද නිරීක්ෂණ ඇතුලත් වාර්තාවක් යොමු කිරීමට කටයුතු කරමි.

(උ). පිළිගනිමි. පසුගිය කාලය තුල රටතුල පැවති ව්‍යසන තත්ත්වය මත සහ රජය මගින් වාහන අපහරණය සම්බන්ධයෙන් ලබා දුන් උපදෙස් අනුව (වාහන ආනයනය නතර කර ඇති බැවින් හැකි සෑම අවස්ථාවකම වාහන අළුත්වැඩියා කර භාවිතා කරන ලෙසට) මෙම කාර්යය අඛණ්ඩව සිදු කරගෙන යා නොහැකි වුවද 2022 වර්ෂයේ දී මෙම කාර්යය අවසන් කිරීමට කටයුතු කරමි.

2.2.4

2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රධාන කාර්යාලයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් වර්ෂයේ ආරම්භයේ දී රු.මි. 17 ප්‍රතිපාදන වෙන් කර තිබුණි. නමුත් වරින් වර වාර්ෂික සැලැස්ම සංශෝධනය වීමත් සමඟ රු. මි. 33 ක මුදල් ප්‍රතිපාදන ප්‍රධාන කාර්යාලය සහ කලාප කාර්යාල සඳහා ඉල්ලීම් කර ඇති ඩෙක්ස්ටොප් පරිගණකය හා ලැප්ටොප් පරිගණකය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කරන ලදී.

ඒ අනුව වර්ෂයේ දී ප්‍රතිපාදන සැලැස්ම රු. මි. 17 ප්‍රමාණයට අනුමත කර ඇති නමුත් සංශෝධිත සැලැස්මට අනුව ඉහත මිල දී ගැනීම් සිදු කර ඇති බව දන්වා සිටිමි.

2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීමට සිදු වීමක් සමඟ ඉදිරිපත් කර ඇති ඉල්ලීම පරිදි ලැප්ටොප් පරිගණකය වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

ප්‍රසම්පාදන අංශය සඳහා ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ ප්‍රධාන කාර්යාලයේ පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා පමණක් නොව ප්‍රතිපාදන වෙන් වී නොමැති කලාප/අංශ/ කාර්යාල සඳහා ද අවශ්‍යතාවයන් අනුව මිලදී ගැනීමටය.

ඊ , බී සහ හුරුළුවැව කලාප කාර්යාලයන්හි මිලදී ගැනීම් සිදු කර ඇත්තේ සංශෝධිත වැඩ සැලැස්ම සංශෝධනය කිරීමෙනි.

2.3 වෙනත් කරුණු

(අ). මෙම තැන්පතු මුදල් කඩිනමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලෙස දන්වමින් සභාපති, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත අවස්ථා ගණනාවකදීම සභාපති - පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, ලේකම් - මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, අධ්‍යක්ෂ ජනරල්-ජාතික අයවැය දෙපාර්තමේන්තුව ආදි ආයතනය වෙත පිටපත් සහිතව දැනුම් දී ඇත. ඇතැම් අවස්ථාවල අප නිලධාරින්ට අදාල බැංකුව වෙත ගොස් අදාල බලධාරීන් වෙත මෙම මුදල් නිදහස් කරන ලෙස දැනුවත් කිරීම් පවා සිදු කරන ලදී. එම දැනුම්දීම් වල ප්‍රතිඵලයක් වශයෙන් උක්ත තැන්පතු මුදලින් කොටසක් 2021.04.06 හා 2021.04.27 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිදහස් කලද තවදුරටත් හිඟ මුදලක් පැවතුන බැවින් අධ්‍යක්ෂ (මුදල්) ගේ අංක MASL/FIN/03/02/RDB හා 2021.12.07 දිනැති ලිපිය මගින් ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ සහකාර සමාන්‍යාධිකාරී (ණය සැපයුම් හා පරිපාලන) වෙත මෙම හිඟ මුදල කඩිනමින් පියවන ලෙසට ලිපියක් යොමු කර ඇතත් ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැති බැවින් ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (ණය) සමඟ 2022 .05.25 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දී සාකච්ඡාවක් ද පවත්වන ලද අතර ඔහු විසින් මෙම මුදල කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලද අතර මේ පිළිබඳ ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී (ණය) වෙත කඩිනමින් හිඟ මුදල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පියවන ලෙස තවදුරටත් දන්වා 2022.05. 26 නැවත සිහිකැඳවීමේ ලිපියක් ද යොමු කරන ලදී

(ආ). මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම හා ස්භාවික සම්පත් කළමනාකරණ (පුද්ගලික) සමාගම් යන පරිපාලිත සමාගම් ඇවර කිරීම සම්බන්ධ ඉදිරි කටයුතු මහා භාණ්ඩාගාරය හරහා ඉටු කර දෙන ලෙස ඉල්ලා (2021.03.15 දින චාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් මගින්) ලිපියක් යොමු කර තිබුණි. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021.12.23 දිනැති ලිපිය ප්‍රකාරව මේ වන විට ඇවරකරු නම් කොට එම ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

(ඇ). ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි පශු සම්පත් කෘෂි (පුද්ගලික) සමාගම විසින් කළමනාකරණය කරනු ලබන සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ සහ බී කලාපයේ දම්මින්න ගොවිපල වලට අයත් අක්කර 1154 ක වපසරියකින් යුත් භූමිය සියළු දේපල ඇතුළත්ව රාජ්‍ය - පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අභිලාශයන් කැඳවීමට අමප/21/2229/317/025-1 හා 2022.01.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව, 2022.02.01 දිනැති මාගේ සටහන පරිදි පුවත්පත් දැන්වීම් මගින් ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2022.02.28 දින ලබාගෙන ඇත.

ඒ අනුව, පුවත්පත් දැන්වීම් සකස් කර දිනමිණ, තිනකරන්, ඩෙලිනිවුස්, පුවත්පත් වල පලකිරීම සඳහා අවශ්‍ය විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වන විට අනුගමනය කරමින් සිටින අතර, ඒ සඳහා වන ඉල්ලීම වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත.

(ඈ).

(i) වැව් පිළිසකර කිරීමට වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ප්‍රමුඛතාවය ලබාදී වැව් තෝරා ගැනීම ඒ ඒ කලාපවල නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් විසින් සිදු කරන ලදී. කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කඩින්කඩ රට වසා තිබීම සහ කාර්යාලයද වරින් වර වසා තැබීමට සිදු වීම නිසා ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු නිසියාකාරව අඛණ්ඩව සිදු කල නොහැකි විය.

- බී කලාපයේ වැව් 11ක ප්‍රතිසංස්කරණ කටයුතු වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ 2021 වසර තුල දී සිදු කල අතර ඒ සඳහා රු. මිලි. 39.5 ක් වෙන් කර තිබුණි. වැව් 07 ක වැඩ නිම කරන ලද අතර වැව් 11හි මූල්‍ය ප්‍රගතිය රු. මිලි. 46 ක් වූ අතර 71% ක භෞතික ප්‍රගතියක් 2021 වසර තුල ලභා කරගෙන තිබුණි.

- ඊ කලාපයේ වැව් 12 ක ප්‍රතිසංස්කරණ කටයුතු වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ 2021 වසර තුලදී සිදු කල අතර ඒ සඳහා රු.මි. 26.4 ක් වෙන් කර තිබුණි. එක වැවක වැඩ නිම කරන ලද අතර වැව් 12 හි මූල්‍ය ප්‍රගතිය රු.මි. 27.9 ක් වූ අතර 68% ක භෞතික ප්‍රගතියක් 2021 වසර තුල ලභා කරගෙන තිබුණි.

රොන්මඩ ඉවත්කර ගැනීමේ කාර්යය සඳහා වැවේ රොන්මඩ කැණීමට, කැණීම් කල රොන්මඩ ප්‍රවාහනය කිරීමට හා වැලි සෝදන ස්ථානය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා භූ විද්‍යා හා පතල් කාර්යංශය ආදී අනෙකුත් රේඛීය ආයතනයන්ගෙන් අනුමැතිය ලබා ගත යුතුවේ. රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කඩින් කඩ රට වසා තිබීම නිසා එම ආයතනයන්ගේ අනුමැතින් ලබා ගැනීමට අධික කාලයක් ගත වූ බැවින් මෙම අපේක්ෂිත ප්‍රගතියක් ලභා කර ගැනීමට නොහැකි විය.

තවද වැව් යටතේ ඇති කුඹුරු සඳහා ජලය නිකුත් කිරීමට බාධාවක් නොවන සේ රොන්මඩ ඉවත් කිරීමේ කාර්ය සිදු කල යුතු වේ. එබැවින් මෙම රොන්මඩ ඉවත් කිරීමේ ක්‍රියාවලිය මාර්තු, අගෝස්තු, සැප්තැම්බර් යන මාසවල පමණක් සිදු කල හැකි බැවින් වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු වල අපේක්ෂිත මූල්‍ය ප්‍රගතියක් හෝ භෞතික ප්‍රගතියක් ලභා කර ගැනීමට නොහැකි විය.

(ඉ). මහවැලි බල ප්‍රදේශ වල පිහිටි රජයේ ඉඩම් කළමනාකරණය කරලීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම අරමුණු ඇතිව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නියෝජිත ආයතනය හදුන්වා දෙන ලද රජයේ ඉඩම් කළමණාකරණ පද්ධතිය (E-Slims) ආරම්භ කරන ලදී. රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ජනපදිකයින් වෙත ඉඩම් බෙදාදීම, ඊට අදාළ පසු කටයුතු කළමනාකරණය කාර්යක්ෂමව පවත්වාගෙන යාම මෙමගින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නියෝජිත ආයතනයේ (ICTA) උපදේශකත්වය හා අධීක්ෂණය යටතේ ගිවිසුම්ගතව කටයුතු කිරීමටත් කළමනාකරණ පද්ධතියේ

සංවර්ධනය, මෙහෙයුම් සහ නඩත්තු කටයුතු පෞද්ගලික සමාගමක් සමග සේවා ගිවිසුමකට එළඹීමට කටයුතු කර ඇත.

මහවැලි බල ප්‍රදේශ වල රජයේ ඉඩම් ආඥා පනත යටතේ බෙදා දී ඇති (වාණිජ / නිවාස / ආයෝජන ව්‍යාපෘති / වෙනත්) ඉඩම් කොටස් 23,210 ප්‍රමාණයක තොරතුරු ඇතුලත් කිරීම මූලික පියවර ලෙස ආරම්භ කරන ලද අතර ඒ සමග ඉඩම් සංවර්ධන ආඥා පනතේ ප්‍රදාන පත්‍රයක් /අවසර පත්‍රයක් නිකුත් කර ඇති ඉඩම් සම්බන්ධ තොරතුරුද මෙම පද්ධතියට ඇතුලත් කරනු ලැබේ. ඒ අනුව දීර්ඝකාලීන බදුකර/වාර්ෂික අවසරපත්‍ර/ ප්‍රදාන පත්‍ර /අවසර පත්‍ර 5416 කට අදාල මූලික තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීමට මෙවන විටත් කටයුතු කර ඇත.

මහවැලි ජානපදිකයින් වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදා දී ඇති සියළු ගොඩ/වාරි/වර්ෂාපෝෂිත ඉඩම් කොටස් සඳහා ප්‍රදානපත්‍ර ලබා දීම, ඉඩම් අංශයේ ක්‍රියාත්මක සැලැස්මේ ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මෙම අංශය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රතිශතයක් ඒ සඳහා යෙදවීමට කටයුතු කර ඇත. ඒ අනුව පවතින මූල්‍ය තත්වය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාලව මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බව දන්වමි.

(ඊ). පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී නිරවුල් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගනිමි

(උ). මහවැලි බල ප්‍රදේශ තුල ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කර ඇති ඉඩම් කාර්යක්ෂමව උපයෝජනය කිරීම හා ඌන උපයෝජිත ඉඩම් අවලංගු කිරීම සඳහා විධිමත් ක්‍රියා පිලිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කලාප මට්ටමින් බැහැර කර ඇති ඉඩම්වල ,දින පැවති සකවිශාවට අනුව 2021.06.23 දින සිට 2021.07.08 සංවර්ධන තත්ත්වය භෞතිකව හඳුනා ගැනීම සඳහා විශේෂ සමීක්ෂණයක් දින දක්වා පවත්වන්නට යෙදුණු අතර එම සමීක්ෂණ දත්ත අනුව ව්‍යාපෘති ඉඩම් පිළිබඳ 2021.08.13 සාරාංශය පහත පරිදි වේ.

විස්තර විස්තරය	ප්‍රමාණය (හෙක්.)
ලබා දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය	6879
ආයෝජකයින් ප්‍රමාණය	695
පූර්ණ වශයෙන් සංවර්ධනය කර ඇති ඉඩම් කට්ටි ප්‍රමාණය	305
පූර්ණ වශයෙන් සංවර්ධනය කර ඇති ඉඩම් කට්ටි ප්‍රමාණය	3284
ඌන සංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය	188
ඌන සංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය	2023
අසංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය	202
අසංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය	1572

එම තොරතුරු මගේ අංක MASL/HO/BD/60 හා 2022.01.31 දිනැති ලිපියන් ආයෝජකයන් වෙත ලබා දී ඇති සමස්ථ භූමියෙන් 75% ක ප්‍රමාණයකට වඩා අඩුවෙන් සංවර්ධනය කර ඇති ආයෝජන ව්‍යාපෘතීන් සඳහා බැහැර කර ඇති ඉඩම් විධිමත් ක්‍රමවේදය අනුව කඩිනමින් අවලංගු කර ප්‍රගතිය 2022.02.20 දිනට යොමු කරන ලෙස දැනුවත් කර ඇත.

ඒ අනුව, ඉඩම් අවලංගු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර වැඩිම ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාවක් පවතින මහවැලි බී කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්.1285 ක් වන ඉඩම් කට්ටි 128ක් අවලංගු කිරීමට කටයුතු කර ඇත.

ඉන් අක්කර 500ක් පමණ වන රිදීකැන්න කොට්ඨාශයේ පිහිටි ඉඩම් තරුණ කටයුතු අමාත්‍යාංශය සමග "තරුණ කෘෂි ආයෝජන ගම්මානයක්" සැකසීම සඳහා වෙන් කර ඇති අතර, එම ඉඩම එම අමාත්‍යාංශයේ හා රේඛීය ආයතන වල සංවර්ධන සැලසුම් අනුව ඉදිරි කටයුතු ඉටු කිරීමට යෝජිතවේ.

දේශීය කඩිනම් ආහාර සුරක්ෂිතතාවය අරමුණු කර ගනිමින් මුතුවැල්ල ඒකකයේ අවලංගු කරන ලද හෙක්.180 ක භූමිය කෙටිකාලීන භෝග වගාව සඳහා ආයෝජකයන් 18 දෙනෙකු සඳහා වසරක කාලයක් සඳහා ලබා දීමට 2022.02.28 හා 2022.03.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති ප්‍රකාරව කටයුතු කර ඇත.

අනෙකුත් අවලංගු කර ඇති ඉඩම් සඳහා ද විධිමත් ආයෝජකයින් ගේ ශක්‍යතාවය පරීක්ෂාකර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

එල් කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කරන ලද ඉඩම් පාරිසරික නිර්දේශ ලබා ගැනීමේ ක්‍රමවේදයට අනුගත වී නොපැවති බැවින් සංවර්ධනය කිරීමට නොහැකි වූ ඉඩම් වන අතර, එම ඉඩම් සංවර්ධනය කිරීම සඳහා 2019.02.21 පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලබා දුන් උපදෙස් වලට අනුකූලව 2019.03.27 දිනැතිව අප අධිකාරිය මගින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද පාරිසරික අනුමැති අයදුම්පත්‍රය අනුව, පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/EIA/AGR/06/2021 හා 2022.03.22 දිනැති ලිපිය මගින් අදාල මර්ගෝපදේශ ලබා දී ඇති අතර, එම මාර්ගෝපදේශ අනුව සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට නේවාසික ව්‍යාපාර කළමනාකාර මේ වන විට දැනුවත් කර ඇත.

රඹකැන්ඔය කලාපයේ ආයෝජන ව්‍යාපෘති 06ක් සඳහා ලබා දී ඇති හෙක්.72ක් පමණ වන අසංවර්ධිත හා බදු ගෙවීම් පහර හැර ඇති ඉඩම් අවලංගු කිරීම සඳහා කලාපීය නිර්දේශය 2021.11.26 දින ප්‍රධාන කාර්යාලයට යොමු කර ඇති අතර, කොරෝනා තත්ත්වය හේතුවෙන් බදු ගෙවීම හා සංවර්ධනය සඳහා 2022.07.30 දක්වා සහන කාලයක් මා විසින් ලබා දී ඇත.

මොරගහකන්ද සහ වික්ටෝරියා කලාපයෙන් දිගුකාලීන ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දෙන ලද ඉඩම් පිළිබඳ තොරතුරු මේ සමග ඉදිරිපත් කර ඇත. ඩී, සහ වලව කලාපවලට අදාල තොරතුරු ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඌ). මහවැලි එල් කලාපයේ මිරිදිය ධීවර සංවර්ධන වැඩසටහන සඳහා 2019-2023 දක්වා සංවර්ධන සැලැස්මක් සකස් කර ජලාශ 13 ක ධීවර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. ඒ අනුව ජලාශ වල ජල ධාරිතාවය උපරිම අවස්ථාවේදී වගා පාදක ජලජීවී වගාව එම ජලාශ වල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය ගණනය කර මුදා හැරීමට යෝජනා කර 2021 වසර සඳහා එල් කලාපයේ ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 2,164,000 ක ප්‍රමාණයක් අවශ්‍ය බව ඇස්තමේන්තු කර එම මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය ජලාශ වලට මුදාහැරියේ නම් නියමිත කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කර මත්ස්‍ය අස්වැන්න ලෙස මෙ.ටො. 1490 ක් ලබා ගත හැකි බව ඇස්තමේන්තු කර සැලසුමක් ඉදිරිපත් කර ඇත.

1. නමුත් 2021 වර්ෂයේ මහවැලි අධිකාරියේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී මහවැලි එල් කලාපය සඳහා මෙ.ටො. 500 ක මත්ස්‍ය අස්වැන්නක ඉලක්කයක් ලබා දී ඇත. තවද 2021 ක්‍රියාත්මක සැලැස්මෙන් කලාපයේ ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 400 000 ක් මුදාහැරීම සඳහා සැලසුම් කර ඇත. මේ සඳහා රුපියල් මිලියනයක 1.3 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කොට ඇත.

2. ඒ අනුව මෙම මත්ස්‍ය පැටවුන් සපයා ගැනීම සඳහා විධිමත් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙන් මත්ස්‍ය පැටවුන් මිලදී ගැනීම සඳහා ඇණවුම් කර ඇත.

3. 2021 වසර තුල මත්ස්‍ය ඇඟිල්ලන් 60,000 ක් මුදාහැර තිබේ.

4. නමුත් කලාපයේ ජලාශ වල ජලය සිදීයාම සහ අවශ්‍ය අවස්ථාවේදී මත්ස්‍ය ඇඟිල්ලන් සැපයීමට ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට නොහැකි වූ නිසා 2021 වසර තුල ඉතිරි මත්ස්‍ය ඇඟිල්ලන් 360,000 මුදා හැරීමට නොහැකි විය. නමුත් මෝසම් වර්ෂාවත් සමග ජලාශ පිරියාමත් සමග 2022 වසරේ පළමු මාසය තුල අදාල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම කර ඇත. ඒ අනුව මහවැලි අධිකාරිය විසින් නිකුත් කරන ලද රුපියල් මිලියන 1.3 ක අදාල වෙක්පත සඳහා මිලියනයකට අදාල බිල් පත ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් 2022.01.17 වන දින නිකුත් කර ඇති අතර 2022.02.28 දින එම අත්තිකාරම් මුදල පියවා ඇත.

5. එසේම කීට ඉස්සන් ප්‍රමාණවත් තොග අදාල ආයතන සතුව නොපවතින බැවින් රු. 300,000 කට අදාල කීට ඉස්සන් තොගය ඉදිරි සති දෙක තුල දී ලබා දෙන බව අදාල ආයතනය දැනුම් දී ඇත. තවද 2021 වසර තුල මෙ.ටො. 99.3 ක මත්ස්‍ය අස්වැන්නක් ලබා ඇත.

6. ශ්‍රී ලංකාවේ ජලාශවලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය නිෂ්පාදනය නොවීම නිසා මහවැලි කලාප වල ජලාශ සඳහා අවශ්‍ය සම්පූර්ණ මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය සපයා ගැනීම අසීරු වී ඇත. එම නිසා මහවැලි කලාප වල ජලාශ වලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත. ඒ අනුව මහවැලි එල් කලාපය සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය කිරීම සඳහා වන වර්ධක පොකුණු පද්ධති දෙකක් ඉදිකිරීම සුදුසු බව හඳුනා ගෙන ඇත. ඒ අනුව 2021.03.19 දිනැති MASL/LD/21 දිනැති ලිපිය මගින් මේ බව නේවාසික ව්‍යාපර කළමණාකාර එල් කලාපය වෙත ප්‍රධාන කාර්යාලයේ ධිවර හා පශු සම්පත් සංවර්ධන අංශය විසින් දැනුවත් කර ඇත. මේ සම්බන්ධව නේවාසික ව්‍යාපාර කළමණාකාර එල් කලාපය විසින් අධ්‍යක්ෂ ජනරාල් තුමා වෙත එවා ඇති අංක RPM/L/AG/67 හා 2021.09.23 දිනැතිව එවා ඇති ලිපියට අනුව පොකුණු පද්ධතිය ඉදිකිරීමට යන්ත්‍රසූත්‍ර සපයා ගැනීමට අපහසු වීම සහ අවශ්‍ය වෙනත් ද්‍රව්‍ය සපයා ගැනීමට අසීරු වීම නිසා ඇඟැටුගස්වැව පොකුණු පද්ධතිය 2022 වසර තුල ඉදිකරන බව දන්වා ඇත.

(එ). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ අංක 21/1596/304/134 හා 2021.08.31 දිනැතිව නිකුත් කරන ලද "රාජ්‍ය වියදම් සමාලෝචනය" යන අමාත්‍ය මණ්ඩල තීරණයේ හා ඒ සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමා 2021.08.28 දින ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව දන්වා ඇති පරිදි බදවා ගැනීම් සිදු කිරීම කල් දැමීම මත අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ, මධ්‍යම කළමනාකරණ මට්ටමේ හා මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොමැති බැවින් වැඩ බැලීම, රාජකාරී ආවරණය, කොන්ත්‍රාත් කාර්යය පැවරුම් පදනම් මත හා ද්විතීයන පදනම් මත නිලධාරීන් පත් කිරීමෙන් පුරප්පාඩු තනතුරුවල රාජකාරී අඛණ්ඩව ඉටුකර ගැනීමට කටයුතු සිදුකර ඇත.

2013.06.12 වන දින නව බදවා ගැනීම් පරිපාටිය අනුමත වීමත් සමඟ අධිකාරිය තුළ පැවති සමහරක් තනතුරු හැකිලීමකට ලක් විය. ඒ අනුව නව බදවා ගැනීම් පරිපාටියට අනුව අන්තර්ග්‍රහනය නොවූ තනතුරු වල සේවය කරන්නන් ඔවුනට පමණක් පෞද්ගලික වන සේ එම තනතුරුවලම විශ්‍රාම ගන්නා තුරු තබා ඇති බැවින් අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු වල සේවය කරන නිලධාරීන් ස්ථිර අතිරික්ත නිලධාරීන් ලෙස පෙන්නුම් කරයි.

තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 25/2014 හා 25/2014 (I) අනුව ශ්‍රී ලංකා ලංකා මහවැලි අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ (MA 1-2) සිට ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 1) දක්වා අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දෙන ලදි.

ඒ අනුව රටට අදාළ සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගන්නා ලෙස දන්වා ඇති අතර, ඒ අනුව සේවක සංඛ්‍යාව සංශෝධනය වී නොමැති බැවින් ඔවුන් අතිරික්තව සිටියි. එසේම සමහර තනතුරුවල එවකට සිටි ස්ථිර සේවක සංඛ්‍යාවට වඩා තනතුරු සඳහා අනුමත කර තිබූ බැවින් අතිරික්තව පැවතුනි. මේ අනුව ඉදිරියේදී ඔවුන් විශ්‍රාමයාමත් සමඟ අනුමත සංඛ්‍යාව සමාන වනු ඇත.

එමෙන්ම සම්බන්ධීකාරක තනතුර සඳහා මහවැලි ගොවි ජනතාවගේ කෘෂිකර්ම හා සත්ව පාලන සම්බන්ධ තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීමේ සඳහා විශ්ව විද්‍යාලය සතු දැනුම ගොවීන් වෙත සෘජුව ගෙනයාමේදී එහි සම්බන්ධීකරණ කටයුතු කොටයාශ මට්ටමින් සිදු කිරීමට කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මගින් බදවා ගැනීම් සිදු කර ඇත.

මහවැලි අධිකාරිය විසින් සිදුකරන සංවර්ධන කාර්යයන් පිළිබඳව ප්‍රජාව නිවරුදිව දැනුවත් නොවීමත් වැරදි තොරතුරු සමාජගත වීමත් නිසා වර්තමානය වන විට ආයතන කෙරෙහි සෘණාත්මක මාධ්‍ය බලපෑමක් නිර්මාණය වී ඇත. එබැවින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදු කරනු ලබන ආර්ථික, සමාජීය හා පරිසර සංවර්ධන වැඩසටහන් පිළිබඳව සහ එහි ප්‍රගතිය වගකීමෙන් යුතුව නිවරුදි යාවත්කාලීන තොරතුරු කාර්යක්ෂමව මහජනතාව සහ මාධ්‍ය වෙත ඉදිරිපත් කිරීම මෙම කාල සීමාව තුළ ඉතා අත්‍යාවශ්‍ය කාර්යයක් බවට හඳුනාගෙන ඇති බැවින්, එකී කර්යය ඉටුකර ගැනීම සඳහා මාධ්‍ය ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහ අත්දැකීම් සහිත නිලධාරියකු " මාධ්‍ය උපදේශක" තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මගින් බදවා ගෙන ඇත.

(ඒ). වාහනයට සිදුවී ඇති අලාභයෙන් රක්ෂණ ආයතනයෙන් ආවරණය නොවන මුදලක් වේ නම් එම මුදල අදාල වගකිවයුතු නිලධාරියා විසින් ගෙවීමට ලිඛිතව කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(ඔ). වී අලෙවි මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ගබඩා ගොඩනැගිලි දැනට දීර්ඝ කාලයක සිට භාවිතා කරනු ලබන අතර ඒ සඳහා කුලී ගෙවන ලෙස දන්වා සිටි නමුත් කුලී ගෙවීමේ හැකියාවක් නොමැති බව දන්වා ඇත. තවද අදාළ වී ගබඩා අලුත්වැඩියා කල යුතු තත්ත්වයේ පවතින බවත් ඒවායේ අයිතිය ඔවුන් සතු නොවන බැවින් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමේ ගැටලු පවතින බවත් එබැවින් අදාල ගබඩා එම මණ්ඩලය වෙත පවරා දෙන ලෙසත් ඉල්ලුම් කරනු ලබයි.

නමුත් රජයේ ඉඩම් ආඥා පනත අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩමක් මණ්ඩලයකට නොමිලේ පවරාදීම සඳහා ප්‍රතිපාදන නොමැත. එබැවින් ඉල්ලුම් කරනු ලබන සියලු ගබඩා ගොඩනැගිලිවල සම්පූර්ණ වටිනාකම අය කර ගැනීමෙන් පසු එම ඉඩම් රජයේ තක්සේරුවෙන් 4% ක වටිනාකමක් අය

කර ගැනීම මත පදනම්ව දීර්ඝකාලීන බදු පදනම් මත ලබා දීම හෝ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව කුලී පදනම මත ලබා දීම පමණක් සිදු කල හැකිය.

ඉහත කරුණු හේතුවෙන් කුලී අය කර ගැනීම හෝ පවරාදීම සම්බන්ධ ගැටලුව විසඳා ගත නොහැකි බැවින් මෙම ආයතන දෙක අයත් රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් කැඳවා ඉදිරි කටයුතු සම්බන්ධ සාකච්ඡා කිරීමට තීරණය කර ඇත.

තවද දැනට රටේ පවතින වාතාවරණය හමුවේ මහජනතාවට අත්‍යාවශ්‍ය සේවාවක් සපයන වී අලෙවි මණ්ඩලය භාවිතා කරනු ලබන ගබඩා ගොඩනැගිලිවල සන්තකය ලබා ගැනීම සම්බන්ධයෙන් නීති ක්‍රියාමාර්ග ගැනීම යෝග්‍ය නොවන බැවින් සහ රාජ්‍ය ආයතන අතර ගැටලු නීති මාර්ගයට නොයා අමාත්‍යාංශ ලේකම්වරුන් හරහා විසඳා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙමින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොමැති බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එමෙන්ම ගබඩා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට තොරතුරු යොමු කිරීමෙන් පසු බදු පදනම් මත ලබා දෙන්නේ නම් මිනින්දෝරු සැලැස්ම යොමු කරන ලෙස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය තක්සේරුකරුවකු දන්වා ඇත. පවතින ගැටලුකාරී තත්ත්වය හමුවේ බදු පදනම් මත ලබාදීමට වටිනාකම් තක්සේරු කිරීම් පල රහිත වන බැවින් (තක්සේරු වටිනාකම් ලබා දෙනුයේ ඉල්ලුම් කරනු ලබන කාර්යයට යොදා ගැනීම සඳහා පමණක් වන අතර එම තක්සේරුව මත පදනම්ව පවරාදීම් කල නොහැකිය.) අදාළ තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු නොකරන ලදි.

(ඹ). මහවැලි අධිකාරිය සතු සංචාරක බංගලා 2017 වර්ෂයට පෙර දී වාර්ෂික රු.මි. 1.5 ක සාමාන්‍ය ආදායමක් උපයමින් පැවති අතර 2017 වර්ෂයේ දී ව්‍යාපාර සංවර්ධන අංශය වෙත පැවරීමන් සමග මහවැලි සංචාරක බංගලා නවීකරණය කරමින් අන්තර්ජාල ගත කිරීමේ ව්‍යාපෘතිය තුල සාමාන්‍ය ආදායම රු.මි. 10 ඉක්මවා ගැනීමට හැකිවිය.

තවද 2020 වර්ෂයේ සිට මේ දක්වා පවතින ලෝක වසංගත තත්වය තුල දේශීය හා විදේශීය සංචාරක ව්‍යාපාරය විශාල පසුබැමකට ලක් වූ අතර එම තත්වය තුල අපේක්ෂිත ඉලක්කය වෙත ලඟා වීමට නොහැකි විය.
සමස්තයක් ලෙස සැසදීමේ දී මෙම ව්‍යාපෘතියේ වාර්ෂිකව අලාභයක් පෙන්නුම් කල ද දිගුකාලීනව අලාභය අවම කර ගනිමින් ලාභ ලැබීම මෙන්ම වඩා ගුණාත්මක සේවාවෙක් ලබා දෙමින් මහවැලි අධිකාරිය තුල පවතින විශේෂිතම ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාමට ඉලක්ක කර ඇත.

එමෙන්ම මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ප්‍රධාන වෙළි හා ජලාශ මෙහෙයුම්) යටතේ සංචාරක බංගලා 05 ක් පවති. එම සංචාරක බංගලා වෙළි ආශ්‍රිතව පිහිටා ඇති බැවින් අධ්‍යක්ෂ (ප්‍රධාන වෙළි හා ජලාශ මෙහෙයුම්) විසින් සිදු කරන ලද ඉල්ලීමට අදාලව සේවා අවශ්‍යතාවය වෙනුවෙන් සංචාරකයින් වෙත බැහැරකිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.

(ක). මහවැලි සංවර්ධන ක්‍රියාවලිය තිරසාරව ක්‍රියාත්මක කිරීම් සඳහා හා එහි ආර්ථික සළුලතාවය පවත්වාගෙනයාම සඳහා මහවැලි කලාප වල පැල තවාන් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් ඇත. එහිදී පහත ආකාර දෙක මගින් අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට උපකාරී වේ.

1. මහවැලි ගොවීන් වෙත කෘෂිකාර්මික භෝග පැල ලබා දීම. මෙම පැල මුදලට, 50% දායකත්ව (සහන මිලට) හෝ නොමිලයේ ලබා දීම සිදු වේ. මෙය අදාල වර්ෂයේ ව්‍යාපෘතියේ සිදුකල සැලසුම් අනුව සිදු වේ.

2. මහවැලි සංවර්ධන කටයුතු වලින් ඉවත්වූ වන වැස්ම නැවත ප්‍රතිස්ථාපනය සඳහා හා ඉහල මහවැලි ජල පෝෂක ප්‍රදේශ වල වන වැස්ම වැඩිකිරීම සඳහා අවශ්‍ය වනවගා පැල නිෂ්පාදනය සිදු කිරීම හා එම වන වගා වැඩසටහන් වලට අවශ්‍යතාවය අනුව පැල ලබා දීම.

පරිසර හා වන සංරක්ෂණ අංශය විසින් ඉහල මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම සහ පහළ මහවැලි කලාප වල පරිසර සංරක්ෂණය අරමුණු කරගෙන මෙම ප්‍රදේශ වල වනගහනය වැඩිකිරීම සඳහා වන පැල නිෂ්පාදනය කිරීමට හා වනපැල රෝපණය කිරීම උදෙසා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම යටතේ මුදල් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි.

ඒ අනුව වන පැල, පළතුරු පැල, ඖෂධ පැල, කෘෂි ආර්ථික භෝග නිෂ්පාදනය සඳහා මහවැලි කලාපවල පැලතවාන් වලට හා ඉහල මහවැලි ජලපෝෂක ප්‍රදේශයේ පැල තවාන් සඳහා 2021 වර්ෂයේ පහත පරිදි ප්‍රාග්ධන මුදල් වෙන්කර ඇත.

විගණන තොරතුරු විමසා ඇති පැල තවාන	පරිසර අංශය මඟින් පැල තවාන් සඳහා වෙන්කල ප්‍රාග්ධන මුදල (රු.මි)	ඉලක්ක ගත පැල නිෂ්පාදනය
බී කලාපය (මධ්‍යම පැල තවාන හා වැලිකන්ද පැල තවාන)	3.98	100,000
සී කලාපය	1.467	52,000
මොරගහකන්ද කලාපය	1.15	45,632
එච් කලාපය	නැත	නැත
වලව කලාපය	4.404	118,000
පරිසර හා වන සංරක්ෂණ අංශය - කොත්මලේ (නවදෙව්ට හා පල්ලෙකැලේ පැල තවාන)	1.783	116,000

මීට අමතරව පැලතවාන් වල පරිසර සංරක්ෂණයට අදාලව වන පැල නිෂ්පාදනයට අමතරව කෘෂිකර්ම අංශයේ වැඩසටහන් සඳහා කෘෂි භෝග නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබන අතර මේ සඳහා අවශ්‍ය අවස්ථාවල කෘෂිකර්ම අංශය මඟින්ද ප්‍රතිපාදන වෙන්කරනු ලබයි (එච් කලාපයේ පැල තවාන් සඳහා). එසේම පරිසර අංශය මඟින් අදාල කෘෂි නිෂ්පාදන වලටද ප්‍රතිපාදන යොදාගනු ලබයි.

පරිසර අංශය මඟින් වෙන්කරනු ලබන ප්‍රාග්ධන මුදල් ප්‍රතිපාදන යොදා පැල නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම (බීජ, බෑග්, පස්, පොහොර, ප්‍රවාහනය හා වෙනත් නඩත්තු කටයුතු) හා පැල තවාන් වල නව ඉදිකිරීම් හා භාණ්ඩ මිලදී ගැනීම් සිදු කිරීම පමණක් කරනු ලැබිණි.

මෙසේ නිපදවනු ලබන වන, පළතුරු, ඖෂධ පැල හා කෘෂි භෝග වැඩි ප්‍රමාණයක් එක් එක් කලාප තුල හා එම කලාපය අවට ප්‍රේරණ ප්‍රදේශයේ සිටුවීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අනුමැතියට යටත්ව රේඛීය ආයතන, අදාල ඉල්ලුම් කරන පාර්ශව වෙත හා ගොවි ජනතාව වෙත නොමිලේ ලබා දීම සහ 50% දායකත්වය යටතේ සහන මිලට ලබා දීම සිදු කර ඇත. එමඟින් පරිසර සංරක්ෂණ හා කෘෂි නිෂ්පාදන ඵලදාව ඉහල දැමීමට හා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අතර රුක් රෝපණය හා නඩත්තුව සඳහා අධිකාරිය තනිව දැරිය යුතු විශාල පිරිවැය ප්‍රමාණයක් අවම කර ගැනීමට හැකිවී ඇත. ඒ අනුව එක් එක් කලාප වල අදාල තොරතුරු පහත දැක්වේ.

ලාභාංශ අඩුවීම පෙන්නුම් කිරීමට අදාලව නිරීක්ෂණය වූ හේතු :-

- ලාභාංශ ගණනයේදී 2021 වර්ෂයේ සමස්ථ කෘෂි හා වන වගා පැල නිෂ්පාදනයේදී හා පැල තවාන් නඩත්තුවේදී (ආරක්ෂා කටයුතුද ඇතුළුව) කම්කරු ශ්‍රම ඒකක සපයා ගැනීමට අදාල පිරිවැය, ස්ථීර සේවක කාර්යමණ්ඩල හා නිලධාරී වේතන වියදම්ද හා පුනරාවර්තන වියදම් වලින් දරනු ලැබීය. වියදම් ගණනයේදී මෙම අගයන්ද අදාල කරගෙන ඇත. විශේෂයෙන් ස්ථීර සේවක කාර්යමණ්ඩල හා නිලධාරී වේතන වක්‍ර වියදම් ලෙස ගණනයට ඇතුලත්වීම මත විශාල පිරිවැයක් පෙන්නුම් කර ඇත. පැල තවාන් 08 අමතරව ලාභාංශ ගණනයේදී පටක රෝපණන විද්‍යාගාරයේ සහ වලව අලෙවිසැලේ වියදම්ද ඇතුලත් කර ඇති බැවින් පැල තවාන් අටට අදාල අලාභය රු: 35,077,470.00ක් ලෙස වාර්තාකර ඇත. එම අගය පැල තවාන් අටට අදාලව වෙනම ගණනය කර දැක්වීම සුදුසුය.

- මහවැලි කලාප වල වන පැලයක් නිෂ්පාදනය කිරීම සඳහා දළ වශයෙන් විකුණුම් අවස්ථාව දක්වා කාලයක් නඩත්තු කිරීම සඳහා රු 50 -60 අතර මුදලක් පසුගිය වසර (2019) වල වැයවී ඇති අතර වැයවන අතර එක් එක් කලාප වල අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව හා හැකියාව මත මෙම මුදල වෙනස් වේ. වර්තමාන ආර්ථික තත්වය මත අමුද්‍රව්‍ය මිල ගනන් අනුව මෙම අගය රු. 100 වැඩි අගයක් ගනු ඇත . එසේම නිෂ්පාදන වියදම් වැඩිවීමට හේතුවක් ලෙස කම්කරු ශ්‍රම ඒකකයක් රු.1,300.00ක් දක්වා වැඩිවීම බලපා ඇති අතර එයට සමගාමීව සෙසු වියදම්ද විශාල ප්‍රමාණයකින් ඉහල ගොස් ඇත. එයට සමගාමීව අදාල වර්ෂ වලදී (2019 සිට) පැල වල මිල සංශෝධනයක් වී නොමැත. ලාභාංශ අඩුවීමට මෙයද හේතුවක් වී ඇත.

- දැනට මහවැලි පැල තවාන්වල සාමාන්‍ය පැලයක විකුණුම් මිල රු. 30 – 60 පරාසයක ඇත. විශේෂයෙන් පරිසර සංරක්ෂණයට අදාලව වන වගා පැල අවම මිලකට ලබාදීමට සිදුව ඇති අතර එමගින් පරිසර සංරක්ෂණය සඳහා ජනතාව පෙළඹවීමක් බලාපොරොත්තුවේ. එසේ නොවුන හොත් වන පැල අලවිය අවම වීම හා පැල රඳවාගෙන නඩත්තු කිරීමේ වියදම් ඉහලයාහැක.

- ඒ අනුව ලාභාංශ ගණනයේදී වර්තමාන වෙළඳ පොළ මිලගණන් අනුව පැල තවාන්වල සාමාන්‍ය පැලයක විකුණුම් මිල රු. 110 - 125 පරාසයක තබාගැනීම සුදුසුය.

- එසේම අධිශ්‍රේණි පැල වල විකුණුම් මිල රු. 450 – 750 පරාසයක ඇත. මෙම පැලද නොමිලේ ලබාදීම හා සහන මිලට ලබාදීම නිරීක්ෂණය වන අතර ලාබාංශ අඩුවීමට මෙයද හේතුවක් වී ඇත.

- තවද අදාල වර්ෂයේදී අපේක්ෂිත අරමුණු ලගාකර ගැනීම සඳහා පැල 96,160 (කෘෂි 17,661 වන වගා 78,499) යක් මෙම පැල තවාන් ආශ්‍රිතව නොමිලේ ලබා දී ඇත. (එහි දළ වටිනාකම රු5,769,600) (පැලයක විකුණුම් මිල රු 60.00 ලෙස සලකා ඇත) .එම පැල වල අපේක්ෂිත පැල විකුණුම් මිල ඉහල දැමීම සමග ස්කන්ධ වටිනාකම ද ලාභාංශ ගණනයට එකතුකර නොමැති අතර එය ද ගණනය කර එකතු කිරීම සුදුසුවේ. (මේ සඳහා කළමනාකාරිත්වය උපදෙස් ලබා දී ඇත)

- 2021 වර්ෂයේදී රටතුල උද්ගත්වූ අර්බුදකාරී තත්වය මත පැලසිටුවීම හා මිලදී ගැනීම අවම වී තිබීම හේතුවෙන් පැල විකුණුම් අදායම් අඩුවූ අතර නඩත්තු වියදම්ද ඒ අනුව වැඩිවී ඇත.

මහවැලි අධිකාරිය විසින් නිපදවනු ලබන පැලයක් බිම් ගත කිරීම හා මාස 12 ක කාලයක් නඩත්තු කිරීම සඳහා රු 1300.00 පමණ මුදලක් වැය වන අතර වාර්ෂිකව එක් එක් කලාප වල පැල නිෂ්පාදන ඉලක්කය අනුව මේ සඳහා විශාල මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් අධිකාරියට වාර්ෂිකව වැය කිරීම අපහසුය. (වගුව 3) පැල නොමිලේ ලබාදීම හා අඩුම නිෂ්පාදන වියදම පමණක් ලබාදීම මගින් මෙම බාහිර වියදම් නොමැතිව අධිකාරියේ අපේක්ෂිත ඉලක්ක වලට යාමට බලාපොරොත්තුවිය.

කලාපය	ඉලක්කගත රුක් රෝපණය (පැල)
බී කලාපය	100,000
සී කලාපය	25,000
ඩී කලාපය	50,000
මොරගහකන්ද කලාපය	100,000
හුරුළුවැව කලාපය	10,200
එච් කලාපය	20,000
එල් කලාපය	10,000
ඊ කලාපය	6,000
රඹකැන්ඔය කලාපය	10,250
වලව කලාපය	50,000
පරිසර හා වන සංරක්ෂණ අංශය - කොක්මලේ (නවදෙවිට හා පල්ලෙකැලේ පැල තවාන)	50,000

පරිසර සංරක්ෂණය සඳහා මහවැලි ප්‍රදේශ වල වනගහනය ඉහල දැමීම සඳහා මහවැලි පැල තවාන් ආශ්‍රිතව වන පැල නිෂ්පාදනය ආර්ථික වශයෙන් ඉල්ලුම්, සැපයුම් නියමයන්ට අනුව සලකා බැලීමේදී වියදම් සහගත ක්‍රියාවන් ලෙස නිරීක්ෂණය වුවද වැඩුණු ශාක මගින් සිදුවන පරිසර සේවාවන් (ස්වාභාවික ප්‍රාග්ධනය ලෙස) නිෂ්පාදන ආර්ථිකයට ගලපා බැලීමේදී ඉහල ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙන බවට නිරීක්ෂණය වේ.


කෙසේ වුවද දැනට පාඩු ලබා ඇති බවට සඳහන් වන පැල තවාන් වල කම්කරු වැටුප් සඳහා විශාල මුදලක් වැය වී ඇති බවට නිරීක්ෂණය වන අතර අඩු ශ්‍රම ඒකක ප්‍රමාණයක් සමග කලාපීය පැල තවාන් වල පැල නිෂ්පාදන කටයුතුද සැලසුම් කිරීම මගින් ඉදිරි පිරිවැය අවම කර ගැනීමට උපදෙස් නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් වෙත සැපයීමට බලාපොරොත්තු වන අතර තවද කෘෂිහෝග නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳව සැලසුමද යාවත්කාලීන කිරීමට බලාපොරොත්තු වෙමි.

(ග). මේ සම්බන්ධව පරීක්ෂණ, පොලිස් වංචා විමර්ශන අංශය විසින් කරගෙන යනු ලබන අතර විමර්ශනවල වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

කීර්ති බී. කොටගම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

පිටපත

1. ලේකම් - වාරිමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය



දීර්ඝගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

ඇමුණුම් -01

(2015 සිට 2021.12.31 දක්වා ලබා දී ඇති වත්කම්)

කලාපය/අංශය	පිරිවැය (රු)
ප්‍රධාන කාර්යාලය	118,591,059.15
හුරුළුවැව	1,506,955.38
ප්‍ර.වේ.හා ජ.මේ.අංශය	1,547,275.38
ගංගා දේණි හා කළමනාකරන අංශය	20,813,584.31
අමාත්‍යාංශය	1,333,999.00
බී කලාපය	71,998,487.93
සී කලාපය	2,102,528.95
එච් කලාපය	88,395,028.71
එල් කලාපය	15,600,000.00
වලව	3,568,621.64
එකතුව	**325,457,540.45**

මොරගහකන්ද ව්‍යාපෘතිය

(2015 සිට 2021.12.31 දක්වා ලබා දී ඇති වත්කම්)

කලාපය/අංශය	පිරිවැය (රු)	ක්ෂය (රු)	ශුද්ධ අගය (රු)
ප්‍රධාන කාර්යාලය	117,774,623.40	84,512,684.31	33,261,939.13
ප්‍ර.වේ.හා ජ.මේ.අංශය	93,455,494.83	52,472,317.16	40,983,177.69
වාරිමාර්ග	44,721,741.81	41,397,312.88	3,324,428.94
ගංගා දේණි හා කළමනාකරන අංශය	5,577,214.00	5,014,992.98	562,221.02
මොරගහකන්ද	64,467,759.29	48,352,703.22	16,115,056.12
ම.අ.බ	17,698,381.50	13,085,126.01	4,613,255.49
රඹකැන්ඔය	4,600,000.00	4,140,000.00	460,000.00
බී කලාපය	4,500,001.00	4,050,000.00	450,001.00
ඩී කලාපය	23,181,591.24	16,224,819.25	6,956,772.04
එච් කලාපය	11,065,000.00	9,958,500.00	1,106,500.00
එල් කලාපය	10,084,608.00	8,826,140.00	1,258,468.00
වික්ටෝරියා	16,593,601.00	14,924,440.00	1,669,161.00
වලව	16,698,717.03	14,398,520.52	2,300,196.51
එකතුව	**430,418,733.10**	**317,357,556.33**	**113,061,176.94**

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

2021 වර්ෂයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වත්කම් ලේඛණයෙහි ගිණුම්ගත කරන ලද වත්කම්.

කලාපය/අංශය	පිරිවැය (රු.)	ක්ෂය (රු.)	ශුද්ධ අගය (රු.)
ප්‍රධාන කාර්යාලය	104,326,819.31	50,996,073.44	53,330,745.87
ප්‍ර.චේ.හා ජ.මේ.අංශය	3,494,440.95		3,494,440.95
ගංගා ද්‍රේණි හා කළමනාකරන අංශය	955,638.03		955,638.03
බී කලාපය	48,041,569.48	18,388,463.05	29,653,106.43
එච් කලාපය	26,192,609.35		26,192,609.35
යාන්ත්‍රික වැඩපල මොරගහකන්ද	1,797,165.85		1,797,165.85
වලව	1,582,994.57	1,452,232.01	130,762.56
එකතුව	**186,391,237.54**	**70,836,768.50**	**115,554,469.04**

<u>මොරගහකන්ද ව්‍යාපෘතිය</u>

2021 වර්ෂයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වත්කම් ලේඛණයෙහි ගිණුම්ගත කරන ලද වත්කම්.

කලාපය/අංශය	පිරිවැය (රු.)	ක්ෂය (රු.)	ශුද්ධ අගය (රු.)
ප්‍ර.චේ.හා ජ.මේ.අංශය	46,120,053.80	21,965,969.81	24,154,083.99
ගංගා ද්‍රේණි හා කළමනාකරන අංශය	277,221.44	49,899,086.00	227,321.58
මොරගහකන්ද	65,274,920.54	56,959,254.85	8,315,665.69
රඹකැන්ඔය	37,600,002.00	6,300,000.00	31,300,002.00
බී කලාපය	7,329,000.00	6,596,100.00	732,900.00
ඩී කලාපය	31,104,781.24		31,104,781.24
එල් කලාපය	4,484,600.00	4,036,140.00	448,460.00
වික්ටෝරියා	16,593,600.00	14,924,440.00	1,669,160.00
යාන්ත්‍රික වැඩපල	340,000.00		340,000.00
වලව	16,698,717.03	14,398,520.52	2,300,196.51
එකතුව	**225,822,896.05**	**125,230,325.04**	**100,592,571.01**

වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2021

V - කොටස

පටුන

1.1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය

1. මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය 177
2. රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය 177
3. රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය 178
4. වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය - එල් කලාපය 179
5. කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය 180

1.2. එක් එක් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

1.2.1 කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන අංශයේ ප්‍රගතිය 181
1.2.2 ව්‍යාපාර සංවර්ධන අංශයේ ප්‍රගතිය 184
1.2.3 ඉඩම් බෙදා දීම 184
1.2.4 පරිසර සංරක්ෂණය 184

1.1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය

1. මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

- **අරමුණු:** වාරි ජල සැපයුම සුරක්ෂිත කරමින් කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම
- **ව්‍යාපෘති කාලසීමාව** : 2007-2021
- **ප්‍රතිලාභ ලැබූ දිස්ත්‍රික්ක හා පවුල් සංඛ්‍යාව :** පොළොන්නරුව හා මඩකලපුව දිස්ත්‍රික්කවල පවුල් 20, 000ක්
- **සමස්ත ඇස්තමේන්තු ආයෝජනය** : රු.මි 4,910
- **සමුච්ඡිත පිරිවැය (දෙසැම්බර් 2021) :** රු මිලියන 4749.55
- **2021 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය**

වෙන්කිරීම (රු.මිලියන)	ලැබුණු ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු.මිලියන)
217 .00	194.00	194.00

- **31.12.2021 වන විට භෞතික ප්‍රගතිය**

නිම කරන ලද කාර්යයන් පිළිබඳ විස්තරය	භෞතික ප්‍රගතිය
බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංසකරණය	කි මී 17.7
කෙත් ඇල ඉදි කිරීම/ප්‍රතිසංසකරණය	කි මී 24.3
ගොඩනගිලි 18ක් ප්‍රතිසංස්කරණය කිරීම	16
කි.මී 40ක මාර්ග නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය	කි මී 36
කුඩා වැව් 05ක් ප්‍රතිසංස්කරණය	වැව් 5

1. රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

- **අරමුණු :** යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා මහවැලි කලාප යටතේ තිබෙන ප්‍රදේශවල වෙසෙන පවුල්වලට කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම.
- **ව්‍යාපෘති කාලසීමාව**: 2012-2022
- **ප්‍රතිලාභී දිස්ත්‍රික්ක සහ පවුල් සංඛ්‍යාව:** බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද පවුල් *14,782*
- **ඇස්තමේන්තුගත මුළු ආයෝජනය**: රුපියල් මිලියන 1,100
- **සමුච්චිත වියදම්:** රුපියල් මිලියන 836.58
- **2021.12.31 වන විට භෞතික ප්‍රගතිය**

වෙන්කිරීම (රු.මිලියන)	ලැබුණු ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු.මිලියන)
165.00	152.5	137.45

- **31.12.2021 වන විට භෞතික ප්‍රගතිය**

කාර්යයන් පිළිබඳ විස්තර	ඉලක්කය	භෞතික ප්‍රගතිය
වැව් ප්‍රතිසංස්කරණය කිරීම	වැව් 16	වැව් 11ක් ප්‍රතිසංස්කරණය
අමුණු ප්‍රතිසංස්කරණය කිරීම	අමුණු 1	අමුණක් ප්‍රතිසංස්කරණය
මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	කි.මී 50.4	කි.මී 50.4 නිම කරන ලදී
පොදු ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තු කිරීම	ගොඩනැගිලි 13	ගොඩනැගිලි 12ක් නිම කරන ලදී

ආනයනික සීමා සහිත බෝග වගා කිරීම	හෙක්ටයාර 1000	හෙක්ටයාර 1014
ගෙවතු සංවර්ධනය	ගෙවතු 240	ගෙවතු 240
ගොවීන් / නිලධාරීන් පුහුණු වැඩසටහන්	වැඩසටහන් 30	වැඩසටහන් 28
ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධති ස්ථාපනය කිරීම	ඒකක 20	ඒකක 20
ආයතනික හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	වැඩසටහන් 97	වැඩසටහන් 94
පාරිසරික අධ්‍යාපන වැඩසටහන්	වැඩසටහන් 05	වැඩසටහන් 04ක් පවත්වන ලදී
රුක් රෝපණ වැඩසටහන	වැඩසටහන් 06	වැඩසටහන් 04ක් පවත්වන ලදී






2. රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

- **අරමුණු :** ඉඩම්, කෘෂිකාර්මික හා ජනාවාස ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම තුළින් රඹකැන්ඔය ජලාශ ව්‍යාපෘතියේ පහළ සංවර්ධන කටයුතුවල ඉතුරු කොටස සම්පූර්ණ කිරීම.
- **ව්‍යාපෘති කාලසීමාව:** *2012-2023*
- **ප්‍රතිලාභී දිස්ත්‍රික්ක සහ පවුල් සංඛ්‍යාව:** මහඔයේ සහ අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව පවුල් *3,550*ක්
- **ඇස්තමේන්තුගත මුළු ආයෝජනය :** රුපියල් මිලියන *1,086*
- සමුච්චිත වියදම් (දෙසැම්බර් *2020):* රුපියල් මිලියන 660.01
  ***2021* දෙසැම්බර් *31* දිනට මූල්‍ය ප්‍රගතිය**

වෙන්කිරීම (රු.මිලියන)	ලැබුණු ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු.මිලියන)
192.00	191.5	172.602

- **31.12.2021** වන විට භෞතික ප්‍රගතිය

කාර්යයන් පිළිබඳ විස්තර	**ඉලක්කය**	**භෞතික ප්‍රගතිය**
ආනයනික සීමා සහිත බෝග වගා කිරීම	හෙක්ටයාර 1000	ආනයනික සීමා සහිත බෝග හෙක්.986ක වගා කිරීම
ගෙවතු සංවර්ධනය	ගෙවතු 360	ගෙවතු 360 සංවර්ධනය
ගොවීන් / නිලධාරීන් පුහුණු වැඩසටහන්	වැඩසටහන් 40	වැඩසටහන් 38ක් නිම කරන ලදී
පශු සම්පත් සංවර්ධනය	වැඩසටහන් 13	වැඩසටහන් 12
මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	කි. මී 100	කි මී 95 නිම කරන ලදී .
වැව් ප්‍රතිසංස්කරණය කිරීම	වැව් 9	වැව් 2 ක් ඉදි කරන ලදී .
පොදු ගොඩනැගිලි ඉදිකිරීම	ගොඩනැගිලි 08	ගොඩනැගිලි 6ක් නිම විය.
ඉඩම් මැනීම සහ අනු සීමා කිරීම	ඉඩම් කට්ටි 2,900	ඉඩම් කට්ටි 1455 නිම කරන ලදී
වන්දි ගෙවීම	ඉඩම් කට්ටි 77	ඉඩම් කට්ටි 73 කට වන්දි ගෙවන ලදී .
ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන්	54	50 ක් නිම කරන ලදී .
කුඩා කාන්තා කණ්ඩායම්වල නිෂ්පාදන අලෙවි කිරීමට පහසුකම් සැලසීම.	ප්‍රතිලාභීන් 11	ප්‍රතිලාභීන් 11
50% දායකත්වය යටතේ යන්ත්‍රෝපකරණ සැපයීම	ප්‍රතිලාභීන් 13	ප්‍රතිලාභීන් 13 සඳහා ලැබිණි
ළිං ඉදිකිරීම		ළිං 43 ක් ඉදි කරන ලදී
සනීපාරක්ෂක පහසුකම් සැපයීම		558 ක් වැඩි දියුණු කරන ලදී
විදුලි වැට නඩත්තු කිරීම	කි.මී 10	කි.මී 10 ක විදුලි වැටක් ප්‍රතිසංස්කරණය කරන ලදී
පැල නිෂ්පාදනය	පැල 5000	පැල 5000 ක් නිෂ්පාදනය කරන ලදී
රුක් රෝපණ වැඩසටහන	6	වැඩසටහන් 4 ක් සිදු කරන ලදී







3. වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපාරය -එල් කලාපය

- **අරමුණු:** අවතැන් වූ පවුල් සඳහා ගෙවතු, වාරි ඉඩම් සහ අවශ්‍ය භෞතික, සමාජ-ආර්ථික යටිතල පහසුකම් සැපයීම
- **ව්‍යාපෘති කාලසීමාව:** 2012-2023

- **ප්‍රතිලාභී දිස්ත්‍රික්ක සහ පවුල් සංඛ්‍යාව:** අනුරාධපුර, වවුනියාව, මුලතිවු දිස්ත්‍රික්කවල පවුල් *6,788*
- **ඇස්තමේන්තුගත මුළු ආයෝජනය:** රුපියල් මිලියන 3,957.10
- **සමුච්චිත වියදම් (දෙසැම්බර් 2020):** රුපියල් මිලියන 2496.72
- **2021** *දෙසැම්බර්* **31** *දිනට මූල්‍ය ප්‍රගතිය*

වෙන්කිරීම (රු මිලියන)	ලැබුණු ප්‍රතිපාදන (රු මිලියන)	වියදම (රු මිලියන)
233.00	216.00	207.96

- **31.12.2021** වන විට භෞතික ප්‍රගතිය

කාර්යයන් පිළිබඳ විස්තර	ඉලක්කය	භෞතික ප්‍රගතිය
මාර්ග ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම	කිලෝමීටර 100 කි	කිලෝමීටර 90ක මාර්ගය නිම කර ඇත.
ව්‍යුහයන් ඉදි කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම		ව්‍යුහයන් 13ක් සම්පූර්ණ කර ඇත.
ඇල මාර්ග පුනරුත්ථාපනය කිරීම	කිලෝමීටර 2.9 කි	කිලෝමීටර 2.6 ක් සම්පූර්ණ කර ඇත.
ගොඩනැගිලි ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම	10	ගොඩනැගිලි 9 ක් නිම කර ඇත.
ඉඩම් කට්ටි මැණුම් කිරීම	5200	බිම් කොටස් 2,000ක් සමීක්ෂණය කරන ලදී.
ඔප්පු ලබාදීම	වැඩසටහන 4	ප්‍රදාන 850ක් නිකුත් කර ඇත
ආයතනික සංවර්ධනය සිදුකිරීම	වැඩසටහන් 451 ක්	275 සම්පූර්ණ කර ඇත.






4. කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

- **අරමුණු**: රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා දේශීය කෘෂි ආනයනය අඩු කිරීමට හේතු වන දේශීය ආහාර බෝග වගාව සහ පශු සම්පත් නිෂ්පාදනය වැඩිදියුණු කිරීම
- **ව්‍යාපෘති කාලය:** *202*1 ජනවාරි සිට දෙසැම්බර් දක්වා
- **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක සහ පවුල් සංඛ්‍යාව**: මහවැලි පද්ධතියේ සියලුම ගොවි පවුල්
  - **ඇස්තමේන්තුගත මුළු ආයෝජනය :** රුපියල් මිලියන 500
  - **සමුච්චිත වියදම් (දෙසැම්බර්** 202**1**): රුපියල් මිලියන 418.95
  - **202**1 දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රගතිය

වෙන්කිරීම (රු මිලියන)	ලැබුණු ප්‍රතිපාදන (රු මිලියන)	වියදම (රු මිලියන)
500.00	500.00	418.95

කෘෂිකාර්මික භෝග වගාව

- 2020/2021 මහ කන්නයේදී මහවැලි ප්‍රදේශවල වී වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්. 96,027.0 ක් වන අතර මහවැලි කලාපවල වී නිෂ්පාදනය දල වශයෙන් මෙ. ටො. 556,954.0 ක් විය 2021 යල කන්නයේ වී වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක් 86,979.0 වන අතර වාර්තා වන වී නිෂ්පාදනය මෙ. ටො. 521,874 වේ. 2020/2021 මහ සහ 2021 යල කන්නයේ වාර්තා වී ඇති මුලු වී නිෂ්පාදනය මෙ. ටො. 1,078,828 වේ..

- අනෙකුත් භෝග වගාවේ නිෂ්පාදනය මෙ.ටොන් 93,906 ක් වූ අතර, පලතුරු නිෂ්පාදනය ලෙස මෙට්‍රික් ටොන් 218,960 ක් වාර්තා වී ඇති අතර එළවලු නිෂ්පාදනය මෙ.ටොන් 171,805.2 කි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තු දත්ත වලට අනුව, මහවැලි අධිකාරිය රටේ දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ සංවර්ධනය සඳහා සක්‍රීය කාර්යභාරයක් ඉටු කරන අතර එය මේ කාලසීමාව තුළ වී වලින් 20%, සෝයා බෝංචි 90%, මුං අැට නිෂ්පාදනයෙන් 24% සහ ලොකු එෑණු වලින් 21% සඳහා දායකත්වය සපයා ඇත. (**2020/21** මහ සහ **2021** යල බෝග පුරෝකථනය අනුව).

1.2. එක් එක් අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

1.2.1 කෘෂිකර්ම හා පශු සම්පත් අංශයේ ප්‍රගතිය

අංකය	ක්‍රියාකාරකම	ඉලක්කය (මෙට්‍රො)	ප්‍රගතිය (මෙට්‍රො)	%
1	**කෘෂිකාර්මික නිෂ්පාදනය (2020/21 මහ + 2021 යල+ 3 වන කන්නය)**			
1.1	**බීජ - මහවැලි ගොවිපල**			
	බිත්තර වී	1,805	1,353	75%
	වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ	108	15.71	15%

		ඉලක්කය (මෙට්‍රො)	ප්‍රගතිය (මෙට්‍රො)	%
1.2	**බීජ - මහවැලි ගොවීන්**			
	බිත්තර වී	6,503.7	6,972.7	107%
	වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ	851.0	981.8	115%

		ඉලක්කය (මෙටො)	ප්‍රගතිය (මෙටො)	%
1.3	**බෝග නිෂ්පාදන වැඩසටහන**			
	වී	980,653	1,078,828	110%
	වෙනත් ක්ෂේත්‍ර බෝග			
	ලොකු ළූණු	31,640	18,880	60%
	සෝයා	13,361.9	7,501	56%
	උඳු	3,276.3	3,221.4	98%
	කව්පී	1,345.6	1,141.5	85%
	කුරක්කන්	1,193.3	1,395.8	117%
	මුං ඇට	8,804	7,535	86%
	බඩ ඉරි හූ	46,556	36,981	79%
	රට කජු	4,392	3,022	69%
	මිරිස්	11,349	10,529	93%
	තල	312	755	242%
	කහ	876	1,478	169%
	ඉහුරු	1,100	1,466	133%
		ඉලක්කය (මෙටො) වාර්ෂික	**ප්‍රගතිය (මෙටො)**	**%**
1.4	**පළතුරු නිෂ්පාදනය**			
	කෙසෙල්	149,592	166,733.7	111%
	පැපොල්	28,710.6	28,929.3	101%
	පේර	9,967.8	10,155.5	102%
	අනෙකුත් පලතුරු (අඹ, ඩ්‍රැගන් ෆෘට්, අන්නාසි, පැෂන්, තැඹිලි)	11,598.9	13,141.3	113%
1.5	**එළවළු**	157,449.9	171,805.2	109%

අංකය		ඉලක්කය (මෙටො)	ප්‍රගතිය (මෙටො)	%
2	**කාබනික කලාප සංවර්ධනය**	9,275.0	9,740.0	105%
2.1	කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන	244,300	153,240	63%

		ඉලක්කය (මෙටො) වාර්ෂික	ප්‍රගතිය (මෙටො)	%
3.	පශු සම්පත්			
	මිරිදිය ධීවර කර්මාන්තය (මෙටො)	11,000	12052.1	110%
	නැවුම් කිරි (ලීටර් මිලියන)	40	42.02	105%
	බිත්තර (මිලියන)	60	62.35	104%
	විසිතුරු මාළු (ජෝඩු මිලියන)	37	39.98	108%








ක්‍රියාකාරකම	**ඒකකය**	**ඉලක්කය 2021**	**ප්‍රගතිය 2021**
ආයෝජන ප්‍රවර්ධනය			
ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් වෙන් කිරීම සඳහා ආයෝජකයින් තෝරා ගැනීම *			
ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන සහ නියාමන වැඩසටහන්	වැඩසටහන	11	17
එක වහලක් යටින්			
නව ඉදිකිරීම් ව්‍යාපෘති	ව්‍යාපෘති	2	1
නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යවසායකයින්ගේ නිරන්තර අධීක්ෂණය සහ අලෙවිකරණය	වැඩසටහන	13	13
සංචාරක ප්‍රවර්ධන වැඩසටහන			
මහවැලි වැව් සහ ජලාශවල පරිසර හිතකාමී බෝට්ටු මෙහෙයුම් ව්‍යාපෘතිය	ව්‍යාපෘති	8	4
සී ප්ලේන් ව්‍යාපෘතිය	ව්‍යාපෘති	1	1
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්			
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නඟා සිටුවීම සඳහා ස්වයං ව්‍යාපාර අදහස් උත්පාදන (GYB) සහ ව්‍යවසායකත්ව වැඩසටහන් පැවැත්වීම	වැඩසටහන	20	15
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ප්‍රවර්ධනය සඳහා 50% මූල්‍ය දායකත්වය යටතේ භාණ්ඩ හා උපකරණ බෙදා හැරීම	ව්‍යවසායකයෝ	200	383
කුඩා හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමය			
(“මහවැලි සවිය”) ණය යෝජනා ක්‍රමය	ව්‍යවසායකයෝ	55	54
(මොරගහකන්ද අත්වැල) ණය යෝජනා ක්‍රමය	ව්‍යවසායකයෝ	60	9

1.2.2 ව්‍යාපාර සංවර්ධනය

* වලව කලාපයේ කාර්මික ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයින් 46 දෙනෙකු තෝරාගෙන ඇත (හෙක්ටයාර 56). 30 සඳහා මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත
* බී කලාපයේ කෘෂිකාර්මික හා සත්ත්ව පාලන ව්‍යාපෘති 74ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ඇඹිලිපිටියේ හෙක්ටයාර 58ක තෝරාගත් කාර්මික සැකසුම් ව්‍යවසායන් 46ක් සී කලාපයේ ඉඩම් හෙක්ටයාර 50.6ක් සඳහා ඇගයීම් කටයුතු අවසන් කර ඇත.

1.2.3 ඉඩම් බෙදාදීම

ඉඩම් සංවර්ධනය	වාර්ෂික ඉලක්කය	ප්‍රගතිය	%
ඔප්පු බෙදා දීමේ වැඩසටහන	100,000	35,485	35%

1.2.4 පරිසර සංරක්ෂණය

ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්කය 2021	ප්‍රගතිය 2021
ජලජ ශාකවලින් වැසී ඇති වැව් පවිත්‍ර කොට කොම්පෝස්ට් නිෂ්පාදනය	ටොන්	160	148.5
හරිත මාර්ග සංකල්පය ප්‍රවර්ධනය කිරීම	කි.මී	14	9
පැල නිෂ්පාදනය (මහවැලි පැල තවාන්, පාසල් දරුවන් හා ගොවීන් විසින්)	පැල	819,284	508,124
ඉහළ ජල පෝෂක ප්‍රදේශවල සහ පහළ ගංගා නිම්නවල පැල සිටුවීම	පැල	431,450	385,720
හරිත උද්‍යාන පිහිටුවීම	උද්‍යාන	5	3
පාරිසරික අධ්‍යාපනය සහ ප්‍රවර්ධනය	වැඩසටහන	80	71
විදුලි වැට නඩත්තු කිරීම	කිමී	විවෘත	116
පටක රෝපණ පැල නිෂ්පාදනය	පැල	200,000	66,285